328 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 328 - இல. 05
Volume 328 - No. 05

2026 ජූලි 21වන අඟහරුවාදා
2026 யூலை 21, செவ்வாய்க்கிழமை
Tuesday, 21st July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට අදාළ ලිපිලේඛන අධිවේගී තැපෑලෙන් ලබා ගැනීම [තීරුව 723]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 724]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 729-774]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ණය ආපසු ගෙවීමේදී ඩොලර් මිලියන 2.5ක් අහිමි වීම සම්බන්ධව COPF වාර්තාවෙන් කළ හෙළිදරව්ව [තීරුව 774]
"අස්වැසුම" ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක [තීරුව 778]

**සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 784]

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 785]

**කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:**
කාලය දීර්ඝ කිරීම [තීරුව 786]

**පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණ** [තීරු 787-843]

**කල් තැබීමේ යෝජනාව:**
දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යසාධනය [තීරු 844-899]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරුව 900]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
பாராளுமன்ற அலுவல்கள் தொடர்பான ஆவணங்களை விரைவுத் தபால் மூலம் பெறுதல் [ப: 732]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 724]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 729-774]

**தனி அறிவித்தல் மூல வினா:**
கடனைத் திருப்பிச் செலுத்துகையில் ஏற்பட்ட 2.5 மில்லியன் அமெரிக்க டொலர் இழப்பு தொடர்பான COPF அறிக்கையின் வெளிப்படுத்தல்கள் [ப: 774 ]
"அஸ்வெசும" பயனாளிகளைத் தேர்ந்தெடுப்பதற்கான ஏற்றுக்கொள்ளப்பட்ட அளவுகோல்கள் [ப: 778]

**விலங்குகள் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 784]

**தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 785]

**கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:**
காலநீடிப்பு [ப: 786]

**பாராளுமன்ற நிலையியற் கட்டளைகளின் கீழான தீர்மானங்கள்** [ப: 787-843]

**ஒத்திவைப்புப் பிரேரணை:**
பத்தாவது பாராளுமன்றத்தில் பொது மனுக்கள் பற்றிய குழுவின் செயலாற்றுகை [ப: 844-899]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 900]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Receiving Documents Relating to Business of Parliament by Speed Post [Col. 723]

AUDITOR-GENERAL'S REPORT [Col. 724]

ORAL ANSWERS TO QUESTIONS [Col. 729-774]

QUESTION BY PRIVATE NOTICE:
Revelations Made by COPF Report on Loss of US Dollars 2.5 Million in Debt Repayment [Col. 774]
Criteria Adopted for Selecting "Aswesuma" Beneficiaries [Col. 778]

ANIMALS (AMENDMENT) BILL:
Read the First Time [Col. 784]

NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD (AMENDMENT) BILL:
Read the First Time [Col. 785]

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD:
Extension of Time [Col. 786]

DECISIONS UNDER THE STANDING ORDERS OF PARLIAMENT [Cols. 787-843]

ADJOURNMENT MOTION:
Performance of Committee on Public Petitions of Tenth Parliament [Cols. 844-899]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 900]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජූලි 21වන අඟහරුවාදා***
*2026 யூலை 21, செவ்வாய்க்கிழமை*
*Tuesday, 21st July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට අදාළ ලිපිලේඛන අධිවේගී තැපෑලෙන් ලබා ගැනීම
### பாராளுமன்ற அலுவல்கள் தொடர்பான ஆவணங்களை விரைவுத் தபால்மூலம் பெறுதல்
### RECEIVING DOCUMENTS RELATING TO BUSINESS OF PARLIAMENT BY SPEED POST

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අධිවේගී තැපැල මඟින් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය, න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය සහ න්‍යාය පත්‍රය බෙදා හැරීමේ දී දැරීමට සිදුවන පිරිවැය අවම කර ගැනීම සඳහා මෙම ලිපිලේඛන තවදුරටත් අධිවේගී තැපැල මඟින් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ ද යන්න පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණයට අනුව, එම ලිපිලේඛන තවදුරටත් අධිවේගී තැපෑල මඟින් ලබා ගැනීම සඳහා කැමැත්ත පළ කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්හට පමණක් අදාළ ලිපිලේඛන අධිවේගී තැපැල මඟින් යැවීමට 2026.07.10 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී තීරණය කළ බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

තවද, සියලුම මන්ත්‍රීවරුන් සඳහා එම ලිපිලේඛනවල උඩුගත කරන ලද වෙබ් සබැඳිය අදාළ දිනයේ දී කෙටි පණිවුඩයක් මඟින් දැනුම්දීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XXIV කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXXI කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXI කොටස, තෙවැනි කාණ්ඩයේ XXVII කොටස සහ නවවැනි කාණ්ඩයේ XLV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Performance Reports of the Commission to Investigate Allegations of Bribery or Corruption for the Third and Fourth Quarters of the year 2025; and

(ii) Annual Performance Report of the Delimitation Commission for the year 2025.

I move that these Reports be referred to the Committee on Constitutional Affairs.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I also present the Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Department of Examinations, Sri Lanka in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) සහ 120(4) සංශෝධනය කර අනුමත කිරීම නිසා එම කාරක සභා දෙකෙහි වාර්තා කෙළින්ම අදාළ නිශ්චිත පරීක්ෂණ ආයතනවලට යැවීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ සම්බන්ධව අපි ඔබතුමාටත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වනවා. ඒ වාගේම එම සංශෝධිත ස්ථාවර නියෝග ඇතුළත් අලුත් Standing Orders පොත් අපට ලබා දී තිබෙනවා. එය අපගේ පරිශීලනයට පහසුවක් වනවා. එසේ අලුත් Standing Orders පොත් ලබා දීම පිළිබඳවත් ස්තුතිවන්ත වනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ධීවර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ලංකා සතොස ලිමිටඩ් සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) වාරියපොල, නාවින්න විද්‍යාලය ඉදිරිපිට යන ලිපිනයෙහි පදිංචි ඉන්දික ප්‍රියන්ත ඇපා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හොරොව්පතාන, කපුගොල්ලෑව, නිවාස 30 යන ලිපිනයෙහි පදිංචි ජයසේනගේ ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අතුරුගිරිය, පෝරේ, සීලවිමල මාවත, අංක 228/4 යන ලිපිනයෙහි පදිංචි කේ.එස්. අබයදීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හකුරුවෙල, උඩයාල, රත්තගේ ආර පාර, අංක 1/ඩී/04 යන ලිපිනයෙහි පදිංචි පී. වික්‍රමආරච්චි මහත්මිය සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) හෙට්ටිපොල, දොලහමුණ යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. චාමින්ද කුමාර තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
*(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)*
*(The Hon. Lakshman Nipuna Arachchi)*

ගරු කථානායකතුමනි, පිළියන්දල, ගැඩඹුවාන, සිරිමල් උයන, අංක 52 යන ලිපිනයෙහි පදිංචි ඩී. රේණුකා එදිරිසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා විදුලිබල මණ්ඩලය: විදුලි ජනනය
### இலங்கை மின்சார சபை: மின்சாரப் பிறப்பாக்கம்
### CEYLON ELECTRICITY BOARD: ELECTRICITY GENERATION

180/2024

**1.** ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වසර 05 තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජනනය කරන ලද මුළු විදුලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉදිරි වසර 15 සඳහා ප්‍රක්ෂේපිත විදුලි ජනනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විදුලි ජනන ක්‍රම සහ පුනර්ජනනීය සහ තාප ප්‍රභවයන් මඟින් ජනනය කරන ලද ප්‍රමාණ සහ මණ්ඩලය විසින් ජනනය කරන ලද සහ පෞද්ගලික අංශයෙන් මිලදී ගන්නා ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් පසුගිය වසර 05 සඳහා මුළු ස්ථායි සහ ස්ථායි නොවන ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iii)හි සඳහන් ඒකකයක මූල්‍ය පිරිවැය සහ ක්ෂයවීම් සංරචක ඇතුළුව මණ්ඩලය විසින් දරන ලද ජනනය කිරීමේ ඒකකයක් සඳහා පිරිවැය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) පසුගිය වසර 05 තුළ මුළු විදුලි පරිභෝජනය සහ ඉදිරි වසර 05 සඳහා ප්‍රක්ෂේපිත විදුලි පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) පාරිභෝගිකයන්ගෙන් අය කරනු ලබන ඒකකයක ලාභය/අලාභය සහ එහි විකුණුම් මිලට ඇතුළත් බදු ප්‍රමාණය කවරේද;

(viii) ඉදිරි වසර 03 සඳහා අපේක්ෂිත මුළු ලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) පසුගිය වසර 05 තුළ සාමාන්‍ය උපරිම සහ අවම විදුලි ඉල්ලුම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 05 வருட காலப்பகுதியில் இலங்கை மின்சார சபையால் பிறப்பிக்கப்பட்ட மின்சாரத்தின் மொத்த அளவை வெவ்வேறாகவும்;

(ii) அடுத்த 15 வருடங்களுக்காக எதிர்பார்க்கப்படும் மின்சாரப் பிறப்பாக்கத்தின் அளவை வெவ்வேறாகவும்;

(iii) மின்பிறப்பாக்க முறைமை மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி மற்றும் வெப்ப சக்தி மூலங்களால் பிறப்பிக்கப்பட்ட மின்சாரத்தின் அளவையும் சபையால் பிறப்பிக்கப்பட்ட மின்சாரத்தின் அளவையும் தனியார் துறையிடமிருந்து கொள்வனவு செய்யப்பட்ட மின்சாரத்தின் அளவையும் வெவ்வேறாகவும்;

(iv) மேலே (i)இல் குறிப்பிடப்பட்டுள்ளவாறு, கடந்த 05 வருடங்களுக்கான தடைப்படக்கூடிய மற்றும் தடைப்படாத மொத்த பிறப்பாக்க ஆற்றலை வெவ்வேறாகவும்;

(v) மேலே (iii)இல் குறிப்பிடப்பட்டுள்ளவாறு, ஓர் அலகுக்கான செலவையும் தேய்மானக் கூறுகள் உள்ளடங்கலாக ஓர் அலகுக்கான நிதிச் செலவுகளையும் சபையின் உற்பத்திச் செலவுகளையும் வெவ்வேறாகவும்;

(vi) கடந்த 05 வருடங்களுக்கான மொத்த மின் நுகர்வையும் மற்றும் அடுத்த 05 வருடங்களுக்கான எதிர்பார்க்கப்படும் மின் நுகர்வையும் வெவ்வேறாகவும்;

(vii) நுகர்வோரிடமிருந்து வசூலிக்கப்படும் ஓர் அலகுக்கான இலாபத்தையும்/நட்டத்தையும் விற்பனை விலையில் சேர்க்கப்பட்டுள்ள வரிகளையும்;

(viii) அடுத்த 03 வருடங்களுக்காக எதிர்பார்க்கப்படும் மொத்த இலாபத்தை வெவ்வேறாகவும்;

(ix) கடந்த 05 வருடங்களுக்கான சராசரி அதிகபட்ச மற்றும் குறைந்தபட்ச மின் தேவையை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the-

(i) total electricity generation by the Ceylon Electricity Board during the last five years, separately;

(ii) projected electricity generation for the next 15 years, separately;

(iii) modes of generation and the quantities generated under renewable and thermal sources, separately the generation by the Board and purchases from the private sector;

(iv) total firm and non-firm generation capacity for last five years, separately, as referred to in (i) above;

(v) cost per unit in respect of (iii) above, indicating the cost of generation by the Board, including financial costs and depreciation components per unit, separately;

(vi) total electricity consumption for the last five years and the projected consumption for the next five years, separately;

(vii) profit/loss per unit charged to consumers and the taxes included in the selling price;

(viii) total profit expected for the next three years, separately; and

(ix) average maximum and minimum electricity demand for last five years, separately?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

Hon. Speaker, the Answer is as follows:

(a) (i) The details are given in the table below.

| Year | Major Hydro | Thermal Oil | Thermal Coal | CEB Wind | CEB Net Generation in (GWh) |
|---|---|---|---|---|---|
| 2020 | 3,911 | 1,465 | 5,754 | 8 | 11,138 |
| 2021 | 5,640 | 1,234 | 5,519 | 318 | 12,711 |
| 2022 | 5,364 | 1,340 | 5,174 | 347 | 12,225 |
| 2023 | 4,573 | 1,975 | 4,646 | 391 | 11,585 |
| 2024 | 5,426 | 1,570 | 5,482 | 383 | 12,861 |
| 2025 | 6,306 | 1,418 | 4,870 | 374 | 12,968 |

(ii) The projected electricity generation for the next 15 years are given in the table below. But, here we have not considered the losses at the transmission and distribution. That depends on the renewable-thermal energy mix in the future. Since it has not been forecasted, we have not included the losses at the transmission and distribution.

| Year | Net Generation Forecast (GWh)[1,2] |
|---|---|
| 2027 | 20,549 |
| 2028 | 21,587 |
| 2029 | 22,616 |
| 2030 | 23,821 |
| 2031 | 25,091 |
| 2032 | 26,301 |
| 2033 | 27,511 |
| 2034 | 28,733 |
| 2035 | 30,145 |
| 2036 | 31,615 |
| 2037 | 33,160 |
| 2038 | 34,798 |
| 2039 | 36,539 |
| 2040 | 38,312 |
| 2041 | 40,233 |

[1] In the process of developing the demand forecast, all embedded generation that is not metered real time at NSCC is evaluated to reflect the actual demand and generation.

[2] Net losses include losses at the Transmission and Distribution levels and excludes Generation (including auxiliary consumption) losses. Loss forecast will vary depending on the renewable-thermal generation mix of the future.

(iii) The details are given in the table below.

(Units in GWh)

| | Generation Source/ Year | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|
| CEB | Major Hydro | 3,911 | 5,640 | 5,364 | 4,573 | 5,426 | 6,306 |
| | CEB Wind | 8 | 318 | 347 | 391 | 383 | 374 |
| | Thermal Oil | 1,465 | 1,234 | 1,340 | 1,975 | 1,570 | 1,418 |
| | Thermal Coal | 5,754 | 5,519 | 5,174 | 4,646 | 5,482 | 4,870 |
| IPP | Mini Hydro | 1,047 | 1,568 | 1,377 | 1,378 | 1,473 | 1,425 |
| | Wind | 325 | 328 | 376 | 427 | 409 | 401 |
| | Solar (Grid Connected) | 118 | 156 | 190 | 227 | 257 | 343 |
| | Rooftop Solar | 269 | 390 | 530 | 632 | 867 | 1,674 |
| | Dendro | 89 | 91 | 46 | 69 | 85 | 104 |
| | Bio Mass | 9 | 2 | 1 | 25 | 14 | 27 |
| | Municipal Waste | 2 | 70 | 69 | 73 | 68 | 72 |
| | Thermal Oil | 2,717 | 1,400 | 1,128 | 1,160 | 768 | 798 |
| Total | | 15,714 | 16,716 | 15,942 | 15,576 | 16,802 | 17,812 |

(iv) The total firm and non-firm generation capacity for the last five years is given below:

| Year | Thermal Oil | Thermal Coal | Major Hydro | CEB Wind | Total CEB Capacity in MW |
|---|---|---|---|---|---|
| 2020 | 654 | 900 | 1,383 | 31 | 2,968 |
| 2021 | 654 | 900 | 1,383 | 103 | 3,040 |
| 2022 | 654 | 900 | 1,413 | 104 | 3,071 |
| 2023 | 801 | 900 | 1,413 | 104 | 3,218 |
| 2024 | 801 | 900 | 1,533 | 104 | 3,338 |
| 2025 | 727 | 900 | 1,530 | 104 | 3,261 |

(v) The cost per unit in respect of each generation source is given below:

| Power Source | Cost Per Unit (Rs.) | | | | |
|---|---|---|---|---|---|
| | 2025 | 2024 | 2023 | 2022 | 2021 |
| CEB-Hydro | 2.35 | 2.24 | 2.96 | 2.78 | 1.72 |
| CEB-Thermal | 46.83 | 53.93 | 70.08 | 67.87 | 31.68 |
| CEB- 50MW Generators | 155.79 | 166.23 | 97.16 | 62.74 | 42.50 |
| CEB- Coal | 19.79 | 20.82 | 36.33 | 27.32 | 12.43 |
| CEB- Wind | 18.25 | 12.12 | 4.24 | 65.73 | 3.95 |
| IPP- Thermal | 94.27 | 73.37 | 64.13 | 69.65 | 30.35 |
| Renewable Energy | 16.81 | 15.94 | 16.35 | 14.98 | 16.22 |
| Solar Rooftop - Net Accounting | 29.28 | 28.48 | 23.00 | 21.98 | 22.77 |
| -Net Plus | 31.01 | 26.44 | 22.00 | 21.76 | 21.93 |
| -Net Plus Plus | 25.88 | 26.43 | - | - | - |
| LECO Rooftop Solar- Prosumers | 28.62 | - | - | - | - |

[ගරු අනුර කරුණාතිලක මහතා]

(vi) The total electricity consumption for the last five years and the projected consumption for the next five years are given below:

| Year | Sales to Consumers (GWh)[3] CEB+ LECO |
|---|---|
| 2021 | 15,180 |
| 2022 | 14,536 |
| 2023 | 14,195 |
| 2024 | 15,294 |
| 2025[4] | 16,268 |

[3] Excluding rooftop solar self consumption

[4] Provisional Data

| Year | Demand Forecast (GWh)[5] |
|---|---|
| 2027 | 18,853 |
| 2028 | 19,860 |
| 2029 | 20,920 |
| 2030 | 22,037 |
| 2031 | 23,214 |

[5] In the process of developing the demand forecast, all embedded generation that is not metered real time at NSCC is evaluated to reflect the actual demand and generation.

(vii) Profit/ loss per unit charged to consumers and taxes included in the selling price

| Description | 2025 | 2024 | 2023 | 2022 | 2021 |
|---|---|---|---|---|---|
| Profit and (Loss) Before Tax Rs'000 | (38,739,948) | 141,604,809 | 57,632,828 | (298,189,204) | (34,139,017) |
| Number of Units Sold (GWh) | 16,069 | 15,191 | 14,153 | 14,520 | 15,214 |
| Profit and (Loss) Per Unit before Tax Rs (Including Other Income) | (2.41) | 9.32 | 4.07 | (20.54) | (2.24) |
| Profit and (Loss) Per Unit before Tax Rs (Excluding Other Income) | (3.99) | 5.03 | 1.94 | (12.41) | (2.25) |
| Tax (SSCL) Included in Selling Price ('000) | 10,323,682 | 13,060,587 | 14,384,212 | 2,169,253 | N/A |

(viii) The forecast of the profit expected over the next three years is currently under preparation. After completing we can submit those details as well.

(ix) The details are given in the table below.

| Year | Minimum Electricity Demand in MW | Maximum Electricity Demand in MW |
|---|---|---|
| 2020 | 892 | 2,717 |
| 2021 | 964 | 2,802 |
| 2022 | 833 | 2,708 |
| 2023 | 928 | 2,415 |
| 2024 | 994 | 2,673 |
| 2025 | 722 | 2,896 |

(b) Not Relevant.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම සවිස්තර පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. මගේ පරමාර්ථය වූයේ, අපේ ස්වභාව ධර්මය තුළින්; අපට පාවිච්චි කරන්න පුළුවන් පුනර්ජනනීය බලශක්තිය තුළින් ඉදිරියේදී විදුලිය ජනනය කිරීමේ හැකියාව කොතරම්ද කියා දැනගැනීමයි. මේ තුළ ඔබතුමාටත් පෙනෙනවා ඇති, තාප බලාගාර තුළින් විදුලිය නිෂ්පාදනය කිරීමට දරන වියදම සියයට 65ක් වෙනකොට, ඒකකයක - unit එකක - වියදම වැඩිවෙලා තිබෙන බව. ඔබතුමාගේ පරිපාලනය යටතේ මේ වියදම අඩු කරලා, පාරිභෝගිකයාට වාසියක් ලබාදෙන්න හැකියාව ලැබෙන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ තුළ ඉදිරිපත් වෙලා තිබෙන ප්‍රශ්නයක් තමයි, සම්ප්‍රේෂණය. දැන් කොතරම් විදුලිය නිෂ්පාදනය කළත් සම්ප්‍රේෂණ ප්‍රශ්නය නිසා පාරිභෝගිකයාට යවන්න බැරි වේවි. මම හිතන විධියට, ඒ ප්‍රශ්නය ඉස්මතු වෙලා තිබෙනවා සාම්පූර් බලාගාරය තුළ. ඒකට ඔබතුමන්ලාගේ විසඳුම වන්නේ Indian grid එක එකතු කිරීම ද? නැත්නම් කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන එක ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. දැනට 70 per cent තමයි අපේ renewable energyවලට යන්න පුළුවන් percentage එක. අපි අපේ generation plan එක හදාගෙන යනවා, ඉස්සරහට මේ තිබෙන constraint එක ඉවත් කරලා, ඒ 70 per cent කියන limit එකේ තබා ගන්නේ නැතිව ඉදිරියට යන්න.

ඒ වාගේම thermal powerවලින් සියයට 20ක capacity එකක් තමයි අපේ generation එකට එන්නේ. හැබැයි අපේ generation cost එකෙන් 40 per cent යන්නේ thermal powerවලට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, ඒක හරියටම හරි. එහෙම නම් ඒක අඩු කර ගන්න පුළුවන් වෙන්නේ සුනිත්‍ය බලශක්තියට යෑමෙනුයි. ඒකට තිබෙන ප්‍රධාන බාධාවක් තමයි අප renewable energy plants හැදුවත් ඒක National Grid එකට absorb කර ගන්න පුළුවන් transmission lines පසුගිය කාලවල හැදිලා නැති

එක. ඔබතුමා කියපු, සාම්පූර්-කප්පල්තුරේ සම්ප්‍රේෂණ මාර්ගය අපි මේ වනකොට හදාගෙන යනවා. ආරම්භයේදී - initially - ගැටලුවක් තිබුණා. මොකද, ඒක සැලසුම් කරලා තිබුණේ 300 megawattsවලට. නමුත් capacity increase එකකින් අපි ඒක 600 megawatts ලෙස තීරණය කරලා, දැන් ඒකේ ටෙන්ඩර් කටයුතු කරගෙන යනවා. අපි හිතන්නේ නැහැ ඒකේ ලොකු delay එකක් එයි කියලා. ඒක ඉතාම ඉක්මනින් කරන්න අපට පුළුවන්.

විශේෂයෙන්ම උතුරේ මන්නාරම ප්‍රදේශයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන renewable energy ජාතික විදුලි පද්ධතියට එකතු කර ගැනීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රධාන බාධාව තමයි ඒ transmission lines. විශේෂයෙන් උතුරු backbone line එක 400 kV යන එකක්. අප ගරු ජනාධිපතිතුමාත් එක්ක පසුගිය සතියේ පැවැති සාකච්ඡාවේදී එතුමා පොරොන්දු වුණා ලංකාවේ භාණ්ඩාගාරයේ මුදල් යොදවා අපි ඒක කරමු කියලා. මොකද, අපේ විදුලිබල පද්ධතියට renewable energy absorb කර ගැනීම සඳහා ඒක අතිශයින්ම වැදගත්.

සාමාන්‍යයෙන් වෙනත් මූලාශ්‍රයකින් - වෙනත් source එකකින් - funds සොයා ගන්න ගියාම කාලයක් යන බව අපි දන්නවා. ඒ කාලය අඩු කරලා ඉතාම ඉක්මනින් renewable energy sourcesවල විදුලිය පද්ධතියට එකතු කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ මුදල් යොදවා ඒ පද්ධතිය හදන්නත්, ඒ වාගේම තවත් ප්‍රධාන transmission lines හතරක් හදන්නත් ඉදිරියේදී අපි කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට වෘත්තීමය පදනමක් සහිතව උත්තරයක් දීම ගැන ස්තුතියි.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ රාජ්‍ය ඇමතිතුමා වශයෙන් කටයුතු කරන කොට අපි අදාළ ඉදිරිපත් කිරීම් කර තිබෙනවා. දැන් පුනර්ජනනීය බලශක්තිය තුළින් මෙගාවොට් 3,000ක් නිෂ්පාදනය වනවා. එපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය වුණාට තාප බලාගාර සම්බන්ධව ඇති අවශ්‍යතාව මත ඇතැම් ඉංජිනේරුවරු Battery Energy Storage System - BESS - එක තුළින් පුනර්ජනනීය බලශක්තිය දිරිමත් කිරීමට අප කර තිබුණු ඒ කටයුතු සම්පූර්ණයෙන්ම අඩාළ කර තිබෙනවා. ඒ කියන්නේ, පුනර්ජනනීය බලශක්තිය නිෂ්පාදනය අධෛර්යවත් කරලා තිබෙනවා. මා මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් විදුලිය නිෂ්පාදනය ධෛර්යවත් කළා. දැන් ඒ තුළින් මෙගාවොට් 3,200ක නිෂ්පාදනයක් තිබුණත් සෙනසුරාදා සහ ඉරිදා දිනවල තවම curtailment එකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපේ විදේශ සම්පත් ද ආරක්ෂා කරගෙන, පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය ද ධෛර්යවත් කරගෙන, දේශීය ව්‍යාපාරිකයන් මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගන්න පුළුවන් හැකියාව ඇති කරන්නේ කොයි ආකාරයෙන්ද? ලංකා විදුලිබල මණ්ඩලය සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් මීට වඩා ඕනෑකමින් කටයුතු නොකරන්නේ ඇයි? ගරු ඇමතිතුමනි, ඒ වාගේම, ඒකට tax holidays දෙන්න. සුද්දන් මේ රටට ඇවිල්ලා විදේශ ආයෝජන වශයෙන් මේවා කරනවාට වඩා හොඳයි දේශීය මට්ටමෙන් ආයෝජනය කරන්න අවස්ථාව දීලා රටේ ව්‍යාපාරික ප්‍රජාව සවි ශක්තිමත් කරන්න එය පාවිච්චි කරන එක. ඒ සංකල්පයට ඔබතුමා එකඟ ද? එහෙම නැත්නම්, එම ආයෝජන විදේශීයකරණය කිරීමේ ප්‍රතිපත්තියක ඔබතුමන්ලා සිටිනවා ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, renewable energy සම්බන්ධයෙන්, විශේෂයෙන් solar power සම්බන්ධයෙන් ඔබතුමා දැන් කරපු ප්‍රකාශය ද ඇතුළුව ඒ කියපු කාරණා සම්පූර්ණයෙන් නිවැරැදි නැහැ. මම උදාහරණයක් ගන්නම්. 2024දී rooftop solar නිෂ්පාදනය තිබුණේ මෙගාවොට් 867යි. 2025 වනකොට එය මෙගාවොට් 1,674 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, තිබුණු ප්‍රමාණයට වඩා දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව ඇවිල්ලා අවුරුද්දක් ඇතුළත තිබුණු නිෂ්පාදනයට වඩා දෙගුණයක් වැඩි කරලා තිබෙනවා. ඒ නිසා කවුරු හරි කියනවා නම්, solar powerවලට යන එක සම්බන්ධයෙන් විරෝධතාවක්- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා දත්ත මත කථා කරන්න. එහෙම නැතුව නිකම් ආවාට ගියාට කථා කරන්න ලැස්ති වෙන්න එපා. දත්ත මත කථා කරනකොට රිදෙනවා නම් මට කරන්න දෙයක් නැහැ. *[බාධා කිරීමක්]*

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් එතුමාගේ ගරුත්වය ආරක්ෂා කර ගනිමින් ප්‍රශ්න අහනවා. ඒ නිසා එතුමාට උත්තර දෙන්න මට ඉඩ දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළව ගත්තොත්, අපේ renewable energy සම්බන්ධයෙන් තිබෙන එක ප්‍රශ්නයක් තමයි, මේ පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යෑම. මෙහි චාලක ශක්තියෙන් ජනනය වන component එක අපට එක ප්‍රමාණයකට පවත්වාගෙන යන්න වෙනවා. එහෙම එක ප්‍රමාණයක පවත්වාගෙන යන්නේ නැතිව renewable energyවලට - විශේෂයෙන් solar energyවලට - විතරක් ගිහිල්ලා පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යන්න අපට බැහැ. අපි එක පැත්තකින් වෙනත් විකල්ප ක්‍රමයකින් චාලක ශක්තිය ලබා දීම සඳහා, විශේෂයෙන් hydropower තිබෙන තැන්වල විකල්ප ක්‍රමයකින් චාලක ශක්තිය ලබා දීම සඳහා, ඒ හරහා මේ පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා වන වැඩ පිළිවෙළක් මේ වනකොට සකස් කරමින් ඉන්නවා. දවල් කාලයේ මේ renewable energy අපට ගන්න පුළුවන්. හැබැයි, රාත්‍රි කාලයේදී peak hoursවල තමයි ප්‍රධාන ගැටලුවක් පවතින්නේ. ඒ නිසා තමයි අපි BESS කියන system එක හඳුන්වා දී තිබෙන්නේ. ලබන අවුරුද්ද අවසාන වනකොට මෙගාවොට් 560ක් අපි BESSවලින් පද්ධතියට එකතු කරනවා. මේ අවුරුදු දෙක තුළ මෙගාවොට් 1,200ක් දවසකට peak hoursවල පැය 4ක් පාවිච්චි කරන්න පුළුවන් විධියට Battery Energy Storage System එක හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම,- *[බාධා කිරීමක්]* ඒක අදාළ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම පිළිතුර දුන්නා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -194/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම: ක්‍රියාමාර්ග
## பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை நீக்குதல்: நடவடிக்கை
## REPEAL OF PREVENTION OF TERRORISM ACT: ACTION TAKEN

234/2024

3. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බව "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ පොරොන්දුවී තිබේද;
(ii) එසේ නම්, එය අහෝසි කරන්නේද;
(iii) එය අහෝසි කරනු ලබන කාලවකවානු කවරේද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?
(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை நீக்குவதாக "வளமான நாடு - அழகான வாழ்க்கை" கொள்கைப் பிரகடனத்தில் வாக்குறுதி அளிக்கப் பட்டுள்ளதா என்பதையும்;
(ii) ஆமெனின், மேற்படி சட்டம் நீக்கப்படுமா என்பதையும்;
(iii) அச்சட்டம் எக்காலப்பகுதியில் நீக்கப்படும் என்பதையும்;
அவர் இச்சபைக்கு அறிவிப்பாரா?
(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -
(i) whether it has been pledged in the policy document "A Thriving Nation - A Beautiful Life" that the Prevention of Terrorism Act will be repealed;
(ii) if so, whether the said Act will be repealed; and
(iii) the date on which it will be repealed?
(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.
(ii) ඔව්.
(iii) දැනට පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩල අනුමැතිය මත පත් කරන ලද කමිටුව විසින් අවසන් කර ඇත. එකී පනත් කෙටුම්පත සම්මත වූ වහාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කෙරෙනු ඇත.
(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම නිශ්චිත කාල වකවානුවක් පිළිබඳවයි අහලා තිබෙන්නේ. නව රජය බලයට පත්වෙලා වසර දෙකකට ආසන්න කාලයක් වෙනවා. නමුත්, තවමත් ඒ පනත අහෝසි කරලා නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා, අපේ රටේ ත්‍රස්තවාදය හා සම්බන්ධ ප්‍රධාන සංවිධාන ගණනාවක් තිබුණු බව. එල්ටීටීඊ සංවිධානය ප්‍රමුඛ බෙදුම්වාදී ත්‍රස්තවාදී කණ්ඩායම සිටියා. ඒ වාගේම, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ මාක්ස්වාදී ත්‍රස්තවාදී කණ්ඩායම සිටියා. ජනතා විමුක්ති පෙරමුණ හා සම්බන්ධ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද අපේ රටේ සාමාන්‍ය සමාජයට ඇවිල්ලා, පාර්ලිමේන්තුවට පත්වෙලා, මේ සභාවේ ඉදිරි පේළිවල තනතුරු දරනවා. ඒ වාගේම රටේ ජනාධිපති ධුරයට පත්වෙලා තිබෙනවා. ඒ අය ප්‍රජාතන්ත්‍රවාදී මාවතට පැමිණීම අපි අගය කරනවා.

ගරු කථානායකතුමනි, නමුත් අපි දැක්කා, අවුරුදු 15කට වැඩි කාලයක් නඩු නැතුව රක්ෂිත භාරයේ හිටපු එල්ටීටීඊ ත්‍රස්තවාදයට සම්බන්ධ තැනැත්තෙකුට ඇප නියම කිරීමේදී අධිකරණය සඳහන් කරලා තිබුණා, "නඩු නැතුව දීර්ඝ කාලයක් මෙම පනත යටතේ රඳවා තැබීම ඉතාම බරපතළ තත්ත්වයක්, මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්, ඒක නිසා පනතේ මොනවා තිබුණත් ඉතා සුවිශේෂ කරුණක් ලෙස සලකා ඒ තැනැත්තාට ඇප ලබා දෙනවා" කියලා. මේ පනත සම්මත කිරීමට තව කල් ගතවන නිසා දැනට නඩු නැතුව, චෝදනා නැතුව අත්අඩංගුවේ සිටින ත්‍රස්තවාදී සැකකරුවන් සියලුදෙනාම ඇප පිට නිදහස් කිරීමට හෝ නිදහස් කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නවාද කියන එක මම දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මූලික ප්‍රශ්නයෙන් පරිබාහිර කාරණයක් වුවද මම ඒ ප්‍රශ්නයට උත්තර සපයන්නම්. ඒකට මූලික හේතුව මෙයයි. ඔවුන්ට ඇප ලබා ගන්න බාධාවක් නැහැ. එය මහාධිකරණය හරහා කරන්නේ. ඒ ඇප ඉල්ලීම ඒ ආකාරයට කරන්න පුළුවන්. මන්ත්‍රීතුමා සඳහන් කරපු විධියට ඊයේ පෙරේදා කරපු ඇප ඉල්ලීමක් අනුව ඔවුන්ට ඇප ලැබිලා තිබෙනවා. ඒකට රජය ප්‍රතිපත්තිමය තීන්දු ගන්නේ නැහැ. මොකද, අධිකරණය ස්වාධීනව කටයුතු කරන්නේ. කෙසේ වෙතත්, මේ පනත අහෝසි කිරීම නම්, වේගවත්ව සිදුවන බව කියන්නට ඕනෑ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ත්‍රස්තවාදය ඇතිවන්න මූලික වෙච්ච එක හේතුවක් තමයි බලය විමධ්‍යගත කිරීම පිළිබඳව ගැටලුව. කොළඹ කේන්ද්‍රගත වෙච්ච පාලනය තුළ විශේෂයෙන්ම උතුරු,

නැගෙනහිර පළාත්වලට ඒ ප්‍රදේශවල පාලන අයිතිය අහිමි වීම සහ ඒ හා බැඳුණු පොදුවේ රට පුරාම බලය විමධ්‍යගත කිරීම පිළිබඳ ප්‍රශ්නය තමයි හේතුව. කාර්යක්ෂම පාලනයක් සඳහා, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ කාරණයේදී ඉතා වැදගත් වෙනවා. නැවත ත්‍රස්තවාදය ඇතිවීම වළක්වන්නත් එය ඉතා වැදගත් වෙනවා. තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අයින් කරනවා කියන ස්ථාවරය වැදගත් වාගේම, නැවත ත්‍රස්තවාදය ඇතිවීම වැළැක්වීමත් වැදගත් වෙනවා, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, එවැනි තත්ත්වයක් තුළ ඔබතුමාට තමයි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ බලය පැවරිලා තිබෙන්නේ. 2024 නොවැම්බර් මාසයේ 25වැනි දා නිකුත් කළ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මඟින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම පිළිබඳව අධිකරණ අමාත්‍යවරයා වන ඔබතුමාට තමයි බලය පවරලා තිබෙන්නේ. ඒ ගැසට් නිවේදනයෙන් ඔබතුමාට බලය පවරපු අයිතමවල අයිතම අංක 18 වශයෙන් සඳහන් වෙනවා, "නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම" ඔබතුමාගේ වගකීමක් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදය නැවත ඇතිවීම වැළැක්වීම උදෙසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එන රාජකාරිය ඇමතිතුමාට පැවරිලා තිබුණත්, දැනට එහි තිබෙන ප්‍රගතිය මොකක්ද, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අරගෙන එන්නේ කවදාද, අරගෙන එන්නේ නැද්ද, ඒක මේ තරම් ප්‍රමාද ඇයි කියලා ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීමේදී Standing Orders සහ රීති තිබෙනවා. ඒක අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා නොදන්නවා නොවෙයි. නමුත් එතුමාගේ Facebook page එකට අවශ්‍ය voice-cut එකට තමයි හැම දාම උදේට මේවා අහන්නේ. ඒ නිසා මම කියනවා, ස්ථාවර නියෝග 33(1) යටතේ මම ඒකට උත්තර දෙන්න බැඳිලා නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා voice-cut එක දාගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -325/2024- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සති දෙකක් කල් ගන්නා ලෙස දැනුම් දී තිබෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රෝහණ විජේවීර මහතාගේ පවුල: නඩත්තු වියදම්
திரு. ரோஹன விஜேவீரவின் குடும்பம்: பராமரிப்புச் செலவினம்
FAMILY OF MR. ROHANA WIJEWEERA: MAINTENANCE EXPENSES

553/2025

**5. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක නායක රෝහණ විජේවීර මහතාගේ බිරිඳගේ සහ දරුවන්ගේ නම් කවරේද;

(ii) රෝහණ විජේවීර මහතාගේ ඝාතනයෙන් පසු මේ දක්වා ඔවුන් ජීවත්වූ එක් එක් ස්ථානය සහ එම එක් එක් ස්ථානයේ ජීවත් වූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ගේ නඩත්තු වියදම් ශ්‍රී ලංකාවේ රජය විසින් දරා තිබේ නම්, ඒ සඳහා දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ නඩත්තු කටයුතු වෙනත් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් දරා තිබේ නම්, නඩත්තු කරන ලද කාල සීමාව සහ ඒ සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා විදේශ රටවලින් ආධාර ලැබී තිබේද;

(vi) එසේ නම්, ආධාර ලබා දුන් රට, පුද්ගලයන් සහ ආධාර ලබා දුන් කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் விடுதலை முன்னணியின் ஸ்தாபகத் தலைவர் திரு. ரோஹன விஜேவீரவின் மனைவி மற்றும் பிள்ளைகளின் பெயர்கள் யாவை;

(ii) திரு. ரோஹன விஜேவீரவின் படுகொலையின் பின்னர் இற்றைவரை அவர்கள் வாழ்ந்துவந்த ஒவ்வோர் இடம் மற்றும் மேற்படி ஒவ்வோர் இடத்திலும் வாழ்ந்த காலப்பகுதி வெவ்வேறாக யாது;

(iii) அவர்களின் பராமரிப்புச் செலவினம் இலங்கை அரசால் மேற்கொள்ளப்பட்டு இருப்பின், அதற்காக செலவிடப்பட்ட செலவினம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு;

(iv) அவர்களின் பராமரிப்பு நடவடிக்கைகளை வேறு எவரேனும் ஆள் அல்லது குழுவொன்று ஏற்றுக் கொண்டிருப்பின், அவ்வாறு பராமரித்த காலப் பகுதி மற்றும் அதற்காக மேற்கொள்ளப் பட்ட செலவினம் வெவ்வேறாக யாது;

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

(v) அவர்களின் பராமரிப்பு நடவடிக்கைகளுக்கு வெளிநாடுகளிலிருந்து நிதி உதவி கிடைத்துள்ளதா;

(vi) ஆமெனில், நிதி உதவி வழங்கிய நாடு, ஆட்கள் மற்றும் நிதி உதவி வழங்கப்பட்ட காலப்பகுதி வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the names of the wife and children of Mr. Rohana Wijeweera, the founding leader of the Janatha Vimukthi Peramuna;

(ii) the places where they have lived since the assassination of Mr. Rohana Wijeweera and the duration of residence in each of the said places;

(iii) if their maintenance expenses have been borne by the Government of Sri Lanka, the amount of the expenditure incurred on their maintenance, separately for each year;

(iv) if their maintenance has been borne by any other individual or a group of people, the amount of the expenditure incurred on their maintenance along with the duration of maintenance period, separately;

(v) whether any assistance has been received from foreign countries for their maintenance; and

(vi) if so, the countries, persons and the period for which such assistance has been provided, separately?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දූ දරුවන්ගේ විස්තර මෙසේයි.

බිරිඳ, දියණියන් හතරදෙනා, වැඩිමහල් පුතා සහ බාල පුතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, නම් තමයි ඉල්ලලා තිබෙන්නේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් තේරුම් ගන්න ඕනෑ නේ නම් කියන එක සුදුසු නැහැ කියලා. *[බාධා කිරීමක්]* ඒක නේ මම කිව්වේ දියණියන් හතර දෙනායි, පුතාලා දෙන්නයි කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නම් ඉල්ලන්නේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

සදාචාරයක් තිබෙනවා නේ. ඔබතුමාත් ඒක තේරුම් ගන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මොකක්ද, සදාචාරය?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

(ii)
- 1992 ජූනි මස 11වන දින සිට 1999 අගෝස්තු මස 22වන දින දක්වා ත්‍රිකුණාමලය නාවික තටාකාංගණය තුළ.
- 1999 අගෝස්තු මස 23වන දින සිට මේ දක්වා වැලිසර නාවික සංකීර්ණයේ පිහිටි ශ්‍රී ලංකා නාවික නෞකා ගැමුණු ආයතනය තුළ.

(iii) 992 සිට 2026 වනතුරු වියදම් කර ඇති රාජ්‍ය මුදල් පිළිබඳ සවිස්තරාත්මක දත්ත සහිත වගුවක් පහත දැක්වේ.

| වර්ෂය | දරන ලද වියදම (රුපියල්) |
|---|---|
| 1992 | 13,114.58 |
| 1993 | 26,309.63 |
| 1994 | 26,954.63 |
| 1995 | 26,849.63 |
| 1996 | 26,811.15 |
| 1997 | 29,451.83 |
| 1998 | 32,981.63 |
| 1999 | 145,559.87 |
| 2000 | 276,589.05 |
| 2001 | 311,585.63 |
| 2002 | 352,639.05 |
| 2003 | 391,829.23 |
| 2004 | 401,184.20 |
| 2005 | 417,089.73 |
| 2006 | 490,723.06 |
| 2007 | 587,779.26 |
| 2008 | 729,008.32 |
| 2009 | 819,761.43 |
| 2010 | 754,867.73 |
| 2011 | 828,328.78 |
| 2012 | 953,294.23 |
| 2013 | 992,656.56 |
| 2014 | 1,000,618.00 |
| 2015 | 903,302.75 |
| 2016 | 964,158.38 |
| 2017 | 1,020,595.65 |
| 2018 | 1,080,211.85 |
| 2019 | 1,266,665.30 |

| වර්ෂය | දරන ලද වියදම (රුපියල්) |
|---|---|
| 2020 | 1,287,410.48 |
| 2021 | 1,695,248.75 |
| 2022 | 1,469,748.40 |
| 2023 | 1,950,339.79 |
| 2024 | 1,908,548.05 |
| 2025 | 2,823,590.50 |
| 2026 | 272,245.35 |

(iv) ඔවුන්ගේ නඩත්තු කටයුතු වෙනත් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් දරා නොමැති බව දන්වා සිටිමි.

(v) නාවික හමුදා මූලස්ථානයේ විදේශ සබඳතා කාර්යාලයේ පවතින තොරතුරු අනුව විදේශ රටවලින් ආධාර ලබා දී නොමැත.

(vi) පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයේ (අ) (i) කොටසින් අසා තිබෙන්නේ "ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක නායක රෝහණ විජේවීර මහතාගේ බිරිඳගේ සහ දරුවන්ගේ නම් කවරේද?" කියලායි. නම් ටික දෙන්න පුළුවන්කමක් තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* කරුණාකරලා ඔබතුමිය පාඩුවේ ඉන්න. මම එතුමාගෙන් ප්‍රශ්නය ඇහුවේ. *[බාධා කිරීම්]* නයි අරින්නේ නැතිව පාඩුවේ ඉන්න. නයා ඇරගන්න ඕනෑද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට උත්තරය දෙන්න කියන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, මම හිතුවේ ඔබතුමා පරිණත දේශපාලනඥයෙක් කියලායි. මේක තේරුම් ගන්න. බලනකොට මටයි වැරදිලා තිබෙන්නේ. ඔබතුමා තේරුම් ගන්න, මේ විධියේ ප්‍රශ්නයක් අහනකොට උත්තරය දෙන්න පුළුවන් විධියක් තිබෙනවා. සමාජයේ උත්තර ලබා ගත යුතු ආකාරයක් තිබෙනවා. ඔබතුමා ඒ අයගේ නම්, ගම් ඇහුවාම ඒ දියණියන්ට, පුතාලාට ඇති වන තත්ත්වය හිතාගන්නකෝ. සදාචාරයක් තිබෙනවා නේ. ඔබතුමා ප්‍රශ්නයක් අහනකොටත් සදාචාරයක් තිබෙන්න ඕනෑ නේ. අනෙක් ඔක්කොම විස්තර කිව්වා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළමුවැනි අතුරු ප්‍රශ්නය ඉවරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ. මගේ ප්‍රශ්නයට උත්තරය මම ඇහුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි, පළමුවැනි අතුරු ප්‍රශ්නයයි මම අහන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඒ ඇහුවේ. න්‍යාය පත්‍රයේ 5 වැනි ප්‍රශ්නයේ (අ) (i) කොටසට පිළිතුර කියන්න කියලායි මම කියන්නේ. මේ, අතුරු ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැනගන්න. උත්තරයෙන් පැන නඟින ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා තමයි අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා න්‍යාය පත්‍රය බලන්න. න්‍යාය පත්‍රයේ අහලා තිබෙන ප්‍රශ්නයේ (අ) (i) කොටසට උත්තරය මම ඉල්ලුවේ. ඒක අතුරු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ නැත්නම් මම ඊළඟ ප්‍රශ්නයට යනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, කරුණාකරලා මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, උත්තරයෙන් පැන නඟින ප්‍රශ්න මම ඇහුවේ නැහැ; මම කිසිම දෙයක් ඇහුවේ නැහැ. මම කිව්වේ මගේ මූලික ප්‍රශ්නයට උත්තර දෙන්න කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේක නාඩගමක් කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 92 (උ) යටතේ,- *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි රීති 32 යටතේ පැහැදිලි කරන්න අවස්ථාව ඉල්ලන්නේ. අද දින න්‍යාය පත්‍රයට මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ තමුන්නාන්සේගේ ගරු අවසරය ඇතිවයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඔය point එක නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Point එක, ස්ථාවර නියෝග 92. ඔබතුමාගේ අවසරය ඇතිවයි ප්‍රශ්නය දාලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඉල්ලුවේ වෙන එකක් නොවෙයි. පස්වෙනි ප්‍රශ්නයේ (අ)(i) කොටසට උත්තර ලබා දෙන්න කියලායි මම ඉල්ලුවේ. ඒක අතුරු ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට එතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය අහන්න කියන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒ ප්‍රශ්නය අනුව පිළිතුර ලබා දෙයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නය එතුමාගෙන් අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා වෙන එකක් කියනවා නේ. සභානායකතුමා යන්තම් වෙලාවට ආවේ. ඔය විධියට කටයුතු කරන්න එපා, ගරු කථානායකතුමනි. ගරු සභානායකතුමාට මම ස්තුතිවන්ත වනවා, අඩුම තරමේ අතුරු ප්‍රශ්න දෙක අහන්න ඉඩ දුන්නාට. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් අපට එහෙම බලාපොරොත්තු වන්න බැහැ. මොකක්ද, මේ කරන්නේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමාට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නය අහන්න කියන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, එතුමාට ඕනෑ උත්තරය දෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විජේවීර මැතිනිය සහ ඒ ආදරණීය දරුවන් අවුරුදු 37ක් රක්ෂා කරලා තිබෙන්නේ - අල්පෙනෙත්තේ ඉඳලා, බත් ඇටයේ ඉඳලා, වතුර උගුරේ ඉඳලා, ආරක්ෂක නිවාස, බෙහෙත්, ප්‍රවාහන පහසුකම්, පොත පතේ සිට සියල්ලම දීලා - මේ රජයෙන්. ඒ වාගේම මාස 444ක් තිස්සේ රජයක් විසින් එතුමිය සහ එතුමියගේ දරුවන්ව රැක බලාගෙන තිබෙනවා. විශේෂයෙන්ම එතුමිය 2015දී තම ආදරණීය සැමියාගේ පොත් හතක් මුද්‍රණය කිරීමට විරුද්ධව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා තිබෙනවා, ඒ ක්‍රියාවලිය නතර කරන්න කියලා. දැන් බලයේ සිටින්නේ ජාතික ජන බලවේගයේ - ජනතා විමුක්ති පෙරමුණේ - බහුතරයක් සිටින ආණ්ඩුව. පළමුවැනි කාරණය තමයි, එතුමියට දැන් ආරක්ෂාවක් වුවමනා නැහැ. මොකද, මොනයම් හෝ ප්‍රශ්නයක් ඇති වුණා නම්, ඒ ආරක්ෂාව තිබෙන්න ඕනෑ. දෙවැනි කාරණය මේකයි. ඇත්තවශයෙන්ම දැන් එතුමියව මේ පක්ෂය විසින් හෝ රැක බලා ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේ නැද්ද? ආණ්ඩුව පැත්තකින් තියන්නකෝ. මේ මිය ගිය නායකයාගේ ආදරණීය බිරිඳ සහ දරුවන් රැක බලා ගන්න වැඩ පිළිවෙළක් හදන්නේ නැද්ද? ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ පක්ෂයෙන් හදලා දෙනවාද කියලා මම අහන්න කැමැතියි, පළමුවන අතුරු ප්‍රශ්නය විධියට.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ඒක අපේ ව්‍යාපාරයේ, පක්ෂයේ වැඩක්. ගරු මන්ත්‍රීතුමා කලබල වෙන්න එපා. අපි ඒක බලාගන්නම්. ඒක අපේ ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ නැති ප්‍රශ්නයක්.

බොහොම ස්තුතියි, එච්චරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. හැබැයි, ඒ උත්තරය නිකම් උඩින් ඇවිල්ලා වාගේයි. මම හිතන්නේ අවුරුදු 25ක් විතර - *[බාධා කිරීම්]* ඔව්, දිව්‍ය ලෝකයෙන් ඇවිල්ලා නම් ඕක කරන්න තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. *[බාධා කිරීම්]* ඉන්න, පොඩ්ඩක් ඉන්න. මට මේ ප්‍රශ්නය අහන්න දෙන්නකෝ. කලබල කරන්නේ ඇයි? *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගේ නායකයා ගැන ප්‍රශ්නයක් අහන්නේ. ඔබතුමන්ලා අහන්නේ නැත්නම් අපිවත් අහන්න එපායැ. *[බාධා කිරීම්]* දැන් ඔබතුමන්ලාට විජේවීර සහෝදරයාව මතක නැහැ. *[බාධා කිරීම්]* ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. බලන්නකෝ, ගරු කථානායකතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා headphone එක දමාගෙන ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම බැහැ. මටත් නිදහසක් තිබෙන්න එපායැ, ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
අපට හිනායන්නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රශ්න අහනකොට.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි ඝාතකයෝ වෙලා නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි තුවක්කු අරගෙන, ගල්කටස් අරගෙන වෙඩි තිබ්බේ. *[බාධා කිරීම්]* අපි ඕවාට සම්බන්ධ මිනිස්සු නොවෙයි. මතක තියාගන්න. *[බාධා කිරීම්]* මහින්ද ජයසිංහ මහත්තයා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔයගොල්ලන් දැන් කියන්නේ, කොහොම හරි බලය තියා ගන්නවා කියලා නේ අවුරුදු 25කට. *[බාධා කිරීම්]* ඒ, ඝාතනය කරලා තමයි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විජේවීර සහෝදරයා මරා දැමීම සම්බන්ධව ප්‍රශ්න ගණනාවක් මතු වුණා. මමත් ඒ ගැන පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම කථා කර තිබෙනවා. මම දැක්කා, තමුන්නාන්සේලා බටලන්ද ගැන පරීක්ෂණ කරනවා කියලා තිබුණා. දැන් එහි වැඩ කටයුතු කරගෙන යනවා කිව්වා. මම අහන්න කැමැතියි, විජේවීර මැතිතුමාගේ ඝාතනය පිළිබඳව. මොකද, ඒකට සම්බන්ධ වුණු අයත් ඇවිල්ලා ඔබතුමන්ලා එක්ක පොල්තෙල් පහන් දල්වනවා අපි දැක්කා. ඒ නිසා කරුණාකරලා කියන්න, විජේවීර සහෝදරයාගේ ඝාතනය පිළිබඳව සොයා බැලීමක් කර, එය සිදු කරපු අයට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්නවාද, ඒ සම්බන්ධයෙන් කිසියම් පරීක්ෂණයක් කරනවාද කියලා?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, එය ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නැහැ. එම කාරණය සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය කටයුතු සම්පාදනය කර තිබෙනවා නම්, ඒ විස්තර ලබා දෙයි කියා මම පැහැදිලි කරනවා. එච්චරයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාට ඒක දැනගන්න ඕනෑ නම්, එතුමාගේ පක්ෂ රැස්වීමේදී නායකයාගෙන් ඇහුවා නම් හරි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද, ඒ කථාව? *[බාධා කිරීම්]* අපි ආණ්ඩුවෙන් අහන්නේ. *[බාධා කිරීම්]* අපි ආණ්ඩුවෙන් අහන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -830/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කිරි ගොවීන්, ගවයින් සහ තණ බිම්: විස්තර
பாற்பண்ணையாளர்கள், கால்நடைகள் மற்றும் புற்றரைகள்: விபரம்
DAIRY FARMERS, CATTLE AND GRAZING LANDS: DETAILS

1633/2025

**7. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ලියාපදිංචි වී ගව පාලනයේ නියැළෙන කිරි ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවීන් සතුව සිටින ගවයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(iii) එම ගවයන්ගේ ආහාරය සඳහා තණ කැපීමට ගොවීන්ට ලබා දී ඇති තණ බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது பதிவு செய்யப்பட்டு, கால்நடை வளர்ப்பில் ஈடுபட்டுள்ள பாற்பண்ணையாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பண்ணையாளர்களிடம் உள்ள கால்நடைகளின் எண்ணிக்கை அண்ணளவாக யாது என்பதையும்;

(iii) மேற்படி கால்நடைகளின் தீவனத்துக்காகப் புற்களை அறுப்பதற்குப் பண்ணையாளர்களுக்கு வழங்கப்பட்டுள்ள புற்றரைகளின் அளவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) number of dairy farmers currently registered and engaged in cattle farming in Sri Lanka;

(ii) approximate number of cattle owned by the said farmers; and

(iii) extent of grazing land provided to farmers for cattle grazing?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දැනට ලියාපදිංචි කිරි ගොවීන් සංඛ්‍යාව 259,370කි. ඒ සම්බන්ධ විස්තර දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් තිබෙනවා.

(ii) ලියාපදිංචි කිරි ගොවීන් සතු ගවයන් සංඛ්‍යාව 1,974,323කි. අවශ්‍ය නම් එම තොරතුරු වෙන වෙනමත් තිබෙනවා.

(iii) එම ගවයන්ගේ ආහාරවලට අවශ්‍ය තෘණ කැපීම සඳහා ගොවීන් විසින් තම පෞද්ගලික ඉඩම්වල වගා කර ඇති තණ බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 9,000කි.

එහෙත් තණ කැපීම සඳහා ගොවීන්ට රජයේ ඉඩම් ලබා දී නොමැත. නමුත් ගොවීන් බොහෝ දෙනෙකු තමන් සතු ගවයන්ට ආහාර ලබා ගැනීම සඳහා පොදු තණ බිම් පාවිච්චි කරනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මා **සභාගත*** කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය අහන්න මූලික වුණු කාරණාව මෙන්න මේකයි. මාදුරුඔය, ලාහුගල සහ ඇතිමලේ රක්ෂිතවලට ගවයන් විශාල ප්‍රමාණයක් ඇතුළු වෙලා ඒ රක්ෂිතවල තිබෙන තණ බිම්වලින් තමයි ආහාර ගත්තේ. ගරු කථානායකතුමනි, අපේ රටේ කිරිපිටි අවශ්‍යතාවෙන් සියයට 70ක් පමණ ආනයනය කරනවා. සියයට 30ක් විතර කිරිපිටි අපි නිෂ්පාදනය කරනවා. ගරු කථානායකතුමනි, අපේ රටට වුවමනා කිරිපිටි අවශ්‍යතාව සපුරන්න අවුරුද්දකට කිරිපිටි ගෙන්වීම සඳහා හම්බන්තොට වරායට ගිය වියදම වාගේ මුදලක් වියදම් වනවා. හැබැයි, මේ වනකොට මාදුරුඔය ඇතුළු රක්ෂිතවල සිටින ගවයන් සම්බන්ධයෙන් ඒ සතුන්ගේ හිමිකරුවන්ට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නඩු පවරා තිබෙනවා. මේ කිරි ගවයන්ගෙන් සියයට 90ක් විතර මේ වන විටත් මසට විකුණා තිබෙනවා. ඒ වාගේම මාදුරුඔය, මහඔය ඇතුළු රක්ෂිතවල හිටපු කිරි ගවයනුත් මේ වන විට මසට විකුණන්න පටන්ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නුවරඑළිය, අඹේවෙල, පට්ටිපොල, බොරලන්ද වාගේ ප්‍රදේශවල තමයි එක්වැම් ක්‍රමය වාගේ ගාල් කරලා ගවයින් හදන්න පුළුවන් වෙන්නේ. හැබැයි, රක්ෂිතවල හදන ගවයින් එක්වැම් ක්‍රමයට තියලා හදන්න බැහැ. මොකද, මේ දවස්වල ඒ ගවයින්ට කෑමට වල් නැහැ. වනඅලින්ට කන්න තිබෙන තෘණ භූමි ගවයින් කනවා කියලා තමයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්නයක් ඇති කරලා මේ ගවයන්ගේ හිමිකරුවන්ට නඩු දාලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම හිතන විදියට මාදුරුඔය රක්ෂිතයේ හිටපු ගවයන්ගෙන් මේ වන විට සියයට 10ක්වත් තව ඉතිරි වෙලා නැහැ. මොකද, දැන් ඒ ගවයන් ඔක්කෝම මසට විකුණනවා. එහෙම වුණොත් අපේ මේ කිරි නිෂ්පාදනය සියයට 30ක් නොවෙයි, සියයට 15ක් දක්වා පහළ බහීවි. එම නිසා දැන් මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. වක්‍රානුකූලව බැලුවොත්, මේක එක ප්‍රශ්නයකින් අහන්න පුළුවන් දෙයක් නොවෙයි, ගරු කථානායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒක දන්නවා. මේ සම්බන්ධයෙන් නඩු දාලා, නඩු දාලා දැන් ගවයන් ගොඩක් ඒ ප්‍රදේශවල නැහැ. තව ටිකයි ඉතිරි වෙලා තිබෙන්නේ. මේ විධියට අපේ රටේ ගවයන් හදන්න බැහැ. මොකද, ශුෂ්ක කලාපවල ගවයන් හදනවා නම් තෘණ බිම්වලින් කන්නම තමයි හදන්න වෙන්නේ. මේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට මම උත්තරයක් බලාපොරොත්තු වනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔව්. අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 30ක්, 35ක් අතර ප්‍රමාණයක් තමයි අපි නිෂ්පාදනය කරන්නේ. දෛනිකව ගත්තොත්, කිරි ලීටර් ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් තමයි අපි නිෂ්පාදනය කරන්නේ. අපේ ඉලක්කයක් තිබෙනවා, 2030 වකවානුව වනකොට මේ ප්‍රමාණය තුන් ගුණයක් දක්වා ඉදිරියට අරගෙන යන්න.

ඒකට අදාළව අපේ තිබෙන සැලැස්ම තමයි කිරි ගවයන්ගෙන් ගන්න පුළුවන් කිරි ප්‍රමාණය වැඩි කර ගැනීම. ඊට අදාළ තාක්ෂණික ක්‍රමවේද භාවිත කරලා කිරි අස්වැන්න වැඩි කර ගැනීමට අපි මූලිකත්වය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම dairy hubs හදමින් ඊට අදාළ වැඩ පිළිවෙළකුත් අපි සකස් කරලා තිබෙනවා. නිකවැරටිය ගොවිපළ පදනම් කරගෙන සිදු කරන විශාල වැඩ කටයුත්තකටත් අපි අතගහලා තිබෙනවා. මේ වනකොට ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කිරි ගව ගාල්වලට අවශ්‍ය මැදිහත් වීම කරමින් කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට අදාළ ජාතික වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා. ඒ ඔස්සේ තමයි අපි කටයුතු කරන්නේ.

ඔබතුමා කියන කාරණය ගත්තොත්, විශේෂයෙන් මොනරාගල, හම්බන්තොට, නැඟෙනහිර පළාතේ අම්පාර සහ ත්‍රිකුණාමලයේ තමයි ගොඩක්ම මේ ප්‍රශ්නය තිබෙන්නේ. මසට හදන ගවයන් තමයි වැඩිපුරම ඉන්නේ. කිරි ගන්න ගවයනුත් ඉන්නවා. විශේෂයෙන්ම පරිසර ප්‍රශ්නත් එක්ක තමයි මේ කාරණා ගැට ගැහිලා තිබෙන්නේ. ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි තමයි ගොඩක් තිබෙන්නේ. ඒ භූමි පරිහරණය කරනකොට නෛතික බාධා සහ පාරිසරික ප්‍රශ්න මතු වන නිසා ඒ පිළිබඳව සාකච්ඡා කරලා යම්කිසි අවබෝධයක් ඇතුව තමයි අපි මේ කටයුත්ත කළමනාකරණය කර ගන්න ඕනෑ. පරිසරයත් ආරක්ෂා වන විධියට, කැලයත් ආරක්ෂා වන විධියට, කැලේ ඉන්න සතුනුත් ආරක්ෂා වන විධියට, කිරි ගොවියාගේ අවශ්‍යතාවනුත් ඉෂ්ට වන විධියේ උත්තරයකට ඇත්තටම අපි එන්න ඕනෑකම තිබෙනවා. ඒක අමාත්‍යාංශ කිහිපයක් එකතු වෙලා සාකච්ඡා කරලා විසඳා ගන්න ඕනෑ ප්‍රශ්නයක්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පසුගිය කාලයේ පොළොන්නරුව ඇතුළු ලංකාව වටේටම ගියා නේ. දැන් මිනිස්සු ඔබතුමාගේ පින්තූරය දාපු බෝඩ් පුච්චන එක වෙනම කථාවක්. නමුත් ඔබතුමා ඒ කාලයේ රටේ හැම තැනකටම ගියා නේ. මම මහ ඇමති විධියට කටයුතු කරපු කාලයේ එක දවසක් ඔබතුමා බදුල්ලටත් ඇවිල්ලා මාවත් හමු වුණා. අපි ඒ කාලයේත් ඔබතුමාව බොහොම සුහදව පිළිගෙන සැලකුවා. ඔබතුමාට ඒ ගැන මතක ඇති. ඔබතුමා සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා එක්ක ආවේ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා තමයි ඔබතුමාව එව්වේ. අපි ඔබතුමාව ඒ කාලයේ බොහොම සුහදව පිළිගත්තා, වෘත්තීය සමිති නායකයෙක් හැටියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ, ගරු කථානායකතුමනි. නාමල් කරුණාරත්න මැතිතුමනි, ඔබතුමා දැන් කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය ඇමති. මේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව. හැබැයි, 2005දී කෘෂිකර්ම ඇමති හැටියට කටයුතු කළේ දැන් ඔබතුමන්ලාගේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා. 2005දී කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා එතුමා ලංකාව වටේ රැස්වීම් පැවැත්වූවා. මම ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට කටයුතු කළ කාලයේ අපිත් ඒ රැස්වීම්වලට ගිහිල්ලා තිබෙනවා. එතකොට අනුර කුමාර දිසානායක මහත්මයා අපේ ඇමති නේ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා එතකොට නියෝජ්‍ය ඇමති. මම කියන්නේ මේකයි. ඒ කාලයේදිත් කිරි නිෂ්පාදනය ගොඩ දමා ගැනීමේ ප්‍රශ්නයක් තිබුණා. හැබැයි, මේ ප්‍රශ්නයට ඔබතුමා පොඩ්ඩක් මැදිහත් වෙන්න.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මාදුරුඔය කියන්නේ විශාල තණ බිම් තිබෙන ප්‍රදේශයක්. එහි තණ බිම්වලට එන ගවයන් ටික විකුණලා ගවයන් ටික නැති වුණොත් මොකද වෙන්නේ? ඔබතුමාත් පොළොන්නරුවේ නේ, ගරු කථානායකතුමනි. මී ගවයන් මසට දෙනවා කියන්නේ හරි අපරාධයක්. නෙස්ලේ ලංකා සමාගමට මී කිරි විශාල වශයෙන් ගන්නේ ඒ කලාපයෙන්. ඉතින්, රටේ කිරි නිෂ්පාදනයෙන් සියයට 30ක්වත් නැති වුණොත් මොකද වෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? ඉන්දියාවෙන් ගෙනැල්ලා දැන් අපේ වීවලට වෙලා තිබෙන දේ පෙනෙනවා නේ. හරි නම් මේ අහිංසක ඇමතිලා දෙදෙනාගේ පින්තූර දාපු බෝඩ් නොවෙයි පුච්චන්න ඕනෑ. වෙළෙඳ ඇමතිගේ පින්තූරය දාපු බෝඩ් තමයි පුච්චන්න ඕනෑ. නමුත් මිනිස්සු එහෙම බෝඩ් පුච්චන්නේ නැහැ. බෝඩ් හදලා පුච්චන්න ඕනෑ කෙනා මෙතැන ඉන්නවා. නමුත් අහිංසකයන් දෙදෙනෙකුගේ රූපය දාපු බෝඩ් තමයි පුච්චන්නේ. ඒක වෙනම කථාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමාට පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න ලබා දී තිබූ කාලය අවසන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැනට විනාඩි දෙකක් අරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. දැන් අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මම අනවශ්‍ය ප්‍රශ්නයක් අහන්නේ නැහැ. මේ ආණ්ඩුව කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා පියවර ගත යුතුයි. කිරි නිෂ්පාදනය සියයට 30ට, 35ටවත් ගෙනෙන්න මේ ආණ්ඩුවට පුළුවන් වෙන්න එපායැ. ඒකයි මම මේ අතුරු ප්‍රශ්නය ඇහුවේ. මේ ප්‍රශ්නය අහපු වෙලාවේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නය අසා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට කාලය නාස්ති කරන්න එපා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, ගොවි බිම්වලට මම දැනුත් යනවා. ඔබතුමාගේ දිස්ත්‍රික්කයටත් පසුගිය දවසක මම ගියා. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් එක්කමයි මම ගියේ. එහිදී ගොවීන් හමු වුණා. *[බාධා කිරීමක්]* හැබැයි, ඔය කියන විධියේ ගැටලුවක් පොදුවේ ගොවි ජනතාව අතරේ නැහැ. ඇත්තටම ඒ ගොවි ජනතාව තුළ කලින්ටත් වඩා පිළිගැනීමක් අප කෙරෙහි තිබෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. පසුගිය දවස්වල ඔය ගොවි බිම් සිසාරා අපි ගියා.

විශේෂයෙන්ම කිරි ක්ෂේත්‍රය ගත්තොත්, කිරි නිෂ්පාදනයට අදාළව විධිමත් වැඩ පිළිවෙළක් අපි මේ වනකොට සකස් කර තිබෙනවා. ඒ සඳහා අය වැයෙන් සල්ලි වෙන් කර තිබෙනවා. කිරි නිෂ්පාදනය වැඩි කිරීමට අදාළව මහවැලි අධිකාරිය හරහා වෙනම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න අපි පටන් ගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]*

ඒ වාගේම බඩල්ගම කිරි කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමට මුදල් වෙන් කරලා මේ වනකොට ඒ කටයුතු කරගෙන යනවා. තවත් අවුරුද්දකින් විතර බඩල්ගම කිරි කර්මාන්තශාලාව විවෘත කරන්න අපට පුළුවන් වෙයි. ඒ අනුව බඩල්ගම කිරි factory එකේ විතරක් වැඩ කරන්න දවසකට කිරි ලීටර් ලක්ෂ 2ක් අවශ්‍ය වෙනවා. ඒ සියලු දේවල් සැලසුම් කරගෙන, කිරි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හරහා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් අපි මේ වනකොට ක්‍රියාත්මක කරගෙන යනවා. ඇත්තටම ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ තමයි මේවා කඩා වට්ටවලා, විහිදුවලා තිබුණේ. *[බාධා කිරීමක්]* ඒ තත්ත්වය යථාවත් කරලා මේ වනකොට කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට අදාළ විද්‍යාත්මක වැඩ පිළිවෙළක් එක්ක අපි ඉස්සරහට යන බව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

## 2020-2025 දක්වා පොල් නිෂ්පාදනය: විස්තර
2020-2025 வரையான தேங்காய் உற்பத்தி: விபரம்
COCONUT PRODUCTION FROM 2020-2025: DETAILS

1962/2026

**8. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 සිට 2025 දක්වා වාර්ෂික පොල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සීමාසහිත හලාවත වැවිලි සමාගමේ පොල් නිෂ්පාදනය ඉහත කාල සීමාව තුළ සාපේක්ෂව වර්ධනය වී තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) මෙරට ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන පොල් ආශ්‍රිත කර්මාන්ත නඟාසිටුවීම සඳහා අමාත්‍යාංශය සතු වැඩ පිළිවෙළ කවරේද;

(v) පොල් වගාවට කෘමීන්ගෙන් සිදු වන හානිය වැළැක්වීම සඳහා නව වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020 முதல் 2025ஆம் ஆண்டு வரை வருடாந்த தேங்காய் உற்பத்தி ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) வரையறுக்கப்பட்ட சிலாபம் பெருந்தோட்டக் கம்பனியின் தேங்காய் உற்பத்தி மேற்படி காலப்பகுதியினுள் ஒப்பீட்டளவில் அதிகரித்துள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(iv) இந்நாட்டுப் பொருளாதாரத்துக்குப் பங்களிப்பு வழங்கும் தெங்கு சார்ந்த கைத்தொழில்களை மேம்படுத்துவதற்காக அமைச்சு கொண்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

(v) தெங்குப் பயிர்ச்செய்கைக்கு பூச்சிகளால் ஏற்படும் சேதத்தை தடுப்பதற்காக ஏதேனுமொரு புதிய வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the annual coconut production for each year from 2020 to 2025, separately;

(ii) whether the coconut production of Chilaw Plantations Limited has increased relatively during the above period;

(iii) if so, the details in that regard;

(iv) the programme formulated by the Ministry to promote coconut-based industries that contribute to the national economy; and

(v) whether there is a new programme in place to prevent damage caused by insects to coconut cultivation?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
|---|---|
| 2020 | 2,818 |
| 2021 | 3,383 |
| 2022 | 3,352 |
| 2023 | 2,944 |
| 2024 | 2,754 |
| 2025 | 2,806 |

(ii) 2020 වර්ෂයේ සිට 2022 දක්වා සාපේක්ෂ වර්ධනයක්ද, 2023, 2024 වර්ෂවලදී සාපේක්ෂ ලෙස පහත වැටීමක්ද දක්නට ලැබේ.

(iii)
- 2020 වර්ෂයේදී ගෙඩි මිලියන 11.94ක් අස්වනු නෙළා ගෙන ඇති අතර, 2021 සහ 2022 වර්ෂවලදී එය පිළිවෙළින් ගෙඩි මිලියන 14.72ක් හා ගෙඩි මිලියන 15.17ක් දක්වා වර්ධනය වී ඇත. සලකා බලන ලද කාලය තුළ අස්වනු ප්‍රමාණය සියයට 27කට වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.
- කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී අස්වනු ප්‍රමාණය ගෙඩි මිලියන 11.70ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර, 2024 වර්ෂයේදී එය තවදුරටත් ගෙඩි මිලියන 10.33ක් දක්වා අඩු වී ඇත.

මේ සම්බන්ධව විස්තරාත්මක කරුණු දැක්වීමක් ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම **සභාගත** කරමි.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the Answer tabled:*

(iv) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් පොල් ආශ්‍රිත කර්මාන්ත නඟාසිටුවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

- 2030 වනවිට මෙරට පොල් අවශ්‍යතාව සඳහා ගෙඩි මිලියන 4,200ක නිෂ්පාදනයක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක අපනයන ආදායමක් ඉලක්ක කරමින්, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය - UNIDO - සමඟ එක්ව පොල් ක්ෂේත්‍රය සඳහා දස අවුරුදු මාර්ග සැලැස්ම සහ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කරමින් පවතී.

- පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද තාක්ෂණික කමිටුවක් මඟින් එම ආයතනයන්හි නිෂ්පාදන හැකියාව පිළිබඳව සිදු කරනු ලබන අධ්‍යයනයකින් පසුව ලබා දෙන නිර්දේශ මත පදනම්ව, සෘජුවම ශීත කළ පොල් මද, පොල් කිරි/පිටි කළ පොල් කිරි, දිසිදි පොල් ප්‍රතිඅපනයනය සඳහා බදු විරාම පදනම -TIEP - මත පොල් ගෙඩි මිලියන 200කට සමාන ධාරිතාවකින් යුත් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණයක්, මාර්ගෝපදේශයන්ට යටත්ව ආනයනය කිරීමට අවසර ලබා දී ඇත.

- කැබලි කර වියළන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) ආනයනය කිරීමේදී සංයෝජිත වර්ගීකරණ සංකේතාංක - HS code- 0801.11.90 යටතේ ආනයන බලපත්‍ර ලබාගෙන ආනයනය කළ හැකි, පොල් මද නොවන වෙනත් ද්‍රව්‍යයන්ද පැවතිය හැකි බැවින්, ඒවා සඳහා ප්‍රතිශතාත්මක බදු ක්‍රමවේදය අදාළ කර ගනිමින් ගණනය කරන ලද කිලෝග්‍රෑමයට රුපියල් 320ක් වූ නිශ්චිත බද්දක් 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ හඳුන්වා දීමටත්, දේශීය වශයෙන් පොල් තෙල් නිෂ්පාදනය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව, කැබලි කර වියළන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) ආනයනකරුවන් හට කිලෝග්‍රෑමයකට රුපියල් 10ක් වූ සහනදායී විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අගයක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත.

- පොල් තෙල් සමඟ වෙනත් තෙල් මිශ්‍ර කිරීම වැළැක්වීම සඳහා ඇසුරුම්කරණය සම්බන්ධයෙන් අංක 2286/26 දරන 2022 ජූනි මස 29වැනි දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කර ඇති ගැසට් පත්‍රයේ කොන්දේසිද ඇතුළත් කර, ඕනෑම ප්‍රමාණයක පොල් තෙල් නිෂ්පාදන සඳහා ලේබලයක් සහිතව ඇසුරුම් කර පමණක් අළෙවි කිරීම සඳහා නව ගැසට් පත්‍රයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් නිකුත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

- තවද, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී.

- කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය

  - 2012 වර්ෂයේ සිට මේ දක්වා කප්රුක ජය ඉසුර නමින් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. පවතින කර්මාන්ත සංවර්ධනයට මෙම ණය මුදල් ලබා දෙනු ලැබේ. මෙම වැඩසටහන මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක කෙරේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව -RDB- හරහා 2015 - 2025 කාල සීමාව තුළ කර්මාන්තකරුවන් 500කට ආසන්න ගණනකට රුපියල් මිලියන 500කට ආසන්න මුදලක් ලබා දී ඇත. වාර්ෂික පොලී අනුපාතය සියයට 6කි.

  - 2025 වර්ෂයේ සිට මෙම ණය මුදල රුපියල් මිලියන 3.5 සිට රුපියල් මිලියන 5.0 දක්වා වැඩි කරන ලද අතර, පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (සූර්ය පැනල) භාවිත කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 10 දක්වා ණය පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. වාර්ෂික පොලී අනුපාතය සියයට 4 දක්වා අඩු කිරීමටද කටයුතු කර ඇත.

- සහනාධාර ලබා දීම.

---

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

- 2026 වර්ෂයේ බ්‍රිස්ටල් කෙඳි නිෂ්පාදන යන්ත්‍ර 20ක් සඳහා ආධාර ලබා දීමට කටයුතු යොදා ඇත.

- 2026 වර්ෂයේදී ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා මූල්‍ය සහාය ලබා දීම. එක් පුද්ගලයෙක් සඳහා උපරිමය රුපියල් 50,00ක් බැගින් වූ ආයෝජන සහායක් ලබා දීමට කටයුතු යොදා ඇත.

  උදාහරණ: අත් ලණු නිෂ්පාදන යන්ත්‍ර/උපකරණ, තවාෂි නිෂ්පාදන යන්ත්‍ර/උපකරණ, කොහු පීරන පනා, ඉරටු සුද්ද කරන මැෂින්, ඉදල් නිෂ්පාදනය කරන මැෂින්, විහිදුම් අච්චු, පොල් කටු හා පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන සඳහා මෙලම් ආදිය

- 2026 වර්ෂයේ සිට පොල් තෙල් කර්මාන්තය හා කොහු කර්මාන්ත ආයතනවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා GMP සහතිකකරණය ලබා ගැනීම වෙනුවෙන් එම ආයතන වෙත සහතිකකරණය සඳහා වැය වූ මුදලින් රුපියල් 100,000ක උපරිමයකට යටත්ව මූල්‍ය සහාය ලබා දීම.

- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය නියාමනය කිරීම හා පහසුකාරකයන් සැපයීම (නියැදි ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, අවශ්‍ය උපදෙස් ලබා දීම.)

- ස්වයං රැකියා මට්ටමේ කණ්ඩායම් පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම.

- දේශීය පොල් තෙල් කර්මාන්තය නඟාසිටුවීමට වැඩ පිළිවෙළ සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය ප්‍රකාරව විෂයගත අමාත්‍යවරයාහට නියෝග නිකුත් කිරීමේ බලතල ප්‍රකාරව, පොල් සංවර්ධන අධිකාරියේ සහතික ලත් දේශීය පොල් තෙල් ලෙස ලාංඡනයක් නිකුත් කිරීමට අදාළව රෙගුලාසි සකස් කිරීමට නෛතික බාධාවක් නොමැති බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය දැනුවත් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- තාක්ෂණික හුවමාරු වැඩසටහන් පැවැත්වීම.

- අනුරාධපුර, ගාල්ල, පුත්තලම, කුරුණෑගල, ගම්පහ, බදුල්ල, අම්පාර, මාතර, මඩකලපුව, හම්බන්තොට, කිලිනොච්චි සහ කළුතර යන දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් 956ක් සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් නිෂ්පාදනවල ගුණාත්මක බව රැක ගැනීම සඳහා කටයුතු කර ඇත.

- **උතුරු පළාත තුළ පොල් ත්‍රිකෝණය ස්ථාපිත කිරීම සම්බන්ධ කටයුතු සඳහා සහාය දැක්වීම.**

- උතුරු පළාත තුළ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ කර්මාන්තකරුවන් 06දෙනෙකු සඳහා තම කර්මාන්ත නවීකරණය සඳහා වැය වූ මුදලින් සියයට 50ක මුදල රුපියල් 200,000ක උපරිමයකට යටත්ව ලබා දීමට කටයුතු කර ඇත. 2025 වර්ෂයේ පොල් දින සැමරුමට සමගාමීව කර්මාන්ත ප්‍රදර්ශනයක් පැවැත්වීම.

(v) මේ වනවිටත් කෘමීන්ගෙන් සිදු වන හානිය වැළැක්වීම සඳහා පහත වැඩසටහන් අමාත්‍යාංශය හා ඒකාබද්ධව පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, 2026 වර්ෂයේදී පහත සඳහන් ආකාරයට කෘමි හානිය වැළැක්වීම සඳහා පියවර ගැනීමට අමාත්‍යාංශය පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත ප්‍රතිපාදන වෙන් කර ඇත.

| අනු අංකය | වැඩසටහන් | වෙන් කළ ප්‍රතිපාදන (රුපියල් මිලියන) | භෞතික ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| 1 | බ්‍රොන්ටිස්පා හානිය පාලනය | 12.0 | • රෝගී ගස් 2,000ක් සලකුණු කිරීම.<br>• රෝග පාලනය සඳහා මොනක්‍රොටපස් එන්නත් කිරීම හා පරපෝෂිතයන් නිදහස් කිරීම.<br>• දැනුවත් කිරීමේ වැඩසටහන් 16ක් පැවැත්වීම<br>• රෝගී ගස් 600ක් පරීක්ෂාව හා සිතියම්ගත කිරීම<br>• මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම (භාෂා මාධ්‍ය ත්‍රිත්වයෙන් පුවත් පත් දැන්වීම් පළ කිරීම) |
| 2 | වැලිගම කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය පාලනය | 90.00 | • රෝගී ගස් 3,300ක් සලකුණු කිරීම<br>• රෝගී ගස් 3,892ක් ඉවත් කිරීම හා වන්දි ගෙවීම<br>• රෝගී ගස් පවතින ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම - අක්කර 25<br>• අතුරු භෝග වගාව ප්‍රවර්ධනය කිරීම. උදා: කුරුඳු<br>• රෝගී ගසක ශක්තිය -vigor- පවත්වා ගැනීම සඳහා පොහොර සහනාධාරය ලබා දීම සහ අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.<br>• අනෙකුත් පළිබෝධ මර්දනය අවශ්‍ය පිළියම් යෙදීම.<br>• රෝගයට ප්‍රතිරෝධී පොල් පැළ 3,000ක් සිටුවීම. |
| 3 | රතු කුරුමිණි හානිය පාලනය | 11.58 | • රතු කුරුමිණි පෙරමෝණ වයල් 50,000ක් හා කළු කුරුමිණි පෙරමෝණ වයල් 3,000ක් බෙදා හැරීම.<br>• මොනක්‍රොටපස් 1200Lක් රෝගී ගස්වලට එන්නත් කිරීම.<br>• වැඩසටහන් 21ක් පැවැත්වීම. |
| 4 | කළු කුරුමිණි පාලනය | 11.58 | |
| 5 | සුදු මැස්සා හානිය පාලනය | 40.00 | • රෝගී ගස් සලකුණු කිරීම හා කොහොඹ තෙල් යෙදීම - ගස් 500,000<br>• හදිසි තත්ත්ව යටතේ විශේෂ පාලනය - ගස් 110,000 මේ වනවිට ත්‍රිකුණාමලය, මඩකලපුව වැනි ප්‍රදේශවල පාලන කටයුතු සිදු කර ඇත.<br>• කොහොඹ තෙල් ඉසීම සඳහා බලවේග දියර ඉසින යන්ත්‍ර 30ක් මිලදී ගැනීම හා යන්ත්‍ර 500ක් අලුත්වැඩියාව මේ වනවිට දියර ඉසිරි යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර යන්ත්‍ර 82ක් අලුත්වැඩියා කර ඇත. |
| 6 | පොල් මයිටාවන් පාලනය | 28.24 | • පරපෝෂී මයිටා පැකට් 414,000ක් ක්ෂේත්‍රය තුළ නිදහස් කිරීම.<br>• වැඩසටහන් 20ක් පැවැත්වීම. |
| 7 | පොල් දළඹු පාලනය | 0.49 | • ක්ෂේත්‍ර වැඩසටහන් 8ක් පැවැත්වීම.<br>• පරපෝෂී නළ 2,100ක් ක්ෂේත්‍රය තුළ නිදහස් කිරීම |

මේ අනුව සමස්ත ලෙස පොල් වගාවේ කෘමි හා පළිබෝධ පාලනය සඳහා 2026 වර්ෂයට රුපියල් මිලියන 182.31ක පමණ මුදලක් වෙන් කර ඇත. මීට අමතරව පොල් වගා කිරීමේ මණ්ඩලය ව්‍යාපෘති සේවාව මඟින් ක්ෂේත්‍ර මට්ටම්වලදී කෘමි හානිය පාලනය සඳහා අවශ්‍ය උපදෙස් වගාකරුවන්ට ලබා දේ. තවද, ගම්මාන මට්ටමින් ප්‍රජාවගේද දායකත්වය සහිතව මෙම පාලන කටයුතු සිදු කිරීම සඳහා පොල් දෙසතිය ලෙස විශේෂ වැඩසටහන්ද පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඊට අමතරව පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මක කරනු ලබන පොල් පොකුරු ඉඩම් සංවර්ධන වැඩසටහන් යටතේ කෘමි පළිබෝධ පාලන වැඩසටහන් සඳහා ප්‍රජා සංවිධානවල සහභාගිත්වයෙන් ක්ෂේත්‍ර මට්ටමින් කටයුතු කරනු ලැබේ.

තවද, ව්‍යාප්ති වැඩසටහන් යටතේ වාර්ෂිකව ගොවි කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන්, හානිකර කෘමීන් මර්දනය ඉලක්ක කර ගත් වැඩසටහන්, පුහුණු මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, ක්‍රම හා ප්‍රතිඵල ආදර්ශන යනාදී ව්‍යාප්ති ක්‍රමවේද යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මීට අමතරව යම් කෘමි හානියක් වසංගත තත්ත්වයක් දක්වා උද්ගත වුවහොත් පොල් පර්යේෂණ ආයතනය හා එක්ව එම උපදෙස් යටතේ විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

උදාහරණ: බ්‍රොන්ටිස්පා කෘමි උවදුර මර්දනය වැනි

(ආ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
**(மாண்புமிகு அஜித் கிஹான்)**
(The Hon. Ajith Gihan)

ගරු කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාගෙන් අසනු ලබන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා, වයඹ පළාතේ පොල් ත්‍රිකෝණය පිළිබඳව. විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කය පිළිබඳවයි මම මේ අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ. ඔබතුමා කියන විධියට පොල් නිෂ්පාදනයේ වැඩි වීමක් වෙලා තිබෙනවා. නමුත්, ගරු අමාත්‍යතුමනි, පොල් වගාකරුවන්ට බරපතළ ගැටලුවක් තිබෙනවා. එම ගැටලුව තමයි, පොල් ගස්වලට වැලඳෙන ලෙඩ රෝග පිළිබඳ ප්‍රශ්නය. සුදු මැස්සා, මයිටා, රතු කුරුමිණියා සහ කළු කුරුමිණියා කියන සතුන් අතුරින් සුදු මැස්සාගෙන් විශාල බලපෑමක් වෙනවා. පොල් පර්යේෂණ ආයතනය තිබෙන්නේ අපේ දිස්ත්‍රික්කයේ තමයි. නමුත්, පොල් පර්යේෂණ ආයතනය සුදු මැස්සන් විනාශ කිරීමට, මර්දනය කිරීමට පර්යේෂණවලින් ගත්ත ක්‍රියාමාර්ග භාවිතාවේ යෙදෙනවාද කියන කාරණාව මතු වෙලා තිබෙනවා. තවමත් ගොවීන් ඒ තත්ත්වයට මුහුණ දෙනවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවාද, අලුතින් පරීක්ෂණ සිදු කර තිබෙනවාද, තිබෙන පරීක්ෂණ මත ඒවා මර්දනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන කාරණයත් ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
**(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)**
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, ඇත්තටම විවිධ භෝග සඳහා වැලඳෙන රෝග මර්දනය කිරීමේදී යම් විටක දුෂ්කරතාවකට පත් වෙනවා. කාලගුණික හා දේශගුණික තත්ත්ව ඇතුළු කාරණා විශාල වශයෙන් ඒවාට බලපානවා. කොහොම නමුත්, ගරු මන්ත්‍රීතුමා අසනු ලබන ප්‍රශ්නය සාධාරණයි. පොල් වගාවට වැලඳුණු විශේෂ රෝග ගණනාවක් තිබෙනවා. පොල් පර්යේෂණ ආයතනයත්, පොල් වගා කිරීමේ මණ්ඩලයත්, අමාත්‍යාංශයක් හැටියට අපේ අමාත්‍යාංශයත් මේ රෝගී තත්ත්වයන්ගෙන් අපේ වගාව මුදා ගැනීම සඳහා ලොකු උත්සාහයක නිරත වෙනවා.

මම ඔබතුමාට ඒ ගැන පැහැදිලි වෙන්න මේ කාරණය කියන්නම්. බ්‍රොන්ටිස්පා හානිය පාලනය කරන්න අපි 2026 අවුරුද්දේ රුපියල් මිලියන 12ක් වෙන් කළා. ඒ සඳහා අපි ක්ෂේත්‍රය පරීක්ෂා කරලා, ඒ රෝගය වැලඳුණු ගස් 2,000ක් පමණ හඳුනා ගෙන තිබෙනවා. ඒවාට දෙන ප්‍රතිකාරය තමයි, මොනක්‍රොටපස් එන්නත් කිරීම හා පරපෝෂිතයන් නිදහස් කිරීම. ඒක අපි කරලා තිබෙනවා. දැනුවත් කිරීමේ වැඩසටහන් කරමින් තිබෙනවා.

ඒ වාගේම පොල් ආශ්‍රිතව දකුණු පළාත කේන්ද්‍ර කරගෙන තවත් ලොකු රෝගයක් තිබෙනවා. අපි ඒකට කියන්නේ "වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය" කියලා. ඒ රෝගය තුරන් කිරීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 90ක් මේ අවුරුද්දේ යොදවා තිබෙනවා. ගරු කථානායකතුමනි, එහිදී රෝගය උත්සන්න වෙලා නම් ඒ ගහ කපලා ඉවත් කරන්න ඕනෑ. අපි බලයට එනකොට ගහකට ගෙවපු ගණන රුපියල් 3,000යි. ඉතින් රුපියල් 3,000කට ගහක් කපන එක පාඩු නිසා මිනිස්සු කැමැති වුණේ නැහැ ගස් කපන්න. අපි ඒක රුපියල් 10,000ක් බවට පත් කළා, රෝගය පාලනය කර ගන්න ඕනෑ නිසා. අපි මේ අවුරුද්දේ රෝගී ගස් 3,300ක් හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම ඒවා ඉවත් කරන්න අපි වන්දි ගෙවලා තිබෙනවා. වැලිගම කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය සම්බන්ධයෙන් ඒ විධියට අපි ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒ වාගේම කොන්ත්‍රාත් පදනම මත අපි ඩිප්ලෝමාධාරීන් බඳවාගෙන තිබෙනවා. ඔවුන්ගේ දීමනා වැඩි කරලා, ඒ කාර්යය ටිකක් වේගවත් කරලා, රෝගයෙන් ගස් ටික මුදා ගන්න බලනවා.

අපේ පොල් වගාවට බලපා තිබෙන තවත් බරපතළ තත්ත්වයක් තමයි රතු කුරුමිණි හානිය සහ කළු කුරුමිණි හානිය. එය මර්දනය කිරීම සඳහා අපි රුපියල් මිලියන 11.58ක් යොදවා තිබෙනවා. මෙය මර්දනය කරන්න පෙරමෝන වයල් එකක් දෙන්න ඕනෑ. ඒ අනුව රතු කුරුමිණි පෙරමෝන වයල් 50,000ක් හා කළු කුරුමිණි පෙරමෝන වයල් 3,000ක් ගොවීන්ට බෙදා දීලා තිබෙනවා. ඒ වාගේම මොනොක්‍රොටොපොස් ලීටර 1,200ක් බෙදා හැර තිබෙනවා; රෝගී ගස්වලට එන්නත් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා විශේෂ ප්‍රශ්නයක් ඇහුවා, සුදු මැස්සා හානිය ගැන. සුදු මැස්සා හානිය සම්බන්ධයෙන් බරපතළ තත්ත්වයක් තිබෙනවා අපේ රටේ. එය බොහෝ තැන්වල තිබෙන හානියක්. වහින කාලයට ටිකක් අඩු වෙනවා, පායන කාලයට ටිකක් වැඩි වෙනවා. ඒ සඳහා දැනට තිබෙන නිර්දේශිත ක්‍රමය තමයි රෝගී ගස් හඳුනාගෙන, ඒවාට කොහොඹ තෙල් ඉසීම. නමුත් පහළ මට්ටමේ තිබෙන ගහකට කොහොඹ තෙල් ප්‍රතිකාරය කරනවා වාගේ නොවෙයි උසට තිබෙන ගස්වලට එම ප්‍රතිකාරය කිරීම. මොකද, පොල් ගහේ අතුවල කොළයේ යට පැත්තේ තමයි සුදු මැස්සා ඉන්නේ. මේ අවුරුද්ද තුළ අපි ගස් 500,000කට කොහොඹ තෙල් ඉසීම කර තිබෙනවා. හදිසි තත්ත්ව යටතේ විශේෂ පාලනය සඳහා ගස් 110,000ක් හඳුනාගෙන, ත්‍රිකුණාමලය, මඩකලපුව වාගේ ප්‍රදේශවල ඒ කටයුත්ත සිදු කරමින් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මැෂින් සාමාන්‍යයෙන් පොඩි මැෂින් නොවෙයි, උඩට spray කරන්න පුළුවන් ඒවා වෙන්න ඕනෑ. දැන් අපි මේ වෙනකොටත් මැෂින් 30ක් මිලදී ගෙන තිබෙනවා. තවත් මැෂින් 500ක් අපේ ළඟ තිබෙනවා. ඒවා අලුත්වැඩියා කරමින් ඉන්නවා.

ඊළඟට, පොල් මයිටාවා පාලනය කරන්නත් අපි රුපියල් මිලියන 28.24ක් යොදවා තිබෙනවා. පොල් දළඹුවා පාලනය කරන්න අපි රුපියල් මිලියනයකට ආසන්න මුදලක් යොදවා තිබෙනවා. ඒ විධියට කටයුතු කරනවා. ඒ නිසා අපි ගොවි ජනතාවගෙනුත්, කර්මාන්තය ආශ්‍රිතව ඉන්න අයගෙනුත් ඒ සඳහා සහාය ඉල්ලනවා. ලබන අවුරුද්දේ අපි මීට වඩා වැඩි වැඩ පිළිවෙළක් ඒ සම්බන්ධයෙන් දියත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු අමාත්‍යතුමාගෙන් මා අසන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා අපේ දිස්ත්‍රික්කය විධියට ගත්තත්, වයඹ පළාත විධියට ගත්තත් ඒ ජනතාව වැඩි වශයෙන්ම තම ජීවිකාව කරගෙන යන්නේ පොල් නිෂ්පාදනයෙන්, පොල් ආශ්‍රිත කර්මාන්ත තුළින් බව. ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම පළාතේ ආදායමත් මම හිතන විධියට වැඩි වශයෙන්ම පොල් ආශ්‍රිත කර්මාන්ත මත තමයි රඳා පවතින්නේ. ගරු අමාත්‍යතුමනි, අපේ දිස්ත්‍රික්කය ගත්තාමත් කුඩා පොල් ඉඩම් වාගේම මහා පරිමාණ පොල් වතු තිබෙනවා. ඉතින් ඔවුන්ගේ ඉල්ලීමක් තිබෙනවා, පොල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කර ගැනීම සහ පොහොර ලබා ගැනීම සම්බන්ධයෙන්. මොකද, පොල් නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන්ම ජලය සහ පොහොර අවශ්‍ය වෙනවා. දැන් එල්නිනෝ තත්ත්වයකුත් නිර්මාණය වෙමින් තිබෙනවා. අපි දන්නේ නැහැ, කොයි පැත්තට එයිද කියලා. නමුත් අභියෝගයක් තිබෙනවා, ජලය සම්පාදනය කර ගැනීම සහ පොහොර සම්බන්ධව. ඒ නිසා කුඩා ඉඩම්වලට වාගේම විශාල වතුවලටත් පොහොර ලබා දෙන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එතුමා ඇහුවේ වැදගත් ප්‍රශ්නයක්. මම මුලින්ම අපේ රටේ පොල් අස්වැන්න සම්බන්ධයෙන් දත්ත ටිකක් ඉදිරිපත් කළා. පසුගිය කාලයේ අපේ රටේ පොල් අස්වැන්න අඩු වෙන්න විශේෂ හේතුවක් තිබුණා. අපේ ශරීරයට ශක්තිය ලැබෙන්න අපට ආහාර ඕනෑ වාගේම පොල් ගහටත් අවශ්‍ය පෝෂ්‍ය කොටස් ලබා දෙන්න ඕනෑ. පසුගිය කාලයේ මේ රටේ ඇති වෙච්ච පොහොර අර්බුදයත් එක්ක, ආණ්ඩු ගත්ත වැරදි තීන්දුත් එක්ක විශේෂයෙන්ම පොල් වගාවට පොහොර යොදලා නැහැ, බොහෝ තැන්වල. මෙතුමාගේ ප්‍රශ්නයේත් සඳහන් වුණු, අප සතුව තිබෙන හලාවත වැවිලි සමාගම අවුරුදු පහක් පොහොර දමලා තිබුණේ නැහැ. හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම ගිය අවුරුද්දේ පොහොර දැමීමේ කටයුතු ආරම්භ කළා. පොල් ගහකට පොහොර දමලා මාස තුනෙන් ගෙඩි ගන්න බැහැ. සාමාන්‍යයෙන් වසර එකහමාරක් විතර යනවා, එහි ප්‍රතිඵල ලැබෙන්න. අපි රජය භාර ගත්ත මොහොතේම කෘෂිකර්ම ඇමතිතුමා හැටියට ලාල් කාන්ත ඇමතිතුමාත්, ජනාධිපතිතුමාත්, විදේශ කටයුතු ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, රුසියාවත් එක්ක සාකච්ඡා කරලා, පරිත්‍යාගයක් ලෙස මෙට්‍රික් ටොන් 56,000ක MOP පොහොර නැවක් රුසියාවෙන් ලබා ගත්තා. මම ඒ ගැන විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒකෙන් භාගයක් -මෙට්‍රික් ටොන් 27,000ක් - අපේ අමාත්‍යාංශයට හම්බ වුණා, පොල් වගාව සඳහා. අපි පොහොර සමාගමත් එක්ක එකඟතාවකට ඇවිල්ලා, අනෙකුත් පොහොර දෙක කලවම් කරලා ඒක පොල් පොහොර බවට පරිවර්තනය කරලා සහනාධාර ක්‍රමයක් යටතේ අක්කර පහට අඩු ගොවීන්ට ලබා දුන්නා. ඒ ටික ඉවර වෙලා, මෙතුමා ප්‍රශ්න කළා වාගේම අක්කර පහෙන් ඉහළ, අක්කර 50 දක්වා ගොවීන්ට අපි ඒ පොහොර ලබා දුන්නා. දැන් තව ඉතාම සුළු පොහොර ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ ටිකත් අපි ළඟදී ලබා දීලා ඉවර කරනවා.

ඒ වාගේම මම ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, 2026 අය වැයේදී ලංකා ඉතිහාසයේ පළමු වතාවට පොල් වගාකරුවන්ට පොහොර සහනාධාරය ලබා දීම සඳහා රුපියල් මිලියන 2,500ක් අපට ලබා දීම පිළිබඳව. පොල් පොහොර විතරක් නොවෙයි ඒකෙන් දෙන්නේ. පොල් ගසේ තෙතමනය ආරක්ෂා කරන්න, පාංශු සංරක්ෂණය කරන්න, පොහොර යොදන්න ආදී සියලු දේවල් සඳහා රුපියල් මිලියන 2,500ක් අපට දීලා තිබෙනවා.

ඒ හින්දා පොකුරු ක්‍රමයට මහ වතු එකතු කරලා ඒ කාර්යය අපි මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ හින්දා රජයක් හැටියට මේ පවතින අර්බුද තත්ත්ව ඇතුළේ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා කියන එක මම මතක් කරන්න කැමැතියි.

## කොටියාකුඹුර ප්‍රදේශයේ පානීය ජල හිඟය: ව්‍යාපෘති යෝජනා
## கொட்டியாகும்புரவில் குடிநீர்ப் பற்றாக்குறை: கருத்திட்ட முன்மொழிவுகள்
## DRINKING WATER SHORTAGE IN KOTIYAKUMBURA: PROJECT PROPOSALS

2060/2026

**9. ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, කොටියාකුඹුර ප්‍රදේශයේ දෙදහසකට අධික ජනතාවක් උග්‍ර පානීය ජල ගැටලුවකින් පීඩා විඳින බව දන්නේද;

(ii) 2023 වර්ෂයේ සිට එම ගැටලුව විසඳීම සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා 02 කවරේද;

(iii) එම යෝජිත ව්‍යාපෘති අනුමත කර, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් කොටියාකුඹුර ප්‍රදේශයේ ජල ගැටලුවට විසඳුමක් ලැබෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்தின், கொட்டியாகும்புர பிரதேசத்தில் வாழும் இரண்டாயிரத்துக்கும் அதிகமான மக்கள் கடுமையான குடிநீர் பிரச்சினையால் அவதியுறுவதை அறிவாரா என்பதையும்;

(ii) 2023ஆம் ஆண்டு தொடக்கம் இப் பிரச்சினையைத் தீர்ப்பதற்காக தேசிய சமூக நீர் வழங்கல் திணைக்களத்துக்குச் சமர்ப்பிக்கப்பட்ட 02 கருத்திட்ட முன்மொழிவுகளும் யாவை என்பதையும்;

(iii) மேற்படி உத்தேச கருத்திட்ட முன்மொழிவுகளை அங்கீகரித்து, அதற்கான நிதி ஒதுக்கீடுகளை மேற்கொள்வதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களை நடைமுறைப் படுத்துவதன் மூலம் கொட்டியாகும்புர பிரதேசத்தில் நிலவும் குடிநீர்ப் பிரச்சினைக்குத் தீர்வு கிடைக்கப்பெறும் வழிமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that more than two thousand residents in the Kotiyakumbura area of the Kegalle District are facing a severe shortage of drinking water;

(ii) the two project proposals submitted to the Department of National Community Water Supply to address the concerned problem since 2023;

(iii) the measures that have been adopted to secure approval for the proposed projects and for allocation of funds for them; and

(iv) the manner in which the implementation of the aforesaid projects will address the drinking water problem affecting the Kotiyakumbura area?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 1. කොටියාකුඹුර ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පිරිපහදු පද්ධතියක් ලබා දීම.

2. ගලිගමුව, රුක්ගහතැන්න ග්‍රාම නිලධාරි වසමේ රුක්ගහතැන්න, දෙමටගොල්ල, වෙරළුගස්තැන්න, ගලඋඩහේන, හැරමන්නාව, බෝහින්න හා අම්පේ උතුර යන පානීය ජල දුෂ්කරතා පවතින ප්‍රදේශ තුළ පවුල් 582කට පානීය ජලය ලබාදීම.

(iii) උක්ත යෝජනා 02 ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර, කොටියාකුඹුර ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා පිරිපහදු පද්ධතියක් ලබාදීම
සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) මඟින් ද, පානීය ජල දුෂ්කරතා පවතින ගලිගමුව - රුක්ගහතැන්න ග්‍රාම නිලධාරි වසම් සඳහා පානීය ජලය ලබාදීමට අදාළව දෙපාර්තමේන්තුව මඟින් ද වෙන් වෙන්ව ඇස්තමේන්තු 02ක් සකස් කර ඇත. එම ව්‍යාපෘති 02 සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බැවින්, එම අනුමැතියට යොමු කිරීම සඳහා 2026.03.17 වන දින ශක්‍යතා අධ්‍යයන වාර්තා හා ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(iv) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොටියාකුඹුර නගරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වන කොටියාකුඹුර සංවර්ධන පදනම යන පානීය ජල ව්‍යාපෘතිය මඟින් ජලය ලබා දෙන ගලිගමුව, බුලත්කොහුපිටිය, වරකාපොල, යටියන්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ග්‍රාම නිලධාරි වසම් 08ක තෝරා ගත් පවුල් 1,362ක් සඳහා පිරිසිදු හා සුරක්ෂිත පානීය ජලය ලැබෙන අතර මේ වන විට පානීය ජල දුෂ්කරතාවෙන් පීඩා විඳින ගලිගමුව, රුක්ගහතැන්න ග්‍රාම නිලධාරි වසමේ පවුල් 582ක් සඳහා ද පිරිසිදු පානීය ජලය ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
ගරු කථානායකතුමනි, මා අසන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ආසනයේ කොටියාකුඹුර ප්‍රදේශයට පමණක් නොවෙයි, පොදුවේ ගත්තොත්, කෑගල්ල දිස්ත්‍රික්කයටම මේ ජල ගැටලුව තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, කෑගල්ල දිස්ත්‍රික්කයට අදාළව අමාත්‍යාංශය මට්ටමින් ක්‍රියාත්මක කරන්නට තිබෙන ඉදිරි සැලසුම් මොනවාද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රිකයට අදාළව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් ග්‍රාමීය ජල ව්‍යාපෘති 6ක වැඩකටයුතු මේ වෙනකොටත් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 77ක මුදලක් අපි වෙන් කර තිබෙනවා. ඒ වාගේම දැනට තිබෙන ග්‍රාමීය ජල ව්‍යාපෘති 7ක වැඩිදියුණු කිරීම් කටයුතු, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් මිලියන 24ක් වෙන් කර තිබෙනවා. මේ විධියට සම්පූර්ණ ව්‍යාපෘති 13කට අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම කෑගල්ල, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් රුවන්වැල්ල ජල පිරිපහදු මධ්‍යස්ථානයේ -Water Treatment Plant එකේ - වැඩකටයුතු මේ වෙනකොට අවසන් කර තිබෙනවා. 2027 වෙනකොට අපි රුවන්වැල්ලේ නළ පද්ධතිය සම්පූර්ණ කරලා ජල සම්පාදන කටයුතු කරන්න සූදානම් කර තිබෙනවා. මේ ව්‍යාපෘතියෙන් තවත් ප්‍රදේශ ගණනාවකට ජලය සම්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා 2028 අවුරුද්දටත් මුදල් වෙන් කර තිබෙනවා.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ජලය සපයා ගන්නා ප්‍රධාන ජල මූලාශ්‍ර වෙන්නේ කැලණි ගඟ, සීතාවක ගඟ, මාඔය හා ගුරුගොඩ ඔය. හැබැයි, කාලයක් තිස්සේම මේ ආශ්‍රිතව වන ජනතා ක්‍රියාකාරකම් නිසා මේ ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යෑමේ තර්ජනයකට මුහුණපාලා තිබෙනවා. ඉතින් ඔබතුමාගේ අමාත්‍යාංශය හැටියට මේකට අදාළව වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයට අදාළ පිළිතුරට තව කොටසක් එකතු කරන්න අවශ්‍යයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ නව ග්‍රාමීය ජල ව්‍යාපෘති සඳහා යෝජනා 24ක් අපේ දෙපාර්තමේන්තුවට ලැබිලා තිබෙනවා, පවුල් 6,180කට ජල

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

සම්පාදන කටයුතු කරන්න. ඒ සඳහා ශක්‍යතා අධ්‍යයන අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඉතුරු ඒවා සම්බන්ධයෙන් ලබන අවුරුද්දේ ශක්‍යතා අධ්‍යයන සිදු කරනවා වාගේම ඒවායේ වැඩකටයුතු ආරම්භ කරන්නත් බලාපොරොත්තු වෙනවා.

එතුමා දෙවන අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ ජල මූලාශ්‍ර ගැනයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉඳලා කොළඹ දක්වා ගත්තොත්, කැලණි ගඟේ - විශාල ගංගා ද්‍රෝණියක් තිබෙන්නේ - තැන් 27කින් ජල සම්පාදන මණ්ඩලය ජලය ලබා ගන්නවා, පානීය ජලය ලබාදීම සඳහා. දළ වශයෙන් ගත්තාම, පවුල් ලක්ෂ 20කට - මිලියන 2කට - කැලණි ගඟෙන් ජල සම්පාදන කටයුතු කරනවා. පුද්ගලයින් විධියට ගත්තාම, ලක්ෂ 80කට ආසන්නයි. කොළඹ දිස්ත්‍රික්කය ගත්තාම, ප්‍රධානම ජල සම්පාදන කටයුතු සඳහා ජලය ගන්නේ කැලණි ගඟෙන්. ඒ නිසා කැලණි ගඟ ආරක්ෂා කර ගන්න, කැලණි ගඟේ ජලය ආරක්ෂා කර ගන්න විශේෂ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. කලින් එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. ඒවා අතරමඟ නතර වෙලායි තිබෙන්නේ. අපි නැවත ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. කැලණි ගඟේ ජලය සුරක්ෂිත කර ගන්නේ කොහොමද, විශේෂයෙන්ම ජලය අපිරිසිදු වන එක සහ කැලණි ගඟ අපවිත්‍ර වන එක වළක්වා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි දැනටමත් වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා.

මේ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේත් වෙනම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, UN-Habitat ආයතනය හරහා අපට ලැබී තිබෙනවා විදෙස් මූල්‍ය ප්‍රදානයක්. කැලණි ගංගා ද්‍රෝණියේම ජලය අපවිත්‍ර වන්නේ මොන මූලාශ්‍රවලින්ද, ඒ සඳහා ගන්න ඕනෑ ක්‍රියාමාර්ග මොනවාද කියන එක සම්බන්ධයෙන් ඒ මුදල් භාවිතයෙන් අධ්‍යයනයක් කරගෙන යනවා. අවුරුදු දෙකකින් තමයි ඒ අධ්‍යයනය අවසන් වන්නේ. අවුරුදු දෙකකට පසුව තමයි අප ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධ යෝජනාවලිය අපට එන්නේ. නමුත්, එතකල් ඉන්න බැහැ. ඒකට සමගාමීව ආයතන ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරලා දැන් අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා, ඒ ඒ ආයතන මඟින් කරන්න. මේකට මධ්‍යම පරිසර අධිකාරිය සම්බන්ධයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධයි, අවිස්සාවේල්ලෙන් පහළට කැලණි ගඟ දෙපස කර්මාන්ත ගොඩක් තිබෙන නිසා කර්මාන්ත අමාත්‍යාංශය සම්බන්ධයි. ඒ වාගේම තමයි, පළාත් පාලන ආයතන 37ක් තිබෙනවා කැලණි ගංගා ද්‍රෝණියේ. ඒ පළාත් පාලන ආයතනත් කුණු කසළ බැහැර කිරීම සහ වෙනත් කටයුතු නිසා ජලය අපවිත්‍ර වීමට අදාළව ක්‍රියාමාර්ග ගන්නා ආයතන. මේ සියල්ල එකතු කරගෙන අපි දැනටමත් සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා, කැලණි ගඟේ ජලය අපවිත්‍ර වන එක නවත්වන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. මම ඉස්සර වෙලා කිව්වා වාගේ මේක ලක්ෂ 80කට බලපාන ප්‍රශ්නයක්.

ඒ වාගේම, මාඔය සම්බන්ධයෙනුත් අපි සාකච්ඡා ආරම්භ කර තිබෙනවා, මාඔය ද්‍රෝණිය ආරක්ෂා කරන්නේ කොහොමද කියලා. මාඔයෙන් තැන් 17කින් වතුර ගන්නවා, ජල සම්පාදන මණ්ඩලය. දළ වශයෙන් පවුල් ලක්ෂ 10කට අවශ්‍ය ජල සම්පාදන කටයුතුවලට මාඔයෙන් ජලය ගන්නවා.

ඊළඟට, සීතාවක ගඟ සම්බන්ධ ගැටලුව ගැනත් අප දන්නවා. එතැන විශාල ගැටලුවක් තිබෙනවා. මැණික් හාරන නිසා එක් කාලයකට එහි ජලය බොර වෙනවා. අවිස්සාවේල්ල ප්‍රදේශය ගත්තාම, පිරිපහදු මධ්‍යස්ථානයෙන් පිරිපහදු කරන්න බැරි තරමට ජලය අපවිත්‍ර වෙනවා. ඒක හරිම සංකීර්ණ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මැණික් ගැරීම නිසා, ඒ මඩ ඔක්කොම සෝදන්නේ ඒ ජලයට වන නිසා, මඩ කැටි ගැහිලා එනකොට ඒ ජලය පිරිපහදු කරන්න බැහැ. අපි දැන් අවිස්සාවේල්ල ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ධාරිතාව වැඩි කරන්න මුල් ගල තියලා ඒ වැඩ කටයුතු සිදු කරමින් යනවා. කෙසේ වෙතත්, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර විධියට කියන්න තිබෙන්නේ, අපි ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙන බවයි. නමුත් ඒක හරිම සංකීර්ණයි. ඒ සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වැඩසටහන හරහා කැලණි ගඟේ ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා.

## හජ් අරමුදල: විස්තර
### ஹஜ் நிதியம்: விபரம்
### HAJJ FUND: DETAILS

2085/2026

**10.** **ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් හජ් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) එම අරමුදලට මුදල් බැර වන ආකාරය කවරේද;

(iii) එම අරමුදලේ මුදල් භාවිත කරමින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) අරමුදල වාර්ෂිකව විගණනයට ලක් කරන්නේද;

(vi) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முஸ்லிம் சமய மற்றும் கலாசார அலுவல்கள் திணைக்களத்துக்குச் சொந்தமான ஹஜ் நிதியத்தில் தற்போதுள்ள மீதி யாது;

(ii) மேற்படி நிதியத்தில் பணம் வரவு வைக்கப்படும் விதம் யாது;

(iii) மேற்குறிப்பிட்ட நிதியத்தின் பணத்தைப் பயன்படுத்தி நடைமுறைப்படுத்தப்பட்டுள்ள திட்டங்களின் எண்ணிக்கை மற்றும் அதற்காகச் செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது;

(iv) மேற்குறிப்பிட்ட திட்டங்களின் முன்னேற்றம் மற்றும் பெறுபேறுகள் குறித்த விபரமான அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

(v) இந்நிதியம் வருடாந்தம் கணக்காய்வுக்கு உட்படுத்தப்படுகின்றதா;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the current balance of the Hajj Fund belonging to the Department of Muslim Religious and Cultural Affairs;

(ii) the method in which funds are credited to the said Fund;

(iii) the number of projects that have been implemented using the monies of the said Fund and the amount that has been spent on such projects;

(iv) whether a detailed report on the progress and the outcomes of those projects will be presented;

(v) whether the Fund is subjected to an annual audit; and

(vi) if not, of the reasons therefor?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් හජ් අරමුදලේ 2026.06.10 දිනට ශේෂය මෙසේයි. ගිණුම් දෙකක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ජංගම ගිණුම - රුපියල් 2,001,497.00

ඉතිරි කිරීමේ ගිණුම- රුපියල් 317,206,610.00

(ii) එම අරමුදලට මුදල් බැර වන ආකාර කිහිපයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ශුද්ධ වූ හජ් වන්දනා නියෝජිත ආයතන තෝරා ගැනීම සඳහා නිකුත් කරන ලද අයදුම්පත්‍රය සඳහා ලබා ගන්නා අයදුම්පත් ගාස්තුව රුපියල් 1,000.00යි. එය එක් විධියක්.

තෝරා ගන්නා ලද හජ් වන්දනා නියෝජිත ආයතන මඟින් ලබා ගන්නා ලියාපදිංචි ගාස්තුව රුපියල් 200,000.00යි.

තෝරා ගන්නා ලද හජ් වන්දනා නියෝජිත ආයතන මඟින් එක් හජ් බැතිමතෙකුගෙන් - එක් වන්දනාකරුවකුගෙන් - ලබා ගන්නා පරිපාලන ගාස්තුව රුපියල් 5,000.00යි.

හජ් බැතිමතුන් ලියාපදිංචි කිරීම සඳහා හජ් බැතිමතෙකුගෙන් අය කරන ගාස්තුව රුපියල් 5,000.00යි.

ශුද්ධ වූ උම්රා වන්දනා නියෝජිත ආයතන තෝරා ගැනීම සඳහා නිකුත් කරන ලද අයදුම්පත් සඳහා ලබා ගන්නා අයදුම්පත් ගාස්තුව රුපියල් 1,000.00යි.

තෝරා ගන්නා ලද උම්රා වන්දනා නියෝජිත ආයතන මඟින් ලබා ගන්නා ලියාපදිංචි ගාස්තුව රුපියල් 50,000.00යි. මෙන්න කියපු විධියට තමයි එම අරමුදලට මුදල් බැර වෙන්නේ.

(iii) ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැත.

(iv) මේ වන විට හජ් අරමුදලේ මුදල් භාවිත කරමින් කිසිම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොමැත. නමුත් මෙම වසරේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුවෙන් අලාභහානියට පත් යටිතල පහසුකම් නැවත ගොඩනැඟීම සඳහා හජ් අරමුදලින් "දිට්වා" අරමුදලට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හරහා රුපියල් මිලියන 5ක මුදලක් ලබා දී තිබෙනවා. එහෙම කරන්න පුළුවන් වෙන්නේ දැනට තිබෙන සටහනක් අනුවයි. ඇත්තටම ඒක පනතක් නොවෙයි, මඟ පෙන්වීමේ සටහනක්. ඒකේ තිබෙනවා, මේ වාගේ ප්‍රජා ආරක්ෂණ ව්‍යාපෘතිවලට වියදම් කරන්න පුළුවන් කියලා. ඒ යටතේ තමයි එම මුදල දීලා තිබෙන්නේ.

(v) විගණනයට ලක් කරන්නේ නැත.

(vi) මෙම අරමුදල ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් - non-statutory fund එකක් - වන බැවින් මෙතෙක් විගණනය කර නොමැත.

තවද, ජාතික හජ් පනත් කෙටුම්පතක් සකස් කර අමාත්‍යාංශය මඟින් දැන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබෙනවා. දැනට විගණනය නොවුණාට සකස් කර අලුතින් යොමු කර තිබෙන පනත් කෙටුම්පතේ හජ් අරමුදල විගණනය සම්බන්ධයෙන් යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඉදිරියේදී එම අරමුදල විගණනයට ලක් කිරීමට ඒ අනුව කටයුතු සැලසෙයි.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ ජීවත් වන මිලියන 2කට වැඩි මුස්ලිම් ජාතිකයන් වෙනුවෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් හජ් පනත නමින් පනතක් සකස් කර තිබේද? එහි අන්තර්ගතය කෙසේද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විමසන්නේ හජ් පනත සම්බන්ධව. මා කලිනුත් සඳහන් කළා ඒ සඳහා දැනට තිබෙන්නේ සටහනක් බව. එනම්, “Guidelines to Regulate Hajj and Umrah Pilgrimages from Sri Lanka” කියන සටහන. ඒක guideline එකක් හැටියටයි තිබෙන්නේ. එය 2013.05.01 වන දා සිට තමයි බලාත්මක වෙලා තිබෙන්නේ. ඒ guideline එක Act එකක් බවට පත් කර ගත යුතුව තිබුණා. ඇත්තටම ඒ පිළිබඳව මේ වනකොට සෑහෙන කටයුතු ප්‍රමාණයක් සම්පාදනය වෙලා තිබෙනවා. ඒ ගැන කියන්න සතුටුයි. හජ් කමිටුව ඉතාම උනන්දුවෙන් එම කටයුත්ත කරනවා. ඔවුන් තමන්ගේ වගකීම් අතරින් ප්‍රථම වගකීම හැටියට ගත්තේ එම පනත් කෙටුම්පත හදන එකයි. දැන් ඒක නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා. මා ඒ පිළිබඳව පරීක්ෂා කර බැලුවා. අපි සංවාදයක් කරලා තමයි ඒ යොමු කිරීම කළේ. ඉතාම දියුණු මාර්ගෝපදේශ රාශියක් එම පනත් කෙටුම්පතේ ඇතුළත් වනවා. අමාත්‍යවරයා හැටියට මා අපේක්ෂා කරනවා, එම පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුව හරහා සම්මත කර ගත්තාට පසුව ඒ ආදරණීය ප්‍රජාවට, ඒ වන්දනාකරුවන්ට, ඒ බැතිමතුන්ට විශාල සහනයක් සැලසේවි කියලා.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මුස්ලිම් සහෝදරයන්ගේ ඉතාම වටිනා අවස්ථාවක් වන ඔවුන්ගේ හජ් වන්දනාව විධිමත් කිරීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, මා නැවතත් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා අපේ මුස්ලිම් සහෝදරත්වය වෙනුවෙන් එතුමා මේ ප්‍රශ්නය විමසීම ගැන. විශේෂයෙන්ම මගේ නියෝජ්‍ය අමාත්‍යවරු දෙපළගෙන් එක සොහොයුරෙක් මේ සමාජයම නියෝජනය කරන කෙනෙක්. එතුමා බොහොම උනන්දුවෙන් මැදිහත් වෙනවා මේ කාරණයට. මේක මුස්ලිම් ජන සමාජය සතුව තිබෙන ඉතාම උතුම් වන්දනා ගමනක් බව මා මේ පාර්ලිමේන්තුවේ වාර ගණනාවක් සඳහන් කර තිබෙනවා, මේ ආශ්‍රිත ප්‍රශ්නවලටම පිළිතුරු සපයමින්.

පසුගිය වසරේ ප්‍රගතිය එක්කම ඔබතුමාට උත්තරයක් දුන්නොත්, දීර්ඝ කාලයක් අපේ වන්දනාකරුවන්ට - බැතිමතුන්ට - නවාතැන් ගන්න ලැබුණේ "C" category එකේ, එහෙම නැත්නම්, ඒ වර්ගයේ ඒවා. ඔබ දන්නවා, හජ් වන්දනාවේ ප්‍රධාන ස්ථාන Mina, Arafat and Muzdalifah බව. ඒ ස්ථාන 3හි තමයි මේ රැඳවීම් ස්ථාන තිබෙන්නේ. ඒ තුන්පොළේ තමයි බොහෝ දුරට පහසුකම් සම්බන්ධ ප්‍රශ්න උද්ගත වෙන්නේ. අපි සමත් වුණා, "C" category එකෙන් "B" category එකට මේක යොමු කර ගන්න. එතැන පහසුකම් වැඩි තැනක්, වැඩි අවකාශයක් තිබෙන තැනක්. ඒ වාගේම ප්‍රවාහන පහසුකම් සම්බන්ධව හොඳ දියුණුවක් ඇති කර ගන්න පුළුවන් වුණා. අපේ බැතිමතුන් 50දෙනෙකුට එක බසයක් බැගින් වෙන් කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම ඔබ සියලුදෙනා දන්නවා, මේ උතුම් වන්දනා ගමන සඳහා එක බැතිමතෙකුගෙන් විශාල මුදලක් අය කරන බව. ඒක සමහර වෙලාවට දරා ගන්න බැරි තරම් විශාල මුදලක්, ගරු කථානායකතුමනි. ඒක රුපියල් ලක්ෂ 20ක්, 22ක්, 25ක් දක්වා වුණත් වෙන්න පුළුවන්. නමුත්, පසුගිය වසරේ අපට පුළුවන්කම ලැබුණා, මේක යම් ප්‍රමාණයකට සැලකිය යුතු මුදලකින් අඩු කර ගන්න. ඒ අඩු කරගෙනත් ඒ ගෙවන්න ඕනෑ මුදල ණය මුදලක් මඟින් ගෙවීමට අපේ වන්දනාකරුවන්ට ඉදිරියේදී පහසුකම් සැලසෙනවා. ඒ ගැනත් කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම තමයි ලංකාවේ බැතිමතුන් සෞදි රාජ්‍යයට රැගෙන යන travel agentsලා සමඟ ඉතා හොඳ සංවාදයක් කරගෙන, තිබෙන ප්‍රශ්න අවම කරගෙන අපි ඉදිරියට යමින් තිබෙනවා. ඒ වාගේම ඉතිරි පහසුකම් ලැබෙන්නේ සෞදි රජයට ගියාට පස්සේ, ඒ රාජ්‍යයේදී. එතැනදී අපේ වගකීම වෙනවා, සේවා සපයන්නන් - service providers - එක්ක ගනුදෙනු කරන්න. එතකොට අපේ හජ් කණ්ඩායම එහෙට ගිහිල්ලා ඒ අය මුණ ගැහිලා සුදුසුම අය පත් කරගෙන අපේ බැතිමතුන්ට අවශ්‍ය උපරිම පහසුකම් සලසා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. පනත සම්මත වුණාට පස්සේ අපට තවදුරටත් මේක නිවැරදි මාර්ගයේ අරගෙන යන්න අවස්ථාව ලැබෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## 2015 සිට කුකුළු මස් ආනයනය: විස්තර
## 2015இலிருந்து கோழி இறைச்சி இறக்குமதி: விபரம்
IMPORT OF CHICKEN FROM 2015: DETAILS

194/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මෙරටට කුකුළු මස් ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ආනයනය කළ කුකුළු මස් ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙළඳපොළ තුළ කුකුළු මස් මිල ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை இந்நாட்டுக்கு கோழி இறைச்சி இறக்குமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அக்காலப்பகுதியில் இறக்குமதி செய்யப்பட்ட கோழி இறைச்சியின் அளவும் அதற்காகச் செலவிடப்பட்ட தொகையும் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) சந்தையில் கோழி இறைச்சியின் விலையை நிலையாகப் பேணுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether chicken has been imported into this country since the year 2015 up to now;

(ii) if so, separately, the quantity of chicken thus imported and the amount of money spent on that in each year during the said period; and

(iii) the measures that will be taken to maintain a stable price for chicken in the market?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

| ආනයනය කළ කුකුළු මස් පිළිබඳ තොරතුරු (2015 - 2025 දක්වා) | | |
|---|---|---|
| වර්ෂය | ප්‍රමාණය (මෙට්‍රික්ටොන්) | වැය කළ මුදල (රුපියල් මිලියන) |
| 2015 | 511.7 | 105.3 |
| 2016 | 190.5 | 75.8 |
| 2017 | 202.9 | 94.7 |
| 2018 | 198.1 | 68.8 |
| 2019 | 140.0 | 40.7 |
| 2020 | 88.0 | 23.7 |
| 2021 | 21.6 | 9.7 |
| 2022 | 124.0 | 119.5 |
| 2023 | 26.0 | 22.9 |
| 2024 | 58.2 | 50.4 |
| 2025 | 122.4 | 105.2 |

(iii) කුකුළු මස්වල වෙළෙඳ පොළ මිල ඉල්ලුම සහ සැපයුම අනුව උච්චාවචනය වේ. එබැවින්, සෑම වසරකම අවසන් කාර්තුව තුළ ඉදිරි වසරේදී ආනයනය කිරීමට අපේක්ෂිත මව් සතුන් සංඛ්‍යාව හා සැලසුම්, අභිජනන ගොවිපළවල් මඟින් ගෙන්වාගෙන, ඒ අනුව ඉදිරි වසර සඳහා නිෂ්පාදන පුරෝකථනයන් සිදු කර ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වා ගැනීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් ලෙස සිදු කරනු ලබයි.

එමෙන්ම, ඉහත කුකුළු මස් හා බිත්තර සැපයුමට අවශ්‍ය කුකුළු ආහාර ප්‍රමාණය ඇස්තමේන්තු කර කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය නියමිත ප්‍රමිතිගත සත්ත්ව ආහාර අමු ද්‍රව්‍ය ආනයන පහසුකරණය ද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. මේ යටතේ ආනයන සීමා පනවා ඇති බඩඉරිඟු වැනි සත්ත්ව ආහාර අමු ද්‍රව්‍ය අවශ්‍යතාව ගණනය කර එය දේශීය නිෂ්පාදනය සමඟ සසඳා බලා ආනයනය කිරීමට අවශ්‍ය නියාමනයන් සිදු කෙරේ.

බීජ රක්කනාගාර හා අභිජනන ගොවිපළවල බෝවන රෝග පැතිරීම වැළැක්වීමත් සහ ජෛව ආරක්ෂණ විධිවිධාන නිසි ලෙස පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරින් මඟින් එම පරිශ්‍ර ආවේක්ෂණය කිරීමත් සිදු කරනු ලබයි. එමෙන්ම, බ්‍රොයිලර් මස් සැකසුම් කර්මාන්තශාලා ද නිරන්තරයෙන් ආවේක්ෂණය කරනු ලබයි.

ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් ගොවිපළ ගැටලු හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර සමීක්ෂණ ප්‍රතිඵල අනුව නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම, නිෂ්පාදන මිල පහළට ගෙන ඒම සහ රෝග පැතිරීම අවම කිරීම ආදී කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම සිදු කරයි.

(ආ) අදාළ නොවේ.

## ඉන්ධන පිරවුම්හල්: විස්තර
### எரிபொருள் நிரப்பு நிலையங்கள்: விபரம்
### FILLING STATIONS: DETAILS

830/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රට පුරා ස්ථාපිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) ඛනිජ තෙල් බෙදුම්කරුවන්ට මේ වනවිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා දෙන කොමිස් මුදල කොපමණද;

(iv) එම කොමිස් මුදල වෙනස් කිරීමට රජය තීරණය කොට තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாடு பூராவும் நிறுவப்பட்டுள்ள எரிபொருள் நிரப்பு நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி எரிபொருள் நிரப்பு நிலையங்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தால் பெற்றோலிய விநியோகஸ்தர்களுக்கு தற்போது வழங்கப்பட்டுவரும் தரகுத்தொகை யாது என்பதையும்;

(iv) மேற்படி தரகுத்தொகையை மாற்றுவதற்கு அரசாங்கம் தீர்மானித்துள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது குறித்த தகவல்களைச் சமர்ப்பிக்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the number of filling stations established across the country;

(ii) the locations of each of the said filling stations;

(iii) the amount of commission currently paid by the Ceylon Petroleum Corporation to the petroleum distributors;

(iv) whether the Government has decided to revise the said amount; and

(v) if so, the details of such revision?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ඇ) (i)

| ආයතනය | ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 888 |
| ලංකා ඉන්දියන් ඔයිල් සමාගම | 273 |
| සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම | 150 |
| ආර් එම් පාර්ක්ස් පුද්ගලික සමාගම | 130 |

(ii)

| ආයතනය | ස්ථාන |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ඇමුණුම 01** |
| ලංකා ඉන්දියන් ඔයිල් සමාගම | ඇමුණුම 02** |
| සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම | ඇමුණුම 03** |
| ආර් එම් පාර්ක්ස් පුද්ගලික සමාගම | ඇමුණුම 04** |

(iii) ඇමුණුම 05 යටතේ දක්වා ඇත.

| බෙදුම්කරු සතු කාණ්ඩයේ (DODO) | | | | | |
|---|---|---|---|---|---|
| | කාණ්ඩ ස්ථාවරය | තොග 1-15 | තොග 16-30 | තොග 31-60 | තොග 61 කට වැඩි |
| A | සාමාන්‍ය බෙදුම්පල සඳහා (පහත B,C,D,E කාණ්ඩවලට අයත් නොවන බෙදුම්හල් සඳහා) ලීටරයකට රුපියල් | 8.00 | 8.30 | 8.30 | 8.30 |
| B | කි.මී.15 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 8.91 | 8.30 | 8.30 | 8.30 |
| C | කි.මී.10 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 8.62 | 8.30 | 8.30 | 8.30 |
| D | කි.මී.5 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 8.32 | 8.30 | 8.30 | 8.30 |
| E | ආරම්භක සංවර්ධනයේ සිට වසර 05 කාලයක් ඇති නව පිරවුම්හල් සඳහා ලීටරයකට රුපියල් | 8.91 | 8.30 | 8.30 | 8.30 |

| සංස්ථාව සතු කාණ්ඩයේ (CODO) | | | | | |
|---|---|---|---|---|---|
| | කාණ්ඩ ස්ථාවරය | තොග 1-15 | තොග 16-30 | තොග 31-60 | තොග 61 කට වැඩි |
| A | සාමාන්‍ය බෙදුම්පල සඳහා (පහත B,C,D,E කාණ්ඩවලට අයත් නොවන බෙදුම්හල් සඳහා) ලීටරයකට රුපියල් | 6.60 | 6.90 | 6.90 | 6.90 |
| B | කි.මී.15 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 7.51 | 6.90 | 6.90 | 6.90 |
| C | කි.මී.10 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 7.22 | 6.90 | 6.90 | 6.90 |
| D | කි.මී.5 ක අවම මාර්ග දුරක වෙනත් බෙදුම්පලක් නොමැති ප්‍රදේශයක පිහිටි බෙදුම්පල සඳහා ලීටරයකට රුපියල් | 6.92 | 6.90 | 6.90 | 6.90 |
| E | ආරම්භක සංවර්ධනයේ සිට වසර 05 කාලයක් ඇති නව පිරවුම්හල් සඳහා ලීටරයකට රුපියල් | 7.51 | 6.90 | 6.90 | 6.90 |

(iv) ඛනිජ තෙල් පනතේ ප්‍රතිපාදන අනුව, ඛනිජ තෙල් සංස්ථාව විසින් කාලීන අවශ්‍යතා පදනම් කරගෙන කාලීනව කොමිස් මුදල තීරණය කරනු ලැබේ.

කොමිස් මුදල තීරණය වීමේදී, ප්‍රවාහන වියදම්, විදුලි වියදම්, ජල ගාස්තු, සුබසාධන වියදම්, දුරකථන හා අන්තර්ජාල බිල්පත්, මුද්‍රණ වියදම්, ගොඩනැගිලි නඩත්තුව, යන්ත්‍ර සූත්‍ර නඩත්තුව, මානව සම්පත්, පරිපාලන, වෙනත් වියදම්, මෙහෙයුම් ශුද්ධ ලාභය, බදු යන සාධක සලකා බලනු ලැබේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ණය ආපසු ගෙවීමේදී ඩොලර් මිලියන 2.5ක් අහිමි වීම සම්බන්ධව COPF වාර්තාවෙන් කළ හෙළිදරව්ව
### கடனைத் திருப்பிச் செலுத்துகையில் ஏற்பட்ட 2.5 மில்லியன் அமெரிக்க டொலர் இழப்பு தொடர்பான COPF அறிக்கையின் வெளிப்படுத்தல்கள்
### REVELATIONS MADE BY COPF REPORT ON LOSS OF US DOLLARS 2.5 MILLION IN DEBT REPAYMENT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

2026 ජුලි 10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාව මඟින් අනාවරණ කර ඇත්තේ 2025 නොවැම්බර් සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ ඕස්ට්‍රේලියාවේ Export Finance Australia වෙත ගෙවිය යුතු විදේශ ණය වාරික සම්බන්ධයෙන් සිදු වූ සයිබර් වංචාවක් හේතුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක රාජ්‍ය මුදලක් අහිමි වී ඇති බවත්, එමඟින් ශ්‍රී ලංකාවට විදේශ ණය හිඟයක් ඇති වූ බවත්ය. කාරක සභාව තවදුරටත් සඳහන් කර ඇත්තේ, මෙම සිදුවීම හුදෙක් තාක්ෂණික දෝෂයක් නොව, පාලන, ක්‍රියාපටිපාටි සහ මෙහෙයුම් මට්ටම්වල පැවැති පද්ධතිමය දුර්වලතා සහ අභ්‍යන්තර පාලන අසාර්ථක භාවයේ ප්‍රතිඵලයක් බවයි.

මෙම බරපතළ සිද්ධිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න ගරු මුදල් අමාත්‍යතුමා වෙත යොමු කරන අතර, ඒ සම්බන්ධයෙන් පැහැදිලි, නිශ්චිත සහ වගකීම්සහගත පිළිතුරු අපේක්ෂා කරනවා.

1. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් මෙම සිදුවීම පාලන, ක්‍රියාපටිපාටි සහ මෙහෙයුම් ක්‍රියාවලියේ පද්ධතිමය අසාර්ථකත්වයක් ලෙස හඳුනාගෙන ඇති අතර, රජය විසින් එම නිගමනය සහ නිර්දේශ පිළිගනු ලබන්නේද?

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2. මෙම සිදුවීමෙන් අහිමි වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක - ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක - මුදල නැවත අයකර ගැනීම සඳහා රජය ගෙන ඇති නීතිමය, මූල්‍යමය සහ ජාත්‍යන්තර ක්‍රියාමාර්ග මොනවාද? එම උත්සාහයේ වත්මන් ප්‍රගතිය කුමක්ද?

අහිමි වුණු ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක මුදල නැවත ගෙවනකොට ගෙවනු ලබන්නේ මේ රටේ බදු ගෙවන්නන්ගේ අරමුදල්වලින්ද කියන කාරණය අපි දැන ගන්නට කැමැතියි.

3. මහ බැංකුව 2025 නොවැම්බර් 26වැනි දින ණය හිමියාගේ ගිණුම් විස්තර සැක සහිත බවට ලිඛිත අනතුරු ඇඟවූ පසුත් මුදල් අමාත්‍යාංශය සැබෑ ණය හිමියා වෙනුවට වංචාකරුවන්ගෙන්ම ගිණුම් විස්තර තහවුරු කළේ කුමන පදනමකින්ද?

ඒක බරපතළ තත්ත්වයක්. මහ බැංකුව විසින් සැක සහිත බවට ලිඛිතව අනතුරු ඇඟෙව්වත් මුදල් අමාත්‍යාංශය ඒක ගණන් ගන්නේ නැතුව වංචාකාරයාගෙන්ම ඒ තොරතුරු අරගෙන ඒ මුදල් යවනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි දැන ගන්න කැමැතියි, මේකට අදාළ දේශපාලන සහ පරිපාලන වගකීම භාර ගන්නේ කවුද කියලා. එහෙම නැත්නම් මේ රජය වගකීම් භාර නොගැනීමේ සංස්කෘතියක් නිර්මාණය කරන බව පෙනෙනවා නේද කියන එක තමයි අපට අහන්න තිබෙන්නේ. ඒක නිසා එහි වගකීම කවුරුත් භාර ගන්නේ නැද්ද?

4. JP Morgan Fraud Team විසින් - JP Morgan එකේ වංචා හඳුනා ගැනීමේ කණ්ඩායම විසින් - වංචා අවදානම පිළිබඳව අනතුරු ඇඟවීමෙන් පසුවත් Mish Global LLC වෙත තවත් ගෙවීමක් සිදු වූයේ කෙසේද?

අනතුරු ඇඟවීමකින් පසුවත් කොහොමද ඒ ගෙවීම සිදු වූයේ? ඒ සඳහා වගකිව යුත්තේ කවුරුන්ද? කවුද මේකට වගකියන්නේ?

5. Export Finance Australia වෙත ගෙවිය යුතු රාජ්‍ය ණය මුදල්, United Arab Emiratesහි පෞද්ගලික සමාගම් වෙත යොමු වූ විට ප්‍රතිලාභියාගේ නම පවා සංසන්දනය කරන්නේ නැතුව ගෙවීම් අනුමත කළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග අරගෙන තිබේද?

6. CID, ඒ වාගේම SLCERT සහ මහ බැංකුව සියල්ල පිළිබඳ අනතුරු ඇඟවූ පසුවත් ගෙවීම් නතර නොකිරීම රාජ්‍ය මුදල් ආරක්ෂා කිරීමේ වගකීම පැහැර හැරීමක් නොවේද?

7. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ - CoPF එකේ - වාර්තාවට අනුව Public Debt Management Office - රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාල - සංක්‍රාන්තිය සඳහා නිසි ක්‍රියාමාර්ග, Key Performance Indicators සහ Terms of Reference නොතිබූ බව පිළිගන්නේද? එම පාලන අසාර්ථකත්වයට දේශපාලන වගකීම භාර ගන්නේ කවුරුන්ද?

CoPF වාර්තාව කියනවා, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සඳහා ලබා දුන් සංක්‍රාන්තිය ක්‍රියාමාර්ග, Key Performance Indicators සහ Terms of Reference තිබුණේ නැහැ කියලා. මොකක්ද ඒකට හේතුව සහ කවුද ඒ වගකීම භාරගන්නේ?

8. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් හා ජාතික විගණන කාර්යාලය මඟින් විදේශ ණය ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණනයක් පැවැත්වීම සහ රාජ්‍ය මූල්‍ය රෙගුලාසි කඩිනමින් සංශෝධනය කිරීම නිර්දේශ කර තිබියදී එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඊ-මේල් සර්වරය හරහා ඇතුළු වූ සයිබර් අපරාධයක ප්‍රතිඵලයක් විධියට මෙම සිදුවීම වෙලා තිබෙන බව දැනට තහවුරු වෙනවා. පැවති පාලන ක්‍රියා පටිපාටිවල යම් හිස්තැන් පැවත ඇති බවට හඳුනාගෙන තිබෙනවා. එම හිස්තැන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය - Public Debt Management Office - පිහිටුවීම නිසා ඇති වූ ඒවා නොවෙයි, දශක ගණනාවක සිට පැවත ඇති දේවල්. එබැවින් මෙම ක්‍රියාවලිය සුමට කිරීමට සහ ශක්තිමත් කිරීමට දැන් කඩිනමින් පියවර අරගෙන තිබෙනවා.

2. අදාළ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර, ඒවායේ ප්‍රගතිය මත ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරියේදී සභාවට දැනුම් දීමට හැකියාව තිබෙනවා.

3. අදාළ පරීක්ෂණ කටයුතු තවමත් අවසන් කර නොමැති බැවින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරියේදී දැනුම් දෙනු ලබනවා.

4. අදාළ පරීක්ෂණ කටයුතු තවමත් අවසන් වී නොමැති බැවින් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරියේදී සභාවට දැනුම් දෙනු ලබනවා.

5. පරීක්ෂණ අවසන් වනතුරු නිලධාරින් හතරදෙනෙකුගේ සේවය දැනට අත්හිටුවා තිබෙනවා.

6. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව - CID එක - සහ ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි අනතුරු ඇඟවීමක් සිදු කර නොමැති අතර, SLCERT එක විසින් ඊමේල් සර්වරයේ පැවති අනාරක්ෂිත බව පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කර ඇත. දැනට සියලු ගෙවීම්වලට අදාළ ලේඛන භෞතිකව ලබාගෙන ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් ගෙවීම් සිදු කිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා.

7. මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව 2026.03.09වැනි දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සහ රාජ්‍ය ණය සේවාකරණයට අදාළ සියලු කාර්යන්, වගකීම් සහ බලතල භාරගෙන ඇත්තේ 2025 දෙසැම්බර් 01වැනි දින සිටය. ඒ අනුව මෙය රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ සංක්‍රාන්තිය නිසා ඇති වූවක් ය යන්න නිවැරදි නොවේ. මෙම කාල සීමාව තුළ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ නිලධාරින් ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රය තුළ සේවාස්ථ පුහුණුවක නිරතවෙමින් සිට ඇත. මෙම සංක්‍රාන්ති කාලය තුළ අදාළ සියලු කාර්යයන් මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ඇති වූ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

අන්‍යෝන්‍ය එකඟතාවන්, ණය කළමනාකරණ පනතේ ප්‍රතිපාදන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුවේ විශේෂඥ දැනුම අනුව සිදු කරන ලදී.

මෙම කරුණු පිළිබඳවද පරීක්ෂණ කටයුතු සිදුවන අතර, එහි ප්‍රගතියද ඉදිරියේදී සභාවට දැනුම් දෙනු ලබනවා.

8. CoPF වාර්තාවේ දෙවන නිර්දේශය පරිදි විශේෂ විගණනයක් සිදු කිරීම පිළිබඳව නිර්දේශ කර ඇත්තේ ගරු කථානායකතුමා වෙතය.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ නීතිමය රාමුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ දක්වා ඇති අතර, එහි විධිවිධාන අනුව මාර්ගෝපදේශ නිකුත් කර ඇත. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විශේෂඥයින්ගේ උපදේශකත්වය සහ තාක්ෂණික සහයෝගීතාව සහිතව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ සියලුම මෙහෙයුම් ආවරණය වන පරිදි එම කාර්යාලයට සුවිශේෂී වූ ප්‍රමිතිගත කාර්ය පටිපාටි සංග්‍රහයක් මේ වන විටද කෙටුම්පත් කොට ඇත. අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව 2026 අගෝස්තු මස සිට එම ප්‍රමිතිගත කාර්ය පටිපාටි සංග්‍රහය බලාත්මක කර සියලු ක්‍රියාවලීන් ඊට මුළුමනින්ම අනුකූල වන පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇත.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අමාත්‍යවරයා පුදුම සහගත පිළිතුරක් ලබා දුන්නා. ඔබතුමා මේ ප්‍රශ්නයට මීට වැඩිය විධිමත් ආකාරයේ පිළිතුරක් ලබා නොදීම ගැන මම කනගාටු වෙනවා.

ඔබතුමා දන්නවා Exim Bank of India එකටත්, එක්සත් රාජධානියට ඇමෙරිකන් ඩොලර් ලක්ෂ 12කුත්, ජර්මනියට යූරෝ ලක්ෂ 40කුත්, බෙල්ජියමට යූරෝ 60,000කුත් ඉතාම වංචා සහගතව යැවීම, ඒ තොරතුරු ලබා දීම වැනි බරපතළ වරදවල් ගණනාවක් සිදු වෙලා තිබෙන බව. එවැනි මොහොතක ඔබතුමා කියනවා, හිස්තැන් තිබුණා ලු. හැබැයි 2025 වර්ෂය අවසානයේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට මේ වගකීම මාරු වෙනකොට, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත හරහා මේ වෙනස්වීම සිදු වෙනකොට, ඒ තුළ සිදු වුණු අකර්මණ්‍යභාවයත්, නිසි ක්‍රමවේද සකස් නොකිරීමත් නොවෙයි ලු, මේකට හේතුව.

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ සම්පිණ්ඩනය මා සතුව තිබෙනවා. එයින් බොහොම පැහැදිලිව ප්‍රකාශ වෙනවා, මේ සංක්‍රාන්තික කාලය තුළ නිසි ක්‍රමවේද ටික සකස් වුණේ නැහැ කියන එක. දැන් ඔබතුමා කියනවා, සේවා පුහුණුවකුත් තිබුණා කියලා. ඒ කියන්නේ මේ නිලධාරින් සේවා පුහුණුවට යන කාලයට කාර්යාලීය ණය ගෙවීමේ ක්‍රියාවලිය අඩපණ වෙනවාද? පුදුම සහගත උත්තරයක් ඔබතුමා දෙන්නේ. ඇත්ත වශයෙන්ම 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත හරහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ඒ කියන්නේ Central Bank එක සතුව තිබුණු වගකීමක් වන රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට - PDMO එකට - මාරු වෙනකොට ඔබතුමන්ලා හරියාකාර ක්‍රමවේද, වැඩ පිළිවෙළ, operating procedures ටික ස්ථාපනය නොකිරීම තුළ අපේ රටට ඩොලර් ලක්ෂ 25ක් අහිමි වුණා. ඔබතුමා මේ සත්‍ය පිළිනොගන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි. ඒ වාගේම මේකට වගකිව යුත්තේ කවුද කියන එක පිළිබඳව ප්‍රශ්න කළාම, ඔබතුමා උත්තරයක් දුන්නේ නැහැ. මේකට වගකිව යුත්තේ කවුද ?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, පළමුකොටම මම මේ කාරණය සඳහන් කරන්නට ඕනෑ. ගරු විපක්ෂ නායකතුමා මතු කරපු කාරණයේදී කිව්වා, තවත් රටවල්වලට මුදල් ගෙවීමක්, යැවීමක් පිළිබඳව. වෙනත් රටවලට එවැනි කිසිදු මුදල් ගෙවීමක් සිදු වෙලා නැහැ. මේ ඉදිරිපත් කරලා තිබෙන CoPF වාර්තාවේ පවා මේක සයිබර් අපරාධයක් බව වාර්තා වෙලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, සයිබර් අපරාධයකට විවිධ ආකාරයට උත්සාහ දරලා තිබෙනවා. නමුත් කිසිදු ආකාරයකින් වෙනත් රටකට මුදල් ගෙවලා නැහැ. ඒ වාගේම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට මේ වගකීම පැවරීම නිසා මෙය සිදුවුණා කියලා කිසිදු තැනක කිසිදු වාර්තාවක ලියලා නැහැ. තවමත් මේ පිළිබඳ පරීක්ෂණ සිදුවෙමින් පවතිනවා. මෙහි ඉතාම පැහැදිලිව තිබෙන්නේ, සයිබර් අපරාධයක් මඟින් emails compromise කිරීමට මැදිහත් වීම නිසා තමයි මේක සිදුවෙලා තිබෙන්නේ කියන එකයි. අපි මුල ඉඳලාම කිව්වා, මේකට පුද්ගලයන්ගේ සම්බන්ධයක් තිබෙනවාද, ඇතුළේ හෝ බාහිර පාර්ශ්වයන්ද, වෙනත් ආකාරයක තාක්ෂණය ලැබිලා තිබෙනවාද කියලා සොයා බලනවා කියලා. මේක සංකීර්ණ ක්‍රියාවලියක් නිසා තමයි මේ පරීක්ෂණ දීර්ඝව සිදුවෙන්නේ. ඉදිරියේ දී මේ පරීක්ෂණවල ප්‍රතිඵල අපි සභාවට වාර්තා කරනවා.

ඒ වාගේම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මහ බැංකුව සමඟ ඒකාබද්ධ වෙලා වැඩ කටයුතු කිරීමේදී එකඟතාවන් මත ඇති කරගන්නා ලද නව ක්‍රියාමාර්ගත්, මූල්‍ය විනය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාමාර්ගයත් මේ අගෝස්තු මාසයේදී ක්‍රියාත්මක කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

# II

## "අස්වැසුම" ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක

"அஸ்வெசும" பயனாளிகளைத் தேர்ந்தெடுப்பதற்கான ஏற்றுக்கொள்ளப்பட்ட அளவுகோல்கள்

CRITERIA ADOPTED FOR SELECTING "ASWESUMA" BENEFICIARIES

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති එකඟතාවන්ට අනුව 2026 දෙසැම්බර් මස වන විට "අස්වැසුම" සුබසාධන වැඩසටහනෙන් දුප්පත් පවුල් 400,000ක් ඉවත් කිරීමට නියමිත බවත්, එසේ ඉවත් කරන පවුල් වෙනුවට සමාන සංඛ්‍යාවක් නැවත වැඩසටහනට ඇතුළත් කිරීමට රජයේ අදහසක් නොමැති බවත්, තවද 2023 දී ආරම්භ කරන ලද අස්වැසුම වැඩසටහන මඟින් අතිශය දුප්පත්, දුප්පත්, අවදානම් සහ සංක්‍රාන්ති යන කාණ්ඩ හතර යටතේ ප්‍රතිලාභීන් මිලියන 1.6කට ආසන්න සංඛ්‍යාවක් ආවරණය කර තිබූ බවටත් පළ වූ වාර්තා සැලකිල්ලට ගනිමින්, එතුමා පහත කරුණු සම්බන්ධයෙන් මෙම සභාවට දැනුම් දෙන්නේද?

1. අද දින වන විට අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව අතිශය දුප්පත්, දුප්පත්, අවදානම් සහ සංක්‍රාන්ති යන එක් එක් කාණ්ඩ අනුව වෙන වෙනම කීයද?

2. දිස්ත්‍රික්ක අනුව,

   (i) පොරොත්තු ලේඛනයේ සිටින අයගේ සංඛ්‍යාව,

   (ii) අභියාචනා ඉදිරිපත් කර ඇති අයගේ සංඛ්‍යාව,

   (iii) තහවුරු කිරීම සඳහා බලාපොරොත්තුවෙන් සිටින අයගේ සංඛ්‍යාව කීයද?

3. නවතම නිල සංඛ්‍යාලේඛන අනුව ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයෙකුට මාසිකව ජීවත්වීමට අවශ්‍ය අවම වියදම රුපියල්වලින් කොපමණද? එම ගණනය කිරීම යථාර්ථවාදී බව රජය පිළිගන්නේද?

4. අස්වැසුම මුදල් ප්‍රතිලාභ සඳහා වැය වන

   (i) මාසික මුළු වියදම,

   (ii) වාර්ෂික මුළු වියදම,

   (iii) එක් ප්‍රතිලාභී පවුලකට ලැබෙන සාමාන්‍ය මාසික මුදල කීයද?

5. සමීක්ෂණ, සුදුසුකම් තහවුරු කිරීම, අභියාචනා විභාග කිරීම, තොරතුරු තාක්ෂණ පද්ධති, බැංකු ගාස්තු, නිලධාරින්ගේ සේවය හා අධීක්ෂණය ඇතුළුව අස්වැසුම ක්‍රියාත්මක කිරීම සඳහා වැය වන සමස්ත පරිපාලන වියදම කොපමණද?

6. ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි මට්ටමින් අස්වැසුම වැඩසටහන පරිපාලනය කිරීම සඳහා යොදවා ඇති රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව කොපමණද?

7. අද දින වන විට ශ්‍රී ලංකාවේ මුළු පවුල් සංඛ්‍යාව කොපමණද? එම පවුල් ආදායම් මට්ටම් හා සුබසාධන ප්‍රතිලාභ ලැබීමේ සුදුසුකම් අනුව කෙසේ වර්ගීකරණය කර තිබේද? එම තොරතුරු දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද?

8. අස්වැසුම සඳහා සුදුසුකම් තීරණය කිරීම, ප්‍රතිලාභ අත්හිටුවීම, ප්‍රතිලාභ අඛණ්ඩව ලබා දීම සහ අභියාචනා තීරණය කිරීම සඳහා භාවිත කරන

   (i) නිශ්චිත නිර්ණායක,

   (ii) ලකුණු ලබා දීමේ ක්‍රමවේදය,

   (iii) දත්ත මූලාශ්‍ර මොනවාද?

   ගරු කථානායකතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් TIN එකක් දීලා තිබෙන අයටත් 'අස්වැසුම' ලැබිලා තිබෙනවා. සමහර වෙලාවට රජයේ නිලධාරින්ටත් ලබා දීලා තිබෙනවා. 30,000කට ලබා දීලා තිබෙනවා කියන හෙළිදරව්ව කර තිබෙනවා.

9. වාර්ෂිකව අස්වැසුම වැඩසටහනට ඇතුළත් වන හා ඉවත් වන පවුල් සංඛ්‍යාව කොපමණ ද? සැබෑ ලෙසම දුප්පත් පවුල් වැරදි ලෙස වැඩසටහනෙන් ඉවත් නොවන බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක ස්වාධීන සත්‍යාපන ක්‍රමවේදය කුමක්ද?

10. වයස අවුරුදු 35ට අඩු පුද්ගලයන් විසින් ප්‍රධානත්වය දරන අස්වැසුම ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද? ඔවුන් ස්වයංපෝෂිත තත්ත්වයට පත් කිරීම සඳහා ලබා දෙන රැකියා, වෘත්තීය පුහුණු හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් මොනවාද?

11. අස්වැසුම වැඩසටහන් දේශපාලන පක්ෂපාතිත්වයෙන්, ප්‍රාදේශීය බලපෑම්වලින් සහ පරිපාලනමය අක්‍රමිකතාවලින් තොරව විනිවිදභාවයෙන් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම සඳහා පවතින ආරක්ෂක ක්‍රමවේද මොනවාද?

12. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ සම්පූර්ණ ක්‍රමවේදය, දිස්ත්‍රික්ක අනුව ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව, පොරොත්තු ලේඛන, අභියාචනා ප්‍රතිඵල, පරිපාලන වියදම් සහ වාර්ෂිකව වැඩසටහනට ඇතුළත් වන හා ඉවත් වන පවුල් පිළිබඳ සම්පූර්ණ දත්ත පාර්ලිමේන්තුවේ සභාගත කරන්නේද?

13. අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහනෙන් පවුලක් ඉවත් කිරීමට පෙර එම පවුල දරිද්‍රතාවෙන් සැබෑ ලෙසම මිදී ඇති බවත්, තවදුරටත් රාජ්‍ය ආධාර නොමැතිව ස්වාධීනව තම ජීවනෝපාය පවත්වා ගෙන යා හැකි බවත් තහවුරු කිරීම සඳහා භාවිත කරන නිල ඇගැයීම් ක්‍රමවේදය, දර්ශක සහ නිර්ණායක මොනවාද?

ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න පත්තරයක්ම - ප්‍රශ්න 13ක්ම - තිබෙනවා. මම කෙටියෙන් ඒවාට පිළිතුරු ලබා දෙන්නම්.

1. මෙම ප්‍රධාන වර්ගීකරණයට අනුව ජූලි මාසය වන විට severely poor කියන category එක යටතේ 415,411ක්, දුප්පත් කියන කාණ්ඩය යටතේ 848,392ක් සහ අවදානම් - vulnerable - කියන කාණ්ඩය යටතේ 18,233ක් සිටිනවා. ඒ කියන්නේ, එතැන තිබෙන්නේ arrears පමණයි. මෙහි එකතුව 1,282,036ක් වෙනවා, ජූලි මාසයට තිබෙන හිඟ payments සහිතව.

2. මෙම ප්‍රශ්නයට පිළිතුර දිස්ත්‍රික්ක වශයෙන් කියනවා වෙනුවට මම මුළු එකතුව කියන්නම්. අභියාචනා - appeal - සහ විරෝධතා ප්‍රකාශ කරන්න පුළුවන්, මෙම ක්‍රියාවලිය ඇතුළේ. ඒ අනුව මේ වනකොට එහි මුළු එකතුව 67,860ක් වනවා. එම අභියාචනා සහ විරෝධතාවලට ප්‍රාදේශීය ලේකම් මට්ටමින් අනුමැතිය ලැබීමට - pending - තිබෙනවා, 7,839ක්. ඊළඟට, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙන් අනුමත කළත් තවම ප්‍රකාශයට පත් කළේ නැති සංඛ්‍යාව විධියට 1,022ක් තිබෙනවා. ඒ වාගේම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙන් approval pending විධියට 1,479ක් තිබෙනවා.

ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත දක්වා තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

| District | Total Appeals and Objec-tions | DS | WBB | |
|---|---|---|---|---|
| | | Approval Pending | Approval not Published | Approval Pending |
| Colombo | 3,404 | 314 | 23 | 181 |
| Gampaha | 2,524 | 216 | 29 | 34 |
| Kalutara | 3,064 | 639 | 37 | 148 |
| Kandy | 4,193 | 475 | 40 | 62 |
| Matale | 2,438 | 229 | 9 | 5 |
| Nuwara Eliya | 4,070 | 1,492 | 17 | 162 |
| Galle | 3,105 | 280 | 42 | 22 |
| Matara | 2,766 | 153 | 29 | 18 |
| Hambantota | 1,316 | 106 | 6 | 24 |
| Jaffna | 2,876 | 66 | 80 | 39 |
| Mannar | 724 | 87 | 10 | 42 |
| Vavuniya | 483 | 110 | 2 | 3 |
| Mullaitivu | 560 | 44 | 1 | 32 |
| Kilinochchi | 850 | 91 | 0 | 3 |
| Batticaloa | 3,159 | 139 | 20 | 62 |
| Ampara | 3,761 | 323 | 80 | 89 |
| Trincomalee | 2,249 | 292 | 25 | 13 |
| Kurunegala | 3,690 | 442 | 71 | 44 |
| Puttalam | 2,313 | 298 | 53 | 15 |
| Anuradhapura | 2,158 | 326 | 47 | 11 |
| Polonnaruwa | 2,588 | 331 | 34 | 63 |
| Badulla | 6,611 | 623 | 261 | 280 |
| Monaragala | 1,723 | 368 | 19 | 15 |
| Ratnapura | 3,294 | 239 | 44 | 39 |
| Kegalle | 3,941 | 156 | 43 | 73 |
| | 67,860 | 7,839 | 1,022 | 1,479 |

3. මේ ගණන් හැදීම සිද්ධ කරන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුවයි. එය අවසන් වරට සිදු කර තිබෙන්නේ 2019දී. නමුත් ඒගොල්ලන් තිබෙන දර්ශක පාවිච්චි කරගෙන මාසයෙන් මාසයට ගණනය කිරීමක් කරනවා. මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ "cost to live" කියලා. නමුත් මෙහි තිබෙන්නේ "cost to live" වශයෙන් නොවෙයි. මෙම ගණනය කිරීම් කර තිබෙන්නේ ආහාර අවශ්‍යතාව සඳහා සහ මූලික අවශ්‍යතා සඳහායි. ඒ අනුව දළ වශයෙන් රුපියල් 17,315ක මුදලක් තමයි පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා සඳහා වෙන් වෙලා තිබෙන්නේ.

4. 2025 වසරේදී අස්වැසුම ප්‍රතිලාභ සඳහා වාර්ෂිකව වැය වුණු මුළු වියදම රුපියල් බිලියන 151.364ක් වනවා. මාසික වියදම විධියට රුපියල් බිලියන 12.613ක් වැය වී තිබෙනවා. ඒ වාගේම සමස්ත වියදම beneficiariesලාගෙන් බෙදුවාම මාසයක සාමාන්‍ය අගය රුපියල් 7,500ක් වනවා.

5. පරිපාලන වියදම් වශයෙන් රුපියල් බිලියන 1.5ක් 2026 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබෙනවා. 2026 ජූනි මාසය වනකොට එයින් රුපියල් මිලියන 153.6ක් ගෙවා තිබෙනවා. ඒ අනුව එහි අඩු ප්‍රගතියක් තිබෙන්නේ. ඒ නිසා මේ වන විට එම සමීක්ෂණ නිලධාරීන්ට ගෙවිය යුතු මුදල වැඩි කර, ඒ ප්‍රමාණ අනුමත කරලා තිබෙනවා. ඒවා ඉදිරියේදී ගෙවනවා. දළ වශයෙන් ගත්තාම පරිපාලන වියදම රුපියල් බිලියන 1.5ක් වනවා.

6. ජාතික මට්ටමින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 48දෙනෙක් ඇතුළුව 60දෙනෙක් වැඩ කටයුතු කරනවා. දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අතිරේක ප්‍රාදේශීය ලේකම්වරුන් සහිතව 50දෙනෙක් ඉන්නවා. ඒ වාගේම කොට්ඨාස මට්ටමින් - divisional level මට්ටමින් - 687දෙනෙක් ඉන්නවා, මෙම කාර්යයන් කිරීම සඳහා.

7. ලංකාවේ ජීවත් වන සමස්ත පවුල් සංඛ්‍යාව 6,111,315යි. අස්වැසුම සඳහා සුදුසුකම් ලබා තිබෙන කාණ්ඩයට වැටෙන, ජූලි මාසය වනකොට අපි මුදල් ගෙවා තිබෙන පවුල් සංඛ්‍යාව 1,224,459ක් වනවා.

8. අංක 2358/15 දරන ගැසට් නිවේදනය යටතේ 2023 නොවැම්බර් 14වන දින මේ නිර්ණායක ඉදිරිපත් කරලා තිබෙනවා. එහි සාරාංශයක් කිව්වොත්, නිර්ණායක 22ක් තිබෙනවා. ඒක හදලා තිබෙන්නේ Multidimensional Poverty Index එක පදනම් කරගෙන. ඒ නිර්ණායක 22 ක්ෂේත්‍ර 6ක් යටතේ තමයි තිබෙන්නේ. අධ්‍යාපනයට නිර්ණායක දෙකකුත්, සෞඛ්‍යයට නිර්ණායක දෙකකුත්, ආර්ථික මට්ටමට නිර්ණායක තුනකුත්, වත්කම් සම්බන්ධයෙන් නිර්ණායක හතකුත්, නිවාසවල තත්ත්වය සම්බන්ධයෙන් නිර්ණායක හයකුත්, demography සම්බන්ධයෙන් නිර්ණායක දෙකකුත් සහිතව ඉදිරිපත් කර තිබෙනවා.

9. දැනට recertification process එක සිදු වෙමින් පවතිනවා. මේක සිදු වුණාට පස්සේ තමයි අපට ඒ අදාළ සංඛ්‍යා ඉදිරිපත් කරන්න පුළුවන් වන්නේ. ප්‍රතිශතයක් විධියට ගත්තාම recertification process එක සියයට 67ක ප්‍රගතියක් වාර්තා කර තිබෙනවා.

10. මේ සඳහා අවශ්‍ය තොරතුරු එකතු කර ගැනීමට යම් කාලයක් අවශ්‍ය වන නිසා, මේ මොහොතේ 10වන ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට හැකියාවක් නැහැ.

11. මීට අදාළ පිළිතුර මම ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නම්.

- The "Aswesuma" programme assures 100 per cent transparency and that there is no political or administrative manipulation in selections. Example එකක් විධියට ඉදිරිපත් කළොත්, the entire enumeration is done by government officers on proper guidlines made under the Regulations of the Welfare Benefits Act.
- The selection criteria is prepared and verified at divisional secretariat level. Selection data is verified by a special committee appointed at divisional secretariat level.
- Monitoring and supervision is done by an administrative mechanism where the Grama Niladari and appointed officers are involved throughout the enumeration process.
- The data list certified by the Selection Committee will be published and handed over to the divisional secretariat for recommendation and further verification and observations would be done through Community Development Committees at the grassroots level.
- A Grievances Redress Mechanism - GRM - is implemented at the village level with a GRM committee appointed to collect data and solve public grievances.
- After the beneficiary list is published, an appeal and objection process is available for the public to submit their objections or appeals for selections.
- In addition, any citizen or beneficiary has the opportunity to submit their appeal or objection or to collect information through WBIU at the DS level.

- A national dashboard is available for the general public to get information about selections and updates.

Therefore, we can guarantee that there is no politicization involved in selections and that it is done purely through a systematic mechanism at the grassroots level. The evaluation board is headed by the Divisional Secretary. Once a list is approved, it is sent to the Welfare Benefits Board. The Welfare Benefits Board also scrutinizes it on a sample basis, and the selections would be done purely on those 22 criteria that I mentioned without any personal, arbitrary or discretionary involvement.

12. ඔව්.

13. The Welfare Benefits Board is planning to conduct such an assessment in the near future.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙනවා. කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම පෙර අහපු ප්‍රශ්නයට සෘජු උත්තරයක් ලැබුණේ නැහැ. 30,000කට පමණ මේ අස්වැසුම ප්‍රතිලාභය ලැබෙනවා කියන එක වාගේම රුපියල් 17,740කින් අපේ රටේ එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියා කියන එකත් ඔබතුමා පිළිගන්නවාද? ඒ වාගේම ලෝක බැංකුව කියා තිබෙනවා, අපි මධ්‍යම ආදායම් සහිත රටක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම, අපේ රටේ තිබෙන පවුල් ඒකක 6,153,000න් සියයට 53ක් අස්වැසුම සහනාධාරය ලබනවා හෝ එය ලැබීම සඳහා යොමු කිරීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙනවාය කියලා ලෝක බැංකුවම වාර්තා කරනවා. ගරු ඇමතිතුමනි, මේක ඔබතුමා ඉදිරිපත් කළ උත්තරයට පරස්පරයි. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාට බලන්න පුළුවන් වන්නේ කොයි ආකාරයෙන්ද? මොකද, යම් විධියකින් ලක්ෂ 4ක පවුල් ප්‍රමාණයක් එළියට එනවා නම්, ඒගොල්ලන්ව සවිබලගැන්වීමක් ඇති කර තිබෙන නිසා නේ එළියට එන්න අවශ්‍ය වන්නේ. නැත්නම් ඒගොල්ලන් තවමත් දුප්පත්කමේ සිටින්නේ. ඒ පරස්පර මතය මේ තුළින් ඉදිරිපත් වන්නේ කොහොමද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන දත්ත අනුව අපි ඉදිරිපත් කළේ නිශ්චිත වශයෙන්ම අස්වැසුම වැඩසටහන තුළ දියත් කරන ක්‍රියාවලිය. ඒ කියන්නේ, සමාජ සුබසාධන මණ්ඩලය හරහා social spending සඳහා වූ ක්‍රියාවලියක්. ඒ වාගේම අතීතයේදීත් යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මෙහි අරමුණු බවට පත් වන්නේම පළමුකොටම social registry එක හදා ගන්න එක. ඒ කියන්නේ, මේ data system එක. ඇත්තටම ඒක අපේ ආණ්ඩුව එන්න කලින් ආරම්භ වෙලා තිබුණු වැඩසටහනක්. ඒ දත්ත පද්ධතිය හදා ගැනීමේත් අඩුපාඩු ගණනාවක් තිබෙනවා. ඒ වාගේම, මේ criteria ඇතුළේ තෝරා ගැනීමේදීත් අඩුපාඩු තිබෙනවා. ඒවා අපි ක්‍රමයෙන් සකස් කරමින් ඉන්නවා.

සමස්තයක් වශයෙන් ගත්තාම, රටේ තිබෙන ප්‍රශ්නයක් වන දුප්පත්භාවයෙන් ජනතාව මුදා ගැනීම කියන කාරණය මේ අස්වැසුම සහනාධාරය මඟින්ම විසඳන්න බැහැ. මේ තිබෙන්නේ තාවකාලිකව සමාජ වියදම් කිරීම හරහා ඔවුන් සවිබලගැන්වීම සඳහා යොමු කර ගැනීමයි. ඒ සඳහා අපේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය තුළ විවිධ වූ වැඩසටහන් ගණනාවක් යෝජනා කර තිබෙනවා. ගමේ තිබෙන ප්‍රශ්න හඳුනා ගැනීම සඳහා සමාජ සංවර්ධන කමිටු පිහිටුවීම, රුපියල් බිලියන 25ක් මේ සඳහා වෙන් කිරීම, කාන්තාවන් සවිබලගැන්වීම ආදී වැඩසටහන් ගණනාවක් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ සිද්ධ කරන ගමන් අනෙක් අමාත්‍යාංශ යටතේත් එවැනි වැඩසටහන් සිදු කරමින් තිබෙනවා. නමුත්, අපිට මේ කාරණය පිළිගන්න වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

දුප්පත්කම කියන්නේ structural issue එකක්. එවැනි ගැටලුවක් අපට අවුරුදු දෙකක් වාගේ කාලයකදී විසඳන්න බැහැ. හැබැයි, අපි ඒ ගැටලුව විසඳීමේ මාර්ගයේ ඉන්නවා. එතකොට එක් පුද්ගලයෙකුට මාසයක් ජීවත් වීමට රුපියල් 17,315ක් අවශ්‍යයි කියන එක දැනට තිබෙන දත්ත අනුව හුදෙක් ගණනය කරලා ඉදිරිපත් කරන එකක් විතරයි. ඒ අනුව තමයි දැනට ලෝක බැංකුවෙන් හෝ වෙනත් ආයතනයකින් තහවුරු කළාට පසුව ඩොලර් 3.5 සීමාව poverty line එක ලෙස සලකා තිබෙන්නේ. මොකද, අපේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,004යි. ඔබතුමා සඳහන් කළා වාගේ අපේ රටේ ඒක පුද්ගල දළ ජාතික ආදායම පදනම් කරගෙන අපි ඉහළ මැදි ආදායම් කාණ්ඩයට ළඟා වෙලා තිබෙනවා. එය ඩොලර් 4,670ක්. අපේ purchasing power parity එක ටිකක් ඉහළින් තිබෙන්නේ. නමුත් මෙයින් අදහස් කරන්නේ නැහැ, සමස්තයක් වශයෙන් රටේ සියලු ප්‍රශ්නවලට උත්තර ලැබිලා තිබෙනවා කියලා. මේ දත්ත පදනම් කරගෙන වාගේම ඔබතුමා ඉදිරිපත් කරපු අදහස්ද පදනම් කරගෙන අපි ඉදිරියේදී ක්‍රමිකව ක්‍රියාමාර්ග ගන්නවා, අප සැබෑ ලෙස මුහුණ දෙන දුප්පත්භාවය මේ රටින් තුරන් කර ගැනීමට. ඒ වෙනුවෙන් විශාල කාලයක් ගත වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත
### விலங்குகள் (திருத்தம்) சட்டமூலம்
### ANIMALS (AMENDMENT) BILL

"1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා විසිනි.***

***2026 අගෝස්තු 04වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation; to be read a Second time upon Tuesday, 04th August, 2026*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability.*

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත

### தேசிய நீர் வழங்கல், வடிகால் சேவைகள் சபை (திருத்தம்) சட்டமூலம்

### NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD (AMENDMENT) BILL

"ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු සුසිල් රණසිංහ මහතා විසිනි.***

***2026 අගෝස්තු 04වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon.(Dr.) Susil Ranasinghe, Minister of Housing, Construction and Water Supply; to be read a Second time upon Tuesday, 04th August,2026*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්

### பாராளுமன்ற அமர்வு

### SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ කටයුතු

### பாராளுமன்ற அலுவல்

### BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජූලි 22 බදාදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

### கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

### SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2025 නොවැම්බර් 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව, 2026 ඔක්තෝබර් 21 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණ දෙකක් අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය
## பாராளுமன்ற நிலையியற் கட்டளைகளின் கீழான தீர்மானம்
## DECISION UNDER THE STANDING ORDERS OF PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය" පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.04.02 දින සිදුකරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025 ඔක්තෝබර් 24 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 318 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි."

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 දරන යෝජනාව ද මා ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Nishantha Samaraweera to start the Debate. You have 14 minutes.

[පූ.භා. 11.23]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, අද දවසේ ඉතාම වැදගත් සාකච්ඡාවක් සඳහා යොමු වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල යම් වෙනස්කමක් සහිතව මතු කර ගන්නා ලද COPE සහ COPAවල කටයුතු සම්බන්ධයෙන් අද දවසේ සිදු වන මේ සාකච්ඡාවට සම්බන්ධ වෙන්න ලැබීම සතුටක්.

විශේෂයෙන්ම පසුගිය වකවානුව ඇතුළත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන විශාල ප්‍රමාණයක් පිළිබඳව විමර්ශන සිදු කර තිබෙනවා. ඒ ආයතන සම්බන්ධව විමර්ශනය කරද්දී මතු වුණු විශේෂයෙන්ම දූෂණ, වංචා සහ අක්‍රමිකතා සම්බන්ධයෙන් මහජනතාවගේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරලා ඒ ආයතන පද්ධතිය පිළිබඳව විශේෂයෙන්ම අධ්‍යයනය කරලා COPE එක විධියට යම් කාර්යභාරයක් කළා. ඒ තමයි, අධ්‍යයනයන් සහිතව ඒ පිළිබඳව විමර්ශනය කරලා රටට නිශ්චිත කරුණු අනාවරණය කරන්න සැලැස්වීම. හැබැයි, අපි හිතනවා ඒක ප්‍රමාණවත් නැහැ කියලා. ඒ වාගේම රටේ මහජනතාවත් එහෙම හිතනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වැනි කාරක සභාවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මහජනතාවගේ අවධානය විශාල වශයෙන් යොමු වෙලා තිබෙන කාලයකයි අපි මේ ඉන්නේ. පසුගිය කාලය පුරා රටේ සිදු වෙච්ච දූෂණ, වංචා, අක්‍රමිකතා, නාස්ති ක්‍රියා සම්බන්ධයෙන් ජනතාවගේ තිබෙන අවධානය කොතරම්ද කියනවා නම්, ඊට සමාන්තර දැවැන්ත අවධානයක් COPE සහ COPA වෙනුවෙන් ද යොමු වෙලා තිබෙනවා.

අපි පසුගිය කාලය පුරාම සාමාන්‍ය වශයෙන් ගත්ත ක්‍රියාමාර්ගය practise කරමින් හිටියා. COPE එකට අදාළව ආයතන 457ක් විතර තිබෙනවා. නමුත්, ඒ ආයතන 457න් යම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් විවිධ විවාදාත්මක තත්ත්වයන් තිබෙනවා. සමහර ආයතන විගණනය කරන්න විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉඩ නොදෙන අවස්ථා අපට නිරීක්ෂණය වෙලා තිබෙනවා. එවැනි ආයතන ගණනාවක් තිබෙනවා. මෙවැනි තත්ත්වයන් යටතේ රටේ අවධානය විශාල වශයෙන් මේ කාරක සභාවට යොමු වෙලා තිබුණා. නමුත් අපට කරන්න පුළුවන්කම තිබුණේ, මෙතෙක් කාලයක් පාර්ලිමේන්තුව ඇතුළේ ඒ practise වෙමින් තිබිච්ච සාමාන්‍ය ක්‍රියාදාමය තුළ කටයුතු කිරීම පමණයි. ඒ ක්‍රියාදාමය ඇතුළේ වෙන්නේ මෙයයි. අදාළ ආයතනය පාර්ලිමේන්තුවට ගෙන්වනවා. ගෙන්වලා, විගණකාධිපතිවරයාගේ ගිණුම් වාර්තාව පදනම් කරගෙන යම් ක්ෂේත්‍ර ප්‍රමාණයක, යම් ගැටලු ප්‍රමාණයක් පිළිබඳව තවදුරටත් අධ්‍යයනයක් කළාට පසු ඒ කටයුත්ත අත හැරෙනවා. ඊට පසුව ඒකෙන් වාර්තාවක් පාර්ලිමේන්තුවට සභාගත කෙරෙනවා. ඒකත් මාස තුනකට වතාවක් පොදු වාර්තාවක් විධියට තමයි සභාගත වුණේ. මේක තමයි මෙතෙක් කල් පාර්ලිමේන්තුවේ තිබිච්ච ක්‍රියාවලිය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ස්ථාපිත කර තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 යටතේ. ඒ යටතේ තිබෙන කාරණා සම්පූර්ණයෙන් කියෙව්වාම පොදුවේ මතු වෙන කාරණයක් තිබෙනවා. 120 (3) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "....... රාජ්‍ය මුල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය"

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් රාජ්‍ය ව්‍යාපාරයක් සම්බන්ධව යම් නිරීක්ෂණයක්, අධීක්ෂණයක් කරනවා නම්, එහිදී අපි සමත් වෙන්න ඕනෑ, ඒ ආයතනය රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය නොවීම සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා නම් එය අනාවරණය කරගන්නත්, මූල්‍ය විනය සම්බන්ධ සියලු ගැටලු අනාවරණය කරගන්නත්, මතුවෙන ගැටලුවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කරන්නත්. විවිධ මට්ටම්වල නිර්දේශ දැනුම් දුන්නත් බොහෝ අවස්ථාවලදී ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් නැවත ගැටලු මතු වෙනවා අපි දැක තිබෙනවා. ඒ නිසා රාජ්‍ය ව්‍යාපාර පද්ධතිය එතරම් කළමනාකරණයකට ලක්වෙච්ච ආකාරයක් අපි දැක තිබුණේ නැහැ. ඒක එක කාරණයක්.

දෙවැනි කාරණය මේකයි. රටේ මහජනතාවගේ පැත්තෙන් දිගටම මතු වෙච්ච ප්‍රශ්නයක් තිබුණා, මෙලෙස පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සාකච්ඡා කරනු ලබන මේ ආයතනවල හෙළිදරව් වන

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

වංචා, දූෂණ, අක්‍රමිකතා සම්බන්ධ කාරණාවලට මොකද වෙන්නේ කියන එක සම්බන්ධව. ඒවා පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ රැඳිලා තිබෙනවා විතරයි, වෙන මොකුත් වෙන්නේ නැහැ කියන ප්‍රශ්නය තිබුණා. මේ වාර්තාව සභාගත කළාම කථානායකවරයාගේ අනුමැතිය යටතේ අවශ්‍ය නම් නීතිපතිවරයාට යවන්න පුළුවන්, නීතිපතිවරයා හරහා තවදුරටත් පරීක්ෂා කිරීමක් කරන්න පුළුවන් කියන කාරණය සම්මතයක් විධියට තිබුණා.

නමුත්, ඉතිහාසය තුළ මෙතෙක් කාලයක් එහෙම practice එකක් තිබිලා නැහැ. ඒ නිසා මහජනතාව දැක්කේ, COPE එක ඉදිරියට එන යම් ආයතනයක් එක්ක සාකච්ඡාවක් කෙරෙනවා, ඒක මාධ්‍යයෙන් ප්‍රචාරය වෙනවා, හැබැයි ඒකෙන් ඉදිරියට කිසිවක් වෙන්නේ නැහැ කියන එකයි. ඒ ගැටලුව තිබුණා. ඒ වාගේම, විපක්ෂයේ කණ්ඩායම් ඇතුළු බොහෝ කණ්ඩායම් ජන සමාජයේ තර්ක කරමින් ඉන්නවා, මේක ඇතුළේ නිලධාරින් භය වෙනවා කියලා. ඒකට හේතුව තමයි, මෙතෙක් කල් තිබුණු විවිධ ක්‍රියාමාර්ග හරහා ඒ වෙච්ච අක්‍රමිකතා පිළිබඳව වැඩිදුර විමර්ශනවලට නොයාම විසින්ම ඒ සඳහා බලය දෙන ලද දේශපාලනඥයන් මේ ක්‍රියාවලියෙන් බේරෙන තත්ත්වයක් තිබීම. එතකොට නිලධාරින්ට පමණයි, මේ ක්‍රියාවලියේ ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ නිසා අපි තීරණය කළා, මේ පිළිබඳව වේගයෙන් ක්‍රියාත්මක වීම සඳහා ස්ථාවර නියෝගවල යම් වෙනස්කමක් කිරීම අවශ්‍යයි කියලා. ඒ නිසා අපි ස්ථාවර නියෝගවල වෙනස්කමක් ඉල්ලුවා. ඒ අනුව ස්ථාවර නියෝග 119 හා 120 සඳහා වෙනස්කමක් විධියට, "අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත්, ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකිය" කියලා සංශෝධනයක් ඉදිරිපත් කළා. අපිට දැන් ඒක ලැබිලා තිබෙනවා. ඒ අනුව කලින් කියපු ගැටලුවලට විසඳුම් ලැබෙන පරිදි, ඒ ආයතනවලට අදාළව COPE එක හෝ COPA එක ඇතුළේදී කරනු ලබන නිරීක්ෂණ සම්බන්ධ වාර්තා, පැමිණිලි විධියට CID එකට හෝ Bribery Commission එකට භාර දෙන්න මෙතැන් සිට අපට හැකියාව ලැබෙනවා. මේක ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ විශේෂ අවස්ථාවක්. මෙතක් කාලයක් COPE එක හා COPA එක තිබුණාට, ඒවායේ කෙරෙන මූල්‍ය පිළිබඳ විමර්ශනවල ප්‍රගතිදායක, ගුණාත්මක ඉදිරි පිම්මක් විධියට තමයි අපි මේ අවස්ථාව සලකන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, පසුගිය කාලයේදී විමර්ශනය කරන ලද ආයතන 8කට අදාළව පැමිණිලි 23ක් විමර්ශනය සඳහා මේ සතිය ඇතුළත Bribery Commission එකට භාර දෙන්න. ඒ වාගේම, CID එකට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා විශේෂ අක්‍රමිකතා සම්බන්ධ කරුණු ගණනාවක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා අද මෙතැනදී මතු කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. ඇත්තටම COPE එක ගත්තාම, මේ ආයතන 457 වෙන වෙනම කැඳවා අවසන් කරන්න පුළුවන් ක්‍රියාවලියක නොවෙයි අපි ඉන්නේ. අපිට පාර්ලිමේන්තුවේ තිබෙන කාලය, එහෙම නැත්නම් මේ කාර්ය මණ්ඩලය සම්බන්ධ වෙලා කරන්න පුළුවන් කටයුතුවල ප්‍රමාණාත්මක සීමාවක් තිබෙනවා. ඒ නිසා අපි පසුගිය දවස්වල විශේෂ වැඩසටහන් දෙකක් පැවැත්වුවා. එකක් තමයි, මේ ආයතන 457ම එකවර මේ පාර්ලිමේන්තුවට කැඳවා - ඒවායෙහි සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරි කියන තනතුරු දරන නිලධාරින් කැඳවලා - ඔවුන් දැනුවත් කළා සහ ඔවුන් සමඟ සාකච්ඡාවක් කළා, මේ ආයතන පද්ධතිය ඇතුළේ තිබෙන අක්‍රමිකතා, එහෙම නැත්නම් අකාර්යක්ෂමතා නිවැරැදි කර ගන්නේ කොහොමද කියලා. ඒ ආයතන අධ්‍යයනය කරද්දී විශාල අක්‍රමිකතා අපි දකිනවා. ඒවා මඟහැර ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව අපි විශේෂයෙන්ම ඔවුන් සමඟ සාකච්ඡා කළා. එය ඉතා සාර්ථක සාකච්ඡාවක්.

ඒ වාගේම අපි දෙවනුව සාකච්ඡාව කළා, ඒ ආයතනවල අභ්‍යන්තර විගණක නිලධාරින් සහ මූල්‍ය අධ්‍යක්ෂවරුන් ඇතුළු මූල්‍ය සම්බන්ධව සහ අධීක්ෂණයන් සම්බන්ධව ඉන්න නිලධාරින් එක්ක. විශේෂයෙන්ම ජාතික විගණන කාර්යාලය, භාණ්ඩාගාරය යටතේ තිබෙන ජාතික අය වැය දෙපාර්තමේන්තුව, Department of Public Enterprises - DPE, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වාගේ ආයතන සම්බන්ධ කරගෙන ඔවුන්ගේ දැනුම, ඔවුන්ගේ හැකියාවන් සහ ඉලක්ක සංවර්ධනය කර ගනිමින්, මේ ආයතන පද්ධතිය ගොඩ නඟන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව අපි විශේෂ සාකච්ඡාවක් කරලා තිබෙනවා. මෙතෙක් කාලයක් කිසිම අවස්ථාවක ඒ ආයතන 457ම එකවර කැඳවා තිබුණේ නැහැ. අපි COPE එක විධියට එහෙම පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. ඔවුන් දැනුවත් කරලා තිබෙනවා. ඔවුන් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාර පද්ධතිය රාජ්‍යයේ පැවැත්ම උදෙසා, එහෙම නැත්නම් සමස්ත ශ්‍රී ලංකාවේ මහජනතාවගේ වුවමනා එපාකම් වෙනුවෙන් යොදවා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධව, නිශ්චිතව භාවිත කරන්න පුළුවන් ආකාරය සම්බන්ධව අපි ඔවුන් සමඟ සාකච්ඡා කර තිබෙනවා. අපි ඉදිරි පියවර ගණනාවක් යෝජනා කර තිබෙනවා.

මෙහිදී අපට දකින්න ලැබුණු තවත් විශේෂම දෙයක් තිබෙනවා. කියන්න කනගාටුයි ගරු කථානායකතුමනි, මෙතෙක් කාලයක් මේ ආයතන පද්ධතියෙහි ආයතන විශාල සංඛ්‍යාවක් නිසි සැලසුම් සහිතව නොවෙයි තිබුණේ. උදාහරණයක් ගත්තොත්, ආයතන පවත්වාගෙන යෑමේදී සකස් කර ගන්න ඕනෑ සංයුක්ත සැලැස්ම - Corporate Plan එක - බොහෝ ආයතන සතුව තිබුණේ නැහැ. එහෙම නැත්නම්, ඒක වෙනත් කිසිවෙකු විසින් හදලා දීපු එකක්. සමහර වෙලාවට ඒක පනතේ photocopy එකක් වාගේ එකක්. එය කිසිම ආකාරයකින් තමන් කරගෙන යන කාර්යයට බැඳිලා තිබුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

ඒ වාගේම, rolling model එකක් තිබුණේ නැහැ, එහෙම නැත්නම් වර්ෂයෙන් වර්ෂය දීර්ඝ කර ගනිමින් ඒ සැලසුම් සකස් කරලා තිබුණේ නැහැ, ඒකට අනුබද්ධ ලෙස වාර්ෂික සැලැස්ම - Annual Plan එක - සකස් කරලා තිබුණේ නැහැ. ඒකට අනුබද්ධව Procurement Plan එක, Budget Plan එක සකස් කරලා තිබුණේ නැති අවස්ථාත් අපි නිරීක්ෂණය කළා. එවැනි විවිධ ගැටලු තිබුණා. ඒ නිසා අපි දැන් ඒ සියලු ආයතනවලට අවස්ථාව ලබා දෙමින් ඉන්නවා, ඔවුන් විසින් සකස් කරන ලද වාර්තා කෝප් කමිටුව හමුවේ ඉදිරිපත් කරන්න. එයට විගණකාධිපති දෙපාර්තමේන්තුවත්, ඒ අදාළ නිලධාරින් ඇතුළු සියලුදෙනාත් සම්බන්ධ කර ගනිමින්, එම ආයතනවල සැලසුම් අප ඉදිරියේ present කරන්න අවස්ථාව සලසා දී තිබෙනවා; ඇත්තටම ඒක මහ

ජනතාව ඉදිරියේ කරන present කිරීමක්. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, ඒ ආයතන පද්ධතිය නිර්මාණය කරලා තිබෙන පනතේ බලතල ප්‍රකාරව මේ රටේ මහ ජනතාව වෙනුවෙන් ඔවුන් සිය කාර්යය ඉෂ්ට කරන්නේ කොහොමද කියන එක ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට. ඒක මහජනතාව දකිනවා. එතකොට අර වහගෙන කරන, වැහිලා කරන බොහෝ ක්‍රියාකාරකම් අත් හැරෙයි කියා අපි අපේක්ෂා කරනවා. එහෙම නැතුව, මේ පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව විධියට අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, postmortem model එක විතරක්ම පාවිච්චි කරමින්, ඔවුන් පසුපස පන්නාගෙන යන කණ්ඩායමක භූමිකාවක් කරන්න. ඒක අවශ්‍ය වෙන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, ඒ කණ්ඩායම්වලට ඉදිරිගාමීව - ඉදිරියෙන් ඉඳගෙන - මඟ පෙන්වන්න; ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සමාජය තුළ, එහෙම නැත්නම් රට තුළ, රටේ අවශ්‍යතා වෙනුවෙන් යොදා ගන්න පුළුවන් මට්ටමට උසස් කරන්න පුළුවන් විධියට ඒ ආයතන පද්ධතිය මෙහෙයවා ගන්න. එහෙම නැතුව අපි ඒ ආයතන පස්සෙන් කොච්චර පැන්නුවත් වැඩක් නැහැ. අපි දශක ගණනාවක් තිස්සේ ඒ පිහිටුවපු ආයතන පස්සෙන් පන්නමින් ඉන්නවා. නමුත් පසුගිය 2022 වර්ෂයේදී රට බංකොලොත් කියලා ප්‍රකාශ කරන කොට ඒ ආයතන පද්ධතියත් automatically බංකොලොත් වෙලා ඉවරයි, ගරු කථානායකතුමනි. ඒ එක ආයතනයක්වත් ඉතා හොඳ මට්ටමේ තිබුණේ නැහැ. නමුත් දැන් ඒ තත්ත්වය වෙනස් වෙමින් තිබෙනවා. අපි බලපොරොත්තු වෙනවා, ඒ ආයතන වෙනස් කර ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

ඒ වාගේම, ඒ ආයතන පද්ධතිය තුළ තීන්දු තීරණ දෙමින් වංචා මෙහෙයවපු, වංචාවලට ඒ නිලධාරින් සම්බන්ධ කර ගනිමින් කටයුතු කරන්න උත්සාහ කරපු දේශපාලනඥයන්ටත් නිශ්චිත දඬුවම් දෙන්න පුළුවන් ක්‍රියාමාර්ග යෝජනා කරන අතරම, අනෙක් පැත්තෙන් ඒ නිලධාරින් සම්බන්ධවත් අවශ්‍ය කටයුතු කළ යුතු බවත් සඳහන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මේ කාරණය පමණක් කියා මම කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කෝප් කමිටුවේ සභාපතිතුමාට අපි ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් තවත් වැඩිපුර විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් අමතර විනාඩි දෙකක කාලයක් ලබා දුන්නා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම ඒ නිලධාරින් සම්බන්ධව, නිලධාරි යන්ත්‍රණය සම්බන්ධව මේ රටේ මහජනතාව අතර තිබෙන්නේ හොඳ චිත්‍රයක් නොවෙයි. ඒක අප විසින් කරන ලද දෙයක් නොවෙයි. එය, මේ රටේ මහජනතාව ඒ ආයතන පද්ධතියේ තිබෙන අකාර්යක්ෂමතාව, ඒ ආයතන පද්ධතියේ තිබෙන දූෂණ, වංචා, අක්‍රමිකතා පිළිබඳව ඇස්, කන් ඇරගෙන ඉන්න මහජනතාවක් ලෙස දැකපු දේවල් මත ගොඩනැඟිච්ච චිත්‍රයක්. අපට ඇත්තටම අවශ්‍යයි, ඉදිරියේදී ඒ චිත්‍රය වෙනස් කරන්න. ඒ නිලධාරින් අතරත් ඉන්නවා, වැරැදි කරන නිලධාරින්ට දඬුවම් ලබා දීම අපේක්ෂාවෙන් ඉන්න නිලධාරින්. මොකද, නිවැරැදි ලෙස ඒ ආයතන පද්ධතිය තුළට ඇවිල්ලා, තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන මිනිස්සු එකඟයි, වැරැදි කරන කෙනාට දඬුවම් දෙන එකට. ඒ නිසා ඇත්තටම මේ ක්‍රියාවලිය - විශේෂයෙන්ම කෝප් කමිටුවේ ක්‍රියාවලිය - නිලධාරින් බිය කරන්න කරන එකක් නොවෙයි. ඒක කරන්නේම, නිවැරැදි ලෙස කාර්යය කරන නිලධාරින්ට තමන්ගේ කාර්යය පිළිබඳව ඉතාම සතුටින්, වගකීමෙන්, විශ්වාසයෙන් වැඩ කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කිරීමයි. ඒ නිසා අපි ඇත්තටම නැවත අවධාරණය කරන්න ඕනෑ, අපි කිසිසේත් ඒ ආයතන පද්ධතිය, එහෙම නැත්නම් ඒ රාජ්‍ය ව්‍යාපාර පද්ධතිය පස්සෙන් පන්නාගෙන යන්නේ නැති බව. එහෙම පසුපස පන්නාගෙන ගිහිල්ලා, ඔවුන් වැරැද්දක් කළාට පසුව, වැරැද්දක් වුණාට පසුව ඒ පිළිබඳව සොයන එක නොවෙයි කළ යුත්තේ. අපි හිතනවා, අප ඉදිරිගාමී ලෙස සිටිමින් - ඉදිරියෙන් සිටිමින් - මේ ක්‍රියාවලිය තවදුරටත් මෙහෙයවමින් නිලධාරින් වංචාවලට, දූෂණවලට, නාස්තියට, අක්‍රමිකතාවන්ට හසු නොවන ආකාරයට මෙහෙයවමින් කටයුතු කළ යුතුයි කියලා. වංචා, දූෂණවලට අදාළ දේශපාලන තීන්දු තීරණ ලබා දීමේ ක්‍රියාවලිය දැන් මුළුමනින්ම නැවතිලා තිබෙනවා, මේ අලුත් දේශපාලන සංස්කෘතිය ඇතුළේ. එහෙම නම්, නිලධාරිනුත් ඉතාම නිවැරැදි ක්‍රමවේදයකට හැඩගස්වා ගැනීම තුළ මේ ආයතන පද්ධතිය ගොඩ ගන්න අපට පුළුවන්. ඉතින් ඒ විශ්වාසයෙන් තමයි අද දවසේ මේ විවාදයට මා සම්බන්ධ වුණේ.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Hector Appuhamy. You have 10 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.40]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE එක - විසින් කරන ලද විමර්ශනයට අදාළ සිද්ධි කීපයක් පිළිබඳව ස්ථාවර නියෝග යටතේ ගනු ලබන තීරණය ද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා අද ඉදිරිපත් කර තිබෙනවා. අදාළ ආයතනවල විවිධ කාරණා සම්බන්ධයෙන් COPE එකේ, COPA එකේ සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්නවා. කාලයක් තිස්සේ සාකච්ඡාවක් තිබුණා, COPE එකේ සහ COPA එකේ සාකච්ඡා කරලා තීන්දු තීරණ අරගෙන නිකුත් කරන වාර්තා සම්බන්ධයෙන් නීතිමය පියවර ගත හැකි පරිදි ස්ථාවර නියෝග සංශෝධනය කරන්නේ කොහොමද කියන එක ගැන. යම් අමාත්‍යාංශයක වෙන්න පුළුවන්, වෙනත් ආයතනයක වෙන්න පුළුවන්, කිසියම් හොරකමක් හෝ වංචාවක් හෝ දූෂණයක් හෝ වෙනත් අයථා සිද්ධියක් හෝ වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධව නීතිමය පියවර ගන්නේ කොහොමද කියන එක ගැන කාලයක් තිස්සේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරගෙන ආවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි ස්ථාවර නියෝග සංශෝධනයකුත් එක්ක විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත මේ අවස්ථාවේදී පළමුවෙන්ම මේ යොමු කිරීම කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇතුළු ආයතන කිහිපයක් ගැන මෙහි සඳහන්ව තිබෙනවා.

මෙතැනදී අපට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. කෝප් කමිටුවේදී අප සාකච්ඡාවට ගන්නේ, විමසීම් ආදිය කරන්නේ විගණකාධිපති වාර්තාවත් පදනම් කරගෙන එම නිලධාරින් ද සම්බන්ධීකරණය කරගෙනයි. එතැනදී විමසීම් කරන, ප්‍රශ්න අහන බොහෝ කරුණු කාරණා තිබෙනවා. හැබැයි, එතැනදී අපට තීන්දු කරන්න බැහැ, කවුද හරි, කවුද වැරැදි කියලා. අපට නිගමනවලට එන්න පුළුවන්. අපේ නිගමන හරිද, වැරැදිද කියලා ඊට පසුව තීන්දු කරන්නේ අධිකරණයකින්. විශේෂයෙන්ම අද අප විවාදයට ගන්නා මේ කරුණු කාරණා සම්බන්ධයෙන් කාට හෝ ඇඟිල්ල දිගු කරලා ඒ කවුරු හෝ නිලධාරියෙකු වැරැදියි කියලා තීන්දු අරගෙන කථා කරන්න අපට බැහැ කියා මම විශ්වාස කරනවා. මොකද, ඒක නිවැරැදි නැහැ.

මෙතැනදී අපි විශේෂයෙන් මතක් කළ යුතු ඊළඟ කාරණාව මේකයි. අපි කාලයක් තිස්සේ මේ ආයතනවල තිබිච්ච වැරැදි සම්බන්ධව කථා කරනවා. හැබැයි, මේ system change එකක් ආපු වෙලාවේ ඇයි අප අලුත් කාරණාත් මේක ඇතුළට ගන්නේ නැත්තේ? දැන් අලුත් කාරණාත් තිබෙනවා නේ. එකක්, ගල් අඟුරු හොරකම. ඒක මේ රටේ සිද්ධ වෙච්ච විශාල වංචාවක්. ඒ වංචාව පිළිබඳ කාරණයත් අපට මේ විධියට ගන්න පුළුවන්; අරගෙන කථා කරන්න පුළුවන්. ඒ පිළිබඳව කථා කරන්න තවත් කාලයක් ඉස්සරහට යන්න ඕනෑ කියා එකක් නැහැ. එය වර්තමානයේ කළ එකක් වුණත් ඒ වැරැද්ද කළේ කවුද, ජාවාරමක් කළාද, හොරකමක් කළාද, වංචාවක් කළාද, දූෂණයක් කළාද කියන එක ගැන සාකච්ඡා කරලා, මේ හා සමානවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම එකක්, ඩොලර් හොරකම. එය, ඩොලර් මිලියන 2.5ක හොරකමක්. ඒක සම්පූර්ණයෙන්ම හොරකමක්. ඒ හොරකම කළේ කවුද, ඒක කොහොමද සිද්ධ වුණේ, ඒකට සම්බන්ධ වෙච්ච ආයතන මොනවාද, ඒකට සම්බන්ධ වෙච්ච පුද්ගලයන් කවුද කියලා කියන්න පුළුවන් වෙන්න ඕනෑ. ඊළඟට, කන්ටේනර් 323 සම්බන්ධයෙනුත් පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සොයා බලන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ද තිබෙනවා. හැබැයි අපි දන්නවා, ඒ කාරක සභාවට සමහර අය කැඳවන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ කියලා. මොකද, ඡන්දයක් තියලා ඒ කටයුතු නතර කළා. අමාත්‍යවරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා එම කාරක සභාවට ගෙන්වන්න දුන්නේ නැහැ. මා කියන්නේ මේ කටයුතු විනිවිදභාවයෙන් කරන්න කියලායි. විනිවිදභාවය තිබෙන්න ඕනෑ. මොකද, කන්ටේනර් 323 සිද්ධිය සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් රටේ තිබෙනවා. ඒවායේ ආවේ මත්කුඩු වෙන්න පුළුවන්, මත්ද්‍රව්‍යට සම්බන්ධ ඒවා වෙන්න පුළුවන්, විශේෂයෙන්ම පාතාලයට සම්බන්ධ ඒවා වෙන්නත් පුළුවන්. ඒ විතරක් නොව, අවි ආයුධ සම්බන්ධ ප්‍රශ්න පිළිබඳවත් කරුණු කාරණා එළියට ආවා.

මෙවැනි පරීක්ෂණයක් සිද්ධ වෙන කරුණු කාරණා ගැන මේ පාර්ලිමේන්තුවේ අපි නිකම් විවාදයක් කරනවාට වඩා හොඳයි ඒ කරුණු කාරණා ඒකරාශි කරගෙන විශේෂ කාරක සභාවේදී විමර්ශන කරන එක. නමුත් විශේෂ කාරක සභාවේදී ඡන්දයක් පවත්වා ඒ සමහර අය ගෙන්වන්නේ නැති තත්ත්වයට පත් කරන්නේ නැතිව, ඒකටත් විනිවිදභාවයෙන් කරන වැඩසටහනක් හදන්න කියලා මා යෝජනා කරනවා.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා කිව්වා, රාජ්‍ය අංශයේ තිබෙන ප්‍රශ්න විනිවිදභාවයෙන් යුතුව විසඳා නිවැරදි කරන්න, අලුතින් ඉදිරි ගමනක් යන්න තමයි වැඩ පිළිවෙළ හදන්නේ කියලා. හැබැයි, අපි දන්නවා තවමත් රාජ්‍ය අංශය දේශපාලනීකරණය කරන වැඩසටහනක් කරන බව. රාජ්‍ය අංශයේ සමහර පත්වීම් දෙන්නේ දේශපාලනීකරණය කරලා. ජාත්‍යන්තරයේත් ඒක කරලා තිබෙනවා, ශ්‍රී ලංකාවේත් ඒක කරලා තිබෙනවා. ආයතන රාශියක ඒක කරලා තිබෙනවා. දේශපාලන හෙංචයියන්, තමන්ගේ හිතවතුන්, ආණ්ඩුවේ යම්කිසි ආයතනයකට පත් කිරීමත් බරපතළ වරදක්. එහෙනම් ඒකත් වරදක් හැටියට මෙතැන විවාදයට ගන්න ඕනෑ දෙයක්. අපි විශ්වාස කරනවා, එවැනි දේවල් රටේ සිදු නොවිය යුතුයි කියලා. ඒ නිසා මෙවැනි යෝජනා ගෙනෙනවා නම් අපි ඒ ප්‍රශ්නත් විසඳා ගනිමින් මේ යෝජනා ගෙනෙන්න ඕනෑ.

ඊළඟට, මන්නාරම සුළං බලාගාරයේ මෙගාවොට් 50ක ටෙන්ඩරයට අදාළ වංචාවක් සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, රටේ. මේක වර්තමානයේ තිබෙන ප්‍රශ්නයක්. අපි කියන්නේ, ඒ ප්‍රශ්නයත් මේ හා සමානවම COPE එකට හෝ COPA එකට ගෙනැල්ලා සාකච්ඡා කරලා ඒ කරුණු මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ බවයි. ඒ වාගේම අර plug base සම්බන්ධවත් ප්‍රශ්නයක් ආවා. ඒකෙනුත් යමක් ගහලා කියලා ප්‍රශ්නයක් ආවා. අපි කියන්නේ මේවා නිවැරදි කරගන්න, මේවා නිර්දෝෂී කරගන්න කියලායි. තමුන්නාන්සේලා කියනවා

නම් තමුන්නාන්සේලාගේ සමහර ආයතන, සමහර නිලධාරින්, දේශපාලනඥයන් නිර්දෝෂියි කියලා, මේ කියන ප්‍රශ්නත් අදාළ ආයතනයට ඉදිරිපත් කරලා ඒකෙන් නිර්දෝෂී වෙන්න. ඒවාත් ඉදිරිපත් කරන්න.

ඊළඟට, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා සමාගම් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා කියනවා. එතකොට එතැන විනිවිදභාවය නැහැ. ස්ථාවර නියෝග වෙනස් කරලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවන්න මේ කමිටුවල වාර්තා එවද්දී, මේ වාර්තාවලට ඒ තිබෙන චෝදනාත් සම්බන්ධ වෙනවාය කියන එක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ඊළඟට, වාහන ගෙන්වීමේදී බදු පැනවීමේදී, සමහර වාහන ආනයනය කරන්න සමහර කණ්ඩායම්වලට අවස්ථාව දීලා බදු වෙනස් කළා කියලා, අර සීනි වංචාව සහ පොල්තෙල් වංචාව හා සමාන වැඩ පිළිවෙළක් සිද්ධ වුණාය කියලා බරපතළ පණිවුඩයක් සමාජයට දීලා තිබෙනවා. තමුන්නාන්සේලා මේවා නිවැරදි කරගන්න ඕනෑ. තමුන්නාන්සේලා වැරදි නැත්නම් නිවැරදියි කියන්න අවශ්‍ය වැඩ පිළිවෙළත් මේ ආකාරයෙන්ම සකස් කරන්න පුළුවන්, COPA එක සහ COPE එක හරහා.

තමුන්නාන්සේලා මේ ළඟදී අපූරු දෙයක් කළා. අර "Rebuilding Sri Lanka" යටතේ තමුන්නාන්සේලා විදේශවල සිටින අපේ අහිංසක සහෝදරයන්ගේ සල්ලි ටික අරගෙන එකතු කරගත්තා. ඒ සල්ලි එකතු කරගත්තාට එහෙම පදනමක් හැදුවේත් නැහැ. අවසානයේ මොකක්ද කළේ? ඒ මුදල් Clean Sri Lanka එකට දමන්න යනවා. ඒකත් බරපතළ ප්‍රශ්නයක්. ඒ සල්ලි කොහේටද යන්නේ, Clean Sri Lanka එකේ මොන වැඩකටයුතුද ඒකෙන් කරන්නේ කියන විධිමත් සාකච්ඡාවක් මේ ආකාරයෙන්ම එන්න ඕනෑ කියන එක තමයි විශේෂ යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරන්නේ.

ඒ ගැන කථා කරද්දී, ඒ හා සමානවම මතක් කළ යුතු කාරණාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මේ බන්ධනාගාරයේ ඇති වෙච්ච සිද්ධිය. බන්ධනාගාරයේ ඇති වෙච්ච ඒ සිද්ධියත් එක්ක මොනවාද සාකච්ඡාවට ගැනුනේ? හැම තිස්සේම සාකච්ඡාවට ගැනුනේ බන්ධනාගාරය ඇතුළේ පාතාල කණ්ඩායම් අතර කුඩු සෙල්ලම්, කුඩු ජාවාරම් වෙනවා කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා අවුරුදු එකහමාරක්, දෙකක් වෙනවා. එහෙම නම් මේ රටට කුඩු එන වැඩ පිළිවෙළ ගැන යම්කිසි සොයා ගැනීමක් හරි විධියට තමුන්නාන්සේලා කරලා තිබෙනවාද? මේවා Airport එකෙන්ද එන්නේ, වරායෙන්ද එන්නේ, smuggling හරහා වෙනම බෝට්ටු හරහා එනවාද? මේ පිළිබඳව තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළක් තිබෙනවාද? තමුන්නාන්සේලා හැම තිස්සේම කියනවා, බන්ධනාගාරය ඇතුළේ කුඩු බිස්නස් වෙනවාලු. තමුන්නාන්සේලා කොහොමද ඇඳුමක් ඇඳගෙන එහෙම කියන්නේ? බන්ධනාගාරය ඇතුළේ ඉන්න, ඒ හිරේට ගිහිල්ලා ඉන්න අය මැරෙන්නත් බැහැ, නිලධාරින් මැරෙන්නත් බැහැ. ඒ දෙගොල්ලන්ම මැරෙන්නේ තමුන්නාන්සේලාගේ වැරැද්දෙන් කියන එක විශේෂයෙන් මම මතක් කරනවා.

කනගාටුවෙන් වුණත් ඒ හා සමාන තවත් විශේෂ සිද්ධියක් මතක් කරන්න ඕනෑ. මාරවිල රෝහලේත්, පුත්තලම ප්‍රධාන රෝහලේත් මෝචරි දෙකේම තිබෙන ශීතාගාර ටික කාලයක් තිස්සේ කැඩිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හදන්න පොඩි ගණනයි යන්නේ. ඒක නොවෙයි කාරණාව. සාමාන්‍යයෙන් මේ රටේ මාළු සහ මස් තමයි අයිස් ගහලා සීත කරලා ජනතාවට වික්කේ. අද යම් කෙනෙක් මැරිලා ඒ ශරීරය රෝහලට ගේනකොට නෑදෑ හිතමිත්‍රයන්ට කියනවා අයිස් අරගෙන එන්න, අයිස් දාලා තියන්න ඕනෑ, නැත්නම් මිනිය නරක් වෙනවා කියලා. ඒක තමයි ඇත්ත කථාව. තමුන්නාන්සේලා මේ ආණ්ඩුව ගැන කථා කරනවා. COPE එකේදී වංචා, දූෂණ නතර කරන්න කථා කරනවා. හැබැයි තමුන්නාන්සේලා මේ රටේ මැරෙන ගෞරවනීය මිනිස්සු රෝහලේ ශීතාගාරය ඇතුළේ තියන්නේ අයිස් දාලා. මේක එහෙම ආණ්ඩුවක්. මතක කියා ගන්න, ඒ වැරැද්ද තමුන්නාන්සේලා දිගින් දිගටම කරනවා. කාලයක් තිස්සේ මම මාරවිල රෝහල ගැන කිව්වා. විශේෂයෙන් දැන් ඒ මෝචරිය කඩාගෙන වැටිලා ගිලෙන්න යන්නේ. ඒක හදන්න කිව්වාම තමුන්නාන්සේලා කියනවා බාස්ලා රටින් ගේන්න ඕනෑ කියලා. මේ රටේ වැඩ කරන්න බාස්ලා රටින් ගේන්න ඕනෑලු! දෙවියන්ගේ නාමයෙන් බාස්ලා ගෙවල්වල ඉන්නවා කිසිම වැඩක් නැතිව, කන්න නැතිව. ඒ මිනිස්සුන්ට වැඩක් නැතිව ඉන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hector Appuhamy, your time is up.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අපි දෙන්නම් ආණ්ඩුවට බාස්ලා, වැඩ කරන්න. ඒ බාස්ලා අරගෙන ඒ ටික හදලා රට හදන වැඩ පිළිවෙළ නිවැරදිව කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Aravinda Senarath. You have 11 minutes.

[පූ.භා. 11.50]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්නේ ඉතාම වැදගත් කාරණයක් තෙරෙහියි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 සහ 120 වෙනස් කිරීමකට ලක් කරමින් මේ සමාජයේ පුරවැසියන් ඉල්ලා සිටි වෙනසක් කිරීමට අදාළ විවාදය තමයි අපි අද පවත්වන්නේ. අපේ රටේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - COPA - අවුරුදු 100කට වඩා පැරණි පාර්ලිමේන්තු කාරක සභාවක්. ඊට පස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගොඩනැගෙනවා. ඒ සියල්ලම ඉතිහාසයේ සිට පාර්ලිමේන්තුවට යම් කාර්යභාරයක් ඉටු කරලා දීලා තිබෙනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිහිටුවන්නේම රටේ මූල්‍ය කටයුතු කළමනාකරණය කර ගැනීමේ පහසුව සඳහා. රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඒ තොරතුරු වාර්තා කිරීම තමයි සරලව ගත්තාම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වගකීම බවට පත් වෙන්නේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පුළුවන් රාජ්‍ය ආයතන 830ක් කැඳවලා ඒ ආයතනවල විගණන වාර්තා

[ගරු අරවින්ද සෙනරත් මහතා]

නිරීක්ෂණයට ලක් කරලා වාර්තා ඉදිරිපත් කරන්න. පළාත් සභා, පළාත් පාලන ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 830ක් පිළිබඳව මේ කාරක සභාව වාර්තා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ඉඳලා අපේ රටේ පුරවැසියන් සහ මේ කටයුතු පිළිබඳ අවධානය යොමු කළ පිරිසගේ චෝදනාව තමයි කාරක සභා සාකච්ඡා පවත්වනවා, විවිධ ආයතන ගෙනැල්ලා නිරීක්ෂණ කරනවා, පරීක්ෂා කරනවා, හැබැයි ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්නේ නැහැ කියන එක. ඒක තමයි පසුගිය දශක ගණනාව පුරාම චෝදනාව හැටියට තිබුණේ. අපි බලය ගත්තාට පස්සේ ඒ තත්ත්වය හඳුනාගෙන ඒ කාරක සභා නියෝජනය කරන සභිකයන් විධියට, ඒ සභාපතිවරු විධියට සහ ආණ්ඩුවක් විධියට අපි තීන්දු කළා, පවතින ස්ථාවර නියෝග වෙනස් කරලා ඒ ආයතනවල ඇති වෙලා තිබෙන විගණන දෝෂ නිවැරදි කර ගන්න. ඒ වාගේම යම් හෙයකින් ඒවාට සම්බන්ධ වුණු නිලධාරීන් හෝ වෙනත් කිසියම් පුද්ගලයකු හඳුනා ගන්න පුළුවන් නම් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ තැනට මේ කාරක සභා පත් කර ගත යුතුයි කියලා තීන්දු කළා. අපි ආණ්ඩුවක් විධියට ඒ ගැන සාකච්ඡා කරලා කාරක සභා හරහා පාර්ලිමේන්තුවට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේදී බරපතළ මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියා සිදු වී ඇති බවට කාරක සභාව නිගමනය කළ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු, පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී එකී සිද්ධි සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී වාර්තා සෘජුව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට යොමු කිරීම සඳහා කාරක සභාවට බලය ලබාදීමට තමයි අපි අද ස්ථාවර නියෝග 119 වෙනස් කරනු ලබන්නේ. අපි ඒ ආකාරයට කටයුතු කරන්න තීන්දු කළේ සමාජය විසින් ඉල්ලා සිටි පරිදි පොදු සමාජ මතයට ගරු කිරීමක් වශයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳව අපි 2025.04.02වැනි දින සිදුකරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව 2025 ඔක්තෝබර් 24වැනි දා පාර්ලිමේන්තුවේ සභාගත කළා. විශේෂයෙන්ම අපේ රටට වාහන ආනයනය කිරීම සඳහා ඒ ඒ කාල වකවානුවල තිබුණු තත්ත්වයන් සලකා බලා ආණ්ඩු ගත් තීන්දු තීරණ තිබුණා. එහිදී විදෙස් ශ්‍රමිකයන්ගේ ඩොලර් අපේ රටට ගෙන ඒම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ලෙස විශේෂ තීන්දුවක් ගත්තා. ඒ අනුව විද්‍යුත් වාහන ආනයනය කරන්න විදෙස් ශ්‍රමිකයන්ට විශේෂ අවසරයක් දුන්නා. එවකට ආණ්ඩුව බලපත්‍ර 1,077ක් නිකුත් කරලා වාහන ආනයනය කරන්න අවස්ථාව දුන්නාට පසුව විවිධ අක්‍රමිකතා නිසා ඒ 1,077න් 77ක් අවලංගු කර තිබෙනවා. වාහන 921ක් ගෙනැල්ලා තිබෙනවා. ඉන් වාහන 699ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරලා තිබෙනවා. ලියාපදිංචි නොකළ වාහන පිළිබඳ තොරතුරු විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කළා. සාමාන්‍යයෙන් වාහන ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය බලය පවරා දී තිබෙන්නේ ආනයන හා අපනයන පාලක වෙත වුවත්, මෙකේ පළමු කැබිනට් තීරණයෙන් පසුව එම බලය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා තිබෙනවා. මේ විෂය පථයට සම්බන්ධයක් නැති නිලධාරියකු සම්බන්ධ කරගෙන ඒ සිදු කළ වාහන ආනයනයත් එක්ක රට තුළ ප්‍රශ්න ගණනාවක් නිර්මාණය වුණා. එවකට තිබුණු ආණ්ඩුව ගත්ත මෙවැනි තීන්දුත් එක්ක 2022, 2023 කාලයේ අපේ රටේ ඩොලර් ප්‍රශ්නය ඉතා අර්බුදයකට ලක් වුණා. අදාළ නොවන නිලධාරීන් සම්බන්ධ කරගෙන, විවිධ සමාගම් සම්බන්ධ කරගෙන රටක් විධියට ගනු ලැබූ තීන්දු තීරණ සහ විනිවිදභාවයෙන් තොරව තමන්ගේ දේශපාලන වුවමනා මත, පුද්ගල ලැදියාවන් මත තීරණ ගත් අවස්ථා අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව තමයි අපි පාර්ලිමේන්තුවට වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. එය සමාගම් කිහිපයක් එක්ක එකතු වෙලා කරපු වංචනික ක්‍රියාවක් බව විගණන වාර්තාවලින් අපි හඳුනා ගත්තා. ඒවා පැහැදිලිවම දේශපාලන වුවමනා මත සිද්ධ වුණු බවට අදාළ කරුණු කාරණා බොහොමයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙහිදී අපි අවධානය යොමු කරන්නේ නිලධාරින්ගේ අත්වැරදීම් පිළිබඳව නොවෙයි. මේවා සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින්ව චෝදනාවට ලක් කරලා ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරන්න හදනවා කියලා සමාජයට මතයක් යන්න පුළුවන්. නැහැ, එහෙම එකක් නොවෙයි. ගනුදෙනුවකදී අත් වැරදීමක්, එහෙම නැත්නම් මොන යම් හෝ අඩුපාඩුවක් සිද්ධ වුණාද කියලා අපට හඳුනා ගන්න පුළුවන්. සාමාන්‍යයෙන් ඕනෑම පුද්ගලයෙකුට අත්වැරදීම් වෙන්න පුළුවන්, අඩුපාඩු වෙන්න පුළුවන්. හැබැයි, මේවා දේශපාලන ඩීල් එක්ක ගිය මිලියන ගණනේ ගනුදෙනු. මේවා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව රටට වග කියන්න ඕනෑ. ඒ නිසා තමයි මෙවැනි කාරණා හොඳින් අධ්‍යයනය කරලා, පාර්ලිමේන්තුවේ වාර්තා සභාගත කළාට පස්සේ ඒ ගැන විවාද කරලා, යම් විධියකින් වංචාවක් සිදු වෙලා තිබෙනවා නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින්, එහෙම නැත්නම් පොලිස්පතිවරයා හරහා ඒවාට නඩු පවරලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි යෝජනා කරන්නේ. මේක තමයි සමාජය ඉල්ලා හිටපු දේ.

අපට මතකයි, අපි COPA එකේ සාමාජිකයන් විධියට පත් වුණාට පස්සේ රට පුරා හිටපු උගතුන්, බුද්ධිමතුන් ඇතුළු මේ ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කළ අය අපට පණිවුඩ දාලා තිබුණා, "ඉතිහාසය පුරාම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කියන්නේ සාකච්ඡා මේසයක් විතරයි, ක්‍රියාමාර්ග ගෙන නැහැ" කියලා. "COPA එකේ, COPE එකේ තිබෙන්නේ සාකච්ඡා විතරයි, ක්‍රියාමාර්ග නැහැ, ඒ නිසා මේවාට විසඳුම් ගෙනෙන්න සමත් වෙන්න" කියලා ඒ අය යෝජනා කරලා තිබුණා. ඒ ජනතා මතයට අපි සවන් දීලා, අවුරුදු 100ක ඉතිහාසය ඇතුළේ සිදු නොවුණු කාර්යයක් ඉතිහාසයේ පළමු වතාවට අපි යෝජනා කරලා තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙන්න පුළුවන්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙන්න පුළුවන්, හඳුනා ගනු ලැබූ වංචාවක්, එසේ සිදු වුණා යැයි හැඟෙනවා නම් අපි ඒ ගැන පාර්ලිමේන්තුවේ විවාද කරලා ඒවාට අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර ආරම්භ කරන්න සූදානම් කියන පණිවුඩය තමයි අපට කියන්න තිබෙන්නේ.

කලින්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. මේ වාගේ සංශෝධන ගෙනෙද්දි, ප්‍රජාතන්ත්‍රවාදී යෝජනා ගෙනෙද්දි විපක්ෂය ටිකක් කලබල වනවා. එතුමා කිව්වා, රාජ්‍ය ආයතන දේශපාලනීකරණය වෙලා කියලා. මම එක කාරණයක් මතක් කරනවා. LRC එක කියන්නේ, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. LRC එක කොච්චර දේශපාලනීකරණය වුණා ද කියනවා නම්, ඒකට අයිති ඉඩම් ටික තමන්ගේ ගජ මිතුරන්ට, තමන්ගේ හිතවතුන්ට බෙදා දුන්නා. ඒ විතරක් නොවෙයි. අවශ්‍යතාව, ඇත්ත වුවමනාව තිබෙන රටේ ජනතාවට ඉඩම් නොදී බෙදා ගත්තා වාගේම, ඒකට නිලධාරිනුත් පත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදටත් ඒකේ ස්ථිර කරගන්න බැරි වුණු නිලධාරින් ඉන්නවා. එක කණ්ඩායමක් ගාල්ලේ, අනෙක් කණ්ඩායම අනුරාධපුරේ. ඔය කථා කළ මන්ත්‍රීතුමා දකුණු පැත්තට හැරිලා ඇහුවා නම්, ගාල්ලේ මේ බඳවා ගැනීම් කරලා තිබෙන්නේ කොහොමද කියලා අහගන්න පුළුවන්. ඒ නිසා හරි පැහැදිලියි, ඉතිහාසය පුරා මේවා දේශපාලනීකරණය කළ බව. මේ ආයතනවලට නිලධාරින් පත් කරද්දී, මේ ක්‍රියාවලි සියල්ල දේශපාලනීකරණය කරලා තිබෙනවා. දේශපාලනීකරණය කරපු ආයතන තමයි අපි මේ නිවැරදි කරලා, ජනතාවගේ ඇත්ත වුවමනාව වෙනුවෙන් සේවාව සපයන ආයතන බවට පත් කරන්න කටයුතු කරමින් ඉන්නේ.

ඒ වාගේම ගල් අඟුරු වංචාව සිද්ධ වුණා කියලා විපක්ෂය චෝදනා කරද්දී, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න COPE එක විගණන වාර්තාවක් කැඳෙව්වා. ඒකට අදාළව සාකච්ඡා කළා. ඒකත් වැරදියි. ඒකටත් විපක්ෂය චෝදනා කළා. ඒ නිසා අපි එදා වෙච්ච දේවල් ද, අද වුණා කියන දේවල් ද කියලා බලන්නේ නැහැ, මේ ආයතනවල සියල්ල පිළිබඳ පරීක්ෂා කරන්න සූදානම් වෙලා තිබෙනවා. ඉතා විනිවිදභාවයෙන් කටයුතු කරන ආයතන අපි නිර්මාණය කර තිබෙනවා.

සුප්‍රකට මහ බැංකු වංචාව අපට මතකයි. මේවායේදී විවිධ අය කටයුතු කරපු විධිය අපට මතකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අපරාධ සම්බන්ධයෙන්, මේ රට බංකොලොත් කරන්න දේශපාලන වශයෙන් සහ නිලධාරින් එකතු වෙලා ගත් තීන්දු තීරණ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා අදත් රටේ පුරවැසියන් ඉල්ලා සිටිනවා. ඒවාට අදාළ පසුබිම හදන්න තමයි අපි ස්ථාවර නියෝග 119 වෙනස් කරලා කටයුතු කරමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව තත්පර 30ක් ගන්නවා. මම නැවත මේ කාරණය මතක් කරනවා. රාජ්‍ය නිලධාරින් අපහසුතාවට පත් කරන්න, රාජ්‍ය නිලධාරින්ගේ කාර්යක්ෂමතාව අඩු කරන්න, ඔවුන්ට බලපෑම් කරන්න නොවෙයි මේ සංශෝධන ගෙනෙන්නේ. ඔවුන්ටත් පෞරුෂයක් හදන්න වාගේම රටේ ආර්ථිකය, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න විනිවිදභාවයකින් යුතු ආයතන ගොඩ නඟන්න තමයි මෙවැනි යෝජනා අපි පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ. ඒ නිසා මේ සඳහා සියලුදෙනාගේ සහයෝගය අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, may I speak now?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

[අ.භා. 12.02]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම රටේ ප්‍රශ්න රැසක් තිබෙන මොහොතක, අද දවසේ ඒ ප්‍රශ්න මහ හැරලා හැමෝගෙම අවධානය වෙනත් ක්ෂේත්‍රයකට යොමු කරන්නට හදනවා. පැහැදිලිවම වර්තමාන රජය ඔප්පු කර තිබෙනවා, රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නවලට විධිමත් ලෙස විසඳුම් ලබා දෙන්නට මේ රජයට හැකියාවක් නැහැ කියලා. අදටත් මේ රටේ ගොවි ජනතාව අන්ත අසරණභාවයකට පත් වෙලා තිබෙනවා. රජයේ මැති ඇමතිවරු එදා කුඹුරට බැහැලා ගොයම් කකා කිව්වා, වී කිලෝවකට රුපියල් 150ක සහතික මිලක් ලබා දෙනවා කියලා. හැබැයි, අද වනකොට හිතා මතාම ගොවියාට අලාභ කරලා රුපියල් 120ට සහතික මිලක් ලබා දෙන්නට රජය යෝජනා කරනවා. එහෙම කියනකොට කෘෂිකර්ම ඇමතිවරයාම පාර්ලිමේන්තුවේ කියනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. මම මේ රජයෙන් අහන්න කැමැතියි, කෝ එදා විපක්ෂයේ ඉන්නකොට දමපු රඟපෑම්? ගොවි දුක ගැන කථා කරලා, ගොවි ජනතාව රජවරුන් කරන්නට ඕනෑය කියන කථාව කියලා අද ගොවියාට කියනවා, කසිප්පුකාරයාලු. අද ගොවියාට කියනවා, "ආටිෆිෂල් ගොවියා" ලු. මේ විධියට රටේ ගොවි ජනතාව අනාථ කරන්නේ ඇයි? මේ තරම් බොරු කියන්නේ, මේ වාගේ ඇන්දෙව්වේ ඇයි?

අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා වීවලට ලබා දෙන සහතික මිල ගැන විවෘත ප්‍රකාශයක් කරන්න කෘෂිකර්ම ඇමතිවරයාට හැකියාවක් නැහැ. අද වී මිල ගැන කථා කරනකොට ඇමතිවරු හැංගෙනවා. මාධ්‍යවේදීන්ගේ කැමරා අතින් වහනවා. මයික්‍රෆෝනය ඉවත් කරන්නලු. මෙන්න ගොවියාගේ ප්‍රශ්නවලට රජයට තිබෙන උත්තරය. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් වැය වනකොට රුපියල් 17ක් පාඩු කරලා රජය ගොවි ජනතාවට කියනවා, රුපියල් 120ට ගන්නවා කියලා. හැබැයි, ඒ මිලවත් අද නැහැ; ඒ මිලවත් ලබා දෙන්නේ නැහැ. ඒක තමයි මහ පොළොවේ සත්‍යය.

එක පැත්තකින් ගොවි ජනතාව අනාථ කරනකොට, මේ රජය වතු ක්ෂේත්‍රයේ වතු ප්‍රජාවට ලබා දුන් පොරොන්දුව මොකක්ද? වතු ක්ෂේත්‍රයේ ජනතාව ආරක්ෂා කරනවා කිව්වා, ඒ අය රැක ගන්නවා කිව්වා. සෙන්දිල් තොණ්ඩමන් මැතිතුමා ඊයේ දවසේ මා හමුවෙලා බරපතළ ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව එතුමාට මම ස්තුතිවන්ත වනවා. මැතක ඉඳලා වතු ක්ෂේත්‍රයේ ජනතාව ඒ වතුවලින් පන්නනවා. රාගල St. Leonard's Estate එකේ වසර 20ක කාලයක් තිස්සේ අඛණ්ඩව එකම ස්ථානයක පදිංචි පවුල් 6ක්, LRC වතුවල superintendentලා විසින් පන්නා දමනවා. හැබැයි මතක තබාගන්න ඕනෑ, මේ කාරණයත්. 1889 අංක 13 දරන වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනතේ 24(1) වගන්තියට අනුව, ස්වකීය සහකරු හෝ සහකාරිය සමඟ ජීවත් වන වතු කම්කරුවෙක් පදිංචි නිවාස පහසුකම් සඳහා ඔවුන් හිමිකම් ලබන බව පැහැදිලිව තිබෙනකොට, වතුවල superintendentලා 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන වතු ජනතාව ඒ වතු ඉඩම්වලින් පන්නා දමනවා. නමුත්, වර්තමාන රජය කරබාගෙන පැත්තකට වෙලා ඉන්නවා. එදා වතු ජනතාවත් රැවටුවා. වතු ජනතාවට තිබෙන ඉඩම් අයිතිය අද අහිමි කරමින්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

යනවා. මතක තබාගන්න, වතු ප්‍රජාවට පුරවැසිභාවය ලබා දීමේ කටයුත්ත එදා දියත් කළේ අපියි කියන එක. අපි තමයි ඔවුන්ට පුරවැසිභාවය ලබා දුන්නේ. අපි විශ්වාස කරනවා, වතු ප්‍රජාවගේ ඉඩම් අයිතිය තහවුරු කරන්නට මේ රජය පොරොන්දු වුණා සේම, ඒ දේ ඉෂ්ට සිද්ධ කරයි කියලා. වතු ජනතාව මේ විධියට පන්නන්න ඉඩ තබලා, වතු superintendentලාට ඒ කර්තව්‍යය කරන්නට ඉඩ තබා කරබාගෙන සිටීම තුළින් ඔබ කරන්නේ වතු ජනතාවට ද්‍රෝහී වීමක් කියන එක මම මේ අවස්ථාවේ කියන්නට කැමැතියි.

සෞඛ්‍ය ඇමතිවරයා අද දවසේ මේ සභාව තුළ පෙනෙන්නටවත් නැහැ. ඩෙංගු ප්‍රශ්නය ගත්තොත්, වර්තමානය වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? ඊයේ වනකොට 77,044ක් ඩෙංගු උවදුරට ගොදුරු වෙලා තිබෙනවා. ඒ වාගේම මරණ 56ක් සිද්ධ වෙලා තිබෙනවා. මේ තත්ත්වය 2023, 2024, 2025 වර්ෂවලට වැඩිය අද උත්සන්න වෙලායි තිබෙන්නේ. එසේ වුවත්, ඩෙංගු මර්දන ව්‍යාපාරය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්න රජයට පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ. ඩෙංගු මර්දන ව්‍යාපාරයේ නියැළෙන විශාල පිරිසක් ස්ථිර කරනවා කියලා එදා කිව්වා. ඒ දේ කරලාත් නැහැ. ඩෙංගු මර්දන ව්‍යාපාරයට උත්තර සපයන්නට මේ රජයට කිසිම හැකියාවක් නැහැ. විශේෂයෙන්ම ඩෙංගු මර්දන ව්‍යාපාරය මීටත් වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම රජයේ යුතුකමක්. අඩුම ගණනේ සෞඛ්‍ය ඇමතිවරයාගේ වගකීම තමයි, මේ සභාවට ඇවිල්ලා ඩෙංගු ප්‍රශ්නය සම්බන්ධයෙන් වර්තමානයේ රට මුහුණ දෙන බරපතළ තත්ත්වය පිළිබඳව රටට ප්‍රකාශයක් කරන එක. ඒ වැඩ පිළිවෙළ ගැන කිසිම කථාවක් නැහැ, කිසිම අදහසක් ඉදිරිපත් කරන්නේ නැහැ.

ඒ වාගේම මම තවත් කරුණක් කියන්න කැමැතියි. අද මේ රජය විශේෂයෙන්ම දේශීය වෛද්‍ය පද්ධතියම අර්බුදයකට ලක් කරලා තිබෙනවා. අද දේශීය වෛද්‍ය පද්ධතිය තුළ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් 700කට ලිඛිත සහ වාචික පරීක්ෂණවලට මුහුණ දීමේ අවස්ථාව අහිමි කරලා තිබෙනවා. ඒ දරුවෝ 700දෙනා විභාග ගාස්තු ගෙවා තිබියදීත් විභාග පැවැත්වීම රජය විසින් ප්‍රතික්ෂේප කරනවා. "ගුරු ගෝල ගුරුකුල" ක්‍රමය තුළ වසර 7ක්, 10ක් පූර්ණ කාලීනව පුහුණුවක් ලැබූ එම ශිෂ්‍යයන්ට අද වෙනත් ආදායම් මාර්ගයක් නැහැ. මේ නිසා ඔවුන්ගේ පවුල් දැඩි අසරණභාවයකට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම වර්තමාන අණපනත් උපයෝගී කරගෙන රජය කියනවා, පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රයේ ලියාපදිංචි වෙන්නට නම්, අපොස උසස් පෙළ විභාගයෙන් විෂයයන් තුනම සමත් වෙන්නට ඕනෑ කියලා. එතකොට පරම්පරා ගණනාවක් පුරාවට ගුරු ගෝල ක්‍රමය ඔස්සේ පැවැතගෙන එන පාරම්පරික වෙද පරම්පරාවලට මොකක්ද වෙන්නේ කියන එක අපි අහන්න කැමැතියි. පෞද්ගලික අනුග්‍රහයන් තුළ, විශේෂයෙන්ම පාරම්පරික වෛද්‍යවරුන්ගේ පෞද්ගලික අනුග්‍රහයන් තුළ විද්‍යාල එකොළහක් නොමිලේ ක්‍රියාත්මක වුණා, ඒ පාරම්පරික වෙද පුහුණුව මේ රටේ ක්‍රියාත්මක කරන්න. ඒ වෙද පුහුණුවට උපයෝගී කරගත් විදුහල් එකොළහම අද වනකොට වැහිලා ගිහිල්ලා තිබෙනවා. ඒවා ආරම්භ කළේ වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාගේ කාලයේදීයි. අද පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රයට, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට පැහැදිලි ජාතික ප්‍රතිපත්තියක් නැහැ. එම නිසා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත වහාම වෙනස් කරන්නට ඕනෑ. එහි විධිවිධාන හේතුවෙන් පාවට්ටා, මුකුණුවැන්න ඇතුළු දේශීය ඖෂධ රැසක් ප්‍රවාහනය කිරීම, භාවිත කිරීම රට තුළ තහනම් කිරීම නිසා දේශීය ඖෂධ නිෂ්පාදනය බරපතළ ප්‍රශ්නයකට අද මුහුණ දෙනවා. විශේෂයෙන්ම අද වගා කළ හැකි සහ ප්‍රමාණවත් ලෙස ලබා ගත හැකි ඖෂධ රට තුළ තිබියදී විදේශීය ඖෂධ ආනයනය කිරීම තුළ අපේ රටට විශාල විදේශ විනිමයක් අහිමි වනවා. එම නිසා දේශීය ඖෂධ නිෂ්පාදකයින් සහ දේශීය සැපයුම් දාම ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට රජය යා යුතුයි.

ලියාපදිංචි විභාග කඩිනමින් පවත්වා, ගුරු-ගෝල ක්‍රමය සුරක්ෂිත කරලා, වැසී ගිය පාරම්පරික වෛද්‍ය විද්‍යාල නැවත සක්‍රිය කරලා, දේශීය වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරන, පාරම්පරික වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරන ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපි රජයට යෝජනා කරනවා, මහව, යාපහුව ප්‍රදේශයේ ස්ථාපනය කරපු අංගම්පොර මධ්‍යස්ථානය පිළිබඳව අවධානය යොමු කරලා, ඒ මධ්‍යස්ථානය තුළ අපේ රටේ පාරම්පරික දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ක්‍රියාත්මක වුණු වැඩසටහන් නැවත ක්‍රියාත්මක කරන්න කියලා.

මම මේ අවස්ථාවේ ඒ යෝජනාව කරමින්, අවසාන වශයෙන් අග්‍රාමාත්‍යතුමියට ප්‍රශ්නයක් යොමු කරනවා. මොඩියුලර් පද්ධතිය යටතට පත් කර ඇති ඉතිහාසය සහ සෞන්දර්ය අධ්‍යාපන විෂයයන් සම්බන්ධව රජයේ ස්ථාවරය මොකක්ද? අපි විශ්වාස කරනවා, ඉතිහාසය හර විෂයයක් විය යුතුමයි කියලා. ජාතික පාසල් විෂය මාලාව යටතේ ඉතිහාසය සහ සෞන්දර්ය අධ්‍යාපනය නැවතත් අනිවාර්ය විභාග විෂයයන් ලෙස තීරණය කිරීමට රජය සලකා බලන්නේ නැද්ද? මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජිත කාලරාමුව හෝ අඩුම ගණනේ ඉදිරිපත් කරන්න. අපි විශ්වාස කරනවා, අධ්‍යාපන පද්ධතිය තුළ මෙම විෂයයන්ට සමාන ප්‍රමුඛතාවක් ලැබිය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩෙංගු ප්‍රශ්නයට අද උත්තරයක් නැහැ. ගොවියාගේ ප්‍රශ්නයට උත්තරයක් නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ කඩා වැටීමට උත්තරයක් නැහැ. පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැළෙන්නන් අද විශාල අසහනයකට, පීඩනයකට පත් වෙලා තිබෙනවා. වතු ජනතාවට පොරොන්දු වුණු දේවල් මේ රජය ඉටු කරන්නේ නැහැ. මේ කරුණු කාරණාවලට අවධානය යොමු වීම නතර කරලා, වෙනත් කරුණු කාරණා ඉදිරිපත් කරලා, විශේෂයෙන්ම රටේ ජනතාවගේත්, සියලුදෙනාගේත් අවධානය වෙනතකට යොමු කරන්නට උත්සාහ දරන අවස්ථාවක විකල්ප රජය හැටියට අපි ප්‍රකාශ කරනවා, ජන සමාජයේ සියලුම ජන කොට්ඨාස සුඛිත, මුදිත කරවන්නට අපි අනිවාර්යයෙන්ම කැප වනවා කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Asitha Niroshana Egoda Vithana. You have eight minutes.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Deputy Minister, what is your point of Order?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මම මේක කියන්නේ.

විපක්ෂ නායකතුමා තමන්ගේ කථාවේදී ප්‍රකාශයක් කළා, LRC එක සම්බන්ධයෙන්. ඒ වාගේම අනෙකුත් විෂයයන් පිළිබඳවත් අපි උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ඇටම්පිටිය වතු බංගලාව අල්ලාගෙන හිටියේ, එතුමාගේ පක්ෂයේ මන්ත්‍රී සෙන්දිල් තොණ්ඩමන්. ආණ්ඩුව ආවාට පස්සේ අපි තමයි අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, we are not going for a debate on that.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්න.

LRC එකේ ඉඩම් බෙදුවේ, වතු සමාගම්වලට. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Asitha Niroshana Egoda Vithana. You have eight minutes.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
වතු කම්කරුවන්ගේ ඉඩම් ටික දීගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. අපි නීත්‍යානුකූලව ඒක විසඳමින් තිබෙන නිසා ගෙදර ගිහිල්ලා පින්තූරය දිහා බලාගෙන අහන්න ජනතාවගේ ඉඩම් ටික - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana, are you going to speak?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is enough. Let the Hon. Member speak.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය සතියේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? Tell me.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92(2)(ආ) කියලා මෙච්චර වෙලා කථා කරකර හිටියා නේ. Let me read Standing Order No. 92(2)(ආ).

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That was not allowed, Hon. Member. Shall we allow the Hon. Asitha Niroshana Egoda Vithana to speak?

[අ.භා. 12.14]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙහෙත් අරගෙන එන්න කියලා එතුමාට කියන්න. එතුමා අද ගන්න තිබෙන ඖෂධ මාත්‍රාව අරගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පසුගිය සතියේ සිදු කරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල එළිදැක්වුවා. එහිදී ජනාධිපතිවරයාගේ පාලන කාලය සහ ක්‍රියා කලාපය පිළිබඳව සියයට 75.5ක ජනතා ප්‍රසාදයක් තිබෙන බවත්, විපක්ෂ නායකවරයාගේ මැදිහත් වීම සහ නායකත්වය පිළිබඳව සියයට 29.4ක ජනතා ප්‍රසාදයක් තිබෙන බවත් තමයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන්ගේ සමීක්ෂණ වාර්තාවලින් එළිදැක්වුවේ. ඒ කියන්නේ, අපේ රටේ විපක්ෂ නායකවරයා සියයට 64.9ක ජනතා අප්‍රසාදයක් සහිතව තමයි පාර්ලිමේන්තුව තුළ කටයුතු කරන්නේ. එතුමන්ලා පුළුවන් තරම් විශ්වාස භංග යෝජනා ගෙනෙන්න උත්සාහ කරනවා. අධිකරණ ඇමතිවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් අත්සන් කරන්න යනවා. ජනතාවගේ විශ්වාසය භංග වෙලා තිබෙන්නේ මේ රටේ විපක්ෂය සම්බන්ධයෙන් කියන එක තමයි අපේ තර්කය වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවන්හි ඇතුළත් වාර්තා මඟින් හඳුනා ගත් සිද්ධි සම්බන්ධයෙනුත් ඇතුළත් වන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය පිළිබඳවත් අද විවාදයට ලක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය කාල පරිච්ඡේදය තුළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සහ විපක්ෂයේ මන්ත්‍රීවරු 16දෙනෙකුගෙන් සැදුම්ලත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් පිළිබඳව තමයි මේ පැමිණිල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ නීතිපතිවරයාට යොමු කරන්න කටයුතු කරමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ රටේ පොදු ව්‍යාපාර 52ක් පිළිබඳව 2025 අවුරුද්දේ වාර්තාවක් එළිදැක්වුණා. ඒ අනුව 2023 සහ 2024 වර්ෂවලට සාපේක්ෂව අපේ රටේ ප්‍රධාන පොදු ව්‍යාපාර 52ක් ලාභ ලබමින් රජයේ ඒකාබද්ධ අරමුදලට විශාල මුදලක් බැර කරලා තිබුණා. අපේ රටේ ඇති වෙලා තිබෙන දේශපාලන පරිවර්තනයත් එක්ක මේ පොදු ව්‍යාපාර ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒවා තුළින්

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

රටේ ජනතාවට විශාල සේවාවක් කරමින් තිබෙනවා. වංචා, දූෂණ අවම කරමින් මේ යන ගමනේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විධියට අපිට තිබෙන වගකීම අපි ඉෂ්ට කරමින් තිබෙනවා. එහි බලපෑමත් මේ රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන්න, කාර්යක්ෂම වෙන්න, ක්‍රමයකට, පිළිවෙළකට ඉදිරියට යන්න ඉවහල් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වතුවල ජනතාව ඉවත් කළා කියලා සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා. සමහර නීතිමය කාරණා නිසා වතු සමාගම් ඒ වතුවල ජනතාව ඉවත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒවා යම් යම් සුළු කාරණා. නමුත් ඔය කිව්වා වාගේම, සෙන්දිල් තොණ්ඩමන් මහත්මයා ඒ වතුවල තිබුණු බංගලාවක් අත්පත් කරගෙන ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ආවාට පස්සේ තමයි ඒකෙන් ඉවත් වුණේ. තවම වතු නිවාසවල අපේ සමහර මන්ත්‍රීවරු ඉන්නවා. හැබැයි, එතුමන්ලා බංගලා අල්ලා ගන්න ගිහිල්ලා නැහැ. හැබැයි, බංගලා අල්ලාගෙන හිටපු අය මෙතුමන්ලාගේ ඒකාබද්ධ විපක්ෂයේ තවම ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Glocal Fair කියන වැඩසටහන 2022 වර්ෂයේදී ක්‍රියාත්මක වුණා. මේ රට හැදුවා කියන, රටේ ආර්ථිකය ගොඩදැමුවා කියන රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා යටතේ 2022 ඔක්තෝබර් මාසයේ 15 සහ 16 කියන දවස් දෙකේ ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ Glocal Fair කියන විදේශ රැකියා වෙළෙඳ පොළ පැවැත්වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විමර්ශනයට අනුව, ඒ විදේශ රැකියා වෙළෙඳ පොළ පවත්වන්න යෝජනා කරලා තිබුණේ ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ. වියදමකින් තොරව ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ ගොඩනැඟිලි පාවිච්චි කරලා මේ විදේශ රැකියා වෙළෙඳ පොළ පවත්වන්න සූදානම් වෙලා තිබියදී රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා විසින් පත් කරන ලද මනුෂ නානායක්කාර කියන හිටපු ඇමතිතුමා තීන්දු කළා, ඔක්තෝබර් මාසයේ 15 සහ 16 දිනවල මේ Glocal Fair කියන විදේශ රැකියා වෙළෙඳ පොළ ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ පවත්වන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා අඩි 10X10 size එකේ canopies 50ක් ඔවුන් order කරලා තිබුණා. සාමාන්‍යයෙන් රුපියල් 30,000ක්, 40,000ක් වන අඩි 10X10 size එකේ canopy එකක මිල ලෙස ඔවුන් නියම කර තිබුණා, රුපියල් 170,000ක්. මේ රටේ මහජන ධනයෙන් රුපියල් 170,000ක්, අඩි 10X10 size එකේ canopy එකකට ඔවුන් වෙන් කර තිබුණා. ඒ අනුව කූටි 30කට රුපියල් ලක්ෂ 51ක් වැය කර තිබුණා, 2022 ඔක්තෝබර් මාසයේ 15 සහ 16 දිනවල ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ තිබුණු Glocal Fair කියන විදේශ රැකියා වෙළෙඳ පොළ වෙනුවෙන්.

ඊට පස්සේ ඒ කොන්ත්‍රාත්තුව භාර දීලා තිබෙන්නේ Randipa Media (Pvt.) Limited එකට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විමර්ශනවලට අනුව ඒ Randipa Media (Pvt.) Limited කියන එක හිටපු අමාත්‍ය මනුෂ නානායක්කර මැතිතුමා මේ වාගේ ව්‍යාපාරයක් කර ගැනීමේ අරමුණින්ම ගොඩනඟපු ආයතනයක් බවට තොරතුරු වාර්තා වුණා. ඒ වාගේම, ඒ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබෙන්නේත් ඒ ආයතනයට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන තවදුරටත් විමර්ශනය කිරීමේදී ඒක විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික සැලැස්මේ - Corporate Plan එකේ - වැඩ පිළිවෙළක් විධියට ඇතුළත් කරලා තිබුණේ නැහැ. කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරලා තිබුණේ නැහැ. ඒ සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල් පාවිච්චි කළාට, විදේශ කටයුතු අමාත්‍යාංශය තමයි මේ සියලු කටයුතුවලට මුළුමනින්ම මැදිහත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන බරපතළ කාරණය ඒක නොවෙයි. ඊට පසුව ඔවුන් මේ Glocal Fair කියන වැඩසටහන 2023 ජූලි මස 15 සහ 16 කියන දවස් දෙකේ යාපනයේදී පැවැත්වූවා. එහිදී රුපියල් 170,000ක් වූ අඩි 10 x 10 canopy එක රුපියල් ලක්ෂ 5කට තමයි මිල නියම කරලා තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගාල්ලේදී ඒක රුපියල් 170,000යි. ඒ canopy එකම යාපනයට ගෙන ගියාට පස්සේ රුපියල් ලක්ෂ 5යි. Google කරලා බැලුවොත් පෙනෙනවා, ගාල්ලේ ඉඳලා යාපනයට කිලෝමීටර 501යි තිබෙන්නේ කියලා. මේ canopies 30 කිලෝමීටර 501ක් අරගෙන යන්න ලොරියකට වැය වෙන්නේ රුපියල් 80,000කට ආසන්න මුදලක්. හැබැයි, ඔවුන් රුපියල් 170,000 canopy එකක් යාපනයේදී රුපියල් ලක්ෂ 5ක් ලෙස මිල නියම කරනවා. මේවා මහ අමු ගැහිලි. මේවා, මේ රටේ මහජන ධනය ඇස් පනාපිට කොල්ල කාපු අවස්ථා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රට බංකොලොත් කරන්න හේතු වුණු, මේ රටේ මහජන ධනය කොල්ලකාපු අවස්ථා පිළිබඳව තමයි අපි COPE එක විධියට විමර්ශනය කළේ. රටේ ආර්ථිකය ගොඩ දැම්මා කියන නායකයා වන රනිල් වික්‍රමසිංහ මහත්තයා යටතේ පත් කරපු මේ ඇමතිවරයා තමයි විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මේ වාගේ පාඩුවක් කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට මේ මහත්වරුන්ට කියන්න තිබෙන්නේ මේකයි. ඔයගොල්ලන් තැන් තැන්වලට ගිහිල්ලා පෙත්සම් අත්සන් කරනවා. ආණ්ඩුවට විරුද්ධව කථා පවත්වනවා. හැබැයි, විශ්වාසය භංග වෙලා තිබෙන්නේ ආණ්ඩුවේ නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය කාල පරිච්ඡේදය පුරාවට වංචා සහ දූෂණ කරමින් මේ රටේ මහජන ධනය විනාශ කරපු විපක්ෂයේ තමයි විශ්වාසය භංග වෙලා තිබෙන්නේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් මේ වාර්තා ඉදිරිපත් කිරීම තමයි සිදු කර තිබෙන සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. මේ වාර්තා ඉදිරිපත් කරලා මේ රටේ මහජන ධනය සූරාගෙන කාපු ඒ දූෂිත රැළට අදාළ කරන නීතිමය කටයුතු ඉදිරියටත් සිදු කරනවා කියන එක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have eight minutes.

[12.22 p.m.]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, I feel that, on principle, taking up for debate what is being discussed today is incorrect because Standing Order No. 120(4) very clearly states, I quote:

> " ...the Committee may refer such matters directly to the Commission to Investigate Allegations of Bribery or Corruption or to the Inspector-General of Police, at a time determined by Parliament after the report thereon has been tabled in Parliament,"

So, basically, once the Report is tabled in Parliament, it could be sent to the IGP or to the Commission to Investigate Allegations of Bribery or Corruption. But, today, what we see is, passing judgement on somebody. The speakers who spoke before me, especially on the

Government side, spoke about incidents which are yet to be investigated. Names of certain persons were mentioned, but they do not even have the opportunity to defend themselves in Parliament. Here, they are not talking about Members of Parliament who are present in the House; they are speaking about officials.

Sir, on principle, the whole idea of making the COPE able to forward these cases to the Attorney-General, the CIABOC or to the IGP is okay, but who has selected those cases? Who selected the cases identified to be forwarded to the CIABOC or which are being debated today in the House? If it is the Committee on Public Enterprises which had decided what cases should be forwarded, obviously, the majority of the Committee Members of the COPE is from the Government side.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකෙන් හඳුනා ගත් මෙම cases, CIABOC ආයතනයට යොමු කිරීම හෝ පොලිස්පතිතුමාට යොමු කිරීම පිළිබඳව මගේ විරුද්ධත්වයක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තුව ඇතුළේ Report එක table කරන එකට එහා ගිහිල්ලා අද ඒ පිළිබඳව විවාදයක් පවත්වමින් ඒ තුළින් මනුෂ්‍යයෙක්ව වැරැදිකාරයා කරලා ඉවරයි. අපි දැක්කා, පසුගිය කාලයේදීත් සිය දිවි නසා ගැනීම් වාගේම ප්‍රශ්න රාශියක් සිදු වී තිබෙන බව. අවුරුදු 20ක්, 30ක් රාජ්‍ය සේවයේ හිටපු නිලධාරින්ව සමහර අවස්ථාවලදී වැරැදිකාරයා බවට පත් කරලා ඉවරයි. මේ විවාදයේදී කියැවුණු සමහර කාරණා ගත්තොත්, ඒ තුළ සමහර අයව වැරැදිකාරයා බවට පත් කරලා තිබෙනවා.

අද මේ forward කරන දේවල් තෝරා ගත්තේ කවුද? COPE එකේ සභාපතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. COPE එකෙන් මේ කාරණා තෝරා ගත්තා කියනවා නම් එහි threshold එක මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමත් පසුගිය කාලයේ COPE එකේ හිටපු සාමාජිකයෙක්. ලංකා බැංකුවේ, මහජන බැංකුවේ සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිබුණු බොල් ණය පිළිබඳව 2021දී COPE එක තුළින් ප්‍රථම වරට රටේ ජනතාවට හෙළි කළේ මමයි. BoC එක සම්බන්ධ කාරණාවේදී වුණත් මොකක්ද threshold එක? ඇයි BoC නැත්තේ? ඇයි People's Bank නැත්තේ? ඇයි NSB නැත්තේ? ඒවා යම් විධියකට දේශපාලනීකරණය වෙලා තිබෙනවාද කියන සැකය අපට මතු වන එක සාධාරණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේදී මම COPE එකේ ඉන්නකොට සභාපතිවරු හිටියා, කටට ඇඟිල්ල තියලා "ෂ්" කියලා කථා කරන්න එපා කියලා පැමිණි නිලධාරින්ට පෙන්වන. ඒ කියන්නේ, COPE එකේදි යම් කාරණයක් ගැන විවාද වෙනකොට, සාකච්ඡා වෙනකොට ආණ්ඩු පක්ෂය නියෝජනය කරපු සභාපතිවරයා කටට ඇඟිල්ල තියලා "ෂ්" කියලා, ඊට පස්සේ නහය හාරනවා වාගේ පෙන්වන වීඩියෝ එකක් ගියා. ඒක මතක ඇති, ගොඩක් අයට. COPE එකේ දැන් ඉන්න සභාපතිවරයා ගැන හෝ සාමාජිකයන් ගැන මම චෝදනා කරන්නෙත් නැහැ; සහතික දෙන්නෙත් නැහැ. හැබැයි, මේ set කරන precedent එක පිළිබඳව හිතන්න ඕනෑ.

මම පසුගිය පාර්ලිමේන්තු සතියේදිත් කිව්වා, ඒ අවස්ථාවේ money laundering පිළිබඳ ගෙනාපු පනතින් කිසිම oversight එකක් නැතිව පොලීසියට සම්පූර්ණ බලය ලබා දීම මේ ආයතන දේශපාලනීකරණය කිරීමේ ආරම්භයක් කියලා. හැමදාම ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් තියෙයි, හැම දාම COPE එකේ සභාපතිවරයා ජාතික ජන බලවේගයේ වෙයි කියලා විශ්වාස කරන්න බැහැ නේ. මේවා ඉදිරි අනාගතයේදීත් දේශපාලනීකරණය වෙන්න පුළුවන්. අපි අද දවසේ කුරුසේ ගහනවා, යම් කණ්ඩායමක්. මොකක් නිසාද කුරුසේ ගහන්නේ? මෙන්න මේ දේවල් වෙලා තිබෙනවා කියලා කියනවා. අද ඉදිරිපත් කරන ආයතන පිළිබඳව, ඒ කාරණා පිළිබඳව මම අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, ප්‍රතිපත්තිමය වශයෙන් මගේ මතය ඒක වැරදියි කියන එකයි. ඒක ඉදිරිපත් කරන්න Attorney-Generalට, ඉදිරිපත් කරන්න පොලිස්පතිට, ඉදිරිපත් කරන්න CIABOC එකට. ඒකට මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න. ඒක ගැන මේ පාර්ලිමේන්තු සභාව තුළ විවාද කිරීම මා දකින විධියට ඉතාම වැරදියි. මොකද, මේ වෙනකොට සමහර වංචා දූෂණ පිළිබඳ හරියටම සොයා බලනවාද කියන එක පිළිබඳ සැකයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දේශපාලන අල්ලසක් ලෙස bar permits ලබා දීම පිළිබඳව ජනාධිපතිතුමාම සඳහන් කළා. අපි දැනුවත්ව ඒ පිළිබඳව අද Bribery Commission එකේ පැමිණිලි තිබෙනවා. ඒවාගේ විශාල අකර්මණ්‍යතා, එහෙම නැත්නම් විශාල වැරදි, විශාල චෝදනා තිබෙන කොට ඒවා පිළිබඳව හරි පරීක්ෂණයක් සිදු වෙනවාද කියන එක පිළිබඳව ලොකු ප්‍රශ්නාර්ථයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේකෙන් සිදු වෙන්නේ කුමක්ද? රජයේ ව්‍යාපාර කටයුතු පිළිබඳ ආයතනවල ඉන්න නිලධාරින් මින් ඉදිරියට වැඩ කරන්නේ කොහොමද කියන එක පිළිබඳ සැකයක් තිබෙනවා. මේවා ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. අපි හොරු අල්ලන්න එපා කියන්නෙත් නැහැ; හොරුන්ට දඬුවම් දෙන්න එපා කියන්නෙත් නැහැ. හැබැයි, මේ කාරණා මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කිරීම තුළින් යම් පුද්ගලයන්ගේ ජීවිතවලට වන හානිය ගැන කල්පනා කරන්න. ඔවුන් වැරදිකරු වෙලා ඉවරයි, මේ පාර්ලිමේන්තුව තුළ. ඒගොල්ලන්ට අවස්ථාවක් දෙන්නේ නැහැ, ඒගොල්ලන් වැරදිද, නැද්ද කියලා කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉල්ලීමක් කරනවා. මින් ඉදිරියට COPE එකෙන් CIABOC එකට යවන්න ඕනෑ නම් යවන්න. Standing Orders, amend කරලා COPE එකෙන් IGPට යවන්න. හැබැයි, ඒවා මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවාදයට ලක් කරලා ඒ මිනිස් ජීවිත තුච්ඡ මට්ටමට දමන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා. මොකද, වැරදි කරපු නැති අයත් ඉන්න පුළුවන්. අපි දන්නවා, පසුගිය කාලයේ මඩකලපුව දිස්ත්‍රික්කයෙත් ඇමතිවරු තර්ජනය කරලා නිලධාරින්ට සමහර ක්‍රියාමාර්ග ගන්න වුණා කියලා. පොතේ හැටියට එනකොට ඒකට නිලධාරියාටත් බැහැ කියන්න බැහැ. හැබැයි, අද නිලධාරියා තමයි මේ ගැටලුවට අහු වෙන්නේ.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த வாரம் வைத்தியர் இராமநாதன் அர்ச்சுனா அவர்கள் கலந்துகொண்ட கிளிநொச்சி மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் நடந்த விடயத்தை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். ஏனெனில், மக்களால் தெரிவு செய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர் ஒருவர் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் ஒரு பிரச்சினையை முன்வைக்கும்பொழுது அந்த இடத்துக்கு நேரடியாகச் சென்று அமைச்சர் அவர்கள் அவருடைய கையைப் பிடிக்கின்ற மாதிரித்தான் காணொளியில் இருந்தது. காணொளியைப் பார்க்கும்போது, இராமநாதன் அர்ச்சுனா அவர்கள் கதிரையில் அமர்ந்திருப்பது தெரிகின்றது. இதற்கு முதல், அமைச்சர் அவர்கள் அவருடைய இடுப்பில் கிள்ளிய video ஒன்றும் வெளிவந்திருந்தது. அது வேறு விடயம்! இடுப்பில் கிள்ளியது சரியா, அடிக்கப் போனது சரியா? என்பது எனக்குத் தெரியாது. ஆனால், பாராளுமன்ற உறுப்பினராகத்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

தெரிவு செய்யப்பட்ட ஒருவரை, அந்தக் கூட்டத்திலிருந்து வெளியேற்றுவதற்கு அவருக்கு அதிகாரமில்லை. அந்த இடத்தில் தேசிய மக்கள் சக்தியின் ஊழல் சம்பந்தமாகத்தான் அவர் பேசினார். இன்று நீங்கள் COPEஇல் ஊழல்வாதிகளைக் கண்டுபிடித்து விசாரணை செய்வது நியாயம். ஆனால், பாராளுமன்ற உறுப்பினர் இராமநாதன் அர்ச்சுனா அவர்கள் கிளிநொச்சி மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் பேச -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rasamanickam, your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I have two more minutes. But, you want me to wind up because it is already 12.30 p.m. So, I will wind up within a minute.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It is 12.30 p.m. now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay. I will wind up, Sir.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இறுதியாக ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். தமிழ் பேசும் கட்சிகள் ஒன்றாகச் சேர்ந்து செயற்படுவது, மிக முக்கியமான மூன்று விடயங்களை முன்வைத்துத்தான். அவையாவன: புதிய அரசியலமைப்பு, மாகாண சபைத் தேர்தல், தமிழ் பேசும் சமூகம் முகங்கொடுக்கும் காணிப் பிரச்சினைகள். இதனைப் பிழையான கோணங்களில் வெளியில் சொல்ல முயற்சிப்பது உண்மையிலேயே ஏற்றுக்கொள்ள முடியாத, பிழையான விடயமாகும். எங்களுடைய இலங்கை தமிழரசுக் கட்சியானது, பிரதானமாக தமிழ் மக்களுக்கு இந்த நாட்டில் நிரந்தரமான ஓர் அரசியல் தீர்வு வேண்டும் என்பதில் உறுதியாக இருக்கின்ற கட்சியாகும். தமிழ் பேசும் மக்கள் சார்ந்த கட்சிகள் அனைத்தையும் ஒன்றிணைத்து, இந்தப் பணியை நாங்கள் முன்னெடுத்துச் செல்வது தவறான விடயம் என்றும் தேவையில்லாத விடயம் என்றும் சொல்கின்றார்கள். இதனை அரசாங்கத் தரப்பினர் சொன்னால் ஏற்றுக்கொள்ள முடியும். ஏனெனில், அவர்களுக்கு ஓர் அச்சம் இருக்கின்றது. அவர்கள் கடந்த காலத்தில் சொன்னார்கள், "தமிழ் மக்கள் ஒற்றுமையாக இல்லை. வடக்கு, கிழக்கில் தமிழ் பேசும் மக்கள் ஒன்றைச் சொல்கின்றார்கள். இங்குள்ள மக்கள் இன்னொன்றைச் சொல்கின்றார்கள். மலையக மக்கள் வேறொன்றைச் சொல்கின்றார்கள்" என்று.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, would you please wind up?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I am winding up.

இன்று தமிழ் பேசும் சமூகத்தில் இருக்கின்ற மூன்று தரப்பினரும் ஒன்றாக இணைந்து, இந்த மூன்று விடயங்களையும் வலியுறுத்தும்போது, இது தவறான விடயம் என்று சொல்பவர்கள், என்னைப் பொறுத்தவரையில் அரசாங்கத்தின் பிரதிநிதிகளாகத்தான் இருக்க வேண்டும். இதனால் அரசாங்கத்துக்குத்தான் பாதிப்பே தவிர, எங்களுக்கு அல்ல. நாங்கள் சேர்ந்து பயணிப்பதில் தமிழ் பேசும் மக்களுக்கு எந்தப் பாதிப்பும் இல்லை. அது நன்மையாகத்தான் இருக்குமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what brings you to your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම සඳහන් කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
There was nothing detrimental to you. He spoke for you.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thirty seconds දෙන්න, මම පැහැදිලි කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, you get 30 seconds.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அன்று DCC meetingஇல் நான் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்தும்கூட, என்னை "வெளியே

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்று கூறி, எனது கையைப் பிடித்து fileஜத் தூக்கி எரியுமளவுக்கு இந்த அரசாங்கம் போயிருக்கின்றது. இந்த

விடயத்தில் தமிழ்ப் பாராளுமன்ற உறுப்பினரான கௌரவ சாணக்கியன் அவர்கள் எனக்காகக் குரல்கொடுத்ததற்கு நன்றி கூறுகின்றேன். அமைச்சர் ஒருவர், பாராளுமன்ற உறுப்பினர் ஒருவரை "வெளியே

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்று சொல்கின்ற அளவுக்கு இந்த அரசாங்கம் போயிருக்கின்றது. எனவே, இது தொடர்பில் விசாரணை - විමර්ශනය - செய்யுமாறு அன்புடன் கேட்டுக் கொள்கிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. M.K.M. Aslam. You have eight minutes.

[பி.ப. 1.00]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ இராசமாணிக்கம் அவர்கள் கூறியது போன்று, இந்த நாட்டில் பல அரச அதிகாரிகள் அரசியல் தலைவர்களால் பாரிய பாதிப்புக்கு உள்ளாக்கப்பட்டு உள்ளார்கள். இன்று எமது அரசாங்கத்தில் அரச அதிகாரிகளுக்குப் பூரண சுதந்திரம் வழங்கியுள்ளோம். எமது அரசாங்கமோ, அரசியல் தலைமையோ ஒருபோதும் அதிகாரிகளைப் பிழையான வேலைகளில் ஈடுபட motivation வழங்குவதில்லை. பிழையான நிதிக் கொடுக்கல்வாங்கல் களுக்கு, சட்டத்துக்கு முரணான செயற்பாடுகளுக்கு ஒருபோதும் இந்த அரசாங்கம் வழிகாட்டுவதும் இல்லை; தலைமைத்துவம் வழங்குவதும் இல்லை. கடந்த அரசாங்கங்களில் இருந்த அரசியல்வாதிகள் செய்த ஊழல் காரணமாகத்தான் அரசாங்க உத்தியோகத்தர்கள் இன்று பலவிதமான பாதிப்புகளுக்கு உள்ளாக்கப்பட்டுள்ளார்கள். எனவே, நாங்கள் கௌரவ உறுப்பினருக்கும் இந்த நாட்டு மக்களுக்கும் கூறிக்கொள்கின்ற விடயம் என்னவெனில், எமது அரசாங்கத்தில் அரச உத்தியோகத்தர்கள் மிகவும் பாதுகாப் பாகவும் கௌரவமாகவும் சுதந்திரமாகவும் செயற்பட்டு, தங்களுடைய தொழிலை அரசாங்கத்தோடு சேர்ந்து அழகான முறையில் செய்துகொண்டு இருக்கின்றார்கள் என்பதைத்தான். எனவே, பாதுகாப்பான சூழலானது நல்லதோர் ஆட்சிமூலம் தான் அரச அதிகாரிகளுக்குக் கிடைக்கும்.

அரசியலமைப்பின் ஊடாக பாராளுமன்றத்துக்கே நிதி தொடர்பான முழு அதிகாரங்களும் வழங்கப்பட்டுள்ளது. அதாவது, பாராளுமன்றம்தான் நிதிக் கொடுக்கல்வாங்கல் மற்றும் நிதி நிருவாகத்துக்குப் பொறுப்பாக உள்ளது. COPE, COPAஇல் பல விடயங்கள் விசாரணையுடன் மட்டும் நின்றுவிடுவதைத்தான் நாங்கள் கடந்த காலங்களில் கண்டோம். எங்களுடைய கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் COPEஇன் தலைவராக இருந்த காலத்தில், அக்குழுவின் பரிந்துரைகளுக்கு அமைய, தவறிழைத்தவர்களுக்கு - அது அரச அதிகாரிகளாக இருக்கலாம் அல்லது அரசியல் தலைமைகளாக இருக்கலாம் - தண்டனை வழங்க வேண்டும் என்பதற்காகப் பாரிய முயற்சியில் ஈடுபட்டார்.

எனினும், அன்றிருந்த அரசாங்கம் அதற்கு உதவி செய்யவில்லை. எமது வாக்குறுதிக்கமைய எமக்கு மக்கள் வாக்களித்ததன் அடிப்படையில், ஊழல் மற்றும் மோசடிக்கு எதிரான சட்ட நடவடிக்கைகளை COPE ஊடாகச் செய்வதற்கு முன்வந்துள்ளோம். அந்தப் பாரிய மாற்றம் தொடர்பான விடயமே இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப் பட்டு இருக்கின்றது. COPEஇன் அறிக்கைகளை நேரடியாக Commission to Investigate Allegations of Bribery or Corruption, CID போன்ற நிறுவனங்களுக்குக் கொடுப்பதன் மூலம், ஊழல், மோசடிகள் விசாரிக்கப்பட்டு, குற்றவாளி களுக்குத் தண்டனை வழங்கப்படுவது மட்டுமல்லாமல், எதிர்காலத்தில் இவ்வாறான ஊழல், மோசடிகள் நடை பெறாமல் இருப்பதற்கும் வழியேற்படும். கடந்த காலத்தில் நடைபெற்ற ஊழல்களை நாங்கள் பார்ப்போமேயானால், ஒன்றில் அவர்கள் பொதுமக்களின் நிதியைக் களவாடுவதற்கு ஏற்றவாறு சட்டதிட்டங்களை மாற்றிக் கொண்டார்கள் அல்லது தமது அரசியல் இலாபத் துக்காக, political campaignக்காக, மக்களுடைய வாக்குகளைப் பெறுவதற்காக அரச நிறுவனங்களின் நிதியைப் பயன்படுத்தி னார்கள்.

ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் ஆட்சிக் காலத்தில், 2024ஆம் ஆண்டு கிட்டத்தட்ட 537 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு, இளைஞர்களை அழுத்தங்களிலிருந்து மீட்டெடுப்பதற்காக 6 நிகழ்ச்சிகள் நடத்தப்பட்டதாக Auditor-Generalஇன் அறிக்கையில் குறிப்பிட்டுள்ளது. அவையாவன: Smart Youth புத்தாண்டு விழா, தேசிய இளைஞர் வெசாக் விழா, தேசிய இளைஞர் பொசன் வலயங்கள், யாழ்ப்பாணம் மற்றும் அம்பாறையில் இளைஞர் சந்திப்பு நிகழ்ச்சிகள், 31st Night இளைஞர் கொண்டாட்டம், Smart Youth Exhibition. இவை எந்தவித பிரயோசனமும் இல்லாத நிகழ்ச்சிகள் ஆகும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරින් ප්‍රනාන්දු මහත්මයා අමාත්‍ය ධුරය දරපු තරුණ කටයුතු විෂය භාර අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා සභාවෙන් 2024දී වැඩසටහනක් කළා, තාරුණ්‍යය පීඩනයෙන් මුදා ගැනීම කියලා. ඒ වාගේ වැඩසටහන් 6ක් කර තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 535ක් වියදම් කර තිබෙනවා. විගණකාධිපති වාර්තාවේ කියා තිබෙනවා, එය කිසිදු ප්‍රයෝජනයක් නැති වියදමක් කියලා. 2024 සැප්තැම්බර් මාසය කියන්නේ ඡන්දය පැවැති කාලය. ඡන්දෙට තමයි ඒ කට්ටිය ජාතික තරුණ සේවා සභාව පාවිච්චි කරලා තිබෙන්නේ. මිලියන 535ක් ඒ ආකාරයට වියදම් කරලා තිබෙන්නේ කොයි කාලයේද? 2024දී, රට බංකොලොත් වෙලා තිබුණු කාලයේ. එම වැඩසටහනෙන් අවධාරණය කර තිබුණා, "කොරෝනාවෙන් පීඩාවට පත් තාරුණ්‍යය පීඩනයෙන් මුදා ගැනීම" කියලා. කොරෝනා වසංගතය ඇති වුණේ කොයි කාලයේද? නමුත් 2020 -2021 කාලයේ වුණු දේවල් අරගෙන කථාවක් හදනවා, 2024 වසරේදී. 2024 වර්ෂය කියන්නේ අරගළයෙන් පසුව ලොකු වෙනසක් වුණු කාලයක්. ඒ විධියට COPE එකේ, COPA එකේ විමර්ශනයට භාජන වන ආයතන දේශපාලනීකරණයට ලක් කරමින්, ඒ නිලධාරින් තමන්ගේ ග්‍රහණයට හසු කර ගනිමින් එතුමන්ලාගේ ඡන්ද campaign එක ගෙන ගිය ඉතිහාසයක් තමයි අපි දැක්කේ. මොකක්ද, අපේ වගකීම?

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

எங்களுடைய கடமை என்ன? நாங்கள் இந்த நாட்டின் நிதியை, சொத்துக்களைப் பாதுகாக்க வேண்டும். இந்த நாட்டில் எமது அரசாங்கம் போன்றதொரு சிறந்த தலைமைத் துவமுள்ள அரசாங்கம் இருக்கும்போதுதான், தேவையான சட்டங்கள் இயற்றப்படும். கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களுடைய கனவு இன்று நனவாகின்றது. அன்று அவர் என்ன சொன்னார்? "COPEஇல் Attorney-General அல்லது நீதித்துறை சார்ந்த அதிகாரிகளை அமர்த்தி விசாரணைகளை மேற்கொள்ளும் பொறுப்பை நேரடியாக அவர்களுக்குக் கொடுப்பதன்மூலம் நாட்டில் இடம்பெறக் கூடிய ஊழல், மோசடிகளைத் தடுக்க முடியும்" என அவர் கூறினார். எனினும், அன்று அவருடைய முயற்சி தோல்வியடைந்தது. ஏனெனில், அன்றைய அரசாங்கம் வேறொரு தலைமைத்துவத்தின்கீழ் இருந்தது. அவருடைய கனவை இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் நனவாக்கியுள்ளது. எனவே, நாட்டின் எதிர்காலம் மிகவும் சிறந்ததாக இருக்கும்.

ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමාගේ අදහසට අපි ගරු කරනවා. නමුත් මේ ආණ්ඩුව යටතේ තමයි රාජ්‍ය නිලධාරින්ට තමන්ගේ වගකීම නිදහසේ ඉෂ්ට කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපි කිසි දවසක නායකත්වය දෙන්නේ නැහැ, අපරාධ කරන්න හෝ දූෂණයට හෝ වංචාවට. පසුගිය ආණ්ඩුවල හිටපු දේශපාලන නායකයන්ගේ මඟ පෙන්වීම මත කරපු වැරැදිවලට තමයි අද ඔවුන්ට වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් අපේ ආණ්ඩුව යටතේ කිසිම නිලධාරියෙක් කිසි දවසක අපහසුතාවට පත් වන්නේ නැහැ. අපේ ආණ්ඩුවක් තිබුණත්, නැතත් අපේ ආණ්ඩුව පවතින කාලයේ කරන සේවාවට අදාළව කිසිම නිලධාරියෙකු කිසිම දවසක විභාගයකට හෝ විමර්ශනයකට භාජන වෙන්නේ නැති බව විශ්වාසයෙන් යුතුව කියමින්, අද වන විට COPE එක වෙනස් වෙලා හොඳ සන්ධිස්ථානයකට ඇවිත් තිබෙන බවත් කියමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chamara Sampath Dasanayake. You have 10 minutes.

[අ.භා. 1.08]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් තෝරා ගත් ආයතන කිහිපයකට අදාළ වැරැදි සම්බන්ධ සිදුවීම් කීපයක් නිසි පියවර ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කිරීමේ තීරණය අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාලයේ වැරැදි හෙව්වා වාගේම දැනුත් වැරැදි පෙළ ගස්වමින් යනවා. හැම දාම COPE එක ඔබතුමන්ලා යටතේ තිබෙන්නේ නැහැ. මේ ආණ්ඩුව වෙනස් වෙලා ඊළඟ ආණ්ඩුව ආවාම මේ කාලයේ කරන වැරැදිත් සොයනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම ස්තුතියක් කරන්න ඕනෑ. ඔබතුමා ඔය ආසනයේ සිටි වෙලාවක මම මේ සභාවේදී කිව්වා, බණ්ඩාරවෙල ධර්මාශෝක විද්‍යාලයේ lab එකේදී වුණු පොඩි අත් වැරැදීමකින් ළමයෙක් පිච්චුණා කියලා. මම ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදී කිව්වාට පසු ජනාධිපති අරමුදලින් මාසිකව රුපියල් 25,000ක් දෙන්න ආණ්ඩුව පොරොන්දු වෙලා තිබෙනවා. ඒ ළමයා වෙනුවෙන් මාසිකව රුපියල් 25,000ක දීමනාවක් ලබා දීමට තීරණය කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභානායකතුමා තමයි එදා ඒ වෙලාවේ ඒ ගැන සොයා බලන බව කිව්වේ. අන්න ඒ වාගේ දේවල් කරනවා නම් බොහොම හොඳයි. අපි විපක්ෂය විධියට පාර්ලිමේන්තුවේදී කියන ඒ වාගේ දේවල් ගැන බලලා සොයලා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

මම මෙතැනදී කියනවා, COPE එකෙන් මේ විධියට ඒ ඒ ආයතන ගැන සොයනවා වාගේම සෙවිය යුතු තවත් කාරණයක් ගැන. පසුගිය දවසක සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ මුදල් රුපියල් ලක්ෂ 87ක් වියදම් කරලා දිස්ත්‍රික්ක 6ක නිලධාරින් අරලියගහ මන්දිරයට ගෙන්වා රැස්වීමක් පවත්වා තිබෙනවා. මගේ ළඟ ඒ list එක තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වෙනුවෙන් ලක්ෂ 87ක් වියදම් කර තිබෙනවා. සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල කියන්නේ සමෘද්ධි නිලධාරින් ටිකට් විකුණා හොයපු සල්ලි. ඒ ටිකට් විකුණා හොයපු සල්ලිවලින් ලක්ෂ 87ක් ඒකට වියදම් කරලා තිබෙනවා. කෝටි ගණනක් සල්ලි එකතු කරලා සමෘද්ධි නිලධාරින් ගෙන්වලා රැස්වීම් පවත්වනවා. ඒ රැස්වීම් තියන්නේ මොකටද? "අස්වැසුම" සහනාධාරය හෙට-අනිද්දා වෙනකොට කපන්න හදනවා. "අස්වැසුම" සහනාධාරය කැපුවාට සමෘද්ධි ව්‍යාපාරයේ සල්ලි තිබෙනවා. අවුරුදු තිහක් තිස්සේ සමෘද්ධි ව්‍යාපාරය එකතු කරපු මුදල් සියයට දෙකේ පොලියට ලක්ෂ 5 ගාණේ දීලා අස්වැසුම සහනාධාරය අයින් කරන්න ආණ්ඩුව ලෑස්ති වෙනවා. සමෘද්ධි ව්‍යාපාරය අනිවාර්‍ය වත සංවාරා කරන්න තමයි මේ ආණ්ඩුව ලෑස්ති වෙන්නේ. සියයට දෙකේ පොලියට රුපියල් ලක්ෂ 5 ගාණේ දීලා කෙළින්ම සමෘද්ධියට ෂොට් එක දෙන්නයි යන්නේ. ඉතින් ඒකත් අපි මේ වෙලාවේ සමෘද්ධි ව්‍යාපාරය වෙනුවෙන් කියන්න ඕනෑ.

ඒ වාගේම, දූෂණ චෝදනා ගැන හොයන එක හොඳයි. අද වන විට සම්පූර්ණයෙන්ම දූෂණ චෝදනා ගැන තමයි හොයන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අතේ තිබෙන මේ photo එකේ ජනාධිපති ලේකම්තුමා එක්ක ඉන්නේ විභාග දෙපාර්තමේන්තුවේ හිටපු විභාග කොමසාරිස්. මෙයාගේ නම බෙල්ලනගේ සනත් පූජිත. එයා විශ්‍රාම ගියාට පස්සේ දැන් නැවත විභාග දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ කටයුතු භාරදීලා තිබෙනවා. "LankaeNews" website එකට ගිහිල්ලා බැලුවාම මෙයා ගැන සොයා බලන්න පුළුවන්. ප්‍රශ්න පත්‍ර දූෂණ චෝදනා ගොඩකට සම්බන්ධ විභාග දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිට pension ගිය හිටපු කොමසාරිස් තමයි අලුතින් මේ විධියට පත් කර තිබෙන්නේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා දූෂණ පිළිබඳව සොයා බලා ඒ වාර්තා අද පාර්ලිමේන්තුවට එවලා, පාර්ලිමේන්තුවෙන් සුදුසු තැන්වලට යවන්න කටයුතු කරනවා වුණත්, මේ ආකාරයට චෝදනා තිබෙන අය තමයි මේ තනතුරුවලට පත් කරලා තිබෙන්නේ. ජනාධිපති ලේකම්තුමා තමයි ඒ පත්වීම දීලා තිබෙන්නේ. ජනාධිපතිතුමා තමයි ඒ පත් කිරීම කරලා තිබෙන්නේ. ඒ පත්වීම ලබාදෙන photo එකත් මගේ ළඟ තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. මේ කාරණය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනගන්න ඕනෑ. අපේ රටින් සවුදි අරාබියට රියැදුරන් හැටියට 159 දෙනෙක් යවා තිබෙනවා. මේ වන විට ඒ 159 දෙනා ඒ රටේ අනාථ වෙලා තිබෙනවා. මේ 159 දෙනා යවා තිබෙන්නේ කොල්ලුපිටියේ තිබෙන Ashif Travels & Tours කියන ආයතනයකින්. Ashif Travels & Tours කියන ආයතනය මේ 159 දෙනාට කියලා තිබෙන්නේ රියාල් 1,700ක පඩියකට ඒ රටේ සේවයට යවනවා කියලායි. රියාල් 1,700ක පඩියක් ලැබෙනවා කිව්වාට, ඒ අයට දැන් ලැබෙන්නේ රියාල් 600යි. ඒ අය දැන් සවුදියේ අනාථ වෙලා ඉන්නේ. ගෙවල් දොරවල් උකස් තියලා ණය වෙලා තමයි මේ අය රට ගියේ.

ඊළඟ කාරණය මේකයි. ආණ්ඩුව කරපු හොඳ දේවල් හොඳයි කියලා මම කිව්වා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රියදුරෙක් බීලා පොලීසියට අහු වුණොත් දැන් රුපියල් 25,000ක් දඩ ගහනවා. රුපියල් 25,000ක් දඩ ගහනවා, ලයිසන් එක මාස තුනකට තහනම් කරනවා. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න 2023 අවුරුද්දේ බීලා ගිහිල්ලා accident එකක් වෙනවා. ජනාධිපතිතුමා "නීතියේ රූලෙන් උඩ කවුරුවත් නැහැ" කිව්වාට, රවී සෙනෙවිරත්නට ගල්කිස්ස උසාවියෙන් දඩ ගහලා තිබෙන්නේ රුපියල් 2,500යි. නමුත් ගමේ අහිංසක මිනිහෙක් රා බෝතලයක්, අරක්කු ටිකක් බීලා වාහනයක් පැද්දොත් දඩය රුපියල් 25,000යි. ඔහු බීලා වාහනයක් හැප්පුවත් නැතත් පොලීසියට අහු වුණොත් බැලුම පුම්බපු ගමන් දඩය රුපියල් 25,000යි. හැබැයි අරයාට? බැලුම් පුම්බලා, නඩු කියලා ඔක්කෝම කරලාත් එයාට රුපියල් 2,500යි දඩය. ඒ නීතිය මොකක්ද කියන්න මම දන්නේ නැහැ. පොලීසිය භාර ඇමතිතුමාත් දැන් සභාවට එනවා. ඒ ලබාදී තිබෙන්නේ අධිකරණ තීන්දුවක්. ඒ නිසා පොලීසිය භාර ඇමතිතුමාට ඒ ගැන කියන්න දෙයක් නැහැ. රවී සෙනෙවිරත්නට දඩය රුපියල් 2,500යි. අනෙක් අයට රුපියල් 25,000යි. ඒක ටිකක් රූලෙන් උඩට ගිහිල්ලා. ජනාධිපතිතුමා කිව්වේ හැමෝම නීතියේ රූලෙන් පල්ලෙහා ඉන්න ඕනෑ කියලා නේ. නමුත්, ඒක රූලෙන් උඩට ගිහිල්ලා. රවී සෙනෙවිරත්නට 2,500යි, සාමාන්‍ය මිනිහෙකුට 25,000යි.

අපේ අධිකරණ ඇමතිතුමාත් හෙමින් හෙමින් සභාවට එන නිසායි මම මේක කියන්නේ. අධිකරණ ඇමතිතුමනි, දැන් විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කරන්න යනවා කියලා ආරංචියක් තිබෙනවා. ඒක හොඳයි. හැබැයි, කථා කරගෙන තිබෙන්නේ අවුරුදු දෙකක් දීර්ඝ කරන්න නේද අධිකරණ ඇමතිතුමා? මම හිතන විධියට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලාගේ සේවා කාලය තවත් අවුරුදු දෙකකින් දීර්ඝ කරන්න තමයි කථා කරගෙන තිබෙන්නේ. හැබැයි, ඒ අවුරුදු දෙක 2027දී දුන්නාම, ඒක අවසන් වෙන්නේ 2029දී. ඊට පස්සේ 2029දී ඔබතුමන්ලා මැතිවරණය දින්නාට පස්සේ ඉතිරි අවුරුදු තුන දෙන්න තමයි තීරණය කරගෙන තිබෙන්නේ. මම කියන්නේ මේකයි. එහෙම ඕනෑ නැහැ. ඒ අවුරුදු පහම දෙමු. මොකද, ඊළඟ මැතිවරණයේදී ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැරදුනොත් ඒ මිනිස්සු පව් නේ. ඔබතුමන්ලාගේ මේ ආණ්ඩුව ඊළඟ මැතිවරණයේදී පරාද වුණොත් ඉතිරි අවුරුදු තුන අපරාදේ නේ. ඒ නිසා ඒ අවුරුදු පහම දෙන්න අධිකරණ ඇමතිතුමා. අවුරුදු දෙකක් දැන් දෙන්නයි, ඉතිරි අවුරුදු තුන පස්සේ දෙන්නයි, ඒක අපරාධයක් නේ. එක සැරේ අවුරුදු පහම දෙමු. නේද? ඉස්සෙල්ලා අවුරුදු දෙකක් දෙන්නයි, ඊට පස්සේ තවත් අවුරුදු තුනක් නැවත දෙන්නයි හදන්නේ මොකටද? ගිවිසුම ගහලා තිබෙන්නේ එහෙමලු. 2029 වෙනකම් අවුරුදු දෙකක් දෙනවා. 2029 ඡන්දෙන් පස්සේ තව අවුරුදු තුනක් දෙනවා. එතකොට අපේ කවුරු හරි ආණ්ඩුවක් ගත්තොත්,- මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මෙතැන හිනා වෙවී ඉන්නවා. ඊළඟ ආණ්ඩුවේ එතුමා අධිකරණ ඇමැතිවත් වුණොත්? එතුමාත් නීතිඥවරයෙක් නේ. එතුමාත් දැන් හිනා වෙවී ඉන්නවා. එහෙම වුණොත් එතුමා ඒ අවුරුදු තුන cancel කරන හින්දා, ඒ අවුරුදු පහම එක සැරේ දැන්මම දීලා තිබුණාම ඒක ලේසියි. ඒකත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊත් එක්කම අධිකරණ සේවය ගැනත් කියන්න ඕනෑ. උගත්, බුද්ධිමත් නීතිඥවරු තමයි අධිකරණ ඇමතිවරු වෙන්නේ. මේ සැරේ මහෙස්ත්‍රාත්වරු හැටියට 35දෙනෙක් බඳවාගෙන තිබෙනවා. ගම්පහ පැත්තේ ඉන්න එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන පවුල්වල අය වැඩි ලකුණු මට්ටමක හිටියා. නමුත් මහෙස්ත්‍රාත්වරු හැටියට බඳවාගෙන තිබෙන්නේ මාලිමාවේම අය විතරයි; මාලිමාවටම සම්බන්ධ අය විතරයි බඳවාගෙන තිබෙන්නේ. ලකුණු වැඩි අය ගැන කියන්න මම කැමති නැහැ. මොකද, ඒ ගැන කිව්වොත්, - මේ ක්ෂේත්‍රයේ ඉන්න අයගේ පුතාලත් එතැන ඉන්නවා. මේ රටේ එහෙම කරන්නත් බැහැ නේ. අම්මා බැංකුවේ වැඩ කරනවා කියලා පුතාත් බැංකුවේ වැඩ කරන්න බැහැ නේ. තාත්තා බැංකුවේ වැඩ කළා කියලා පුතාටත් බැංකුවට යන්න බැහැ නේ. ඒක හරි නැහැ. නමුත් ඒ වාගේ අය මේ 35 දෙනා අතර ඉන්නවා. ඒ වාගේම අඩු ලකුණු ලබාගත් අය ගොඩක් බඳවාගෙන තිබෙනවා. ඒ තොරතුරු අපට එනවා.

ඊළඟට ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ ගැන කියන්න ඕනෑ. ඒගොල්ලන්ගේ ස්ථාවර තැන්පතුවලට සියයට 15ක පොලියක් දුන්නා. ඒගොල්ලෝ කීයක් හරි fixed deposit එකක් දමලා තමයි ජීවත් වුණේ. මට පෙනෙන විධියට ඔයගොල්ලන්ට වයසක අය ඇලර්ජික් වෙලා තිබෙනවා; අවුරුදු 60, 70 පැනපු අය ඇලර්ජික් වෙලා තිබෙනවා. ඒ අයට දැන් account එකකට සල්ලි දාන්නවත් බැහැ. ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ අමතක කරන්න එපා. ඒ මිනිස්සුත් මේ රටේ ජීවත් වෙන්න ඕනෑ. මොකද, දැන් ඉස්සර වාගේ නොවෙයි. ළමයි දැන් සලකන්නේ නැහැ. ඒ අයට ළමයින්ගෙන් යැපෙන්න බැහැ. මොකද, ළමයි සලකන්නේ නැහැ. ඒ නිසා ඒ අය ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ හැටියට බොහොම පොඩි මුදලක් පොතක දමාගෙන ඒකට ලැබෙන පොලියෙන් තමයි ජීවත් වුණේ. හැබැයි, ඒ මිනිස්සුන්ට මේ ආණ්ඩුව වැඩේ දීලා ඉවරයි. ඒකත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට, පිටකොටුවේ බස් නැවතුම් පොළ සුද්ද කරලා, තීන්ත ටිකක් ගාලා ලස්සනට හැදුවා. ඊට පස්සේ ඒකේ තිබුණු ටැප් වාගේ දේවල් කඩාගෙන ගිහිල්ලා තිබෙනවා කිව්වා. ඒවා අපි කැඩුවාද වෙන කවුරුහරි කැඩුවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, ඒකත් විපක්ෂය පැත්තට දැම්මා. නමුත් ඒකට කමක් නැහැ, පිටකොටුවේ බස් නැවතුම් පොළ හොඳට හැදුවා. එතැන ව්‍යාපාර කරපු අය හිටියා. සාමාන්‍යයෙන් එතැන ටොෆි, සිගරට් විකුණපු මිනිස්සු හිටියා. ඒ විධියට අවුරුදු 30ක් විතර ව්‍යාපාර කරපු මිනිස්සු ඉන්නවා. දැන් ඒ මිනිස්සු ඔක්කෝම එළියට දමලා, අලුත් විධියට ටෙන්ඩර් දමලා තිබෙනවා. ඒ මිනිස්සු දැන් කබලෙන් ලිපට වැටිලා ඉන්නේ. පිටකොටුව බස් ස්ටෑන්ඩ් එකේ උඩ තට්ටුවේ පොත් විකුණපු අය හිටියා. ඒ අයත් කබලෙන් ලිපට වැටුණා. සාමාන්‍යයෙන් අපි මනුස්සයෙකුට අසාධාරණයක් කරනකොට, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chamara Sampath Dasanayake, your time has been exhausted now.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මට තව විනාඩියක් දෙන්න.

"හවුස් ඔෆ් ෆැෂන්ස්" කියලා රෙදි කඩයක් තිබෙනවා. ඒකේ අයිතිකරු ලොකු ව්‍යාපාරිකයෙක්. එයා undervalue කළා කියලා නඩු දමලා රිමාන්ඩ් කරලා තිබෙනවා. ව්‍යාපාරිකයන් බොහොම සුළු පිරිසයි ඉන්නේ. මේ සිංහල, බෞද්ධ මිනිස්සු. හැබැයි, ඒ මනුස්සයාට ඒ අසාධාරණය කරලා තිබෙන්නේ මොකක් නිසාද?

මහින්ද රාජපක්ෂට ගැවුණා නම්, එයාට ෂොට් එක දුන්නා. සජිත් ප්‍රේමදාසට ගැවුණා නම්, එයා undervalue කරලා! හැබැයි, මෙගොල්ලොත් එක්ක ඉන්න ව්‍යාපාරිකයෝ? Sri Lanka Customs එක කරන්නේ මොකක්ද? Sri Lanka Customs එකේ ඉන්න මේ මිනිස්සු මේ ආණ්ඩුව එන්න කලින් හිටියේ නැද්ද? ඒ අය "හවුස් ඔෆ් ෆැෂන්ස්" එකේ මිනිස්සු එක්ක ගනුදෙනු කළේ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

නැද්ද? දැන්, "හවුස් ඔෆ් ෆැෂන්ස්" එකේ අයිතිකාරයා රිමාන්ඩ් කරලා තිබෙනවා, undervalue කළා කියලා. ඒ මනුස්සයා ව්‍යාපාරිකයෙක්. මහින්දලාට ගැහුණා නම්, විපක්ෂයේ නම් undervalue කරලා. ඔබතුමන්ලා එක්ක හිටියොත් undervalue කරන්නේ නැහැ. ඔය "හවුස් ඔෆ් ෆැෂන්ස්" එකේ එක්කෙනා එක්කෝ මහින්ද මහත්මයාට, නැත්නම් ගෝඨාභය මහත්මයාට උදව් කරලා ඇති, ඔබතුමන්ලාට උදව් කරලා නැතිව ඇති, සන්තෝසම් දීලා නැතිව ඇති. ඒ නිසා එතුමා රිමාන්ඩ්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
හරියට ඇමරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් වාගේ. අපි කැස්සත් ඩොනල්ඩ් ට්‍රම්ප් tax ගහනවා. ඩොනල්ඩ් ට්‍රම්ප්ට විරුද්ධව මොකක් හරි කියපු ගමන්, ඉඳපල්ලා උඹලට කියලා tax එක සියයට 40ක් කරනවා. ඩොනල්ඩ් ට්‍රම්ප්ට විරිත්තුවත් වැඩි කරනවා. ඒ වාගේ තමයි මේ ආණ්ඩුවත්. Undervalue කරනවා නම්, - දෙයි හාමුදුරුවනේ, මේ Sri Lanka Customs එකේ අයත් එක්ක මේ මනුස්සයෝ අවුරුදු 30ක් විතර හිටියානේ. ඒ කාලයෙත් ඕවා කරන්න තිබුණානේ. එදා මේවා කළේ නැහැ. මේ ව්‍යාපාරිකයෝ ටික ආරක්ෂා කරගන්න. හැමදාම මහින්දගේ කියන ව්‍යාපාරිකයෝ නැහැ. හැමදාම සජිත්ගේ කියන ව්‍යාපාරිකයෝ නැහැ. ඒ මිනිස්සු හරියට වැඩේ කරගෙන යනවා නම් ඒ මිනිස්සුන්ට උදව් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up now.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ මිනිස්සු සිරගත කරලා ඒ ව්‍යාපාර බිමට වට්ටවනවා. ඒක කවුරු කරනවාද කියලා අපි දන්නේ නැහැ. තුන්වැනි ලෝකයේ රටවල තමයි ඔය දේශපාලන පළිගැනීම තිබෙන්නේ. ඒකයි තුන්වැනි ලෝකයේ රටවල් දියුණු වෙන්නේ නැත්තේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වපුරවා ගෙන කටයුතු කරන අපේ රටවල් කවදාවත් දියුණු වෙන්නේ නැහැ. වෙනත් රටවල නම් නැඟිටින මිනිස්සුන්ට අත දෙනවා. ඒ මිනිස්සුන්ට පක්ෂය වැඩක් නැහැ, ව්‍යාපාරිකයා ඉහළට ඔසවනවා. අන්න එහෙම වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවේ නැහැ කියන එක ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chandima Hettiaratchi. You have eight minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Upul Kithsiri to the Chair?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
Sir, I propose that the Hon. Upul Kithsiri do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON.UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 1.21]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ කරමින් ඉන්නේ ඓතිහාසික විවාදයක්. ඇයි ඒ? රට තුළ දීර්ඝ කාලයක් තිස්සේ විවාදයට ලක් වුණු, රටේ ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලපු, අරගළ කරපු, ආණ්ඩුකරණය පිළිබඳ මූලික ගැටලුවක් විසඳන්න මේ ගරු පාර්ලිමේන්තුවට පුළුවන් වෙලා තිබෙන නිසා. ආණ්ඩුකරණය, නිකම්ම ආණ්ඩුකරණයේ සිට යහපත් ආණ්ඩුකරණය දක්වා ගෙන ඒමට, ඔසවා තැබීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. රාජ්‍ය භාණ්ඩාගාරය වැය කරන්නේ මේ රටේ ජනතාව මහන්සියෙන් හම්බ කරලා එවන මුදල්. එතැන තමයි ඒවා එකතු වෙන්නේ. ජනතාව මුදල් උපයා එව්වාම ජනතාවගේ පොදු සුබසිද්ධිය සඳහා ඒවා යොදා ගන්න ඕනෑ. ඒක තමයි මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන වගකීම. ඒ නිසා එම ආයෝජන නිසි පරිදි ආයෝජනය කරලා තිබෙනවාද, එහි ප්‍රතිලාභ ජනතාව වෙත අරගෙන යන්න අවශ්‍ය කරන පසුබිමක, වපසරියක කටයුතු මෙහෙයවලා තිබෙනවාද කියන කරුණු විමර්ශනය කිරීම තමයි COPA එකෙත්, COPE එකෙත් වගකීම. මේ පාර්ලිමේන්තු සභා ගර්භයට ඉදිරිපත් කරන කාරණා ඒ කමිටු තුළදී දීර්ඝ ලෙස සංවාද කරලා විමර්ශනයට ලක් කරනවා; කරුණු සොයා බලනවා. ඉතිහාසය පුරාම මේක සිද්ධ වුණා. නමුත්, ජනතා මුදල් පෞද්ගලික වාසි සඳහා පාවිච්චි කරලා තිබෙනවාද, ඒ මුදල් අවභාවිත කර තිබෙනවාද, විනාශ කර තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් විමර්ශන කරලා ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද, ඒ ක්‍රියාමාර්ග ප්‍රමාණවත්ද, එවැනි විනාශ, වංචා සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ ධනය නැවත අත්පත් කරගන්න, අය කරගන්න අදාළ ක්‍රියාමාර්ග ගත්තාද කියන කාරණය ගැන රටේ හැමදාම විවාදයක් තිබුණා. අන්න ඒ විවාදය තමයි අද අපි අවසන් කරගෙන තිබෙන්නේ. ආණ්ඩුව විධියට මෙන්න මේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය ශක්තිමත් තැනකට අරගෙන එන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකරණ ක්‍රියාවලිය සම්බන්ධ සාකච්ඡාව මතු වෙනකොට අපේ විපක්ෂය විවිධ තර්ක ඉදිරිපත් කරනවා. එතුමන්ලා ඉදිරිපත් කරන තර්ක අතර ප්‍රධානම කාරණයක් තමයි, මේ ක්‍රියාවලිය හරහා අපි අපේ රටේ රාජ්‍ය නිලධාරින් බය කරමින් ඉන්නවා කියන එක. එහෙම නැහැ. මෙහිදී අපේ රටේ රාජ්‍ය නිලධාරින් බය වෙනවා නොවෙයි, හොරු

බය වෙනවා. විපක්ෂය හරි ආසයි, හරි කැමැතියි අපි මේ කමිටුවලට නිලධාරින් ගෙන්වලා, චෝදනා කරලා, ඒ නිලධාරින් රට ඉදිරියේ අපහසුතාවට පත් කරලා හිරේ යැව්වා නම්. හැබැයි, දැන් ඒක නොවෙයි වෙන්නේ. ඇත්තටම මේ සියලු කමිටු තුළින් සිද්ධ වෙන්නේ, ඒ නිලධාරින්ට සහ ඒ ආයතනවලට වැරදි ක්‍රියාමාර්ග ගන්න වුණා නම් එසේ ගැනීම සඳහා බල කරනු ලැබුවේ කවුරුන් විසින්ද, ඒ තීන්දු තීරණ ගත්තේ කවුද, ඒ තීන්දු තීරණවලට බලපෑම් කළේ කවුද කියන කරුණු ඉදිරිපත් කරන වාර්තා හරහා විමර්ශනය කිරීමයි.

උදාහරණයක් විධියට LRC එක ගත්තොත්, LRC එකේදී පුටුව පොළොවේ ගහලා, කුණුහරුපයෙනුත් බැණලා, කොම්පෝස්ට් පොහොර හදන්න සල්ලි වෙන් කර ගත්තේ කවුද කියලා සොයා බලන්න ඕනෑ නැද්ද? විගණකාධිපති වාර්තාව ආවාම, COPE එකට ආපු නිලධාරින් ඒ කරුණු ටිකත් කිව්වා. දැන් ඒ ගැන විමර්ශනයක් කරන්නට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙන්න මේ නිරීක්ෂණ මත පදනම් වෙලා තමයි අපි මේ වාර්තා සභාවට ඉදිරිපත් කරන්නේ. එතැනින් එහාට තමයි අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ආයතන සඳහා යොමු කරන්නේ. එතැන තමයි අපි මූලික වශයෙන් වෙනස් කර ගත්ත තැන. අපේ රටේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය ඇතුළේ වගවීම ශක්තිමත් කරන දිශාවට නීති වෙනස් කරන ඒ ක්‍රියාවලිය තමයි අද අපි පාර්ලිමේන්තුව විධියට ශක්තිමත් කරලා තිබෙන්නේ. මේ වාර්තා අපි කාටද ඉදිරිපත් කරන්නේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, නීතිපතිතුමාට, එහෙම නැත්නම් පොලිස්පතිතුමාට තමයි අපි මේ වාර්තා යොමු කරන්නේ, විමර්ශන කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකරණ ක්‍රියාවලියෙන් බැහැර ගිහිල්ලා, "ඇමතිතුමා අනුමැතිය දෙන්න නම් එතුමාටත් කීයක් හරි දෙන්න, එතුමාටත් උදව්වක් කරන්න" කියලා ඉල්ලුවා කියලා පෞද්ගලික අංශයේ සමහර සමාගම් ඒ කාලයේ දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කළාය කියලා මේ කථා කරපු අපේ මන්ත්‍රීතුමන්ලාට මතක ඇති. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාට අර හැරනියාවක මැණික ගැන මතක නම්, - මම හිතන විධියට මේ වාගේ වැඩ සිද්ධ වෙනවාට එතුමා කැමැති නැති වෙයි. අන්න ඒවා වළක්වා ගන්න තමයි, අද මේ ආණ්ඩුව මෙම ආණ්ඩුකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරමින් ඉන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ඉතාම සුළු කාලයකින් ඉතිහාසය අමතක වුණේ ඇයි කියලා මා දන්නේ නැහැ. එතුමා ඇහුවා, ගල් අඟුරු වංචාව ගැන COPE එකේදී මොනවාද කළේ කියලා. "දැන් තිබෙන ඒවාත් ගේන්න, ඔබතුමන්ලා ඒවා ගේන්නේ නැහැ" කිව්වා. දැන් අපේ COPE එකේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිශාන්ත සමරවීර මැතිතුමා තමයි මේ වාර්තාව හදලා දෙන්න කියලා COPE එකට මුලින්ම කිව්වේ. එතුමා COPE එකේ සභාපතිතුමා විධියට නොරොච්චෝලේ බලාගාරය නිරීක්ෂණය කරන්න යනකොට, "බෝඩ් වැඩ කරනවා, මේ වැඩේ කරන්න දෙන්නේ නැහැ. මෙන්න අතගහනවා" කියලා විපක්ෂය චෝදනා කළා. අද ඒවා අමතක වෙලා තිබෙනවා. අපි නීතිය එකිනෙකාට වෙනස් විධියට ක්‍රියාත්මක කරන්නේ නැහැ, කාටත් සාධාරණව කටයුතු කරනවා. මේ පාර්ලිමේන්තුවත් ඒ විධියට කටයුතු කරලා තිබෙනවා. ඒවා විපක්ෂයට අමතක වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මගේ මිත්‍රයා, the Hon. Rasamanickam, questioned what the threshold for selecting all these cases and incidents was. Hon. Member, I do not know why you cannot understand this. It is very simple, the threshold is the Auditor-General's Report. This is based purely on the Auditor-General's Report. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා මෙකේ threshold එක, කවුද මේවා තෝරන්නේ කියන කාරණා ඇහුවා. මේවා කවුරුවත් තෝරන්නේ නැහැ. මේවා තෝරලා තිබෙන්නේ Auditor-General. හොරකම් වෙලා තිබෙනවා, වංචා වෙලා තිබෙනවා, දූෂණ වෙලා තිබෙනවා කියලා විගණකාධිපති වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ කියලා තිබෙන කාරණා විමර්ශනය කරලා තිබෙනවා. එතකොට තවත් කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි විද්‍යාත්මක විමර්ශනයක් කරන්න කියලා පොලිස්පතිතුමාට, නීතිපතිතුමාට, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට බොහොම සද්භාවයෙන් යුතුව මේ වාර්තා යවනවා. එච්චරයි, වෙන මොනවත් නැහැ. අපි මෙතැනදී කවුරුවත් වැරදිකාරයෝ කරන්න යන්නේ නැහැ. අපි මෙතැනදී කවුරුවත් එල්ලන්න යන්නේ නැහැ. එහෙම දේශපාලන වුවමනාවකින් නොවෙයි, මේ COPE එක ක්‍රියාත්මක වෙන්නේ. ඇත්තටම ඒක ක්‍රියාත්මක වෙන්නේ මේ රටේ ජනතාවගේ දේපළ, මහජන මුදල් ආරක්ෂා කරන්නයි. මෙතැන වාචාලකමට යම් යම් දේවල් කිව්වාට මොකුත් කරන්න බැහැ.

අපේ රටේ විපක්ෂයට වෙලා තිබෙන්නේ බොහොම සරල දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂයට වෙලා තිබෙන්නේ මොකක්ද? බුදුහාමුදුරුවෝ එක්ක ඉඳලාත් දේවදත්ත ගොඩ ගියේ නැහැ නේ. "ඉඳ ඉඳ එක වෙහෙර, විඳ විඳ දහම් මනහර, සිඳ බිඳ දුක් සසර, අහෝ දෙව්දත් නොදිටි මොක්පුර" කියලා කවියකුත් තිබෙනවා නේ. ඒ වාගේ තමයි මෙතැන හිටියත්, මේ ආණ්ඩුව වංචා හා දූෂණවලට එරෙහිව කරන අරගළය දකිද්දීත්, නීති වෙනස් කරන ඒවා දකිද්දීත්, නීති සම්පාදනය කරලා අලුත් තැනකට රට ගෙන යන එක දකිද්දීත් මේ විපක්ෂයට ඒවා පෙනෙන්නේ නැහැ. අර දේවදත්ත වාගේ තමයි විපක්ෂයත්. ඒ නිසා, "අනේ විපක්ෂය නොදිටි මොක්පුර" කියලා තමයි අපට කියන්න තිබෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ අපේ ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියපු විධියට අපට අද විශේෂ දවසක්. අපට කිව්වේ කාටද? ආණ්ඩු පක්ෂයට. ඒ වාගේම ජනතාවටත් අද විශේෂයි. මොකද, ජනතාව අපේක්ෂා කළ දෙයක් තිබුණා. ජනතාව වෙනසක් හැටියට බලාපොරොත්තු වුණේ මොකක්ද? ඇත්තටම රටේ හොඳ පාලනයක් අරගෙන යන, ජනතාවගේ මුදල්වලට වගකියන, වගවන ආණ්ඩුවක් ජනතාවට ඕනෑ වුණා. මොකද, ඉතිහාසය තුළම තිබුණේ, ජනතාව අත්වින්දේ වංචා දූෂණවලින් පිරුණු රටක්. එදා ජනතාවගේ මුදල්වලට වගකිව්වේ නැහැ. ජනතාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරලා යැව්වා; ආණ්ඩු හැදුවා. ඒ තුළින් ඔවුන් බලාපොරොත්තු වුණා රටේ වෙනසක් වෙයි කියලා. හැබැයි, ජනතාව අපට බලයක් දුන්නා, නීති නැත්නම් නීති හදන්නත්, අලුත් නීති ගෙනෙන්නත්. නීති සම්පාදනය කරන වගකීම තමයි ජනතාව අපට භාර දුන්නේ. ජනතාවට වගකියන, මුදල්වලට වගකියන ආණ්ඩුවක් තමයි ඔවුන් බලාපොරොත්තු වුණේ.

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

හැමදාම වාගේ මගේ අතේ තිබුණා, මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පොත. අද මම පාර්ලිමේන්තුවට එනකොට මේ පොතේ පාට වෙනස් වෙලා තිබුණා. මෙතෙක් තිබුණු ස්ථාවර නියෝග පොත රෝස පාටයි. ඒ පාට අද වෙනස් වෙලා තිබෙනවා. ඒ වෙනසට හේතුව මොකක්ද කියලා අපි බැලුවා. හේතුව තමයි, ස්ථාවර නියෝග දෙකකට සංශෝධන දෙකක් මේ පොතට ඇතුළත්ව තිබීම. ඒ අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ 120 වැනි ස්ථාවර නියෝගයට අලුත් ඡේදයකුත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යටතේ 119 වැනි ස්ථාවර නියෝගයට අලුත් ඡේදයකුත් එකතු වෙලා තිබෙනවා. මම මේ ස්ථාවර නියෝග කියවා බැලුවා. මේ, අපි කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණු දෙයක්. අපි බලාපොරොත්තු වුණු අලුත් ස්ථාවර නියෝග සංශෝධන දැන් මේ පොතට ඇතුළත් වෙලා තිබෙනවා. මේ අලුත් ස්ථාවර නියෝග සංශෝධන, මේ අලුත් පොත මොකටද? මෙය වුවමනා වන්නේ මේ පාර්ලිමේන්තු බලය තව තවත් ශක්තිමත් කිරීමටයි. අපි මෙහෙම කරන්නේ කාගේ වුවමනාවටද? ජනතාවගේ වුවමනාවට. මේ තුළින් පාර්ලිමේන්තු බලය ශක්තිමත් වෙන්නේ කොහොමද? මේ කාරක සභා දෙකකට අදාළව ස්ථාවර නියෝග සංශෝධන දෙකක් ඇතුළත් වෙලා තිබෙන නිසායි එහෙම වෙන්නේ. ඒ මොකක් සඳහාද? ඒ පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලය හොඳම විධියට ක්‍රියාත්මක කරන්නයි. ඒ නිසා ඉතිහාසයේ නොවූ පරිදි අලුත් දෙයක් මෙහිදී වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වංචා දූෂණ නවත්වන්න අවශ්‍ය අලුත් නීති හැදෙන්නේ නැහැ, පවතින ආණ්ඩුවකින්. විපක්ෂය ඒක හොඳට මතක තියාගත්තා නම් හොඳයි. වංචා දූෂණ නවත්වන්න අවශ්‍ය අලුත් නීති ඇත්තටම මෙතෙක් හැදුණේ නැහැ, පැවති ආණ්ඩුවකින්. දැන් අඬන්න එපා, ඉතිහාසයේ සිදු වූ වංචා දූෂණවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වනවා කියලා. මෙන්න අපි ඒ වංචා, දූෂණ නවත්වන්න, මූල්‍ය විනය හොඳම විධියට ක්‍රියාත්මක කරන්න පුළුවන් විධියේ නීති සම්පාදනය කරලා තිබෙනවා. ඒකේ ගෞරවය ඇත්තටම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, වෛද්‍ය නිශාන්ත සමරවීර සහෝදරයාටත්, ඒ කාරක සභාවටත්, අනෙක් කාරක සභාවලටත් හිමි වෙන්න ඕනෑ. මොකද, ඒ සියලුදෙනා මේ සඳහා විශාල මහන්සියක් ගත්තා, ඔහේ යනවා වෙනුවට, ෂෝ තියනවා වෙනුවට, කෙබර බානවා වෙනුවට ඒ කාරක සභා තුළින් ජනතාවට වගකියන විධියට වැඩ කරන්න. මොකක්ද මෙතෙක් ඒ කාරක සභාවෙන් වුණේ? ඕනෑම වංචාවක්, දූෂණයක් පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව අනුව විමර්ශනයක් කරලා, ඕනෑ නම් සභාවේ අනුමැතිය ඇතුව නීතිපතිට දැනුම් දීම තමයි මෙතෙක් කල් සිද්ධ වුණේ. හැබැයි, මේ මර උගුල් වහන්න නම් ඉන් එහාට ගිහිල්ලා අපට නීතියක් අවශ්‍යයි. ඉතින් ඒ ක්‍රියාවලිය ඉස්සරහට යන්න ඕනෑ නැද්ද? මෙන්න, අපට ලබා දුන් ජන වරම අනුව ඉතිහාසයේ ප්‍රථම වතාවට වංචා, දූෂණ නවත්වන්න, ඒ මර උගුල්වල තිබෙන හිල් වහන්න පවතින ආණ්ඩුවකින් නීති ගෙනැල්ලා තිබෙනවා.

මොකක්ද මේ ස්ථාවර නියෝග 120(4)ට ඇතුළත් කරන අලුත් ඡේදයෙන් කියන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

> "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතළ මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය."

මේ ස්ථාවර නියෝගය ශක්තිමත් වෙලා තිබෙන විධිය කොහොමද? නීතිපතිතුමාගෙන් නතර වෙන්නේ නැතුව ඉන් එහාට ගිහිල්ලා අපට පුළුවන්, පොලිස්පතිවරයාටත්, ඒ වාගේම සෘජුවම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් ඉදිරිපත් කරන්න. මේක ප්‍රගතිශීලී පියවරක් නොවෙයිද? මේක ජනතාව ලබපු ජයග්‍රහණයක් විධියට තමයි අපි දකින්න ඕනෑ. එහෙම දකින්නේ නැතුව විපක්ෂය මොකද කරන්නේ? තවමත් අර බොරු වළවල්වල වැටිලා ඉන්නවා. හිටපු දේශපාලනඥයන් කපපු බොරු වළවල්වල වැටිලා රාසමාණික්කම් මන්ත්‍රීතුමා කියනවා, මේක නීතිපතිට යවලා විතර නේ කටයුතු කරන්න පුළුවන් කියලා. අඩු ගාණේ මේක කියවා බැලුවා නම්, හරි නේ. පාර්ලිමේන්තුව බොරු චෝදනා කරනවාලු. බොරු චෝදනා කරන්න පාර්ලිමේන්තුවට බැහැ. මේ කමිටු දෙකට බොරු චෝදනා කරන්න බැහැ. මෙහි තිබෙන්නේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේදී හෙළිවන බරපතළ මූල්‍ය වංචා පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරලා, තවදුරටත් විමර්ශනය කරන්න යවන්න පුළුවන් කියලායි. හැබැයි එහෙම තිබියදීත් රාසමාණික්කම් මන්ත්‍රීතුමා මොකක්ද මේ කියන්නේ? මිනිස්සුන්ට, ව්‍යාපාරිකයන්ට, නිලධාරින්ට බොරු චෝදනා කරනවාලු. දේශපාලනඥයෝ වැරදි පාරේ ගියා, දේශපාලනඥයෝ නොමඟ යැව්වා. හැබැයි අපි කියනවා, හරියට වැඩ කරන කිසිම නිලධාරියෙකුට කිසිම වංචා, දූෂණ චෝදනාවක් නැහැ කියලා. එවැනි කිසිම කෙනෙකුට කිසිම චෝදනාවක් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වුණාය කියලා අපට බැහැ, නිලධාරින්ට, දේශපාලනඥයන්ට එහෙම චෝදනා කරන්න. විගණකාධිපති වාර්තා අනුව තමයි ඒක කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා දේශපාලන පළි ගැනීම් කියලා මෙච්චර කල් දේශපාලනඥයන්ගේ වැරදි වහන්න උත්සාහ කළාට, දැන් ඒවා හරියන්නේ නැහැ. බලාගෙන ඉන්න, ඒ වැරදි වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න මෙන්න පාර්ලිමේන්තුවෙන් දැන් අලුතින් තවත් ප්‍රතිපාදන හැදිලා තිබෙනවා. ඒ නිසා තවත් අඬන්න වෙයි. කාටද? ඒ, අවනීතිය ක්‍රියාත්මක කරපු අයට.

දැන් හරි හොඳ තැනකට අපේ රට පත් වෙලා තිබෙනවා. කලින් අපේ රටේ ජනතාව කිව්වේ, රටේ නීතියක් නැහැ කියලායි. කලින් පැවති ආණ්ඩු යටතේ වැඩ කරන්න බය වුණේ නිලධාරින්. නමුත් දැන් බය වෙලා තිබෙන්නේ හොරකම් කරපු දේශපාලනඥයන්. ඒවාට අනුබල දුන් ඇතැම් කණ්ඩායමක් පමණක් දැන් බය වෙලා තිබෙනවා. ජනතාව කියනවා, අද නීතිය ක්‍රියාත්මකයි කියලා. විධායක බලය ගැන, එහෙම නැත්නම් අපි විධායක බලය අනිසි ලෙස පාවිච්චි කරනවා කියලා නන් දොඩවන අය මතක තබා ගන්න, අපි පාර්ලිමේන්තුවේ බලය තවත් ශක්තිමත් කරලා තිබෙනවා, මූල්‍ය බලය තවත් ශක්තිමත් කරලා තිබෙනවාය කියන එක. ඇයි, අපි එහෙම කියන්නේ?

වෙලාව නැති නිසා මම එක කාරණාවක් කියන්නම්. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිළිබඳව අපේ COPE එක දින දෙකකදී විමර්ශන කරලා තිබෙනවා. ඒ, 2025.05.08 දිනත්, 2025.07.17 දිනත්. විශේෂයෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කොමිෂන් සභා අරමුදලින් වියදම් කරලා ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතිය පිළිබඳ විමර්ශනයක් කළා, විගණකාධිපති වාර්තාවකට අනුව. මේ විමර්ශනයට අනුව 2021.05.25, එවකට හිටපු ඉඩම් ඇමතිවරයා කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කරනවා, කාබනික පොහොර ව්‍යාපෘතිය පිළිබඳව. මේ කාබනික පොහොර ව්‍යාපෘතිය රුපියල් මිලියන 700ක ව්‍යාපෘතියක්. හැබැයි, මේ ව්‍යාපෘතිය අසාර්ථක වනවා. මේ ව්‍යාපෘතියෙන් ඒගොල්ලන් බලාපොරොත්තු වනවා, මෙට්‍රික් ටොන් 300ක් පමණ කෘෂිකර්ම අමාත්‍යාංශයට අළෙවි කරලා රුපියල් මිලියන 9ක මාසික ආදායමක් ලබා ගන්න. හැබැයි, මේ ව්‍යාපෘතිය අසාර්ථක වනවා. දැන් මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කරන්නේ කවුද? කෘෂිකර්ම ඇමතිද? නැහැ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මෙහිදී ඔවුන්ට අයිති නැති රාජකාරියක් කරනවා. විගණන වාර්තාවේ ඒ පිළිබඳ කරුණු තුනක් ප්‍රශ්න කරනවා. අපිත් ප්‍රශ්න කරනවා මේ කරුණු තුන ගැන. මොකක්ද අපි ප්‍රශ්න කරන්නේ?

පළමුවෙනි එක මෙයයි. මේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලින් මුදල් වියදම් කිරීම නීත්‍යානුකූලද, නැද්ද? මේවා ප්‍රශ්න කරන්න ඕනෑ නැද්ද? පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE එක - තිබෙන්නේ ඒකට නොවෙයිද? ඒක ප්‍රශ්න කරන එක වැරදියි කියලාද මේ විපක්ෂය කියන්නේ? නැහැ, ඒක ප්‍රශ්න කරන්න ඕනෑ. ඒක තමයි අපේ රාජකාරිය.

දෙවැනි එක, එවැනි අසාර්ථක ව්‍යාපෘතියක් සිදු කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් කළාද? ශක්‍යතා අධ්‍යයනයක් කරලා නැහැ. මේ මුදල් කාගේද? මේ, ජනතා මුදල්.

තුන්වන කාරණාව මේකයි. මේ ව්‍යාපෘතියට රුපියල් මිලියන 700ක් ඇස්තමේන්තු කළේ කොහොමද? මේ කාරණා තුන ගැන විගණනය ප්‍රශ්න කරනවා. මේ කාරණා තුන පිළිබඳව COPE එක ප්‍රශ්න කරන්න ඕනෑ නැද්ද? මේ කාරණා තුන පිළිබඳව COPE එක ප්‍රශ්න කරනවා. හැබැයි, එවකට හිටපු ඉඩම් ඇමතිවරයා මොකද කරන්නේ? ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරින් ඒ ගැන සාක්ෂි දෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරින් කියනවා, අනිවාර්යයෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මුදල් ආයෝජනය කිරීමට නීතිමය අවකාශයක් නොමැත කියලා. නීතිමය අවකාශයක් නොමැත කියලා තමයි කියන්නේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 54, 44 සහ 22 වගන්තිවලට අනුව එවැනි ප්‍රතිපාදනයක් නැහැ කියලා අනිවාර්යයෙන්ම කියලා තිබෙනවා. ඒ වාගේම ඒ බව පෙන්වා දීලා තිබෙනවා. හැබැයි, එහෙම පෙන්වා දී තිබියදීත් මොකක්ද වෙන්නේ? චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියපු විධියට සිද්ධ වුණේ මේකයි. මේ ගැන සාකච්ඡා කරන්න ගියාම එදා දේශපාලනඥයා නිලධාරින්ට පුටු පෙරළලා තමයි පහර දුන්නේ; පුටුවලින් පහර දුන්නේ නිලධාරින්ට. එහෙමයි දේශපාලනඥයා නිලධාරින්ට සැලකුවේ. ඒවා ගැන තමයි පරීක්ෂණ කරන්නේ. ඒවා ගැන පරීක්ෂණ කරන එක වැරදියි කියලාද ඔබතුමන්ලා කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට රාජකාරියක් පැවරී තිබෙනවා. මොකක්ද ඒ රාජකාරිය? ඒ රාජකාරිය තමයි, පාර්ලිමේන්තුවේ බලය ශක්තිමත් කරන එක. පාර්ලිමේන්තුවේ බලය ශක්තිමත් කරන්න මේ ස්ථාවර නියෝග ගෙනෙන එක, ඒවාට අදාළ ප්‍රතිපාදන ගෙනෙන එක අප සතු වගකීමක්. ඒ වගකීම අනිවාර්යයෙන්ම මේ කමිටු දෙක තුළින්ම සිදු වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ සභාපතිතුමා ඇතුළු සියලු සාමාජිකයන් ඉතාම හොඳින් මේ කටයුතුවලදී දක්වන සහයෝගයත් අගය කරනවා. මේක ජනතා ජයග්‍රහණයක්. අපට ඕනෑ ජනතා බලය අතට අරගෙන වැඩ කරන දේශපාලනඥයන් සහ නිලධාරින් නොවෙයි, ඒ වාගේම ජනතා මුදල්වලට වග කියන, පුටු පෙරළා නිලධාරින්ට පහර දෙන දේශපාලනඥයන් නොවෙයි. අපට අවශ්‍ය පාර්ලිමේන්තුවට වග කියන, පාර්ලිමේන්තුවට වග වන දේශපාලනඥයන්. ඒ සඳහා නීති හදන්න ඕනෑ. ඒ වෙනුවෙන් හෙට දවසේත් අපි නීති හදන බව කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.43]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම COPE එක විසින් විමර්ශනය කොට ඉදිරිපත් කරන නිර්දේශ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කිරීමට අදාළ කාරණය තමයි අද පාර්ලිමේන්තුවේ කථා කරන්නේ. විශේෂයෙන් මේ රටේ මහජනයා සතු මුදල් සත පහක් හෝ මේ රටේ දේශපාලනඥයන්, නිලධාරින් - මේ රටේ කිසිවකු හෝ - වංචා කරනවා නම් ඒකට විරුද්ධව තමයි සමගි ජන බලවේගය කටයුතු කරන්නේ. ඒ නිසා සමගි ජන බලවේගය විධියට අපි, මේ රටේ මහජනයාගේ මුදල් වංචා කරන සෑම කෙනෙකුටම දැඩි දඬුවම් ලබා දිය යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවා සහ අත් දෙක ඔසවා අපි ඒකට සහයෝගය දෙනවා කියන කාරණයත් මම ඔබ සියලුදෙනාට කියන්න ඕනෑ. ඒක තමයි අපේ ස්ථාවරය. හැබැයි, දූෂිතයන්ට, වංචනිකයන්ට දඬුවම් දෙනවා වාගේම මේ දඬුවම් දීමේ ක්‍රියාවලිය දේශපාලන අතකොළුවක්, දේශපාලන ප්‍රචාරණ මාධ්‍යයක් බවට පත් කර ගැනීම නොවෙයි ආණ්ඩුවට කරන්න තිබෙන්නේ කියන කාරණයත් අපි මතක් කරනවා. ඔබතුමන්ලා මැතිවරණ වේදිකාවේදී ජනතාවට පොරොන්දු වුණේ මහා පරිමාණ වංචා, දූෂණ විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා, ඒ දූෂිතයන්ට දඬුවම් දෙනවා වාගේම, ඒ හොරකම් කරන ලද මහජන මුදල් පවරාගෙන ඒවා ජනතා සුබසිද්ධියට යොදවනවා කියායි. ඒ පොරොන්දුවත් එක්ක තමයි ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තේ. ඔබතුමන්ලා ඒ කියපු කාරණා ඉෂ්ට කරනතුරු තමයි අද එළියේ ඉන්න මහජනතාව බලාගෙන ඉන්නේ.

විශේෂයෙන්ම යම් යම් කාරණා නීතිමය වශයෙන් තහවුරු කරනවා වාගේම, පොඩි පොඩි කාරණාවලට දඬුවම් දෙනවා වාගේම එදා ඔබතුමන්ලා වේදිකාවේ කියන ලද අර මහා පරිමාණයේ දූෂණ, වංචා සිදු කළ අයට දඬුවම් දීමේ ක්‍රියාවලියත් ඉක්මන් කරන්න කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඔබතුමන්ලා එදා වේදිකාවේදී කිව්වා, ගුවන් යානා තුනක් පුරවලා උගන්ඩාවට සල්ලි අරගෙන ගියා, ඒ අරගෙන ගිය මුදල් ගෙනැල්ලා අපි මේ රටේ මහජනයාට ලබා දෙනවා කියලා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහත්තයාට චීන සමාගමකින් දීපු චෙක්පත්වල අංකත් එක්ක කිව්වා. ඒ වාගේම බැසිල් රාජපක්ෂලා මේ රටේ අයුතු විධියට සපයා ගන්නා ලද මහා දේපළ පිළිබඳව කථා කළා. මම අහනවා, ඔබතුමන්ලාට ඒවාට දඬුවම් කරන්න තවම අවස්ථාවක් ලැබුණේ නැද්ද කියලා. හුදු ප්‍රචාරණයට විතරක් හොරකම, දූෂණය සහ වංචාව ගැන කථා කරලා වැඩක් නැහැ. ඒක නොවෙයි මේ රටේ මහජනයා බලාපොරොත්තු වෙන්නේ. මහා පරිමාණ දූෂණ සහ වංචා කළ අයට දඬුවම් දීමේ ක්‍රියාවලිය විධිමත් කරන්න සහ ඔබතුමන්ලා වේදිකාවේ කියපු කාරණා අනුව කටයුතු කරන්න කියන ඉල්ලීමත් අපි කරනවා. ඒ විතරක් නොවෙයි, විපක්ෂයේ ඉන්න අය දේශපාලන වශයෙන් දඩයම් කරනවා. නමුත් අද වනකොට ආණ්ඩු පක්ෂයේ ඉන්න ඇමතිවරුන්ටත් වංචා සහ දූෂණ පිළිබඳව චෝදනා එල්ල වෙලා තිබෙනවා.

සමගි ජන බලවේගයේ වරින් අබේසිංහට චෝදනාවක් එල්ල වුණාම සමගි ජන බලවේගය පහුවදාම ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගත්තා. ඒ අනුව ඔහුගේ සාමාජිකත්වය අහෝසි කළා. මේ ඇමති මණ්ඩලයේ චෝදනාවලට ලක් වුණු ඇමතිවරු ඉන්නවා. සමහර ඇමතිවරුන්ට ගල්කිස්ස උසාවියේ චෝදනා තිබෙනවා, වංචනික ක්‍රියාවලට සම්බන්ධයි කියලා. හැබැයි, ඒ නඩු තවම නිසි

[ගරු සුරංග රත්නායක මහතා]

ක්‍රමයට ඇහෙන්නේ නැහැ. ඒ වාගේම මේ ඇමති මණ්ඩලයේ හිටපු, චෝදනාවලට ලක් වුණු කිසි කෙනෙකුට දඬුවම් දුන්නාද? විශේෂයෙන් අපි ජනාධිපතිවරයාට මතක් කරන්න ඕනෑ, සිංගප්පූරුවේ ලී ක්වාන් යූ දඬුවම් දීම ආරම්භ කළේ තමන්ගේ ඇමති මණ්ඩලයේ සාමාජිකයන්ට නීතිය ක්‍රියාත්මක කරලා කියන එක. හැබැයි, අද අපට පෙනෙන්න තිබෙනවා, ඒ සියල්ලම වෙන්නේ විපක්ෂයේ දේශපාලන ක්‍රියාකාරීන්ට බව. සමගි ජන බලවේගය විධියට අපි විරුද්ධ නැහැ, දූෂිතයන්ට දඬුවම් දීම කියන කාරණයට. දූෂිතයන්ට දඬුවම් දෙන්න ඕනෑ කියන මතයේ අපි ඉන්නේ. හැබැයි අපි කියනවා, ඒක පිරිසිදුව වෙන්න ඕනෑ, ඒක සමාජයට හරියාකාරව දැනෙන්න වෙන්න ඕනෑ කියන එක. අපි දැක්කා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ විදේශ සංචාරය පිළිබඳව සොයන්න කළ ක්‍රියාවලියට එතුමා අවභාවිත කළ මුදලට වඩා වැඩි මුදලක් වැය වෙලා තිබෙන බව. ඒවා ද කළ යුත්තේ?

මට කලින් කථා කළ මන්ත්‍රීතුමිය කිව්වා, එතුමන්ලා දූෂණයට විරුද්ධව නීති සම්මත කරනවා කියලා. මම අහන්න කැමැතියි, දූෂණ විරෝධී පනත සම්මත කරද්දී ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු කොහොමද ක්‍රියා කළේ, එදා ඇවිල්ලා ඡන්දය ප්‍රකාශ කළාද කියලා. එදා විපක්ෂයේ සිටියදී දූෂණ විරෝධී පනතට ඡන්දය නොදීපු අය අද ආණ්ඩුවේ සිටිමින් ඔබතුමන්ලාගේ සුචරිතභාවය ගැන කථා කරනවා.

මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ ප්‍රචාරණවාදී තත්ත්වයෙන් මිදිලා, හුදු දේශපාලන දඩයම් පැත්තකට කරලා ඇත්ත වශයෙන්ම මේ රටේ මහජනයා සතු මුදල් හොරා කන්න බැරි වෙන්නත්, වංචා කරන්න බැරි වෙන්නත් ආරක්ෂා කිරීම සහ මුදල් හොරා කාලා තිබෙනවා නම් නැවත ඒවා ජනතාවට ලබා දීමේ වැඩ පිළිවෙළක්. ඒ බලාපොරොත්තුවෙන් තමයි ජනතාව මාලිමාවට ඡන්දය දුන්නේ. හැබැයි, අද මේ රටේ ජනතාව පිළිගන්නවා, ඔබතුමන්ලා දේශපාලනය වෙනුවෙන්, දේශපාලන පැවැත්ම වෙනුවෙන් බොරු සුරංගනා ප්‍රචාරණවාදී මාධ්‍ය ක්‍රියාවලියක් කරගෙන යන බව. ඇත්තටම දඬුවම් කිරීම පිළිබඳ ක්‍රියාවලියකට යන්න අද ඔබතුමන්ලා කටයුතු කරන්නේ නැහැ කියන කාරණය මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.49]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගත්තාම පෙනෙනවා, මේ රටටත්, ජනතාවටත් ඉතාම වැදගත්, රටේ ජනතාවගේ අභිලාෂයට වටිනාකමක් සහ ගරුත්වයක් නිර්මාණය කරමින්, මේ උ ත්තරීතර පාර්ලිමේන්තුව තුළ ඒ ජනතා අභිලාෂය තව තවත් ශක්තිමත් කරමින් ඉදිරියට යන වැඩ පිළිවෙළක එක් සන්ධිස්ථානයක් පිළිබඳව තමයි අද මේ කථා කරන්නේ කියලා.

මේ දසවන පාර්ලිමේන්තුව. මීට පෙර ස්ථාවර නියෝග අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් - COPA සහ COPE - පාර්ලිමේන්තුවට පැවරී තිබෙන මූල්‍ය බලය පිළිබඳ විවිධාකාරයෙන් පසු විපරම් කරමින්, විමර්ශනය කරමින් යම් යම් වාර්තා සහ ක්‍රියාමාර්ග මේ උත්තරීතර පාර්ලිමේන්තුවට යොමු කරලා තිබෙනවා. හැබැයි, මේ රටේ ජනතාව දන්නා සහ ලද අම්හිරි අත්දැකීම හා කියවීම තමයි, කොච්චර වාර්තා ඉදිරිපත් කළත් ඒ වාර්තාවලින් මතු කෙරෙන අක්‍රමිකතා, වංචා, දූෂණ සහ නාස්තිවලට එරෙහිව පියවර ගන්න ඒ වාර්තාවලට කිසි බලයක්, පණක් නැහැ කියන එක. ඒ නිසා ජනතාව මේ ක්‍රියාවලිය පිළිබඳව කිසි බලාපොරොත්තුවක් නැතුව විශ්වාසය බිඳගෙනයි හිටියේ. මීට පෙර ඡන්දය දීලා නියෝජිතයන් පාර්ලිමේන්තුවට පත් කරලා එව්වාට, ආණ්ඩු හැදුවාට, ඒගොල්ලන් මැතිවරණයෙන් බලය ගන්න කොට වංචා දූෂණවලට එරෙහිව කටයුතු කරනවාය කිව්වාට, ජනතාව ඒවා විශ්වාස කළාට ඒ කිසිම කෙනෙක් අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. නමුත්, මේ මොහොතේ අපට ඒ දේ කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මේ රටේ ජනතාවගේ මූල්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ බලය තමයි මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙන්නේ. අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, රටේ ජනතාවගේ මූල්‍ය බලයට සාධාරණය ඉටු කරමින් මේ රටේ මහජන බදු මුදල් නාස්තිය වළක්වන්න. ඒ වාගේම රජයට ලැබෙන්න ඕනෑ ආදායම් වෙනත් ආකාරයකින් විනාශ වීම වැළැක්වීම සඳහා මෙතෙක් පැවතුණු ක්‍රියාමාර්ගවලට වඩා යහ ක්‍රියාමාර්ග ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ස්ථාවර නියෝග සංශෝධනය කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්නේ. COPA සහ COPE කියන කමිටු දෙකෙන්ම විමර්ශනය සහ පසුවිපරම් කරන, විනිශ්චය කරන යම් යම් කරුණුවලට අදාළ වාර්තා පාර්ලිමේන්තුවට, ගරු කථානායකතුමාට ඉදිරිපත් කරලා, එතැනින් පස්සේ නීතිපතිතුමාට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ ඒ අදාළ ඕනෑම ආයතනයකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට තමයි ජනතාවගේ මූල්‍ය බලයට වගකියන පාර්ලිමේන්තුවක් විධියට කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් විධියට අද මේ සාකච්ඡාව සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කථා කළ ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා, "House of Fashions" හිමි ව්‍යාපාරික මහත්මයා ආණ්ඩුවෙන් අත්අඩංගුවට අරගෙන කියලා. නැහැ. අපි ඉතාම පැහැදිලිව එය ප්‍රතික්ෂේප කරනවා. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව මඟින් undervalue ක්‍රියාවලිය පිළිබඳ යම් යම් පරීක්ෂණ කටයුතු මේ වකවානුවේ සිද්ධ කරනවා. අන්න ඒ පරීක්ෂණ කාර්යයේදී රේගුවේ රාජකාරියට බාධා කිරීම මත තමයි මා දන්නා තරමින් එම ව්‍යාපාරික මහතා යම් නීතිමය ප්‍රශ්නයට මුහුණ පාලා තිබෙන්නේ.

අද විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරමින් මේ රටේ ජනතාව නොමඟ යවන ප්‍රවෘත්ති නිර්මාණය කරමින්, බොරු කියමින්, අවලාද නඟමින් ඒ අයට අහිමි ජන වරම, ජන මතය ගොඩනඟා ගන්න උත්සාහ කරනවා. ඒ නිසා තමයි දයාසිරි ජයසේකර වැනි මන්ත්‍රීවරු කියන්නේ, ඕනෑම දූෂිතයෙක්, වංචනිකයෙක් හෝ අපරාධකාරයෙක් එක්ක එකතු වෙලා හරි මේ ආණ්ඩුව වට්ටන්න කටයුතු කළ යුතුයි කියලා. අද අපි දන්නවා විපක්ෂයේ අයට හැදිලා තිබෙන්නේ මොන වාගේ රෝගයක්ද කියලා. ඒ රෝගය ටිකක් භයානකයි. මොකද, ඒගොල්ලෝ දන්නවා මේ සිදු වෙලා තිබෙන වංචා, දූෂණ, නාස්තිය හා අපරාධවලට ඒගොල්ලන්ගේ තිබෙන සහසම්බන්ධතාව. ඒ නිසා අද ඒගොල්ලෝ උත්සාහ කරමින් තිබෙනවා ආණ්ඩුවේ මේ ක්‍රියාවලිය කඩා වට්ටන්න. ඒ සඳහා බොරු කියමින්, ජනතාව නොමඟ යවන්න උත්සාහ කරනවා. අපි ඒ කාරණා පිළිබඳව ජනතාව දැනුවත් කරනවා.

අනෙක් පැත්තෙන් අපේ රටේ වැඩිහිටි ප්‍රජාව ගැන කියනවා. මීට කලින් වැඩිහිටි ප්‍රජාවගේ තැන්පතු සඳහා සියයට 15ක පොලියක් ලබා දුන්නා. නමුත්, ඒකෙන් සියයට 5ක් එවකට ආණ්ඩුව අඩු කළා, කැපීමකට ලක් කළා. හැබැයි, වර්තමානයේ ගත්තොත් ඉතා පැහැදිලිව පෙනෙනවා යම් ප්‍රමාණයකින් බදු ගෙවිය යුතු ආදායම් සීමාව වැඩි කර ඇති බව. මාසික ආදායම රුපියල් 150,000 ඉක්මවන පුද්ගලයන් බද්දට යටත් කිරීම තුළ ගෙවන්න තිබුණු බදු ප්‍රමාණයේ යම් අඩුවීමක් සිද්ධ වනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ කලින්ට වඩා වැඩිහිටි ජනතාවට යම් වාසියක් අත්පත් වෙලා තිබෙනවා.

ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වනකොට මේ රටේ වැඩිහිටි ප්‍රජාවට රුපියල් 3,000ක මාසික දීමනාවක් තමයි ලබා දෙමින් තිබුණේ. අද රටේ පවතින රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ඇතුළේ අපට පුළුවන් වෙලා තිබෙනවා මාසිකව දුන් රුපියල් 3,000ක දීමනාව වෙනුවට රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්න. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ගෙනා අය වැය යෝජනාව අනුව රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගැටලු විසඳන්නත්, කොමිෂන් සභාවක් පත් කර මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් විශාල ප්‍රමාණයක් නියෝජනය කරන විශ්‍රාමික ප්‍රජාවට අදාළ කරන විශ්‍රාම වැටුප් විෂමතාවට ස්ථාවර විසඳුමක් ලබා දෙන්නත් අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා.

යම් වැඩිහිටියෙකුට වැඩිහිටි දීමනාව ඕනෑ කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ඉල්ලීම් කළාම ඉතිහාසයේ තිබුණේ ඉතාම අමිහිරි, අමානුෂික ක්‍රමයක්. වැඩිහිටියකු මියැදෙන්න ඕනෑ තව වැඩිහිටියෙකුගේ නමක් ඒ ලේඛනයට ඇතුළත් වෙන්න. අද ඒ සංස්කෘතිය අවසන් වෙලා තිබෙනවා. පොරොත්තු ලේඛනයක් නැතුව වැඩිහිටි ප්‍රජාවට ඒ සාධාරණය ඉටු කරමින්, රජය අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. ඒ ආකාරයට අද මේ ආණ්ඩුව රටේ විවිධ ක්ෂේත්‍රවලට සාධාරණයක් ඉටු කරමින් රටේ සමස්ත ජනතාව වෙනුවෙන් ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා.

පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඇතැම් අය යම් යම් සිද්ධි පදනම් කරගෙන ආණ්ඩුවට එරෙහිව විශාල විවේචනයක් ගොඩ නඟන්න උත්සාහ කළා. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ ජනතාවට වග කියන ආණ්ඩුවක්. ඒ නිසා අපේ අඩුපාඩු, වැරදි, ජනතාව වෙනුවෙන් නිවැරදි කර ගන්න කොයි වෙලාවකවත් අපි පසුබට වෙන්නේ නැහැ. හැබැයි, අපි සටන් වදිනවා, අරගළ කරනවා. මොකකට එරෙහිවද? මේ රටේ පැවති ආණ්ඩු රටේ ජනතාවගේ මූල්‍ය බලය විනාශ කරමින්, මේ රටට ඉදිරියට යන්න තිබුණු අවස්ථාව අහිමි කරමින්, ජනතාවට ජීවත් වෙන්න තිබුණු අවස්ථා අවම කරමින් ඒ සිදු කරලා තිබෙන මූල්‍ය වංචාවලට එරෙහිව අපි සටන් කරනවා. ඒක නවත්වන්නේ නැහැ.

මම පොඩි උදාහරණයක් කියන්නම්. පසුගිය දවස්වල මහා භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක ගැටලුවක් පිළිබඳ සාකච්ඡා වුණා. එහිදී අපි පැහැදිලිව කිව්වා, ඒක ආණ්ඩුවේ දේශපාලනඥයන්ගේ වුවමනාවට වෙච්ච සිදුවීමක් නොවෙයි, යම් තාක්ෂණික සහ වෙනත් ගැටලුවක් මත සිදු වෙච්ච එකක් කියලා. හැබැයි, මම නිශ්චිත කාරණාවක් සඳහන් කරන්නම්. යහපාලන ආණ්ඩුව කාලයේ කිරි ගවයන් 20,000ක් ගෙන්වන ව්‍යාපෘතියක් කැබිනට් මණ්ඩලය අනුමත කර ගත්තා. ඒකේ පළමුවෙනි අදියර විධියට කිරි ගවයන් 5,000ක් ගෙනාවා. ඒ ගෙනාපු 5,000නුත් විශාල ප්‍රමාණයක් ලෙඩ සත්තු. ඊට පස්සේ ඒ ව්‍යාපෘතිය අසාර්ථක වෙලා තිබෙද්දී ඉතුරු කිරි ගවයන් 15,000ත් ගෙනෙන්න එවකට යහපාලන ආණ්ඩුවේ හිටපු ඇමති හැරිසන් මහත්මයා ඇතුළු කණ්ඩායම තීරණය කරලා මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඩොලර් මිලියන 11.09ක අත්තිකාරම් මුදලක් ඕස්ට්‍රේලියානු සමාගමට යොමු කර තිබෙනවා. හැබැයි, මේ දක්වා ගෙනාපු එක කිරි ගවයෙක් නැහැ. ඒ එක ඩොලරයක් ලංකාවට අය කරගෙනත් නැහැ. ඒ විධියට තමයි එදා යහපාලන ආණ්ඩුව මේ රටේ මහජනතාවට අයිති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ තිබෙන ඩොලර් විනාශ කළේ. මේ විධියට විශාල වශයෙන් අපේ රටේ මුදල් විනාශ කර තිබෙනවා.

අද මේ වාර්තාවට අදාළව ගත්තාමත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විශාල මූල්‍ය වංචා සහ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳ උදාහරණ දෙකක් කියලා මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම පසුගිය කාලසීමාව ඇතුළේ වැසි අංක, එන්ජින් අංක වෙනස් කරලා වාහන 134ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරලා තිබෙනවා. ඒ අක්‍රමිකතාව නිසා රජයට අහිමි කරලා තිබෙන මුදල රුපියල් බිලියන 1.2ක්. ඒ කියන්නේ, රුපියල් මිලියන 1,200ක්. ඒ වාගේම අවලංගු කරපු රාජ්‍ය තාන්ත්‍රික වාහනවල අංක වෙනත් වාහනවලට ලියාපදිංචි කරලා, ඒකෙන් රජයට රුපියල් මිලියන 122ක මුදලක් අහිමි කර තිබෙනවා. මේ ආදී වශයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ විවිධාකාරයේ දේශපාලන සහසම්බන්ධතා හේතුවෙන් විශාල අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව කිසි විටෙකත් අවංක රාජ්‍ය නිලධාරින්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. මේ රට ඉදිරියට ගියේ අවංක, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සහ රාජ්‍ය සේවකයන් නිසායි. ඒ අය සියලුදෙනාම ආරක්ෂා කරගෙන, වංචාවට, දූෂණයට එරෙහිව ජාතික ජන බලවේගය ආණ්ඩුව ගෙන යන සටන අවසන් කරන්නේ නැහැ කියන එකත් අපි ඉතා පැහැදිලිව අවධාරණය කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.59]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

2015 වර්ෂය වනතුරු විශේෂයෙන්ම COPE සහ COPA කියන කමිටු දෙකේම සභාපති තනතුරු දැරුවේ රජයේ මන්ත්‍රීවරුන් දෙපළක්. සමහර වෙලාවට රජයේ ඇමතිවරු. හැබැයි, 2015දී එක්සත් ජාතික පක්ෂ රජයක් පත් වුණු අවස්ථාවේ පළමු වතාවට එම ප්‍රධාන අධීක්ෂණ කමිටු දෙකේ - COPE එකේ සහ COPA එකේ - සභාපති තනතුරු දෙක භාර දුන්නා, විපක්ෂයට. විශේෂයෙන්ම 2015-2020 කාල පරිච්ඡේදය තුළ COPE එකේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ මේ ආණ්ඩුවේ ඇමති ධුරයක් දරන ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා. එතුමා ඒ කාලයේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එදා COPA එකේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට හිටපු ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා. බැඳුම්කර වංචාව ගැන කථා කරපු වෙලාවේදී එක්සත් ජාතික පක්ෂ රජයක් තිබුණත්, COPE එකේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ ගරු

[ගරු කබීර් හෂීම් මහතා]

සුනිල් හඳුන්නෙත්ති මහත්මයායි. එතුමා තමයි එදා එම කාරක සභාවේ ප්‍රධානියා හැටියට කටයුතු කළේ. ඒ කියන්නේ, විනිවිද බව සහ වගවීම පිළිබඳව උපරිම අවස්ථාව එදා සකස් කර තිබුණා කියන එකයි. එහෙම නම්, මේ ආණ්ඩුව ඇවිල්ලා අලුත් විනිවිද බවක් ඇති කළා, අලුත් ව්‍යුහයක් ඇති කළා කියනවා නම්, ඒක නිකම් මිනිසුන් මුළා කරන කථාවක්. මොකද, ඒ කාලයේ සිටම මේ තත්ත්වය ඇති කරලා තිබුණා.

2023 කාලයේ තුළ තමයි, අල්ලස් සහ දූෂණවලට එරෙහි නීති රීති සම්පාදනය ශක්තිමත් කරලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පත් කරලා සම්පූර්ණ බලය ලබා දුන්නේ. හැබැයි, ඒක ක්‍රියාත්මක කිරීම හරියාකාරව සිදු විය යුතුයි. රටේ නීති පද්ධතිය තුළ එය දේශපාලන අවියක් බවට පත් කරන්නේ නැතුව, ආණ්ඩු පක්ෂය වැරදි කළත්, විපක්ෂය වැරදි කළත් සාධාරණ විධියට, එකම විධියට කටයුතු කළ යුතුයි කියන එක තමයි අපේ මතය.

ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ජාතික ජන බලවේගය රජය ආපු ගමන් විශේෂයෙන්ම විනිවිද බව සහ system change එක ගැන කථා කළා. නමුත් එවැනි වෙනසක් නොකිරීම තමයි ප්‍රශ්නය. මේ ආණ්ඩුව මිනිසුන්ට පොරොන්දු වුණා, system change එකක් කරනවා කියලා. ඔබතුමන්ලා කරපු change එක තමයි, ආණ්ඩු බලයට ආපු ගමන්ම COPE එකේයි, COPA එකේයි සභාපතිකම් දෙක - විපක්ෂයට භාර දීලා තිබුණු සභාපතිකම් දෙක - ආණ්ඩුවට ගත්තු එක. ආණ්ඩු පක්ෂයෙන් සභාපතිවරුන් දෙදෙනෙක් දාලා වසර දෙකක් එම තනතුරු තබාගත්තා. ඇයි ඒ? අපට සැකයක් මතු වෙනවා, තමන්ගේ වැරදි වසා ගන්නටද ඒක කළේ කියලා. ගරු විපක්ෂ නායකතුමා තර්ක කරලා, සටන් කරලා තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය ස්ථාවර නියෝග අනුව විපක්ෂයට යා යුතුයි කියන කරුණ කියලා ඒ තනතුර ආපසු ලබාගෙන මා එහි සභාපති හැටියට පත් කළේ. හැබැයි, COPE එකේ සභාපති තනතුර තවම විපක්ෂයට දීලා නැහැ.

COPE එකේ හෝ COPA එකේ සභාපතිවරු යම්කිසි පරීක්ෂණයක් කරලා ඒ තොරතුරු ටික කෙළින්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවන්න පුළුවන් අවස්ථාව ඇති කිරීම සඳහා ස්ථාවර නියෝග සංශෝධනය කරන්න මේ රජය කටයුතු කළාට, කලින් තිබුණු ක්‍රමය තුළත් ඒ ඉඩ ප්‍රස්තාව තිබුණා. ඒ තොරතුරු නීතිපතිවරයාට යවන්න පුළුවන්කම තිබුණා. නීතිපතිවරයා හරහා ඒක ආපසු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යවන්නත් ඕනෑ තරම් ඉඩ කඩ තිබුණා. එම නිසා මේක අලුත් මාර්ගයක් නොවෙයි. ඒ විතරක්ද? අපි මෙතැන නීති සම්පාදනය කරන අය. නීතිය ක්‍රියාත්මක කිරීම, දඬුවම් දීම අධිකරණය සහ පොලීසිය හරහා සිදු වෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අප හදන නීති මඟින් මේ ආයතනවල අධීක්ෂණ කටයුතු හරියාකාරව සිදු වනවාද කියන ප්‍රශ්නය ගැන අප සොයා බැලිය යුතුයි.

Financial oversight, Hon. Presiding Member, is carried out by a few Committees in this Parliament and the main ones are, the Committee on Public Accounts - COPA, the Committee on Public Enterprises - COPE and the Committee on Public Finance - CoPF. Now, I am the Chair of the Committee on Public Accounts, which is the oldest oversight Committee. It was established in 1921 and its role is to ensure fiscal transparency and accountability in government expenditure. Historically, COPE and COPA have focused on post-mortem scrutiny; ඓතිහාසිකව ගත්තාම, COPE සහ COPA එක කළේ පශ්චාත් මරණ පරීක්ෂණයක් කරනවා හා සමානව කටයුතු කිරීමයි. ඒ කියන්නේ, හොරකමක්, දූෂණයක්, වංචාවක්, නාස්තියක් වුණාට පසු ඒකට ගන්නා පියවර කුමක්ද, දඬුවම හැටියට දෙන්නේ මොකක්ද කියන කාරණාවලට අදාළ කාර්යභාරය තමයි කළේ. හැබැයි, ඒ සාම්ප්‍රදායික, පැරණි, යල් පැන ගිය ආකල්පමය පාරේමයි අද ජනතා විමුක්ති පෙරමුණත් යන්නේ.

System change එකක් ගැන කථා කරපු ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, තිබෙන system එක වෙනස් කරන්න.

In 2022, I was briefly, for a few months, appointed as the Chair of COPA, but I was removed after some time by the Government at that time. However, I wanted a system change; instead on post-mortem scrutiny, I focused on preventive oversight. That was the key thing we needed to change. But, I am sorry to say that the Government, although they are talking big, has not moved in the direction of preventive oversight; it is still doing post-mortem scrutiny. 2022දී මට කෙටි කාලයකට COPA එකේ සභාපතිකම ලැබුණු අවස්ථාවේදී මම මාස කිහිපයක් තුළ එහි system එක වෙනස් කරන්න කටයුතු කළා. පැවැති ක්‍රමය වෙනුවට වැළැක්වීමේ පාලනය හෝ නිවාරක අධීක්ෂණය - preventive oversight - ක්‍රියාත්මක කරන්න පියවර ගත්තා. පැවැති ක්‍රමය වෙනස් කරන්න උත්සාහ කළා. විශේෂයෙන් ශ්‍රී ලංකා රේගුවේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඇති වන මහා පරිමාණ දූෂණ, වංචා නතර කරන්න උත්සාහ කළා. හැබැයි, ඔබතුමන්ලා බලයට ඇවිත් මේ අවුරුදු දෙකට ඒ ව්‍යුහාත්මක වෙනස ඒ තුළ හදන්න උත්සාහ කරන්නේ නැතුව පොලීසියේ රාජකාරියත්, අධිකරණයේ රාජකාරියත් පාර්ලිමේන්තුව තුළ කරන්න බලනවා. ඒකද වෙනස? ඒක නොවෙයි වෙනස වෙන්න ඕනෑ. ඒ ව්‍යුහාත්මක වෙනස කරන්න එක්කෝ ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. එහෙම නැත්නම්, ඔබතුමන්ලා මොකක් හරි වසා ගන්න ඒක කරන්නේ නැහැ.

In November, 2022, I got the support and funding from the UNDP, the National Democratic Institute and the Westminster Foundation for Democracy, one, to strengthen the capacity of the Members and the Secretariat of COPA and, two, to promote an evaluation policy framework and to upgrade the online MIS with UNDP support so that we could regularly check on the Key Performance Indicators of the 840 departments that come under COPA. If you do not have a structure, you cannot manage the 840 departments by writing to the Commission to Investigate Allegations of Bribery or Corruption Commission or to the Attorney-General's Department. You have to do a structural change internally and use advanced technology.

Another bottleneck we identified was the substantial delay in receiving verbatim transcripts pertaining to COPA meetings. Considerable delays take place between the date of the meeting and the submission of the corresponding transcripts. Sometimes, after a meeting, the transcripts come several months later or even about a year later and therefore, the whole purpose is negated. Therefore, we - not only me, but by our team - found a solution. As the Chair of COPA, I spoke to the UNDP. We got advanced technology for the Committee, trainings and a skills upgrade for the staff and proposed, as a solution to address the challenge, to introduce a voice-to-text and AI-based solution. But now, what has happened? මේ JVP ආණ්ඩුව විසින්ම ඒක නතර කරලා තිබෙනවා. මොකද,

කමිටුවක් පත් කරලා තිබෙනවා "Adoption of an AI-enabled Automated Transcription System for Parliament" පිළිබඳ සොයා බැලීමට. එය කමිටුවට පවරලා කියා තිබෙනවා, කමිටුවෙන් නිර්දේශ කරන්න ඕනෑ කියලා. මේ කමිටු දෙකට AI භාවිත කිරීමට අප යෝජනා කරන්නේ විනිවිදභාවය වැඩි කරන්නයි. දූෂණ, අල්ලස් ක්‍රියා හසු කර ගන්නා වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරන්නයි. අපි ඒ අරමුණින් ඉදිරිපත් කළ යෝජනා අනුමත කරන්නේ නැහැ. අපි එය ඉදිරිපත් කළේ මේ වර්ෂයේ ජනවාරි මාසයේදී. දැන් වන විට මාස 7ක් ගිහිල්ලාත් තවම එය අනුමත කරලා නැහැ. එතකොට වැරැදිකාරයා ඔබතුමන්ලාමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකත් එක්කම online MIS එකක් ඇති කිරීම සඳහා කටයුතු කරන්න අපි යෝජනා කළා. අපි මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීමට 2015දී යෝජනා කළා. 2017දී ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. අපි හෙට COPA එකෙන් කැඳවනවා, භාණ්ඩාගාරය, විගණකාධිපති දෙපාර්තමේන්තුව, ඒ වාගේම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය. මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය - online MIS - ශක්තිමත් කරලා අපි ආයතන 130ක KPIs වර්ධනය කරලා තිබෙනවා, හදලා තිබෙනවා. ඒ අනුව ඒ ආයතනවල දූෂණයක්, වරදක් සිදු වෙන්න කලින් ඒ ආයතනවල කාර්ය සාධනය හරියට ඉටු වෙනවාද, නැද්ද කියලා බලන්න අපි කටයුතු කරනවා. අපි මේ ගැන සාකච්ඡා කරනවා.

මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊයේ "Daily FT" පත්තරේ තිබෙනවා මම දැක්කා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ - IRD - ව්‍යුහාත්මක අඩුපාඩු රැසක් තිබෙනවා කියලා "අරුත" කියන උපදේශක සමාගම කියා තිබෙන බව. බලපෑම් කරලා ආදායම් බදු වැඩි කර ගන්න පුළුවන්. මර්දන නීති රීති දාලා බදු ගෙවන්නන් හිරේ දමන්න පුළුවන්. හැබැයි, ඒක තාවකාලිකයි. ඒක ඇතුළේ තිබෙන ව්‍යුහාත්මක අඩුපාඩු නිවැරැදි කරලා නැහැ. විශේෂයෙන්ම ඒකේ තිබෙන මෘදුකාංග පද්ධතිය - RAMIS - හදලා නැහැ, මේ ආණ්ඩුව. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා දැන් අවුරුදු දෙකක් වෙනවා. ඒ පද්ධතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදි අනෙක් ආයතනවලට සම්බන්ධ කිරීම සඳහා කිසිම වැඩ පිළිවෙළක් කරලා නැහැ. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා මේ රටේ හරියාකාරව කාර්ය සාධක වැඩ පිළිවෙළකට යනවා නම්, දේශපාලන වාසි බලාගෙන පාර්ලිමේන්තු විවාදයක් අරගෙන "අරූ හොරා, මෙයා හොරා" කියලා කියන එක නොවෙයි කරන්න ඕනෑ. මේ හොරකම් වළක්වන්න අවශ්‍ය ව්‍යුහාත්මක system change එක ගෙන ආ යුතුයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.09]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ වඩාත් පැරණි වාගේම සුවිශේෂී මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් තමයි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව. එය ජනතා නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කාරක සභාවක්. එමඟින් රාජ්‍ය මුදල් පිළිබඳ වගකීම සහතික කරනවා.

ඒ වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ සඳහා විධිවිධාන සලස්වා තිබෙනවා. මේ ක්‍රියා පටිපාටිය ගත්තොත්, විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තා පදනම් කරගෙන තමයි මේ විමර්ශන කටයුතු සිදු කරන්නේ. ඊට අමතරව රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ වෙනත් කරුණුද මේ කාරක සභාව මඟින් විමර්ශනය කරනවා. අපි මේ යටතේ අධීක්ෂණය කරන ආයතන ගත්තොත්, රාජ්‍ය ආයතන 826ක් තිබෙනවා. ඒ වාගේම, 1978 ඉඳලා 2024 දක්වා විමර්ශනය කරපු ආයතන ගත්තොත්, ආයතන 121ක් පිළිබඳව විමර්ශනය කර තිබෙනවා. ඒ අනුව ඉදිරිපත් කර තිබෙන වාර්තා සංඛ්‍යාව 14ක්.

මම මේ ගැනත් පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මීට ඉස්සෙල්ලා කථා කරපු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීවරයා කිව්වා, "මේ කාරක සභාව කාලයක් තිස්සේ, අවුරුදු 100ක් තිස්සේ තිබිච්ච පැරණිම කාරක සභාවක්, ඒ හරහා නීතිමය ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ කියලා අපිත් හිතුවා" කියලා. ඇත්තටම ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, අපි බලයට ආවාට පස්සේ තමයි මේ වාගේ නීතිමය ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය පදනම සකස් කර තිබෙන්නේ, ඒ සඳහා වන යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ විධියේ ක්‍රියාමාර්ග තමයි අපි අරගෙන තිබෙන්නේ. අපි ඔබ සියලුදෙනාම දන්නවා, අපි බලයට ආවේ නැත්නම් කවදාවත් තව වර්ෂ ගණනක් යනකම් මේ නීතිමය ක්‍රියාමාර්ග ගන්නේ නැහැ කියලා.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. COPA එකේ සහ COPE එකේ සභාපතිකම් සම්බන්ධයෙන් මීට ඉස්සෙල්ලා කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා. එතුමා කිව්වා COPA එකේ සහ COPE එකේ සභාපතිවරු පත් කර ගැනීම සඳහා භාවිත කරපු ක්‍රමය ගැන. අපි පැහැදිලිවම COPA එකේ සභාපතිකම එතුමන්ලාට දුන්නා. එතුමන්ලා මුලින් ඒක වර්ජනය කළා. වර්ජනය කරලා පසුව තමයි COPA එකේ සභාපතිකම එතුමන්ලා ගත්තේ. අවුරුදු ගණනක් තිස්සේ COPA එකේ සහ COPE එකේ සභාපතිකම්වල හිටපු අය ගත්තාම, එතුමන්ලාගෙන් මොකක්ද සමාජයට වෙලා තිබෙන්නේ? අලුත් දෙයක් වෙලා තිබෙනවාද? සුනිල් හඳුන්නෙත්ති වර්තමාන ඇමතිවරයා ඉන්න කාලයේ තමයි සමාජය තුළ මේ සම්බන්ධව ලොකු කථාබහක් ඇති වුණේ; ඒ විමර්ශන කළේ. වංචාකරුවෝ, දූෂිතයෝ සමාජයට හෙළි කළේ ඒ කාලසීමාව තුළ. මේ රටේ ජනතාව මෙවර අපට ආණ්ඩු බලය ලබා දුන්නේ පසුගිය ඉතිහාසයේ තිබිච්ච ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කියලායි. අතීතයේ හිටපු හොරුන්ට, වංචාකාරයන්ට දඬුවම් දෙන්න ඕනෑ කියන අදහසත් එක්ක තමයි අපට ආණ්ඩු ලබය ලබා දුන්නේ. එහෙම නම් අපට මේ පාර්ලිමේන්තුවේ තිබෙන කාරක සභාවලින්, විශේෂයෙන්ම CoPE එකේ සභාපතිකම ඉතා වැදගත් වෙනවා. මොකද, අපි මීට පෙර හකිටපු ඇමතිවරුන්ට සම්බන්ධ වෙච්ච සමහර ආයතනවල දේවල් තමයි පරීක්ෂා කරන්නේ. අද හෙළිවෙමින් යනවා, ඒ හිටපු ඇමතිවරු මොනවාද කළේ කියන එක. රාජ්‍ය සේවකයන් එක්ක ගනුදෙනු කරද්දී ඒ හිටපු ඇමතිවරු වැඩ කටයුතු කළේ කොහොමද කියන එක දැන් හෙළි වෙනවා.

විශේෂයෙන්ම අපි අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා, විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ට විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව සිදුකරන ලද පරීක්ෂණ පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීමේ තීරණය. එහිදී 2022 සිට 2023 දක්වා තමයි මේ යෝජනාව ක්‍රියාත්මක කළේ. ඒකේ බලාපොරොත්තුව වුණේ විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීම දිරිමත් කිරීම. ඒක තමයි බලාපොරොත්තු වුණේ. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් තමයි මේ පහසුකම සලසා තිබුණේ. හැබැයි කියන්න කනගාටුයි, ඇත්තටම ඒ අරමුණ ඉෂ්ට වුණාද? ඇත්තටම ඊට යටින් තිබුණු අරමුණ මොකක්ද? මෙතැනදී සමාගම්

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

දෙකකට විශේෂ වරප්‍රසාද දීලා තිබුණා. වාහන 640ක් ගෙන්වන්න අවසර දීලා තිබුණේ මේ සමාගම් දෙකට. ඒ සම්බන්ධ කිසිම නිර්වචනයක් හෝ විශේෂ වූ කාරණා සම්බන්ධයෙන් විගණකාධිපතිට වාර්තා කරලා තිබුණේ නැහැ. ඒ වාගේම, විදෙස්ගත නොවූ 4දෙනෙකුට මේ බලපත්‍ර ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, අයදුම්පතේ රැකියාව සඳහන් කර නොතිබුණු 61දෙනෙකුට මේ බලපත්‍ර ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, එක පුද්ගලයෙකුට බලපත්‍ර දෙක ගණනේ ලබා දීපු අවස්ථාවක් ඒ විගණකාධිපති වාර්තාවෙන් හෙළි වෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් වැදගත්ම කොටසක් තිබෙනවා. කෙටි කාලයකට විදේශගත වූවන්ටද මේ බලපත්‍රය දීලා තිබෙනවා. මෙතැන මූලික දෙයක් තිබුණා. විදේශ රැකියාවක් කරලා විදේශ ප්‍රේෂණ එව්වාම, ඒකෙන් සියයට 50ක් බලලා ඒ සියයට 50ට අදාළව තමයි ඒ වාහනය ගෙන්වන්න පුළුවන්කම තිබුණේ . මම අහනවා, මාස 4ක විතර කෙටි කාලයකට විදේශ රැකියාවකට ගිය කෙනෙකුට කොහොමද මේ බලපත්‍ර ලබා දෙන්නේ කියලා. කොහොමද ඒ වාගේ වාහනයක් ගෙන්වන්න අවශ්‍ය පදනම හදලා දෙන්නේ? කොහොමද විදෙස්ගත නොවූ අයට මේ බලපත්‍ර ලබා දෙන්නේ? එතැනදී සම්පූර්ණයෙන්ම කරලා තිබෙන්නේ මූල්‍ය වංචාවක්. මේ රටේ බදු මුදල් වංචා කරලා තිබෙනවා. අපි බලමු, ඒ කාලයේ හිටපු අමාත්‍යවරයා කවුද කියලා. ඒ කාලයේ හිටපු අමාත්‍යවරයා තමයි මනූෂ නානායක්කාර. එතුමා තමයි ඒ කාලයේ විෂය භාර අමාත්‍යවරයා විධියට හිටියේ. එතුමා ඒ ඇමතිකම දරලා තිබෙන්නේ එක දවසකින් මේ රටේ ජනාධිපති බවට පත් වෙච්ච රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා යටතේ. එහෙම රටක් තමයි අපි මේ වෙනස් කරලා තිබෙන්නේ. COPE එකේදී, COPA එකේදී විගණන වාර්තාවලින් එළිවෙන දේවල් එක්ක බලද්දී එහෙම තමයි ඇමතිවරු මේ කටයුතු කරලා තිබෙන්නේ. ඒ විධියට ඉතා විශාල වංචා ගණනාවක් වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, ඒ කාල සීමාව තුළ සුඛෝපභෝගී වාහන සඳහා බදු සීමාව රුපියල් මිලියන 6 ඉඳලා රුපියල් මිලියන 12 දක්වා වැඩි කරලා තිබෙනවා. කිසිම හේතුවක් නැතිව තමයි ඒ සීමාව වැඩි කරලා තිබෙන්නේ. සාමාන්‍ය ක්‍රමය ගත්තොත්, මේ තුළින් රුපියල් බිලියන 2.4ක් අහිමි වෙලා තිබෙනවා. එහෙම තමයි ඒ කාලයේ හිටපු අමාත්‍යවරයා වැඩ කරලා තිබෙන්නේ.

තවත් විශේෂ කාරණයක් තිබෙනවා. 2021.06.20 දිනට ආසන්න දිනක සුඛෝපභෝගී වාහන දෙකක් ආනයනය කරලා තිබෙනවා. අපේ රාජපක්ෂ පරම්පරාවේ යෝෂිත සහ රෝහිත කියන අය තමයි මේ වාහන දෙක ආනයනය කර තිබෙන්නේ. ඒ වාහන දෙකේ අංකත් මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න කැමැතියි. එක අංකයක් තමයි CAB -7373, අනෙක් අංකය CAB -7171. මේ කාල සීමාව තුළ මේ සුඛෝපභෝගී වාහන දෙකත් ආනයනය කරලා තිබෙනවා. මේ වාර්තාවේ තිබෙන කරුණුවලට අදාළව ඉදිරියේදී පරීක්ෂණ කරලා වැරැදිකරුවන්ට අපි දඬුවම් ලබා දෙන්න ඕනෑ. එහෙම ඕනෑ නැද්ද කියලා මම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් අහන්න කැමැතියි.

ඒ වාගේම මේගොල්ලෝ තව දෙයක් කරලා තිබෙනවා. අපි ඒ වාහනයක් ගත්තාම කාටවත් පවරන්න බැහැ. විදේශ රැකියාව කරන එක්කෙනෙකුට තමයි ඒ වාහන දෙන්නේ. මේගොල්ලෝ ඒකටත් ක්‍රමයක් හදලා තිබෙනවා, සියයට 10ක බද්දක් ගෙවලා පවරන්න පුළුවන් විධියට. ඊට අදාළ නීත්‍යානුකූල documents හදලා නැහැ. ඒගොල්ලන්ට ඕනෑ ඕනෑ විධියට තමයි ඒවා කරලා තිබෙන්නේ. මේගොල්ලෝ සියයට 10 බද්ද ගෙවලා තමයි ඒ වාහන වෙන අයට පවරන්න කටයුතු කරලා තිබෙන්නේ. මහා පරිමාණ වශයෙන් වංචා කරපු ඇමතිවරු හිටපු රටක් තමයි මේ තිබෙන්නේ.

මේගොල්ලෝ කියනවා රාජ්‍ය සේවකයන් අහු කරන්න, රාජ්‍ය සේවකයන්ට දඬුවම් දෙන්න මේ වාගේ ක්‍රියාමාර්ග ගන්නවා කියලා. පැහැදිලිවම නැහැ. රාජ්‍ය සේවය ගත්තොත්, අද වනකොට අපි ඒගොල්ලන්ට උපරිම පහසුකම් ලබා දීලා තිබෙනවා. අපි ඒගොල්ලන් වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අද වෙනකොට ඒගොල්ලෝ අපට විශාල වශයෙන් සහයෝගය දක්වමින් තිබෙනවා.

පසුගිය කාල සීමාව ගත්තොත්, විශේෂයෙන්ම මම කැමැතියි ගම්පහ දිස්ත්‍රික්කය ගැන කියන්න. ගම්පහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන් ගත්තොත්, විශේෂයෙන් අපේ දිස්ත්‍රික් ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා, සැලසුම් අධ්‍යක්ෂතුමිය, සියලු ප්‍රාදේශීය ලේකම්තුමියන්ලා ඇතුළු ඒ ප්‍රදේශයේ ඉන්න සියලු අය ඉතාම හොඳින් අපිත් එක්ක ගනුදෙනු කරමින් ඉතිහාසයේ වැඩිම ව්‍යාපෘති සංඛ්‍යාවක් පසුගිය අවුරුද්දේ කරලා තිබෙනවා. එහෙම තමයි රාජ්‍ය සේවකයා අපිත් එක්ක වැඩ කරන්නේ. නමුත් ඉතිහාසයේ හිටපු ඇමතිවරු කරලා තිබෙන්නේ ඔවුන්ගේ කොඳු කඩන එක. ඔවුන්ට රැකියාවේ අභිමානය තියාගෙන වැඩ කරන්න අවස්ථාව දීලා තිබුණේ නැහැ. එහෙම තිබුණු රටක් තමයි අපි වෙනස් කරලා තිබෙන්නේ. අපි ඔවුන්ට නිසි ගෞරවය දීලා, ඔවුන්ගේ අත්දැකීම්වලට ගරු කරලා අපි රාජ්‍ය සේවයේ සියලුදෙනාත් එක්කම වැඩ කරනවා. ඒ වාගේම සියලු වංචා, දූෂණවලට සම්බන්ධ සියලුදෙනාටම නිසි ආකාරයෙන් දඬුවම් පමුණුවනවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අදාළ ආයතන පිළිබඳව කරන ලද විමර්ශන වාර්තාවලට අනුව අවශ්‍ය පියවර ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඒ කරුණු යොමු කිරීම පිළිබඳව තමයි ඔබ අපි සියලු දෙනා මේ කථා කරන්නේ, වාද කරන්නේ. හැබැයි ආණ්ඩුව අද මේ කාරණය ඉදිරිපත් කරනකොට එක් කරුණක් මඟ හැරිලා තිබෙනවා. ඒ කාරණය මෙකයි. පසුගිය කාලයේ ඉතා ආන්දෝලනාත්මකව කථා කරපු, ඒ වාගේම ආන්දෝලනාත්මක කරුණක් වෙච්ච, මේ රටේ එතෙක් මෙතෙක් ඉතිහාසයේ දැවැන්තම මූල්‍ය වංචාව විධියට මේ ආණ්ඩුවට චෝදනා එල්ල වෙච්ච ගල් අඟුරු වංචාව පිළිබඳ කරුණු අද මේ ලැයිස්තුවට ඇතුළත් වෙලා නැහැ. මේ ආණ්ඩුවට එල්ල වෙච්ච, ආණ්ඩුවට එල්ල කරපු, ආණ්ඩුව කළාය කියලා මේ රටේ මිනිස්සු විශ්වාස කරන වංචා, දූෂණ මේ ලැයිස්තුවට ඇතුළු නොවෙන්නේ මොකක් නිසාද කියන කාරණය අපි අහන්න කැමැතියි.

මීට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කරපු සමීක්ෂණයක් අනුව, ජනාධිපතිතුමාගේ ජනප්‍රියතාව සියයට 75ක් වෙලා කියලා. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මොන විධියට ඒ සමීක්ෂණය කළාද

කියන කාරණය අපි දන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් යොදවාගෙන ඒ සමීක්ෂණය කළාද කියන්න අපි දන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ ජනප්‍රියතාව සියයට 75ක් වෙලා නම්, පුළුවන් නම් පළාත් සභා මැතිවරණය තියන්න කියලා අපි අභියෝග කරනවා. ඔබ ජනප්‍රිය නම්, ඔබට විශ්වාස නම්, ඔබට ජනතාව අතරට යන්න පුළුවන් නම්, ඔබව ජනතාව පිළිගන්නවා නම්, ඔබ පිළිබඳව ජනතාව දැඩි කැක්කුමකින් ඉන්නවා නම්, ඔබට ඡන්දය දෙන්න ජනතාව පුල පුලා බලා ඉන්නවා නම්, ඔබගේ ජනාධිපතිතුමාට සියයට 75ක ජනතාවගේ ප්‍රසාදයක්, කැමත්තක්, ආකර්ෂණයක් තිබෙනවා නම්, පළාත් සභා මැතිවරණය තියලා පෙන්වන්න කියලා අපි මේ ආණ්ඩුවට අභියෝග කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කථා කරන්න කැමැතියි, මේ මොහොතේ පවතින ගැටලුවක් පිළිබඳව. ඒ ගැටලුව ගැන කියන්න ඉස්සෙල්ලා තව කාරණයක් කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයෙක් මීට පෙර කථා කළා. මම පසුගිය දවසක බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය විවෘත කරන්න කියලා ඉල්ලීමක් කළා. ඒ ගරු මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුව දෙවනත් කරමින් කිව්වා, පසුගිය කාලයේ දූෂණ, වංචා සිදුවෙලා තිබෙනවා කියලා තොරතුරු තිබෙනවා කියලා. එහි කණු හතරක් විතරක් ගහලා තිබෙනවා කියලා තමයි ඒ මන්ත්‍රීවරයා මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක් එක් අවධිවල, එක් එක් වර්ෂවල බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් කළ ගෙවීම්වලට අදාළ ලේඛන සහ මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව කරපු ගෙවීම්වලට අදාළ ලේඛන මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ජනාධිපතිතුමා කිව්වා එතුමා මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ බොරු කියන්න කියලා. "පාර්ලිමේන්තුවේ නම් මම කියන්නේ බොරු, එළියේදී නම් ඇත්ත කියනවා" කියලා තමයි ඔබගේ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ. එතකොට, අපේ ගාල්ලේ මන්ත්‍රීතුමාත් ජනාධිපතිතුමාගේ අඩිපාරේ යමින් පාර්ලිමේන්තුව බොරු කියන්න පාවිච්චි කළාද කියන කාරණය අපි අහන්න කැමතියි. මේ ආණ්ඩුව බෝපෙ පෝද්දල ආදාහනාගාරය වෙනුවෙන් කරලා තිබෙන්නේ අලංකරණ වැඩ ටික විතරයි. තමන් නොකරපු දේවල්වල අගය, වටිනාකම ගන්න උත්සාහ ගත්තාට කමක් නැහැ. හැබැයි, අපි ඔබගෙන් ඉල්ලන්නේ බෝපෙ පෝද්දල ආදාහනාගාරය ජනතා අයිතියට පත් කරන්න කියලායි. ඒක ඔබ කළා කියලා කිව්වාට කමක් නැහැ. ඔබ කළාය කියමින්, මේ පාර්ලිමේන්තුවේ බොරු තමයි කියන්නේ කියන කාරණය ඔප්පු කරමින්, පාර්ලිමේන්තුවේ බොරු කිව්වාට කමක් නැහැ. හැබැයි, ජනතාවට ඒකේ අයිතිය ලබා දෙන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඒ මන්ත්‍රීතුමා ප්‍රමුඛ ඔබගේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය මීට පෙර පාර්ලිමේන්තුවේ කථා කළා; මීට පෙරත් අපි මේ ප්‍රශ්නය පිළිබඳව පාර්ලිමේන්තුවේදී විටින් විට ඇහුවා. ඒ තමයි, අධ්‍යාපනවේදී උපාධිධාරීන් ගුරු පත්වීම් ලබා නොදීම පිළිබඳ ගැටලුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විභාගයකට මුහුණ දෙන්නේ නැතිව ගුරු ක්ෂේත්‍රයට එන්න තිබෙන එකම අවස්ථාව තමයි අධ්‍යාපනවේදී උපාධිය. ඒ තුළින් තමයි ගුරු ක්ෂේත්‍රයට කිසිදු තරග විභාගයක් නැතිව එන්න පුළුවන් වෙන්නේ. නිවැරදි පුහුණුව ලබලා, සියලු සුදුසුකම් සපුරලා තමයි ඔවුන් ගුරු සේවයට එකතු වෙන්නේ. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව කිසිදු අධ්‍යාපනවේදී උපාධිධාරියෙකු ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවාගෙන නැහැ. ගුරුවරුන් වීම සඳහා සිද්ධාන්තික සහ ප්‍රායෝගික යන දෙඅංශයෙන්ම ඉගෙන ගත්ත, ඒ සඳහා ඉතාම හොඳම සුදුසුකම් තිබෙන කණ්ඩායම තමයි මේ බඳවාගෙන නැත්තේ. මේ තත්ත්වය ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට ඇතිවී තිබෙන දැවැන්ත ප්‍රශ්නයක්.

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ගුරු සේවයට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීමට ගිය අවුරුද්දේ ජූනි මාසයේ 20වැනි දා සම්මුඛ පරීක්ෂණ කැඳෙව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අවුරුද්දේ ජූනි 26වැනි දා ගුරු පත්වීම් ලබා දෙන්න වැලිගම නගර සභා ශාලාවට එන්න කියලා පණිවුඩයකුත් දුන්නා. නමුත් අධිකරණමය කටයුත්තක් තිබෙනවා කියලා උපාධිධාරීන්ට ලැබුණු ඒ අවස්ථාව ඔබගේ ආණ්ඩුව නැති කළා. 2026 පෙබරවාරි වෙනකොට සියලුම අධිකරණ කටයුතු අවසන් වෙලා තිබෙනවා. නමුත් එදා මෙදා තුර තවම අධ්‍යාපනවේදී උපාධිධාරීන් ගුරු සේවය සඳහා බඳවා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

මම මූලාසනයේ සිටින වෙලාවේ අපේ විපක්ෂ නායකතුමා ගරු අගමැතිතුමියගෙන් ප්‍රශ්නයක් විධියට ඇහුවා, අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට රැකියා දෙනවාද කියන කාරණය. එතකොට ඔබගේ අගමැතිනිය ඉතාම පැහැදිලිව කිව්වා, ඒ නඩු කටයුත්ත අහවර වුණාම උපාධිධාරීන්ට පත්වීම් දෙනවා කියලා. හැබැයි, මේ වනවිට ඒ නඩු කටයුත්ත අවසන් වෙලා ගොඩක් කල්. අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට පත්වීම් ලබා දෙන්න ඇයි මේ කල් මරන්නේ? සුදුසුකම් ලබා තිබෙන අයට ඒ ඉඩ කඩ ලබා දෙන්න කියලා මම ඔබගේ ආණ්ඩුවෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මන්ත්‍රීවරුන් විධියට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා පවත්වලා යනවා. ඒවා සමාජ මාධ්‍යවල ප්‍රචාරය වෙනවා. අපි ඇවිල්ලා කථා පැවැත්වූවාට, ඒවා ප්‍රචාරය වුණාට, ඒවාට පිළිතුරු නැත්නම් අපි මන්ත්‍රීකම් අරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ කරන දෙයින් ප්‍රතිඵලයක් තිබෙනවාද?

අපි පසුගිය කාලයේ ඇහුවා, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන. අපි නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා, අනෙකුත් ඇමතිවරුන්ගෙන් ඇහුවා, ඒ ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය ප්‍රමාද වීම නිසා උදෑසන තම රාජකාරිවලට යාම සඳහා දුම්රිය භාවිත කරන පෞද්ගලික අංශයේ වාගේම රාජ්‍ය අංශයේ සේවකයින් අද වනවිට විශාල ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා. ඔවුන්ට තම දෛනික රාජකාරි කටයුතු කරගන්න බැරි වීම නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අපි ඉල්ලීමක් කළා, පුළුවන් නම් දුම්රිය ගමන් ආරම්භය විනාඩි 15ක්, 20ක් කලින් සිදුකර එම ගැටලුව විසඳා දෙන්න කියලා. හැබැයි, තවම ඒ ප්‍රායෝගික විසඳුම ඔබේ ආණ්ඩුවෙන් ලබා දුන්නේ නැහැ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් නැවත ඉල්ලීමක් කරනවා. ඔබට ජන වරම ලබා දී තිබෙන්නේ මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්නයි. අපි විපක්ෂය විධියට ඒවා පෙන්වා දෙනවා. ඒවා විසඳීම ඔබේ වගකීම. ඒ නිසා, අපි මතු කරන ගැටලු කෙරෙහි අවධානය යොමු කර ඒවා විසඳන්නත් සානුකම්පිතව කටයුතු කරන්න කියා අපි ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ ගැන සඳහන් කරමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.26]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මෙම විවාදය පවත්වනවා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් වූ කරුණු සඳහාත්. එනම්, කුමක්ද? මෙහිදී ඓතිහාසිකව කිසිදු දිනයක නොතිබුණු ආකාරයේ බලයක් COPE එකෙන් තීන්දු ගැනීම සඳහා ලබා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙපමණ කාලයක් සිදු වුණේ මොකක්ද කියලා ජනතාව television එකේ දැක්කා. රජයේ නිලධාරින් කැඳෙව්වා; ප්‍රශ්න විසඳුවා; වාර්තා හැදුවා. නමුත්, එම වාර්තා සියල්ලම ගරු කථානායකතුමාට දුන්නාට පසුව ඒවා එතැනින් අවසන් වීමේ - අවස්ථා කිහිපයක හැර - සම්ප්‍රදායක් තිබුණා. එතකොට, මහජන මුදල් භාවිත කරමින් එසේ - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබෙන කාලය කොච්චරද කියලා මට දැනගන්න හම්බ වුණේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ස්තුතියි.

මම කලින් සඳහන් කළ ආකාරයට එතැනදී ඇති වුණු ගැටලුව වුණේ "ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ කාලය, පාර්ලිමේන්තුවේ සම්පත් වැය කරමින් මේ කරන දේවල්වල අවසාන ප්‍රතිඵලය කුමක්ද, මේවා කථාවකට පමණක් සීමා වෙනවා නේද?" කියා ජනතාව ප්‍රශ්න කරන්නට වීමයි. විශේෂයෙන්ම COPE එකට මහජන ඉල්ලීමක්, මහජන මතයක් තිබුණා, ඔවුන්ගේ තීන්දු ඉදිරියට ක්‍රියාත්මක කරන්න බලය තිබෙන බලාත්මක තැනක් බවට එය පත් කරන්න කියා. මොකද, ඒක බදු ගෙවන්නන්ගේ මුදලට කරන සාධාරණයක් වන බැවින්. අන්න ඒ නිසා තමයි අද මේ යෝජනා හරහා තමන්ගේ සොයා ගැනීම්, වාර්තා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ CID එකට හෝ නීතිපතිවරයා වෙත කෙළින්ම යොමු කිරීම සඳහා ඓතිහාසිකව පළමු වතාවට COPE එකට බලය ලැබෙන්නේ.

මේ තුළින් බලාපොරොත්තු වන මූලිකම දෙයක් තිබෙනවා. අපේ රජය බලයට පැමිණියාට පසුව දූෂණයට, වංචාවට එරෙහිව සටන් කිරීම ඉතා තීව්‍ර කර තිබෙනවා. නමුත් එසේ තීව්‍ර කරන්න වුණේ හොරුන්ගෙන් ගහන, කඩා වැටිච්ච යන්ත්‍රණයක් හරහායි. එම සටන තීව්‍ර කිරීමේදී අපි අධිකරණ පද්ධතියේ වෙනස්කම් රාශියක් සිදු කළා. ඒ අනුව අලුතින් අධිකරණ පිහිටුවා තිබෙනවා. විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා නඩු අහන්නම කොළඹ උසාවි තුනක් පත් කර තිබෙනවා. මම හිතන විධියට ඊට අමතරව දැනට කරුණු වාර්තා කර තිබෙන පරිදි අපේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ කුමක් සඳහාද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යාල 23ක් ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවීමට. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ අවුරුද්ද අවසාන වීමට පෙර ගන්නා බව තමයි ඔවුන් දැනුම් දී තිබෙන්නේ. එතකොට ඔවුන්ට අවශ්‍ය අධිකරණ බලය ගැසට් කිරීම, අවශ්‍ය අධිකරණ පහසුකම් සැපයීම අපේ අමාත්‍යාංශය විසින් භාර ගන්නවා ඇති, ඔවුන්ට ස්වාධීනව රාජකාරිය කරන්න. ඒකෙන්ම පෙන්නුම් කරනවා, අපි දූෂණ මර්දන යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේදී හුදෙක් නඩු ඇහීමට එහා ගිහිල්ලා, එම කටයුතු පුළුල් කරලා, ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න අවශ්‍ය වටපිටාව සකසමින් සිටින බව. එම වටපිටාව සැකසීමේදී අපි මොනම ආකාරයකින්වත් අධිකරණයේ ස්වාධීනත්වයට හෝ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වයට හානියක් වෙන්න දෙන්නේත් නැහැ. ඒ වාගේම හිරේ යන්න බලාපොරොත්තුවෙන් සිටින, ඇප පිට සිටින වංචනිකයන්ට, දූෂිතයන්ට අධිකරණ පද්ධතියට තර්ජනය කරන්න අපි ඉඩ දෙන්නේත් නැහැ. ඔවුන් බොහෝ විට මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද භාවිත කරමින් එසේ කරන බව පෙනෙනවා.

ඔබතුමන්ලා මේ සභාවේදී කියන දේවල්වලින් වැඩි හරියක් එළියේ කිව්වා නම්, බොහෝ වෙලාවට ඒවාට අවශ්‍ය පියවර අපට වෙනම ගන්න පුළුවන්. නමුත්, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා තමයි මේ අය ඉන්නේ. කෙසේ හෝ වේවා මෙතැනදී අපි බලාපොරොත්තු වන ක්‍රමවේදය සම්බන්ධයෙන් සමහරු කියන්නට යෙදුණා, මේ කරන එක වැරදියි, නිලධාරින් භය වෙනවා, නිලධාරින් වැඩ කරන්නේ නැහැ කියලා. ඒක අසත්‍යයක්. මොකද, ඉස්සර තිබුණු COPE එක සමහර වෙලාවට බොහොම සංදර්ශනාත්මකව නිලධාරින් පස්සෙන් පන්නමින් ඔවුන්ට දඬුවම් කරන්න හදපු ස්වරූපයක් තිබෙන්න ඇති. ඒ, ඉස්සර. දැන් මේ දේවල් වෙනස් වෙලා තිබෙනවා. දැන් වෙනස් වෙලා තිබෙන්නේ කොහොමද? අපි ඔවුන්ට පෙන්වා දෙන්නේ මෙයයි. ඔවුන්ගේ රාජකාරිය වඩාත් යහපත්ව, වඩාත් හොඳින් කරන්න පුළුවන් මාර්ගෝපදේශයක් සපයා ගැනීම තමයි දැන් අපේ COPE එක හරහා සිද්ධ වන්නේ.

ඒ වාගේම අධිකරණ පද්ධතියේ සිටින නිලධාරින් ඇතුළු රාජ්‍ය සේවයේ සිටින සෑම නිලධාරියකුටම මම මේක කියන්න ඕනෑ. අපට ඉතා හොඳාකාරයෙන් තේරෙනවා, තමන් රාජකාරි කිරීමේදී සද්භාවයෙන් වෙන අත්වැරදීම් මොනවාද, තමන් රාජකාරිය කිරීමේදී යම්කිසි duress එකකට යටත් වෙලා, යම්කිසි අනිසි පීඩනයකට යටත් වෙලා වැඩ කරලා තිබෙන අවස්ථා හෝ හුදෙක් වංචනිකව කටයුතු කරපු අවස්ථා මොනවාද කියලා. අධිකරණ පද්ධතියේ සිටින අය වශයෙන් අපට මේ කාරණා තුන ගැනම හොඳ අවබෝධයක් තිබෙනවා. සද්භාවයෙන් වැඩ කරද්දි සිදුවන අත්වැරදීම්වලට ඔබ පසුපස නීතිය හඹා එන්නේ නැහැ. මානුෂික ප්‍රශ්නයක් නිසා ඇති වෙච්ච ගැටලුවකදී ඔබ පසුපස නීතිය හඹා එන්නේ නැහැ. ඒ වාගේම අපේ බහුතරයක් රජයේ නිලධාරින් ඉතා අවංක, දක්ෂ ලෙස වැඩ කරන අය වුණත්, යම් නිලධාරින් පිරිසක් කලින් හිටපු දේශපාලනඥයන්ගේ බලපෑම්වලට යටත් වෙලා නොයෙක් ආකාරයේ දේවල් කරපු නිසා ඔවුන්ට සමහර වෙලාවට නඩුවල සාක්ෂිකරුවන් වෙන්න සිදුවෙලා තිබෙනවා. නමුත් මම පැහැදිලිව කියනවා, COPE එක හරහා කිසිම විධියකින්වත් රාජ්‍ය නිලධාරින් වින්දිතයින් කරන්න හදන්නේ නැහැ කියලා. ඒ වාගේම මම රජයේ නිලධාරින්ගෙන් මෙන්න

මේකත් ඉල්ලා සිටිනවා. COPE එකට එන්න කියලා අමාත්‍යාංශයකට දැනුම් දුන්නාම ඒ නිලධාරින් COPE එකට එන්න ලැහැස්ති වෙන්නේ වෙනම යුද්ධයකට යනවා වාගේයි. මොකද, හැමවිටම COPE එක ගැන ඔවුන් හිතන්නේ ඔවුන්ගේ ප්‍රතිවාදියා හැටියටයි. ඒ, ඉස්සර තිබුණු COPE එක. දැන් මේ ඉන්නේ ඔබට මාර්ගෝපදේශ සපයන, ඔබට යහපත් ආකාරයට වැඩේ කරන්න උනන්දු කරවන සභාපතිවරයෙක් යටතේ මෙහෙයවන COPE එකක්. ඒ නිසා මේක යුද්ධයක් කියලා හිතාගෙන මෙතැනට එන්න එපා. නමුත්, අපි මේ රටේ මහජනතාවගේ බදු මුදල්වලට වග කියන්න ඕනෑ. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවට තමයි මුදල් පිළිබඳව බලය තිබෙන්නේ. අන්න ඒ දේ තමයි අපි කරන්නේ. එහෙම නැතිව එතැනින් එහාට වෙනත් දෙයක් සිද්ධ වන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී දැන් කියන්නට යෙදුණා, - එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ - අපි පොලීසියේ රාජකාරිය කරන්න හදනවා කියලා. නැහැ, පොලීසියේ රාජකාරිය අපි කරන්න හදන්නේ නැහැ. එහෙම නම් අපි පොලිස් බලතල තමයි ඉල්ලන්නට ඕනෑ. ඒ වාගේම මේක නිකම්ම නිකම් කථා පෙට්ටියක් වෙන්න ඕනෑත් නැහැ. කථා කරනවා, වාර්තා හදනවා, වාර්තාව ගොනු කරනවා. ඊට පස්සේ ඒ වාර්තා ඔහේ පුස් කකා තිබෙනවා. එහෙම වෙන්න ඕනෑත් නැහැ. ඒක නිසා මේක පොලීසිය වෙන්න හදනවා නොවෙයි. එහෙම නම් අපි විමර්ශන කරන්න ඉල්ලන්න ඕනෑ. නැහැ, අපි කියන්නේ මේකයි. යම්කිසි වැරැද්දක් හෝ මොනවා හරි දෙයක් සොයා ගත්තා නම්, ඒවා CID එකට වේවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වේවා, එහෙම නැත්නම් නීතිපති දෙපාර්තමේන්තුවට - නිවැරදි ආයතනයකට - යොමු කිරීමේ හැකියාව අපට තිබෙනවා. එසේ යොමු කළාට පස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හිතනවා නම්, නැහැ, මේක අපි විමර්ශනය කරන්න ඕනෑ නැහැ, මේක කරන්න ඕනෑ නීතිපති දෙපාර්තමේන්තුව කියලා, එහෙම නම් ඒක නීතිපති දෙපාර්තමේන්තුවට යවන්න පුළුවන්. නීතිපතිතුමාට හිතෙනවා නම්, නැහැ, මේක වැටෙන්නේ අල්ලස් වරදක් විධියටයි, ඒ නිසා මේක යවන්න ඕනෑ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටයි කියලා, එහෙම නම් ඒක ඒ ආයතනයට යවන්න පුළුවන්. ඒ වාගේම මේ ආයතන දෙකටම පුළුවන් CID එකට උපදෙස් දෙන්න, මේ විමර්ශන තව පොඩ්ඩක් ඉක්මන් කරන්න අපට මෙන්න මේ දේවල් හොයන්නට ඕනෑ කියලා. මම හිතන විධියට සජබය වෙනුවෙන් කථා කරපු මන්ත්‍රීවරුනුත් මේකට විරුද්ධ වුණේ නැහැ. මොකද හැමෝම පිළිගන්නවා, වංචාව, දූෂණය නැති කරන්න ඕනෑය කියන එක අත්‍යවශ්‍ය පොදු කාරණාවක් කියලා. එම නිසා මේ රෙගුලාසිවලට සියලුදෙනාම සහයෝගය දැක්විය යුතුයි කියන එක තමයි මගේ මතය.

මේ ගරු සභාවේදී කරපු කථා බොහොමයක් මම අහගෙන හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධයෙන් මම ගොඩක් කථා කරන්න යන්නේ නැහැ. මොකද, මාතෘකාවෙන් පිට කථා කරපු දේවල් නේ වැඩි හරියක් තිබුණේ. මීට කලින් කථා කරපු එක මන්ත්‍රීවරයෙක් කුඩු ගැන කථා කළා. මම දන්නේ නැහැ, ඒක මේ කාරණයට සම්බන්ධ වුණේ කොහොමද කියලා. නමුත්, ඒ ගැනත් අපි කථා කරමුකෝ. මොකද, එතුමා ඒ ගැන කථා කළා නේ. කුඩු ගැන කථා කළා, කන්ටේනර්වල ගෙනා අවි ආයුධ ගැන කථා කළා, ගල් අඟුරු ගැන කථා කළා. මේ උදවිය කටපාඩම් කරගෙන ආ දේවල් ටිකක් ඒ විධියට මෙතැන කියවාගෙන යනවා. හැබැයි මේ අයට මතක නැහැ, අවුරුදු ගණනාවක් තිස්සේ ඒ අයගේ ආණ්ඩුවලින් හදපු කුඩු ව්‍යාපාරිකයෝ තමයි අපේ රටට කුඩු ගේන්නේ, අයිස් ගේන්නේ කියලා. ඒවා තමයි දැන් අපි නවත්වන්නේ. ආනන්ද විජේපාල ඇමතිතුමා මට කිව්වා, අපි බලයට ඇවිත් මේ ටික කාලය තුළ කුඩු, ගංජා, අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය - narcotics - ටොන් 25කට එහා අපේ ආණ්ඩුව අත්අඩංගුවට අරන් තිබෙනවා කියලා. තවදුරටත් අත්අඩංගුවට ගැනීම් කරනවා. ඒක නවතින්නේ නැහැ.

කන්ටේනර් සිද්ධිය ගැනත් අද කථා කළා. ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න කමිටුවක් පත් කර තිබෙනවා. එම කමිටුවේ සභාපතිවරයා මමයි. එම නිසා මම ඒ ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. ඒ වාගේම එතුමා කියන්නට යෙදුණා, ඉල්ලීම්වලට ඉඩ දෙන්නේ නැහැ කියලා. ඉල්ලීම්වලට ඉඩ නොදෙන්නේ ඡන්ද තියලා නොවෙයි. ඒවා ගැන කථා කළාට ඒකෙන් කරන දේ තමයි, දේශපාලනය කරන්න ඉඩ නොදීම. මේ කමිටුව තුළ දේශපාලනය කරන්න සමහරුන් උත්සාහ කරනවා නම් අපි අන්න ඒකට නම් ඉඩ දීලා නැහැ. නමුත් සියලු හේතු වාර්තා කරලා තිබෙනවා. ඒ වාගේම ගල් අඟුරු ආනයන සිද්ධියට අදාළවත් විමර්ශන සිදු කරනවා. ඒ වාර්තාත් ඉදිරියේදී එයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. නමුත් එක දෙයක් පැහැදිලිව කියන්න ඕනෑ. අපි ජනතාවට පොරොන්දුවක් දුන්නා, දූෂණ, වංචා නවත්වනවා කියලා. ඒකට අපි එක පැත්තකින් විතරක් නොවෙයි, හැම පැත්තකින්ම තල්ලුවක් දෙන්න ඕනෑ. වේගය මදි වුණත්, වේගය වැඩි කරන්න තල්ලු කරන්න ඕනෑ. ඔබතුමන්ලා අපෙන් ඇහුවා, හොරු, වංචනිකයින් අල්ලන්නේ නැත්තේ ඇයි කියලා. අපි දැන් හොරු අල්ලනවා. ඒ වාගේම අපි වැඩ කරනවා. එතකොට ඔබතුමන්ලා කෙඳිරිගාන්නේ නැතිව ඉන්නවා නම් අපට ලෙහෙසියි. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අදාළ ආයතන සම්බන්ධයෙන් එකී කාරක සභා රැස්වීම්වල දී සිදු කරන ලද විමර්ශනවලට අදාළව සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවන්හි ඇතුළත් වාර්තා මඟින් හඳුනාගත් මෙහි පහත ඇමුණුමේ සඳහන් සිද්ධි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4)හි විධිවිධාන ප්‍රකාරව නිසි පියවර ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි."

| අනු අංකය | ආයතනය | කාරක සභා රැස්වීම පැවැත්වූ දිනය | වාර්තාව සභාගත කළ දිනය හා පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය | නිශ්චිත සිද්ධිය/ සිද්ධි |
|---|---|---|---|---|
| 1. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 හා 2025.03.27 | 2025.06.04 PS 212 | 1. කිලෝ ග්‍රෑම් 510ක් බර "Rough Sapphire Cluster" මැණික් පාෂාණය. |
| | | | | 2. හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය. |
| | | | | 3. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීම. |

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

| | | | | |
|---|---|---|---|---|
| 2. | ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලය | 2025.05.15 | 2025.07.24 PS 242 | 1. විදුලි පද්ධතියේ ආරක්ෂාවට ගෙන් වූ උපකරණ ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීම. |
| | | | | 2. දීමනා ගෙවීම්වල අක්‍රමිකතා සහ බඳවා ගැනීම් පටිපාටිය. |
| | | | | 3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා ගැනීම |
| 3. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 හා 2025.07.17 | 2025. 12.18 PS 391 | 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලෙන් කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම. |
| | | | | 2. එස්. ආර්. රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බේගෲප් වත්ත). |
| | | | | 3. මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබාදීම (ඉඹුල්ගස්වාඩිය, කටාන) |
| | | | | 4. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම. |
| 4. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 | 2025.12.18 PS 392 | 1. විශ්වවිද්‍යාලයේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම. |
| | | | | 2. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදි කිරීමේදී සිදුවූ අක්‍රමිකතා. |
| | | | | 3. 2021 වර්ෂය තුළ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම |
| | | | | 4. විශ්වවිද්‍යාල භූමියෙන් අනවසරයෙන් පස් කැපීම |
| | | | | 5. උපකුලපතිවරයාට අයිතිව තිබූ නිවසක් බදු පදනම මත ශිෂ්‍ය නේවාසිකාගාරයක් සඳහා ලබාදීම |
| 5. | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 | 2025.12.18 PS 394 | 1. වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම |
| 6. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 | 2025.12.18 PS 397 | 1. සේවක දිරි දීමනා ගෙවීම. |
| | | | | 2. කිලිනොච්චිය නගරයේ පිහිටි සමාගම සතු වර්ග අඩි 15000ක ගොඩනැගිල්ල බදු පදනමට ලබාදීම. |
| | | | | 3. කාර්ය සාධන දීමනා හා වෘත්තීය දීමනා. |
| | | | | 4. ප්‍රවාහන දීමනා. |
| 7. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 හා 2025.05.23 | 2026.01.08 PS 435 | 1. නේවාසික පුහුණුවක් ලබාදීමකින් තොරව ගෘහ සේවිකාවන් විදේශගත කිරීම නිසා කාර්යාංශයට අලාභයක් සිදුවීම |
| | | | | 2. විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් පත් කිරීම |
| | | | | 3. "Glocal Fair" (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන |
| | | | | 4. "Glocal Fair" (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන වෙනුවෙන් වෙළඳ කුටි ලබා ගැනීම. |
| | | | | 5. "විගමණික හරසර" වැඩසටහන පැවැත්වීම. |
| 8. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 හා 2025.11.26 | 2026.02.19 PS 476 | 1. බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) ණය ලබා දීම |
| | | | | 2. පුද්ගලයන් දෙදෙනෙකු වෙත 2020 දෙසැම්බර් 23 දින ලබා දී ඇති රු. මිලියන 164.73 ක් වූ බද්ධ දේපළ ණය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 3. ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් ණය පහසුකම් 10ක අක්‍රමවත් ආපසු ගෙවීම් සලකා බැලීමකින් තොරව ණය ගැණුම්කරුවෙකුට රු. මිලියන 12.6ක ණයක් ලබා දීම. |
| | | | | 4. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමක් වෙත ලබාදී ඇති එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක් වටිනා සම්මේලනික ණය. (Syndicate Loan) |

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

## දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යසාධනය
## பத்தாவது பாராளுமன்றத்தில் பொது மனுக்கள் பற்றிய குழுவின் செயலாற்றுகை
## PERFORMANCE OF COMMITTEE ON PUBLIC PETITIONS OF TENTH PARLIAMENT

[අ.භා. 2.37]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභිකයෙකු වන ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම සතුටට කරුණක් බව මම පළමුකොටම ප්‍රකාශ කරන්න කැමැතියි. දසවන පාර්ලිමේන්තුවේ ගෙවුණු වසර එකහමාරකට ආසන්න කාලවකවානුව තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සහ කාර්යසාධනය පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ස්ථාවර නියෝග 125 අනුව පිහිටුවා ඇති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මූලික වගකීම වන්නේ ස්ථාවර නියෝග 30(10) යටතේ ගරු මන්ත්‍රීවරුන් විසින් යොමු කරන ලද පෙත්සම් විභාග කිරීමයි. ජනතා නියෝජිතයින් වන මෙම සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් වෙත පොදු ජනතාව ඉදිරිපත් කරන පෙත්සම් සෑම පාර්ලිමේන්තු දිනයකම පාහේ මෙම කාරක සභාවට යොමු කරනු ලැබේ.
>
> දසවන පාර්ලිමේන්තුවේ පිහිටුවා ඇති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වසර එක හමාරකට ආසන්න කාලයක් ක්‍රියාත්මක වී ඇති අතර, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු වී ඇති මහජන පෙත්සම් 392ක් සඳහා සැසිවාර 63ක් පවත්වා, වාර්තා 03ක් මඟින් මෙම සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබේ.
>
> පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මඟින් පැවරී ඇති බලතල, ප්‍රගතිශීලී ලෙස හා විශ්වසනීය ලෙස සුරක්ෂිත කරමින් කාරක සභාව වෙත යොමු කරන ලද මහජන පෙත්සම් මඟින් පෙත්සම්කරුවන්ට සාධාරණ සහනයන් සැලසීම උදෙසා හැකි සෑම විටම උත්සාහ කරන ලදී. මෙහි කාර්යක්ෂමතාව සහ ඵලදායීත්වය පිළිබඳව අවධානය යොමු කරමින් ජනතා නියෝජිතයන් සියලුදෙනාටම ඍජුව සම්බන්ධිත මෙම කාරක සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සියලු සහාය තවදුරටත් ලබා දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වතාවට අද තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳව සහ එහි කටයුතු පිළිබඳව මෙම පාර්ලිමේන්තු සභා ගර්භය තුළ වරුවක විවාදයක් පවත්වන්නේ. ඒ නිසා අද දිනය එක්තරා විධියකට ඓතිහාසික දිනයක් බවට පත්වනවා. ඒ වෙන කිසිවක් නිසා නොවෙයි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පිහිටුවා ඇති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මේ මුළු සභාවේම අවධානය යොමු කිරීමට ඉඩකඩ ලැබීම නිසා.

ඒකට හේතු වෙච්ච මූලික කාරණා කිහිපයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ව්‍යවස්ථාදායකය හැටියට මේ පාර්ලිමේන්තුවට පැවරුණු වගකීම ඉටු කිරීමේදී මේ රටේ මිලියන 22ක් වෙච්ච සාමාන්‍ය මහජනතාවට තමන්ගේ ප්‍රශ්නයක්, දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කරන්න තිබෙන එකම තැන බවට අද වනකොට මහජන පෙත්සම්

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

පිළිබඳ කාරක සභාව පත් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ස්ථාවර කාරක සභා 5ක් පිහිටුවා තිබෙනවා. ඒ ස්ථාවර කාරක සභා 5 තුළ තිබෙන කාරක සභා 2ක ක්‍රියාකාරිත්වය ගැන අද උදේ වරුවේ අපි විවාද කළා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ස්ථාවර නියෝග 30 (10) යටතේ පැවරුණු වගකීම අනුව මේ රටේ සාමාන්‍ය පුරවැසියෙක් ඉදිරිපත් කරන ඕනෑම පෙත්සමක්, දුක්ගැනවිල්ලක්, අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් විභාග කිරීමේ අයිතිය තිබෙනවා. නිලධාරියෙකු, ආයතනයක් හෝ යම්කිසි පළාත් පාලන ආයතනයක් විසින් ගනු ලැබූ තීරණයක් මත ඒ අසාධාරණය වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කරන්න, විභාග කරන්න මෙම කාරක සභාවට අයිතිය තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න තිබෙන එකම ආයතනය බවට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, එහි තවත් එක් සුවිශේෂී වැදගත්කමක් තිබෙනවා. ඒ සුවිශේෂී වැදගත්කම තමයි, මහජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වෙන්න, නිර්දේශ ඉදිරිපත් කරන්න තිබෙන එකම කාරක සභාව බවට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පත් වීම. අනෙක් පැත්තෙන්, මේ පාර්ලිමේන්තුව සතුව තිබෙන ව්‍යවස්ථාදායක බලය තුළ යම් නෛතික අධිකරණමය බලරාමුවක් ද තිබෙනවා. රටේ ඕනෑම පුරවැසියෙක් මේ මූලාසනයේ ඉන්න ගරු කථානායකතුමාට තමන්ගේ දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් වූ පෙත්සම ඉදිරිපත් කළාම ගරු කථානායකතුමා විසින් එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට එය යොමු කළාට පසුව අපේ රටේ ව්‍යවස්ථාදායකය තුළ යම් නීත්‍යානුකූල අධිකරණමය බලයක් තිබෙන නෛතික ආයතනය බවට මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පත් වෙනවා. ඒ නෛතිකමය බලරාමුව තිබෙන්නේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට. එම නිසා ඒ පෙත්සමට අදාළ කරන ඕනෑම ලිපි ගොනුවක් පරීක්ෂා කරන්න, ඕනෑම අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක ඕනෑම නිලධාරියෙකු කැඳවන්න, ඕනෑම විධායක නිලධාරියෙකු කැඳවන්න මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට බලය තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඕනෑම ආයතනයක්, ඕනෑම තැනක් පරීක්ෂා - check - කරන්න මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට බලය තිබෙනවා. ඒ අයිතිය ලැබෙන්නේ ව්‍යවස්ථාදායකයට හිමි නෛතික අධිකරණමය බලරාමුව ඇතුළේ හිමි වන ව්‍යවස්ථාපිත අධිකරණමය බලයත් එක්ක. මේ සියල්ලත් එක්ක දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මහජන පෙත්සම් 392ක් විභාගයට ලක් කළා. මේ ගෙවුණු අවුරුදු එකහමාර තුළ සභාවාර 63ක් රැස් වෙලා නිර්දේශ 392ක් ලබා දුන්නා. එලෙස නිර්දේශ ලබා දුන්නාට පසුව ඒ නිර්දේශ ඇතුළත් වාර්තා 3ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

හත්වන, අටවන සහ නවවන පාර්ලිමේන්තුවල මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය තුළ කාරක සභාව රැස් වුණු දින ගණන, පාර්ලිමේන්තුව රැස් වුණු දින ගණන, ඉදිරිපත් වුණු පෙත්සම් ගණන, විභාගයට ලක් කරපු පෙත්සම් ගණන, විභාගයට ලක් කර නිර්දේශ දීපු පෙත්සම් ගණන සහ ඉදිරිපත් කරන ලද වාර්තා ගණන කොපමණද කියන එක ඕනෑ නම් මට සන්සන්දනාත්මකව ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් මම මේ අවස්ථාවේදී ඒ සඳහා වෙලාව වැය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දසවන පාර්ලිමේන්තුව තුළ මේ සභා ගර්භය රැස් වෙලා තිබෙනවා, දින 149ක්. ඒ දින 149න්, දින 63ක් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව රැස් වෙලා තිබෙනවා. පෙත්සම් 393ක් විභාගයට ලක් කරලා නිර්දේශ ඇතුළත් වාර්තා 3ක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කරපු වාර්තා 3ට අදාළව ගරු කථානායකතුමා විසින් මේ වනකොට විෂය භාර අමාත්‍යවරුන්ට ලබා දීපු නිර්දේශ සම්බන්ධයෙන් ඔවුන් ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක පිළිබඳව විමසීම් කර තිබෙනවා. දැනට වාර්තා දෙකකට එලෙස ගත්ත ක්‍රියාමාර්ග ලැබිලා තිබෙනවා. මම හිතන විධියට, මේ වනවිට රජයේ මුද්‍රණාලයේ භාෂා ත්‍රිත්වයෙන්ම එක් වාර්තාවක මුද්‍රණ කටයුතු කෙරෙමින් තිබෙනවා. මේ ඉදිරිපත් කරපු වාර්තා තුනත් එක්ක මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැටියට අවධානයට ලක් කර ගත යුතු ප්‍රධාන කාරණා කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව මේ වාර්තා තුන අධ්‍යයනය කරද්දී, පෙත්සම් විභාග කරද්දී අපේ විශේෂ අවධානයට ලක් වුණු, විශේෂ නිරීක්ෂණයට ලක් වුණු කාරණා කිහිපයක් තිබෙනවා. ඒ කාරණා කිහිපය සම්බන්ධයෙන් මේ ගරු සභාවේ සහ රටේ ජනතාවගේ අවධානය යොමු කළ යුතු යැයි මා විශ්වාස කරනවා.

අපට ඉදිරිපත් වුණු පෙත්සම් සංඛ්‍යාව ගත්තොත්, පෙත්සම් 1,900 ගණනක් ඉදිරිපත් වෙලා තිබුණා. ඒකෙන් පෙත්සම් 999ක් ලිපි ගොනු සම්පූර්ණ කරලා ගරු කථානායකතුමාගේ නිරීක්ෂණ සහිතව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට විභාගය සඳහා යොමු කරලා තිබුණා. ඒ පෙත්සම් වැඩි ප්‍රමාණයක් අතර පොදු ලක්ෂණයක් දකින්නට තිබුණා. ඒ පොදු ලක්ෂණය තමයි, අපේ රටේ රාජ්‍ය සේවයට ඇතුළු වන රාජ්‍ය සේවකයන් වයස අවුරුදු 45ට කලින් රාජ්‍ය සේවයේ ස්ථිර වෙන්න ඕනෑ වීම. එහෙම නැත්නම් ඒ සේවකයාට විශ්‍රාම වැටුප හිමි වෙන්නේ නැහැ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන අනුව ඕනෑම රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම යන්න නම්, අවම මාස 120ක්, එහෙම නැත්නම් විශ්‍රාම වැටුප හිමි රැකියාවක වසර 10ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වෙනවා. නමුත් රාජ්‍ය සේවකයන් බොහොමයකගේ මුළු සේවා කාලය ගත්තොත්, වසර 23, 24, 25, 30, 33යි. හැබැයි, පත්වීම ස්ථිර වෙලා තිබෙන්නේ වයස අවුරුදු 45ට පස්සේ. එතකොට රාජ්‍ය සේවයේ අවුරුදු 33ක සේවා කාලයක් සම්පූර්ණ කරලා තිබෙන නමුත් විශ්‍රාම යනකොට වසර 10ක ස්ථිර සේවා කාලයක් නැති නිසා විශ්‍රාම වැටුප හිමි වෙන්නේ නැහැ. ඒ නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව නිරීක්ෂණය කළ පරිදි රාජ්‍ය සේවකයන් ස්ථිර කිරීමේදී වයස අවුරුදු 45ට පෙර ස්ථිර කිරීම කෙරෙහි - අනියම්, ආදේශ, කොන්ත්‍රාත් සේවා කාලය සම්පූර්ණ කරන ලද, දින 180ක සේවා කාලය සම්පූර්ණ කරන ලද සියලු සේවකයන් අවුරුදු 45ට පෙර ස්ථිර කිරීම කෙරෙහි - ආයතන ප්‍රධානීන්ගේ අවධානය, සැලකිල්ල යොමු කළ යුතු යැයි; ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු යැයි අපි යෝජනා කරනවා.

අනෙක් පැත්තෙන්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී මතු වෙච්ච තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. වසර 10ක ස්ථිර සේවා කාලය සම්පූර්ණ නොවුණු රාජ්‍ය සේවකයන්ගේ සේවා කාලය සැලකිල්ලට අරගෙන ඔවුන්ට ජීවිතයේ එක් වතාවකදී විතරක් රුපියල් 50,000ක කරුණා සහගත දීමනාවක් ගෙවනවා. වසර 10ක සේවා කාලය සම්පූර්ණ කරන්න බැරි වුණාම හිස් අතින් යවන්න බැරි නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ඒ අයගේ හිත සතුටු කරන්න රුපියල් 50,000ක කරුණා සහගත දීමනාවක් ගෙවනවා, ජීවිතයේ එක් වතාවකදී විතරක්. වසර 15ක, 20ක කාලයක් සේවය කරලා තිබෙනවා නම්, ජීවිතයේ එක් වතාවකදී විතරක් ගෙවන ඒ කරුණා සහගත දීමනාව මම හිතන විධියට කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. ඒක වැඩකට ඇති එකක් නොවෙයි. ඒ නිසා රාජ්‍ය සේවයේ හිටපු, වසර 10ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කරන්න හැකියාව නොලැබෙන සේවකයන් සඳහා ජීවිතයේ එක් වතාවක් විතරක් ගෙවනු ලබන රුපියල් 50,000ක කරුණා සහගත දීමනාව ප්‍රමාණවත් නැහැ, අඩුම තරමේ එය රුපියල් ලක්ෂ පහක් දක්වාවත් වැඩි කරන්න ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැටියට අපි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට, ඒ වාගේම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට බල කර සිටිනවා; ඉල්ලා සිටිනවා. ඒක රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු දෙයක්. නමුත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැටියට අපි ඉල්ලා සිටිනවා, මේ රටේ සුවහසක් රාජ්‍ය සේවකයන් අතරින් වසර 10ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කළ නොහැකි වුණු, විශ්‍රාම වැටුප් අහිමි වන සේවකයන්ගේ සේවා කාලය ඇගයීමට ලක් කරලා, ජීවිතයේ එක් වතාවක් පමණක් ගෙවන රුපියල් 50,000ක මුදල වෙනුවට අවම වශයෙන් රුපියල් ලක්ෂ 5ක්වත් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ඒ වාගේම අනෙක් පැත්තෙන් විශේෂ අවධානයට යොමු වෙච්ච තවත් කාරණයක් තිබෙනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී පෙත්සම් නිරීක්ෂණයේදී විශේෂයෙන් ත්‍රෛපාර්ශ්වික එකඟතාව මත තමයි අපි නිර්දේශ නිකුත් කරන්නේ. මීට කලින් පාට බැලුවා වෙන්න පුළුවන්, පක්ෂ බැලුවා වෙන්න පුළුවන්, දේශපාලනය බැලුවා වෙන්න පුළුවන්, පෙත්සම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා බලලා ඒ අනුව නිර්දේශ ඉදිරිපත් කළා වෙන්න පුළුවන්. නමුත් දසවැනි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මහජන පෙත්සම් විභාග කරලා නිර්දේශ ලබා දීමේදී අපේ මූලික නිර්ණායකය බවට පත් වුණේ, "නීතියට උඩින් කිසිවක් නැත" යන්නයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

"නීතියට උඩින් කිසිවක් නැත. සියලුදෙනා නීතියට යටත් විය යුතුයි. සියලු පුරවැසියන් නීතියට අවනත විය යුතුයි" යන මූලධර්මය පදනම් කරගෙන තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැටියට අපි පෙත්සම් විභාගයට අදාළ කරන මූලික කාරණා ටික සැලකිල්ලට ලක් කර ගත්තේ. එහිදී ත්‍රෛපාර්ශ්වීය එකඟතාවක් මත කටයුතු කරනවා. පෙත්සම්කරු, ඒ වාගේම ආයතන ප්‍රධානීන් - මාත්‍යාංශ ලේකම්වරු සහ රාජ්‍ය සේවා කොමිසමේ, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරින් - සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යන තුන්ගොල්ලන්ම පෙත්සම නිරීක්ෂණය කරලා, පුළුල්ව විභාග කරලා, සාධාරණත්වයේ මූලධර්මය මත, අපක්ෂපාතිත්වයේ මූලධර්මය මත මේ රටේ හැම පුරවැසියෙකුටම මිනිස්කමේ නාමයෙන් උපරිම සාධාරණත්වය ඉටු කිරීම වෙනුවෙන් තමයි අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරයට, ඒ ක්‍රියාවලියට මැදිහත් වුණේ. ඒ පදනම මත හිඳිමින් අපි එකඟ වෙලා දෙනු ලබන නිර්දේශ ඊටපසුව, පසු කාලීනව ක්‍රියාත්මක වෙන්නේ නැති අවස්ථා තිබෙනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව නිර්දේශයක් දුන්නාම බොහෝ දුරට ඒ නිර්දේශය ක්‍රියාත්මක නොවී ඊට පස්සේ ආපසු වෙනත් පිළිතුරක් එනවා; ඒක කරන්න බැහැ කියලා ආයතන ප්‍රධානියාගෙන් ආපසු වෙනත් උත්තරයක් එනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාලය වැය කරලා, මුදල් වැය කරලා, නිලධාරින් විශාල පිරිසක් සහභාගි වෙලා, මේ රටේ ව්‍යවස්ථාදායකය සතුව තිබෙන නෛතික අධිකරණමය බලය පාවිච්චි කරලා නිර්දේශයක් ඉදිරිපත් කළාම ඒ නිර්දේශය ක්‍රියාත්මක නොවෙන තැනට තල්ලු වෙනවා නම්, ඒකෙන් මේ ආයතනය විහිළුවට ලක් වෙනවා; ව්‍යවස්ථාදායකය විහිළුවට ලක් වෙනවා. ඒක එහෙම කරන්න බැහැ.

අපි විශේෂයෙන්ම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැටියට නිර්දේශ නිකුත් කිරීමේදී ත්‍රෛපාර්ශ්වීයව සලකා බලනවා. නිලධාරින්ගේ පැත්තෙනුත්, ඒ වාගේම පෙත්සම්කරුගේත්, පෙත්සම් කාරක සභාවේ සියලු දෙනාගේත් එකඟතාව යන සියල්ල සැලකිල්ලට අරගෙන තමයි නිර්දේශය නිකුත් කරන්නේ. ඒ නිකුත් කරන නිර්දේශය වාර්තා මඟින් ප්‍රකාශයට පත් කළාට පස්සේ, නිල වාර්තාවක් බවට පත් වෙනවා. ඒක ආපසු වෙනස් කිරීමේ බලයක් වෙනත් කිසිවෙකුට නැහැ කියන කාරණයත් මතක් කරන්න ඕනෑ. මොකද, පෙත්සම් කාරක සභාවේ කටයුතු හෑල්ලුවට ලක් කරන්න, අභියෝගයට ලක් කරන්න, විහිළුවට ලක් කරන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවෙනි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු වෙනුවෙන් විශාල පිරිසක් විවිධාකාරයෙන් උදවු උපකාර කරනවා, මැදිහත් වෙනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගත්තොත්, මේ ලබපු සියලු ජයග්‍රහණවල කොටස්කාරයන් බවට පත් වුණේ මේ කාරක සභාවේ සියලු දෙනා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම ඉක්මනින් අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේක නිකම් හරියට සාංඝික දානයක් වාගෙයි. දානය සාංඝික වෙන්න නම්, හැමෝම අත ගහන්න ඕනෑ, හැමෝම සම්මාදම් වෙන්න ඕනෑ, හැමෝම කොටස්කාරයෝ වෙන්න ඕනෑ. තනියම දෙන දානයට සාංඝික දානය කියන්නේ නැහැ. මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සාර්ථක කර ගන්න, සාංඝික දානයකදී වාගේ හැම කෙනෙකුම අත ගැහුවා. හැම කෙනෙකුම එහි කොටස්කාරයෙකු වුණා. හැම කෙනෙකුම තමන්ට කරන්න පුළුවන් උදවු උපකාර සහ මැදිහත්වීම කළා. විශේෂයෙන්ම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය මණ්ඩලය රෑ දවල් නොබලා වැඩ කළා. මම හිතන විධියට, ඒ නිලධාරින් අවස්ථා ගණනාවකදීම අන්තිමටම පාර්ලිමේන්තුවෙන් එළියට ගිය සේවකයා බවටත් පත් වුණා. රාත්‍රී 8.30යි, 9.00යි වැඩකටයුතු ඉවර වෙනකොට. එහෙම තමයි අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ තිබිච්ච අර මහජන පෙත්සම්වල විශාල backlog එක නිම කරන්න කටයුතු කළේ, මැදිහත් වුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ඒ වාගේම කාරක සභාව නියෝජනය කරන පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරු මේ කටයුත්තට මැදිහත් වුණා; දායකත්වය ලබා දුන්නා. ඒ සියලු දෙනාට වාගේම නමක් නොකියැවුණු මේ කාරක

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

සභාවේ කටයුතු වෙනුවෙන් පිටස්තරව ඉඳගෙන විවිධාකාරයෙන් උදවු උපකාර කරන හැම කෙනෙකුටමත් අප ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යන්න උදවු උපකාර කරපු සියලු දෙනාට මේ විවාදය තුළ නැවත වරක් ස්තුතිවන්ත වෙමින්, අද මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, යෝජනාව ස්ථිර කිරීම, ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව ස්ථිර කරමින් මම කැමැතියි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව දස වන පාර්ලිමේන්තු සැසි වාරය ආරම්භ වුණාට පසුව ක්‍රියා කරන ආකාරය, එහි ඇති ඓතිහාසික වටිනාකම, මේ මොහොතේ අපේ මහජන ආණ්ඩුව කටයුතු කරන ආකාරයත් එක්ක මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කවර නම් වටිනාකම් සහිත ක්‍රියාවක් ඉෂ්ට කරනවාද කියන කාරණා පිළිබඳව සියලු දෙනාගේ අවධානය යොමු කරවන්න.

විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගත්තොත්, එය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය මත පදනම් වෙච්ච, ක්‍රියාකාරිත්වයක් ඇති ආයතන ව්‍යුහයක් බව අපට දක්නට ලැබෙනවා. ඒ වාගේම 1948 නිදහසින් පසුව මේ පාර්ලිමේන්තු ක්‍රියාවලිය බොහෝ වේලාවට ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයෙන් ක්‍රියාත්මක වුණත්, හැම විටම වාගේ පාලකයන්ගේ සහ ඔවුන්ගේ වටේ හිටපු අයගේ අයිතිවාසිකම්, ඒගොල්ලන්ගේ ශුභසිද්ධිය වෙනුවෙන් මේ ආයතන පාවිච්චි වුණු යුග තමයි අපි දැක්කේ. විශේෂයෙන්ම දේශපාලන ප්‍රභූ පවුල්වල අවශ්‍යතා සඳහා මේ ආයතන පාවිච්චි කරන ස්වභාවයක් අපි දැක්කා. ප්‍රජාතන්ත්‍රවාදයේ දේවාලය හැටියට සැලකෙන මේ පාර්ලිමේන්තුව දියවන්නාව මැද විරාජමාන වෙමින් මේ රටේ ජනතාව වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරනවාට වැඩිය කළේ, ඒ පාලකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීමයි. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගණනාවක් අපි පරීක්ෂා කර බැලුවොත්, ඒ හැම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකම වාගේ දකින්න ලැබෙන්නේ ඒවා පාලකයන්ගේ අවශ්‍යතා සඳහා කරන ලද සංශෝධන කියන කාරණයයි. ඒ වාගේම පනවන ලද අණ පනත් ගත්තොත්, ඒ බොහෝ අණ පනත්වල ස්වභාවයත් එහෙම තමයි.

හැබැයි, අප බලයට පත් වුණාට පසුව මේ රටේ ඊට වෙනස් තත්ත්වයක් තිබෙන බව අපට පෙනෙනවා. අද දිනයේදීත් අපි මහජනයාගේ හිත සුව පිණිස වන කටයුත්තක් කළා, COPE එකේ විමර්ශන කටයුතු සම්බන්ධයෙන්. ඒ, අප අද දිනයේදී විවාදයට ගෙන මේ වන කොට සම්මත කරපු තීරණය මඟිනුයි. විවිධ ආයතනවලින් කෙරුණු වැරැදිවලට අදාළව, අපරාධවලට අදාළව කෝප් කමිටුවේදී විමර්ශන කටයුතු කරන ලද කාරණා සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, නීතිපතිවරයාට කෙළින්ම පැමිණිලි කිරීමට ඇති බලය අපි අද ක්‍රියාත්මක කරනු ලැබුවා. ඒ ආකාරයට, මහජනයා වෙනුවෙන් කටයුතු කරන පාර්ලිමේන්තුවක් අපි අද නිර්මාණය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවත් අතිශය තීරණාත්මක කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ඒ කියන්නේ, සාමාන්‍ය නීතිය මඟින් සහ ආයතනික නීති රෙගුලාසි මඟින්, පරිපාලනමය තීරණ මඟින් අසාධාරණයට ලක් වන කෙනෙකුට ඒ වෙනුවෙන් විකල්ප සහනයක් ලබා ගැනීම සඳහා තම මහජන නියෝජිතයන් මාර්ගයෙන් සහනයක් සලසා ගැනීම සඳහා ඇති අවසාන ස්ථානය හැටියට පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සලකන්න පුළුවන්. බොහෝ වෙලාවට විශේෂයෙන්ම තාක්ෂණික කාරණා මත, කාලාවරෝධී නීතිය මත, එහෙම නැත්නම් වෙනත් කාරණා මත, පවතින නීතිමය තත්ත්වයන් යටතේ බොහෝ පිරිසකට සහන සැලසීමට නොහැකි වෙනවා. ආයතනික චක්‍රලේඛ සහ විවිධ නීති රීති හේතුවෙන් ද, අවශ්‍ය කරන යුක්ති සහගත සහනය බොහෝ පිරිසකට අහිමි වෙනවා. ඒ වාගේ අවස්ථාවල රටේ මහජනතාවට තමන්ගේ පීඩාවන් සම්බන්ධයෙන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හරහා විශාල සහනයක් ලබා ගත හැකි බව අපට නිරීක්ෂණය වෙනවා.

විශේෂයෙන්ම 17වන ශතවර්ෂයේ සිට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් හැටියට මහජන පෙත්සම්කරණය ආරම්භ වුණා. අපේ රටේ මහජන පෙත්සම් විභාග වීමේ ක්‍රියාවලිය ඒ තරම් කාර්යක්ෂමව සහ පිළිගත හැකි ආකාරයකින් සිද්ධ වූ බවක් අපට පෙනෙන්නට නැහැ. එහෙම නම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කෙරෙහි අවශ්‍ය කරන විශ්වාසය ගොඩනඟන්න, අවශ්‍ය කරන ශක්තිය ගොඩනඟන්න මීට පෙර කටයුතු කළාද කියා කල්පනා කරන්න වෙනවා. ඒ නිසා තමයි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා අද මේ යෝජනාව ඉතිහාසයේ පළමු වතාවට පාර්ලිමේන්තුවේ කල් තැබීමේ විවාදයක් ලෙස ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව, ශක්තිමත්ව කරගෙන යෑම සඳහා අවශ්‍ය කරන අවධානය, සහයෝගය ලබා ගැනීම සඳහායි මේ කටයුත්ත කරන්නේ.

විශේෂයෙන්ම මෙහිදී අපට නිරීක්ෂණය වෙච්ච කාරණාවක් තිබෙනවා. රටේ විවිධ පළාත් නියෝජනය කරන පක්ෂ, විපක්ෂ හැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම අයිතිය ලැබෙනවා, තමන්ගේ ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුවට පෙත්සම් ඉදිරිපත් කරන්න. කථානායකවරයාට ඒ පෙත්සම පිළිගැන්වූවාට පසුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මඟින් ඒ පෙත්සමෙහි තිබෙන කරුණු විමර්ශනය කරලා, නිරීක්ෂණය කරලා, අදාළ බලධාරින් කැඳවලා ඒ පෙත්සම්කරුට සාධාරණය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය කරන සියලු ආකාරයේ උත්සාහයන් දරනවා. එහිදී ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී සමහර වෙලාවට ඒ අදාළ ආයතන, ආයතන ප්‍රධානීන් අවශ්‍ය කරන සහයෝගය ලබා නොදීමේ තත්ත්වයක් අපි දකිනවා.

පාර්ලිමේන්තුවට මේ රටේ ජනතාව සම්බන්ධයෙන් තිබෙන වගකීම බැහැර කළ නොහැකි වගකීමක් බව මේ හැම කෙනෙක්ම පිළිගත යුතුයි. ඒ නිසා යම් ආකාරයකින් තාක්ෂණික කාරණාවක් හේතුවෙන්, එහෙම නැත්නම් යම්කිසි නීති රීති, චක්‍රලේඛ, රෙගුලාසි හේතුවෙන් අසාධාරණයට ලක් වෙච්ච කෙනෙකුට සාධාරණත්වයේ පදනම මත, යුක්ති සහගත හේතූන් මත යම්කිසි සහනයක් සලසන්න හැකි දැයි සොයා බැලීම පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මඟින් කරනවා. එහිදී ඒ සාකච්ඡාවට සම්බන්ධ වන සියලු පාර්ශ්වයන්ගේ අදහස් විමසා එකඟතාවලට එළැඹීමෙන් පසුව තමයි මහජන පෙත්සම් පිළිබඳ

කාරක සභාව බොහෝ වෙලාවට නිර්දේශ ලබා දෙන්නේ. එසේ ලබා දෙන නිර්දේශ අවශ්‍ය කරන බරෙන් යුක්තව ක්‍රියාත්මක කිරීම සඳහා ඒ සියලු ආයතන සහයෝගය ලබා දෙනු ඇතැයි මම කල්පනා කරනවා.

විශේෂයෙන්ම අපේ ආණ්ඩුව, අපේ රජය මහජනතාව වෙනුවෙන් මේ සියලු ආයතන යොදා ගැනීම, මේ සියලු ආයතනවල ශක්තීන් මෙහෙයවීම සඳහා කටයුතු කරන තත්ත්වයක් තුළ හැම කෙනෙකුම ඒ කෙරෙහි තමන්ගේ අවධානය යොමු කිරීම වැදගත් කියා අපි කල්පනා කරනවා. ඒ වාගේම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට වාර්ෂිකව, එහෙම නැත්නම් දිනපතා ලැබෙන පෙත්සම් ප්‍රමාණය සලකා බලන කොට අපට පෙනෙනවා, මේ රටේ ජනතාව තමන්ට යුක්තිය ඉටු කරවා ගැනීම පිළිබඳ විශාල පීඩනයකින්, පීඩාවකින් පසු වන බව. ඒ කාරණාවත් සැලකිල්ලට ගත්තාම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ඇති වටිනාකම හැම කෙනෙකුටම අවබෝධ වෙනවා.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට කටයුතු කරන මා නිරීක්ෂණය කරපු තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි, මන්ත්‍රීවරුන් බොහෝ වෙලාවට ජනතාවගෙන් තමන් වෙත ලැබෙන පෙත්සම් ඉදිරිපත් කිරීමේදී, අධිකරණමය ක්‍රියාමාර්ග පවතින, එහෙම නැත්නම් දැනටමත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවලට සම්බන්ධ පෙත්සම් පවා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීමේ ස්වභාවයක් දකින්නට ලැබීම. කෙසේ වෙතත්, හැම මන්ත්‍රීවරයෙකුම තමන්ට ලැබෙන පෙත්සම් පාර්ලිමේන්තුවේදී ගරු කථානායකතුමාට ඉදිරිපත් කිරීමේදීත් කල්පනාවෙන් කටයුතු කිරීම වැදගත් කියා අපි කල්පනා කරනවා. විශේෂයෙන්ම මේ සඳහා නිලධාරීන් විශාල ප්‍රමාණයක්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක්, විශාල කාලයක් වැය කරන නිසා මම මේ අවස්ථාවේ ඒ කෙරෙහිත් මහජන නියෝජිතයන්ගේ අවධානය යොමු කරවීමට කැමැතියි. ඒ වාගේම, මෙහිදී ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයන් සිදු වීම වළක්වා ගැනීම සඳහා අපි පාර්ලිමේන්තුව හැටියට තීන්දු තීරණ ගැනීමත් අවශ්‍ය බව අවධාරණය කරන්න කැමැතියි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සාමාජිකයන් මේ සම්බන්ධයෙන් දක්වන උද්‍යෝගය, මේ සම්බන්ධයෙන් දක්වන මැදිහත්වීම අගය කරමින්, මෙම කාරක සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කර ගැනීම සඳහා අප සැම කෙනෙකුම සිය සහයෝගය ලබා දිය යුතු බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON.UPUL KITHSIRI left the Chair and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 3.05]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට ස්තුතියි.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ගාමිණී රත්නායක මැතිතුමා කියන්නේ අවුරුදු ගණනක් දේශපාලනයේ යෙදුණු, අපත් එක්ක මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙකු බව. එතුමා ඇත්තටම ජ්‍යෙෂ්ඨයෙක්. මා හිතන විදියට, අද එතුමා අමාත්‍ය ධුරයක හෝ නියෝජ්‍ය අමාත්‍ය ධුරයක හෝ වැඩ කළා නම් තමයි ගොඩක් වටින්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමන්ලා කලබල වෙන්න එපා. මම මේක අවංකවමයි කියන්නේ. නමුත්, එවැනි ධුරයක් එතුමාට දුන්නේ නැහැ. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. මම හිතුවා ගරු බිමල් රත්නායක ඇමතිතුමා ඒ ගැන බලයි කියලා. මොකද, ඒ මන්ත්‍රීතුමා අපේ මිත්‍රයෙක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයකට යන්න එපා, ගරු ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කලාකරුවෙක් නේ. එතුමා දන්නවා, තමන්ගේ වුවමනාව වෙන කෙනෙකු පිට දාලා කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට එහෙම වුවමනාවක් නැහැ. ඔබතුමා දන්නවා නේ, මට එහෙම වුවමනාවක් නැහැ කියලා. මා කැබිනට් මණ්ඩලයේත් හිටපු නිසා මට එහෙම වුවමනාවක් නැහැ. ඔබතුමා ඒ ගැන දන්නවා නේ. විශේෂයෙන් අපේ ගරු ගාමිණී රත්නායක මැතිතුමා ගැන මට කනගාටුවක් දැනෙන්නේ අන්න ඒකයි. මොකද, එතුමා අද ඔය පැත්තේ ඉදිරි පෙළේ ඉන්න ඕනෑ කෙනෙක්; ගරු බිමල් රත්නායක මැතිතුමාට වම් පැත්තෙන් හෝ දකුණු පැත්තෙන් ඉන්න ඕනෑ කෙනෙක්. නමුත්, අවාසනාවකට එතුමාට ඒ අවස්ථාව දුන්නේ නැහැ. කෙසේ වෙතත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය දරමින් ඉතාම මහන්සියෙන් වැඩ කිරීම සම්බන්ධව මම මගේ ගෞරවය සහ ස්තුතිය ගරු ගාමිණී රත්නායක මැතිතුමාට පුද කරනවා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් සෑහෙන කාලයක් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වැඩ කරලා තිබෙනවා. අපේ ගාමිණී ලොකුගේ මැතිතුමා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන කොට, තමන්ට තවත් වැඩ බොහොමයක් තිබෙන නිසා එතුමා මට ඒ කාරක සභාවේ කටයුතු භාර දීලා යනවා. විශාල වැඩ කොටසක් කරපු කෙනෙකු වාගේම ඇත්තටම මේ කාරක සභාවේ කටයුතු ගැන විශාල අවබෝධයක් තිබුණු කෙනෙක් තමයි, ගාමිණී ලොකුගේ මැතිතුමා. එතුමාත් මා ගොඩක් ගරු කරන කෙනෙක්.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ AR/FR ගැන, කම්කරු නීතිය ගැන විශාල අවබෝධයකින් වැඩ කරන්න ඕනෑ තැනක්. ඒ නිසාම තමයි ගාමිණී රත්නායක මැතිතුමා වාගේ කෙනෙකු එම කාරක සභාවේ සභාපතිවරයා වීම ගොඩක් වටින්නේ. එතුමා බොහොම ඉවසිලිවන්තව, ඒ ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්න ඔක්කෝම අරගෙන කටයුතු කරනවා.

මොකද, ජනතාවට යන්න තැනක් නැති වුණාම තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පෙත්සම් ගෙනැල්ලා දෙන්නේ. කොහේ හෝ ගිහිල්ලා ඇනගෙන ඉවර වෙලා, වැඩේ කෙරුණේ නැති වුණාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සොයා ගෙන එනවා, "අනේ! මට මේකට මොකක් හෝ කරලා දෙන්න" කියලා. ඉතින් ඊට පසුව, අපි මොනවා හෝ දන්නා සෙල්ලමක් දමලා, පුළුවන් තරම් නිලධාරින් ගෙන්වා, කරන්න බැරි ඒවාත් සමහර වෙලාවට ඔහුට පමණක් බලපාන සේ හරි කමක් නැහැ ඉෂ්ට කරන්න කියලා ඉටු කර දෙනවා. මොකද, මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට කෙනෙකු එන්නේ වුවමනාවක් ඇති නිසායි. ඉතින් එහෙම තීන්දු ගත්ත අවස්ථා තිබෙනවා. ඒ ගැන අපි ගොඩක් සතුටු වෙනවා. මෙතැන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා, ගාමිණී රත්නායක මැතිතුමනි. පළමු කාරණය තමයි මේ පෙත්සම්වලට ලැබෙන response එක. විශේෂයෙන්ම අමාත්‍යාංශ ගණනාවකින් ලිපි එවලා ඒවා හරි ගියාට පස්සේ තමයි සාමාන්‍යයෙන් අපි මේ පෙත්සම් discuss කරන්න ගන්නේ. හැබැයි, සමහර අමාත්‍යාංශ මේවාට උත්තර එවන්න මාස ගණන් පරක්කු කරනවා. ඒ නිසා විශාල ප්‍රමාදයක් තිබෙනවා. නමුත්, මේ ක්‍රියාවලිය තුළ ශක්තිමත්ව ඒ කටයුතු කරලා තිබෙනවා.

අනෙක් කාරණාව මේකයි. අපි ගත්ත තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ පරක්කුවීමක් තිබෙනවා. ඒ තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්නේම නැති තැනකට තල්ලු වෙලාත් තිබෙනවා. මේ වෙලාවේ සභාවේ ගරු සභානායකතුමා ඉන්න නිසා මම විශේෂයෙන්ම ඉල්ලන්න කැමතියි, අපි Standing Orders වෙනස් කරලා හෝ මේ කටයුතු මීට වඩා ටිකක් හෝ ශක්තිමත් කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් කරනවා නම් හොඳයි කියලා. මේ කාල වකවානු ඇතුළත මේකට පිළිතුරු ලිපියක් එවන්න ඕනෑ කියන එකත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් ගත්ත තීන්දුව මෙන්න මේ කාල වකවානුව ඇතුළත - අඩුම තරමින් මාසයක් ඇතුළත හෝ - ක්‍රියාත්මක කළ යුතුයි කියන තැනකට මේක ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා Standing Orders ශක්තිමත් කළ යුතුයි කියලා මම හිතනවා. මොකද, අපි සියලුදෙනා මේ කටයුත්තට කැමැත්තෙන් සම්බන්ධ වෙන නිසා. මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා ඒ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන්ටත්.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගැන කථා කරන්න debate එකක් ගත්ත පළමු අවස්ථාව මෙයයි. මම ඒ ගැන ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. ඔන්න මම මම ආණ්ඩුව ගැන හොඳ දෙයක් කිව්වා. හැම දාම කියන්නේ එහෙම කරලාම නැහැ කියලා නේ. දැන් ඔන්න,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් වාඩි වෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔන්න, මම හොඳ එකක් කිව්වා. දැන් ඊළඟට තමයි පටන් ගන්න හදන්නේ. අපි අනෙක් ඒවාත් කියන්න එපායැ.

දැන් බලන්න, අපි COPE එකට සම්බන්ධ ස්ථාවර නියෝග 120 සහ 120(4) වැනි ඒවාට සංශෝධන ගෙනාවා, නෛතිකව දඬුවම් කරන්න පුළුවන් බලය දෙන්න. සාමාන්‍යයෙන් ඉස්සර තිබුණේ මේ වාර්තා නීතිපතිතුමා ළඟට යවන්න, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවට යවන්න, අනෙක් පැත්තෙන් පොලිස්පතිතුමා ළඟට යවන්න. මීට කලින් සිදු වූ දේ ගරු බිමල් රත්නායක මැතිතුමාටත් මතක ඇති. වි.ජ.මු ලොකු බණ්ඩාර මැතිතුමා කථානායක පුටුවේ ඉන්නකොට අපි ඒ වාගේ වාර්තා එතුමාට යවලා හැම මාසයකටම සැරයක් එතුමාගෙන් අහනවා, "අරකට මොකද වුණේ, මේකට මොකද වුණේ?" කියලා. අපි යම් කිසි විධියකට ක්‍රමානුකූලව ඒවා බැලුවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ කෙසේ නමුත්, දැන් මෙවැනි දෙයක් ඇතුළත් කරනකොටම අපි විරුද්ධ වුණා. මමත් අජිත් පී. පෙරේරා මැතිතුමාත් ඒ ගැන කරුණු ගණනාවක් කිව්වා. මොකද සමහර වෙලාවට විශාල අර්බුදයක් එන්න පුළුවන්, මේ තීන්දු ගත්ත අය නියමිත වෙලාවට ඒක නොකිරීම නිසා.

මම එක උදාහරණයක් ඔබතුමන්ලාට කියන්නම්. National Savings Bank එකේ බිම්පුත් ෆිනෑන්ස් සමාගම ගත්තොත්, ඒක කරන්නේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් බව අපි දන්නවා. නමුත්, මෙතැන වැරැද්ද කරන්නේ Bank එක. ඒ සමාගම ඇවර කරනතුරු Bank එක මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ නැහැ. ඊට පස්සේ මොකද වෙන්නේ? ඇවර කරන එක තනියම අරයා කරගෙන යනවා. හැබැයි, මේ කමිටුවේදී දේශපාලනඥයා කරපු වැරැද්ද ගැන තමයි කථා වෙන්නේ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ අදාළ බැංකුව ඒ නියමිත වෙලාවට අවශ්‍ය පියවර ගත්තේ නැති එක. සාමාන්‍යයෙන් සමාගමක් ඇවර කරනකොට Bank එකෙන් ගිහිල්ලා තමන්ගේ අයිතිවාසිකම් උසාවියට කියන්න ඕනෑ. එහෙම කිව්වාම තමයි උසාවියෙන් ඒගොල්ලන් party එකක් විධියට ඇතුළත් කර ගන්නේ. හැබැයි, මේකට ඒගොල්ලන් මැදිහත් වෙන්නේ නැහැ. ඒ නිසා දැන් මොනවා කළත් මේ මුදල් ආපහු අය කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මොකද, ඒක දුර දිග ගිහිල්ලා ඉවරයි. මෙතැනදී ඒ වාගේ කාරණා පිළිබඳවත් අපි විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ.

උදාහරණයක් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර රෝහල ගත්තොත්, අද ශ්‍රී ජයවර්ධනපුර රෝහලට අත් වෙලා තිබෙන ඉරණමට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ. මොකද හේතුව? ශ්‍රී ජයවර්ධනපුර රෝහල කියන්නේ ඉතාම වැදගත් රෝහලක්. හිටපු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා කරපු කාර්යභාරය වෙනුවෙන් ත්‍යාගයක් විධියට ජපානය විසින් තමයි මේ රෝහල ලබා දුන්නේ. නමුත් අද වෙනකොට මොකද වෙලා තිබෙන්නේ? ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ වත්මන් වැඩ බලන අධ්‍යක්ෂ වෛද්‍ය ධම්මික අලහප්පෙරුම මැතිතුමා එතුමාගේ හෘද සැත්කම කර ගන්නේ නැහැ, Sri Jayewardenepura Hospital එකෙන්. එතුමා යනවා වෙනත් hospital එකකට. හෘද සැත්කම් පිළිබඳ හොඳම ස්ථානය බවට පත් වෙලා තිබුණු මෙම රෝහලේ වැඩ බලන අධ්‍යක්ෂවරයා කල්පනා කරනවා නම් "මට මේ රෝහල හරියන්නේ නැහැ" කියලා, ඉතින් තවත් මොනවාද කථා කරන්න තිබෙන්නේ?

එතැන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස ඉන්නේ වෛද්‍ය ෆර්මිලා පීරිස් කියලා කෙනෙක්. එතුමියට මෙම තනතුරට යන්න සුදුසුකම් නැහැ. Senior අයගෙන් තමයි පත් කර ගන්න තිබුණේ, නමුත් ඒක කළේ නැහැ. එතුමිය කැනඩාවේ කාලයක් ඉඳලා තමයි මෙහාට එන්නේ. ඒකත් එක්ක තමයි ඒ ක්‍රියාදාමය යන්නේ. GMOA එක ඒ පත්වීමට විශාල විරෝධයක් දැක්වූවා, නිවැරදි අයෙක් ඒකට පත් කරන්න කියලා. අද ඒක කඩාගෙන වැටිලා. ජ'පුර ස්නායු වෛද්‍ය ඒකකය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ඉවරයි. ඔබතුමන්ලා දන්නවා මේ ආණ්ඩුව ආව ගමන් මහේෂි විජේරත්න මැතිනිය හිරභාරයට ගත් බව. ඇය ලංකාවේ හිටපු දක්ෂම වෛද්‍යවරියක්. නමුත් ඇය අතින් වුණාය කියන යම්කිසි කුඩා වරදකට හිරභාරයට ගත්තා. අද ඒ ස්නායු වෛද්‍ය ඒකකයම වහලා දාලා තිබෙන්නේ. ජයවර්ධනපුර රෝහල අද විනාශ වෙලා තිබෙනවා ඒ පැත්තෙන් ගත්තාම.

ඊළඟ එක තමයි, 18 වාට්ටුව. මොළයේ ලේ ගැලීම් සිදු වන රෝගීන් ආවොත් අද ඒ සියලුදෙනාම ජාතික රෝහලට යවනවා. අද ජයවර්ධනපුර රෝහලේ ඒ අංශය සම්පූර්ණයෙන්ම වහලා තිබෙන්නේ. ඊළඟට විකලාංග වෛද්‍ය ඒකකයේ - Orthopaedic Unit එකේ - හිටපු වෛද්‍ය කෞෂල් කරුණාරත්න තමයි මේ රෝහලට වැඩිම ආදායමක් ගෙනාවේ. අද ඒක වහලා තිබෙන්නේ, වැඩ කරන්නේ නැහැ.

අද මේ රෝහල පාලනය කරන්නේ පැලවත්තෙන් සහ වෘත්තිය සමිතිවලින්. මම කියන්නේ ඔබතුමන්ලා ඒකට වෙන වැඩක් කරන්න. නමුත් මේ ආයතන මෙහෙම විනාශ වෙන්න දෙන්න එපා. බිමල් රත්නායක මැතිතුමා සභාවේ ඉන්නවා, පැලවත්තේ අයිතිකාරයා, නායකයා. එතුමාගෙනුත් ජනාධිපතිතුමාගෙනුත් අපි ඉල්ලන්නේ කරුණාකරලා මේ රෝහලට අත ගහන්න එපා කියලායි. බිමල් රත්නායක මැතිතුමා මේ රට හොඳට හැදෙනවාට කැමැති කෙනෙක් නේ. ඉතින් ජයවර්ධනපුර රෝහල ගැන විශේෂයෙන් හිතන්න. අපි නලින්ද ජයතිස්ස මැතිතුමා එක්කත් මේ ගැන කථා කළා. එතුමාත් පිළිගන්නවා. හැබැයි මොකුත් වෙන්නේ නැහැ, කිසිම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. නමුත් මේ රෝහල විනාශ වෙන්න ඉඩ තියන්න එපා කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, අපොස උසස් පෙළ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නය ගැන තමුන්නාන්සේලා ඒ කාලයේ කාරණා ගණනාවක් මතු කළා. අද අපොස උසස් පෙළ ශිෂ්‍යයන්ට කාල සටහන ලැබිලා තිබෙනවා. ඔවුන් ඉල්ලන්නේ විභාගය සඳහා තව දින 45ක්, 50ක් ලබා දෙන්න කියලා; විභාගය අගෝස්තු තියන්නේ නැතිව නොවැම්බර් තියන්න කියලා ඉල්ලන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 ඉඳලා ඉතිහාසය ගත්තොත්, උසස් පෙළ ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු සඳහා 2022දී දින 905ක් තිබිලා තියෙනවා; 2023දී දින 855ක් තිබිලා තියෙනවා; 2024දී දින 908ක් තිබිලා තියෙනවා; 2025දී දින 816ක් තිබිලා තියෙනවා. හැබැයි 2026දී දින 709යි තියෙන්නේ. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට උසස් පෙළ ශිෂ්‍යයෝ ගැන විශාල වශයෙක් කථා කළා. මම අගමැතිතුමියට සහ ආණ්ඩුවට කියනවා මේ මාස දෙක පරක්කු වුණා කියලා කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. උසාවිවලට ගිහින් මේක විසඳා ගන්න බැහැ. නමුත් සාකච්ඡා මාර්ගයෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. ඒ නිසා කරුණාකරලා යම් පියවර ගන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.15]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම සතුටු වෙනවා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳ විවාදයට එකතුවීමට ලැබීම ගැන. අපි දේශපාලන වශයෙන් බෙදිලා මේ සභාවේ වාද විවාද කළත්, පෙත්සම් කාරක සභාවේදී අපි කවුරුත් කටයුතු කරන්නේ ඒක ඉස්සරහට එන කෙනාට උපරිම සාධාරණය ඉෂ්ට කරන්න. ඒ පිළිබඳ සාකච්ඡාවක් මේ සභාවේ කරන්න ලැබීම ගැනත් අපි සතුටු වෙනවා. පොදුවේ ගත්තාම අවුරුදු ගාණක් දිගටම තිබුණු පාර්ලිමේන්තුවල හැම පෙත්සම් කාරක සභාවම හොඳට වැඩ කරලා තිබෙනවා. ඒවා අගය කරන ගමන් වත්මන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනා එකතු වෙලා කරන විශේෂ කාර්යභාරය අගය කරන්නත් කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ උප කමිටු තුනක් එතුමන්ලා පවත්වාගෙන යනවා. එතැන දිගු කාලීනව එකතු වෙච්ච විශාල ප්‍රශ්න තොගයක් තිබෙනවා. ඒවා විසඳන්න කල් යන නිසා ඒ backlog එක clear කරන්න මන්ත්‍රීතුමන්ලා තුන්දෙනෙකුගේ උප සභාපතිත්වයෙන් කමිටු තුනක් පත් කරලා ඒ කටයුතු කරගෙන යනවා. ඇතත්තම අපි ඒක අගය කරන්නට ඕනෑ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට තිබෙන විශේෂත්වය නැති කර ගන්න ඕනෑ නැහැ කියලාත් මම හිතනවා. අපි tailor-made solutions, ඒ කියන්නේ පොදු ප්‍රතිපත්ති රාමුව ඇතුළේ පුද්ගලයා ගැන ටිකක් වැඩියෙන් කල්පනා කරලා තීන්දු තීරණ ගන්නා තැනක් විධියට තමයි පෙත්සම් කාරක සභාව හඳුනාගෙන තිබෙන්නේ. කොහොමත් රටේ උසාවි තිබෙනවා, විනය මණ්ඩල තිබෙනවා. එවැනි විවිධාකාර ආයතන තිබෙනවා. ඒ හැම ආයතනයක්ම ගලේ කෙටුවා වාගේ තිබෙන නිශ්චිත නීති ඇතුළේ තමයි හැම වෙලාවේම උත්තර සොයන්නේ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවත් නීති රාමුවක් ඇතුළේ තමයි කටයුතු කරන්නේ. නමුත්, අපි හැම කෙනෙක්ම වෙනස් නේ. අපි හැම කෙනාගේම ප්‍රශ්න ගත්තාම වෙනස්. ඒ නිසා එන පුද්ගලයාගේ පැත්තත් තරමක් බලලා, ඒ ප්‍රශ්නවලටත් සියයට දෙක, තුනක් කරුණු එකතු කරලා උත්තර දීමේ හැකියාව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට තිබෙනවා. මොකද, මහජන නියෝජිතයෝ කියන කට්ටිය කවදාවත් නිලධාරීන් විය යුතු නැහැ. අපි කවදාවත් චක්‍රලේඛවලට,- අපි චක්‍රලේඛවලට ගරු නොකරන බව, නීති රීති පිළිනොපදින බව නොවෙයි, මම කියන්නේ. ඒවා පිළිගන්න ඕනෑ. නමුත්, ඒ අතරේ අපි හැම වෙලාවේම මිනිස්සු ගැන පොදුවේ වාගේම වෙන වෙනමත් හිතන්න ඕනෑ. ඒ, පාක්ෂිකයාට සලකන්න, එයාට පන්දම් අල්ලන්න, එයාට රක්ෂා දෙන්න, පත්වීම් දෙන්න නොවෙයි. අපේ ආණ්ඩුව කිසිසේත්ම එහෙම කරන ආණ්ඩුවක් නොවෙයි. නමුත්, ඒ අතරේ මිනිසුන්ගේ ප්‍රශ්න දිහා ටිකක් වෙනස් විධියකට බලන්න මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ගියාම අවස්ථාව ලැබෙනවා කියලා අපට පෙනෙනවා. ගරු ගාමිණී රත්නායක මැතිතුමා ඇතුළු කණ්ඩායම ඒ කරගෙන යන වැඩකටයුත්ත ඉතා වටිනවා කියලා මම හිතනවා. මොකද, අර ඇමතිතුමා වෙන්න කැමැති අපේ මන්ත්‍රීතුමා කියපු විධියට ලංකාවේ මිනිස්සු යුඑන්පි,

[ගරු බිමල් රත්නායක මහතා]

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වාගේ ඔක්කෝම පක්ෂ පස්සේ ගිහිල්ලා, හත් පොළේ ගා ගත්තාට පස්සේ තේ අපට දුන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තමයි last resort එක. ඒ කියන්නේ, ඔක්කොම තැන්වලට ගිහිල්ලා තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. සමහර පෙත්සම්වල කොළත් පරණයි; සමහර ඒවා ඉස්සර කාලයේ පැපිරස් කොළවලින් හදපු ඒවා වාගේ කියලා හිතෙනවා, ගොඩක් පරණයි. ප්‍රශ්නය අහන්නත් බැහැ, නිලධාරිනුත් පෙන්ෂන් ගිහිල්ලා. එහෙම වෙලා තමයි මෙතැනට එන්නේ. එහෙම එනකොට ඒ කෙනා ගැන විශේෂ ගරුත්වයකින්, විශේෂ සැලකිල්ලකින් කටයුතු කරන්නට අවශ්‍යයි. මෙතැන සිටින සමහර මන්ත්‍රීතුමන්ලා විවාදවලදී රීති කඩමින්, කොයි තරම් රළු විධියට කටයුතු කළත්, කමිටුවල සභාපතිත්වය දරන වෙලාවේදී සහ සාමාජිකයන් විධියට කටයුතු කරන අවස්ථාවලදී බොහොම මෘදු විධියට, තනි තනිව මිනිසුන්ගේ ප්‍රශ්න ගැන අවධානය යොමු කරලා කටයුතු කරනවා මම දැකලා තිබෙනවා.

ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා සවස හය, හත වෙනකල් එම කාරක සභාවේ කටයුතු කරන බව මම දන්නවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිලධාරින් විසින් එතුමාට විරුද්ධව පෙත්සමක් ඉදිරිපත් කරයි ද කියලා මට භයක් තිබෙනවා. මොකද, නිලධාරින්ට හවස ගෙදර යන්න දෙන්නෙත් නැහැ; හැම දාම කාරක සභාවේ කටයුතු කරගෙන යනවා. එම නිසා ගරු කථානායකතුමාට නිලධාරින් විසින් පෙත්සමක් ඉදිරිපත් කරයි ද කියලාත් මට හිතෙනවා. එය ඉතාම මහන්සියෙන් වැඩ කරන කමිටුවක්, රූපවාහිනියේ, social mediaවල වැඩිය පෙන්වන කමිටුවක් නොවෙයි. නමුත්, එය අතිශය වැදගත් කමිටුවක්; මිනිසුන්ගේ දුක්, කඳුළු ගැන හිතලා වැඩ කරන කමිටුවක්. ඒ නිසා මම ජනතාවට කියා සිටිනවා, තමන්ට ඇතැම් ආයතනවලට ගිහිල්ලා කර ගන්න බැරි වුණු දේවල් සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න මෙතැනට එන එක හොඳයි කියලා. ඒ වාගේම කමිටුවෙන් ඉල්ලා සිටිනවා, tailor-made ගතිය තියා ගන්න කියලා; පොදු රාමුව ඇතුළේ වෙන වෙනම හිතන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, තීන්දු ක්‍රියාත්මක නොවීම පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඒ පිළිබඳව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන්ම යම්කිසි යෝජනාවලියක් සකස් කරලා, කාරක සභාවේ ප්‍රධානින්ට සහ නිලධාරින්ට අපේ Minister of Public Administration, Provincial Councils and Local Government සහ එතුමාගේ ලේකම්තුමා හා නියෝජ්‍ය ඇමතිතුමන්ලා සහ රාජ්‍ය සේවයේ කටයුතු කරන මැති ඇමතිවරුත් සම්බන්ධ කරගෙන ගරු කථානායකතුමා සමඟ සාකච්ඡාවක් කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා. එතකොට ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ජාතියේ සමහර අඩුපාඩුත් හදා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පැහැදිලිව අපේ රටේ රාජ්‍ය යන්ත්‍රණයේ තිබෙන විශාල බිඳ වැටීමක, අඩුපාඩුවක ප්‍රතිඵලයක්. මෙය කාලයක් තිස්සේ එන ප්‍රමාදයක්. ඒ කියන්නේ මිනිසුන්ට තමන්ගේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ කියන එක; 'තමන්ට මේ අයිතිවාසිකම නැහැ, මේ ඉල්ලීම කරන්න බැහැ' කියන එක හෝ අහ ගන්නත් අවුරුදු හතක්, අටක් ගත වෙනවා. අපට හම්බ වුණු සමහර අයගේ ආරම්භක පරීක්ෂණය කරන්න අවුරුදු හතරක්, පහක් ගත වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළින් පෙන්නුම් කරන්නේ අපේ රාජ්‍ය සේවයේ එක පැත්තක්. ඔක්කෝම නොවෙයි. මිනිසුන්ට - නිලධාරින්ට - සිදු වන කරදර, වැරදි සහ ඒගොල්ලන්ට ඇති වුණු ගැටලු විසඳා ගන්න කාර්යක්ෂම ක්‍රමයක් නැතිකම පිළිබඳ ප්‍රශ්න තමයි යම් ප්‍රමාණයකට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරලා තිබෙන්නේ.

මගේ යෝජනා දෙක තුනකුත් තිබෙනවා. වෙලාව ගත වන නිසා ඒවා කෙටියෙන් කියන්නම්. එකක් තමයි, Scottish Parliament එකේ වාගේ ආරම්භක සාක්ෂි online ක්‍රමයකට ගන්න අපට පුළුවන් ද කියන එක. මම හිතන විධියට South Africaවලත් එහෙම සාක්ෂි ගන්නවා. මොකද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අතිවිශාල පෙත්සම් ප්‍රමාණයක් එනවා. ඒ පෙත්සම්කරුවන් ඔක්කෝම ගෙන්වන්න වැඩි කාලයක් සහ මුදලකුත් වැය වෙනවා. ඒ නිසා මගේ යෝජනාව තමයි online සාක්ෂි ගන්න pilot project එකක් කරන්න කියන එක. අපි decision එක ගන්න දවසට in person ගෙන්වමු. මෙතැනට ගෙනැල්ලා තමයි තීන්දු ගන්නේ. නමුත්, ආරම්භක සාක්ෂි අපට online ක්‍රමයට ගන්න පුළුවන් ද? මොකද, ලෝකයේ ඕනෑ තරම් දැන් ඒක කරනවා. අපට එකපාරටම පටන් ගන්න බැහැ. ඒ නිසා මගේ යෝජනාව තමයි මේක කොහොමත් online සහ හයිබ්‍රිඩ් විධියටයි යන්න වෙන්නේ කියන එක. ආරම්භයේදී එක අවස්ථාවක් විධියට online විධියට කරන්න උත්සාහයක් ගන්න කියන යෝජනාව ඉදිරිපත් කරනවා.

දෙවැනි කාරණය තමයි, මේ ලේඛන. මම දන්නේ නැහැ, දැනුත් එහෙම කරනවාද කියලා. මේ නිලධාරින් අතිවිශාල තොරතුරු ප්‍රමාණයක් මේවාට ගෙනෙනවා. මේවා සම්පූර්ණ කොළ විධියට එන්නේ. මේක පාර්ලිමේන්තුවේ හරි, - මම දන්නවා, Cloudවල තියන්න ගියාම අතිවිශාල වියදමක් යන බව. නමුත්, යම් ප්‍රමාණයක් මේ ලේඛනවත් online විධියට තියාගන්න පුළුවන් නම් හොඳයි. මොකද, ඒවා ඒ පුද්ගලයන්ටම, සමහර විට අපිටම නැවත ඕනෑ වෙන නිසා. මගේ තිබෙන ප්‍රධානම යෝජනාව තමයි නියමු ව්‍යාපෘතියක් විධියට evidence ගන්න එක online කරන්න කියන එක. එතකොට යාපනයේ ඉන්න මනුස්සයෙකුට, මඩකලපුවේ ඉන්න මනුස්සයෙකුට මෙහෙටම එන්න ඕනෑ නැහැ. මොකද, එන්නෙත් වයසක අය. එන්නෙත් අමාරුවෙන්. එන්න, යන්නත් රුපියල් 15,000ක් 20,000ක් විතර වියදම් වනවා. රැකවල් නිලධාරියෙකු අරගෙන ආවොත් තව වියදමක් යනවා. ඒ නිසා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට මම යෝජනා කරනවා, එහෙම කරන්න කියලා.

ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු, - මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්න අරගෙන අපේ මහජන දිනවලටත් එනවා. පෙත්සම දීලා මිනිස්සු බලන්නේ කවදාද කැඳවන්නේ කියලා. පෙත්සම කැඳෙව්වාට පස්සේ උත්තරය එන්න තව කාලයක් යනවා. ඒ නිසා මිනිස්සුන්ට අවශ්‍යයි, පෙත්සම කොතැනද තිබෙන්නේ කියලා බලා ගන්න. අපි සරලව කිව්වොත්, track කරගන්න අවශ්‍යයි. ඒ නිසා, පෙත්සමක් කොතැනද තිබෙන්නේ කියන එක දැන ගන්න, - මෙහේ ඇවිල්ලා නොවෙයි, call කරලා නොවෙයි - online ක්‍රමයට හරි වෙනත් විධියකට හරි ක්‍රමයක් හදනවා නම් හොඳයි කියලා මම හිතනවා. අඩු ගණනේ ඔබතුමා traffic light system එකක් හදලා හරි කමක් නැහැ ඒක කරන්න. Red නම්, තවම දාලා නැහැ. මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙනවා, - *[බාධා කිරීමක්]* මොකක් හරි tracking system එකක් හදන්න, online කරන්න බැරි නම්. අඩු ගණනේ ආරම්භයේදී මිනිසුන්ට දැන ගන්න පුළුවන් විධියට, රතු පාට නම්, තවම proceed වෙලා නැහැ; කහ පාට නම්, ඊළඟ මාස තුන ඇතුළත කැඳවන්න නියමිතයි; කොළ පාට නම්, decision එක දීලා තිබෙනවා කියලා, ඒ වාගේ ක්‍රමයකට හදන්න. ඔය වාගේ ක්‍රමයක් හොඳයි, නැත්නම් ඊට වඩා හොඳයි ඩිජිටල්ම යන්න පුළුවන් නම්. ඒ නිසා ඒ කටයුත්තටත් සුබ පතන ගමන් අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ.

අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ශ්‍රී ජයවර්ධනපුර රෝහල පිළිබඳව. මෙහිදී පළමුවෙනි කාරණය විධියට මම කියන්න කැමැතියි, ලංකාවේ කිසිම ආයතනයක් බිඳ වට්ටන්න අපි කටයුතු කරන්නේ නැහැ කියන එක. ලංකාවේ හැම ආයතනයක්ම ගොඩ නඟන්න තමයි අපි කටයුතු කරන්නේ. ශ්‍රී ජයවර්ධනපුර රෝහලත් එහෙම එකක්. දේශපාලන වශයෙන් ඇඳා ගන්නේ නැතිව මේ වාගේ දේවල් කථා කරනවා නම් හොඳයි. නිශ්චිත අඩුපාඩුකම් තිබෙන ඒවා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. වෛද්‍යවරු වෙන්න පුළුවන්, නිලධාරි කවුරු හරි වෙන්න පුළුවන්, ඒගොල්ලන්ගෙන් වන වැරදිවලට විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුයි. එහෙම නැතිව ආයතනයක් පවත්වාගෙන යන්න බැහැ. අපි ඉතාම නිහතමානීව, ඉතාම සාධාරණව තමයි පාලනය කරන්නේ. ඒක ශ්‍රී ජයවර්ධනපුර රෝහල පමණක් නොවෙයි අනෙක් රෝහල්වලට අදාළවත් එහෙම තමයි. ඒ නිසා එතුමා කියපු එකේ සත්‍යතාවක් නැහැ.

මේ රට ඉස්සර පාලනය වුණේ කොහෙන්ද? සිරිකොතෙන්. එතකොට කාටවත් ප්‍රශ්නයක් තිබුණාද? මේ රට ඊට ඉස්සර පාලනය වුණේ කොහෙන්ද? ඩාර්ලි පාරෙන්. මෙතුමාට ඩාර්ලි පාරේ දැන් යන්න බැරිව නේ ඉන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට ඩාර්ලි පාරට යන්න බැරිව නේ ඉන්නේ? *[බාධා කිරීමක්]* ඩාර්ලි පාරට යන්න බැරුව නේ ඉන්නේ? මෙයාට යන්න දෙන්න. ඒවා පත්තරයේ යනකොට ප්‍රශ්නයක් නැහැ. සිරිකොතෙන් රට පාලනය වෙනකොට ප්‍රශ්නයක් නැහැ, ඩාර්ලි පාරෙන් රට පාලනය වනකොට ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පක්ෂයකටයි බලය හම්බ වෙන්නේ. මිනිස්සු ඡන්දය දෙන්නේ පක්ෂයකට. ඔබතුමා පොහොට්ටුවේ නායකයෙක්. ඔබතුමන්ලා 2019, 2020 කාලයේ දිනනකොට ඒකේ බලය දුන්නේ කාටද? බලය දුන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට. ඒක දේශපාලන පක්ෂයක්. ඊට පස්සේ තමයි ඒක ආණ්ඩුව වෙන්නේ. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ රට කලින් සිරිකොතෙන් පාලනය වුණා, ඩාර්ලි පාරෙන් පාලනය වුණා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. දැන් පැලවත්තට තමයි ඒ බලය ලැබිලා තිබෙන්නේ. JVP එකයි, NPP එකයි දෙකම තිබෙන්නේ පැලවත්තේ. අපි එතැන තමයි සියලු සැලසුම් සකස් කළේ; එතැන තමයි මේ පක්ෂය ගොඩ නැඟුවේ; එතැන තමයි මේ මහජන ව්‍යාපාරය ගොඩ නැඟුවේ. එතැන තමයි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කොණ්ඩය තවත් යන මට්ටමට දේශපාලන තත්ත්වයක් ඇති කළේ. *[බාධා කිරීමක්]* ඔයාලාට මේ විපත, ඔයාලාට මේ උහුලා ගන්න බැරි අමාරුව ඇති කළේ පැලවත්තෙන් තමයි. ඒක අමුතු දෙයක් නොවෙයි නේ. මොකද, දේශපාලන පක්ෂ කියන්නේ, රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතා වැදගත් දෙයක්. ඥාතිකමින් නොවෙයි, දේශපාලනමය වශයෙන් මිනිස්සු ලක්ෂ ගණනින් සාමූහිකව එකතුවෙලා, අදහස්වලින් එකතුවෙලා අපේ රටේ පක්ෂ පවත්වාගෙන යනවා. ඒක ඉතාම හොඳ, ප්‍රජාතන්ත්‍රවාදී දෙයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එම නිසා, පැලවත්තෙන් තමයි මේ පක්ෂය පාලනය වෙන්නේ. මේ ආණ්ඩුව පාලනය වෙන්නේ රටේ නීතිය අනුව, ආණ්ඩුවට නායකත්වය දෙන්නේ දේශපාලන පක්ෂයේ නායකයෝ තමයි. ඒක අමුතු දෙයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් මට තව කාලය ගන්න බැරි නිසා මම තවදුරටත් කථා කරන්නේ නැහැ. එම නිසා, අර කාරණයත් එක්ක කවුරුවත් ප්‍රශ්න ඇති කර ගන්න එපා. අපි ඉතාම ප්‍රජාතන්ත්‍රවාදීව, රටේ නීතිය අනුව මේ රට පාලනය කරගෙන යනවා. මට තව එක කාරණයකට උත්තර දෙන්න තිබෙනවා. නමුත්, කාලය නැති නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.28]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

1983ஆம் ஆண்டுக் கலவரம் எங்களுடைய தமிழ் மக்களை மிக மோசமான முறையிலே தண்டித்தது. அந்தத் தண்டனையின் ஊடாகத் தமிழீழ விடுதலை இயக்கத்தினுடைய ஸ்தாபகர்களான தங்கத்துரை, குட்டிமணி உட்பட அவர்களுடன் இருந்த 9 பேர் படுகொலை செய்யப்பட்டார்கள். இந்தப் படுகொலையானது ஜே.ஆர். ஜயவர்தன காலத்திலே நடைபெற்றது. இம்முறை நீர்கொழும்புச் சிறைக்குள் நடந்த படுகொலைகள் உள்ளே இருந்தவர்களாலேயே உருவாக்கப் பட்ட மோதல்களாகக் கருதப்பட்டாலும், 1983ஆம் ஆண்டுக் கலவரத்தின்போது ஜனாதிபதியாக இருந்த ஜே.ஆர். ஜயவர்தன, வெளியிலே இருந்த காடையர்களைச் சிறைக் குள்ளே அனுப்பி அவர்களைப் படுகொலை செய்தார். தமிழீழ விடுதலை இயக்கத்திற்கு அது பாரியதொரு பின்னடைவாக இருந்தது. அதன்பின்பு, தலைவர் சிறீ சபாரத்தினம் எங்களுடைய அமைப்பைப் பொறுப்பெடுத்து மிக நேர்த்தியான முறையிலே அதனை முன்னெடுத்திருந்தபோதும், அடுத்த இழப்பும் எங்களுக்கு ஏற்பட்டது.

இங்கு என்ன சொல்லவருகிறேன் என்றால், 1983 கலவரத்திலே படுகொலை செய்யப்பட்ட எங்களுடைய அமைப்பின் ஸ்தாபகர்களான தங்கத்துரை, குட்டிமணி ஆகிய இருவருக்கும் வல்வெட்டித்துறையிலே சிலைகளை அமைப் பதற்குத் தனியார் ஒருவர் காணி கொடுத்ததன் அடிப் படையிலே, அந்தக் காணிக்குள் அவர்கள் இருவருக்கும் இரண்டு சிலைகளை வைப்பதற்கான முயற்சியை எங்களுடைய தமிழீழ விடுதலை இயக்கம் செய்துவந்த நிலையில், நேற்றைய தினம் அதை நிறுத்த வேண்டும் என்ற ஒரு கோரிக்கையைப் பொலிஸார் நீதிமன்றத்தில் விடுத்திருக்கிறார்கள். ஆனால், சிறையிலே படுகொலை செய்யப்பட்ட அவர்கள் உண்மையிலேயே எங்களுடைய கட்சியின் தலைவர்கள். அவர்களுடைய சிலையை ஒரு தனியார் காணியில் நாங்கள் வைப்பதற்கு ஏன் தடை? 1983 கலவரம் என்பது வரலாற்றில் மறக்கமுடியாது ஒரு சம்பவமாக இருக்கிறது. தங்கத்துரை, குட்டிமணி போன்றவர்கள் நீதிமன்றத்திலே அரிய, சிறப்பான உரைகளை ஆற்றியிருக்கி றார்கள். அவர்களுக்குச் சிலை வைப்பதற்கான வேலைகளை நாங்கள் முன்னெடுக்கும் சூழலில் நேற்றைய தினம் வல்வெட்டித்துறைப் பொலிஸார் நீதிமன்றத்துக்குச் சென்று முறையிட்டு, அவ்வாறு சிலை வைப்பதைத் தடுத்து நிறுத்த வேண்டும் என்று ஒரு தடை உத்தரவைப் பெற்றிருக்கிறார்கள்.

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

நாங்கள் பதிவுசெய்யப்பட்ட ஓர் அரசியல் கட்சியைச் சேர்ந்தவர்கள். எங்களுக்கும் ஒரு வரலாறு இருக்கின்றது. 1989 முதல் இந்த நாடாளுமன்றத்தில் நாங்கள் தொடர்ந்து அங்கம் வகித்துக் கொண்டிருக்கின்றோம். அப்படியான ஒரு கட்சி, தன் தலைவருக்குச் சிலை வைப்பதைத் தடுப்பது எந்த விதத்திலே ஜனநாயக முறைமை என்று சொல்ல முடியும்? கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்களிடம் இது சம்பந்தமாகப் பேசியபொழுது, அவர் பெருந்தன்மையோடு சொன்னார், "அவர்களைப் பயங்கரவாதிகள் என்ற கண்டோட்டத்தில் பார்க்கக் கூடாது, அவர்களுக்குச் சிலை வைப்பதற்கு நான் ஆதரவு தருகின்றேன், எல்லோரையும் அழையுங்கள்!" என்று. அவர் அதை எழுத்துமூலம் தராவிடினும் பெருந்தன்மையுடன் சொல்லியிருந்தார். திறப்பு விழாவுக்கான அனுமதிக் கடிதத்தை வல்வெட்டித்துறை நகர சபைத் தவிசாளர் வழங்கி யிருக்கின்றார். இந்த அரசுகூட ஒரு போராட்டத்தின் ஊடாகப் பதவிக்கு வந்த ஓர் அரசு. இந்த அரசின் கட்சித் தலைவர்கள் அன்று படுகொலை செய்யப்பட்ட சூழலில், ஓர் இயக்கமாகச் செயற்பட்ட இந்த அரசினுடைய இன்றைய செயற்பாடுகள் ஏன் இப்படி அமைய வேண்டும்? வல்வெட்டித்துறை தலைமைப் பொலிஸ் பொறுப்பதிகாரியிடம் பேசியபொழுது கூட, "நீங்கள் திறப்பு விழாவைச் செய்யுங்கள், பிரச்சினை ஒன்றும் இல்லை" என்று கூறியிருந்தார். அதுபோல், இராணுவம் உள்ளிட்ட ஏனைய புலனாய்வுத் துறையினரும் வந்து விசாரித்துவிட்டு, சிலைத் திறப்பு விழாவை நடத்துமாறு சொன்னதன் பின்னரும் இந்த அசம்பாவிதம் நடந்திருக் கின்றது.

தமிழீழ விடுதலை இயக்கத்தைச் சார்ந்த அவர்கள் வன்முறைமீது காதல் கொண்ட மனநோயாளிகள் அல்லர். வெளியில் இருந்த காடையர்களைச் சிறைக்குள் அனுப்பி அங்கு மேற்கொண்ட தாக்குதலின்போது அவர்களின் கண்கள் பிடுங்கப்பட்டன; அவர்கள் படுகொலை செய்யப்பட்டார்கள். இதுதொடர்பாக ஒரு விசாரணையை நடத்த வேண்டுமென்று நான் ஏற்கனவே நாடாளுமன்றத்திலே கோரியிருந்தேன். ஏனென்றால், அவர்களுடைய உடல்கள் எங்கே புதைக்கப் பட்டனவென்று எங்களுக்குத் தெரியவில்லை. ஆகவே, இதிலே சம்பந்தப்பட்டவர்கள் யார் என்பது தொடர்பாக அரசாங்கம் விசாரணை செய்து, உடனடியாக அவர்கள் கைதுசெய்யப் பட்டு, அவர்களின் உடல்கள் எங்கே புதைக்கப்பட்டன என்பது தொடர்பாக அறிய வேண்டும். எப்படி நீர்கொழும்புச் சிறைச்சாலைக்குள் நடந்த வன்முறைச் சம்பவம் தொடர்பான விசாரணைகள் இன்று மேற்கொள்ளப்படுகின்றதோ, அதேபோல் அன்றைய ஜனாதிபதியாக இருந்த ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய அரசாங்கத்தின்கீழ் நடைபெற்ற அந்த அடாவடித்தனமான நடவடிக்கைகளையும் இந்த அரசு விசாரிக்க வேண்டும்.

எதிர்வரும் 25ஆம் திகதி நாங்கள் இவர்களுடைய உருவச் சிலைகளைத் திறந்துவைப்பதற்கான முயற்சிகளைச் செய்கின்றோம். நாளைய தினம் நீதிமன்றத்திலே இது தொடர்பான விசாரணை மீண்டும் நடைபெறவிருக்கின்றது. ஆகவே, எங்களுடைய இந்த இரண்டு மாபெரும் தலைவர் களுடைய உருவச் சிலைகளைத் திறந்து வைப்பதற்கான ஆணையை வழங்குவதற்கான ஆதரவை எங்களுக்கு வழங்குகின்ற வகையிலே நீங்கள் செயற்பட வேண்டும் என்ற கோரிக்கையை நான் இந்த அரசிடம் விடுக்க விரும்புகின்றேன். ஏனென்றால், போராட்டம் இல்லாத ஒரு ஜனநாயக நாட்டிலே நாங்கள் இன்று இருக்கிறோம் என்ற அந்த உணர்வு இதனூடாக எட்டப்பட வேண்டும்.

உருவச்சிலைகளை வைப்பதென்பது வன்முறையைத் தூண்டும் நடவடிக்கையல்ல. ஆனால், அதைத் தடுப்பதென்பது வன்முறையைத் தூண்டும் போராட்டங்களாக மாறக் கூடும். ஆகவே, இந்த உருவச்சிலைகளை வைக்க முடியாது என்ற நிலைப்பாட்டில் இந்த அரசாங்கம் செயற்படுமாக இருந்தால், அது போராட்டமாக மாறுகின்றபோது, நீங்கள் மக்களுக்காகச் செய்த தியாகங்கள், போராட்டங்களை நீங்களே மனதில் கொள்ளவில்லையென்றுதான் கருத வேண்டும் என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று இந்த அரசு பல போராட்டங்களின் பின்னர் பதவிக்கு வந்த, பல இழப்புகளை, பல தியாகங்களைச் செய்த அரசாக இருக்கின்றது. அந்த வகையில், படுகொலை செய்யப்பட்ட எங்களுடைய தமிழீழ விடுதலை இயக்கத்தினுடைய ஸ்தாபகர்களான தங்கத்துரை, குட்டிமணி ஆகியோருடைய உருவச் சிலைகளைத் திறந்து வைப்பதற்கு ஏன் தடை விதிக்கப்படுகிறது? ஆகவே, உங்களுடைய அரசாங்கம் இந்த விடயத்திலே கவனம் செலுத்தி, எங்களுடைய கடற்றொழில் அமைச்சர் சொன்னதைப்போல, 25ஆம் திகதி அந்த உருவச் சிலைகளைத் திறந்து வைப்பதற்கான ஆதரவை, அதற்கான வசதி வாய்ப்புகளை ஏற்படுத்தித் தரவேண்டுமெனக் கோரி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සහ කාර්යසාධනය පිළිබඳ විවාදයකට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මා ඉතා සතුටු වනවා. එම කමිටුවේ සභාපති ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මැතිතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තු ඉතිහාසයේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් මෙවැනි විවාදයක් පවත්වන පළමුවැනි පාර්ලිමේන්තුව බවට මෙම දසවන පාර්ලිමේන්තුව පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දසවන පාර්ලිමේන්තුවට තිබෙන ජන වරම තමයි, ජනතාවගේ අයිතිවාසිකම් ඉෂ්ට සිද්ධ කර දීම. විශේෂයෙන්ම අපි දන්නවා, අපට ජන වරම ලැබී තිබෙන්නේ පාර්ලිමේන්තුව තුළදී වාගේම පාර්ලිමේන්තුවෙන් පිටතදීත් ජනතාවගේ අයිතිවාසිකම් ඉෂ්ට කිරීම සඳහා බව. රාජ්‍ය සේවකයින් වෙන්න පුළුවන්, වෙනත් පාර්ශ්වයක් වෙන්න පුළුවන්, මේ රටේ ජනතාවට පාර්ලිමේන්තුව හරහා තමන්ගේ ප්‍රශ්නයක් විසඳාගන්න දුක්ගැනවිල්ලක් කියන්න තිබෙන එකම කාරක සභාව තමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව. ඒ වාගේම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ අරමුණ තමයි, මහජනතාව වෙනුවෙන් ඇප කැප වීමෙන් කටයුතු කරන කාරක සභාවක් බවට මෙම කාරක සභාව පත් කරන එක.

ඉතිහාසයේ මෙම කාරක සභාවේ කටයුතු පැත්තෙන් සාධනීය දේ වාගේම නිෂේධනීය දේත් සිදු වී තිබෙන බවට ජනතාවගෙන් අපට තොරතුරු ලැබී තිබෙනවා. කාරක සභාව නියමිත වෙලාවට ආරම්භ නොකිරීම, ආරම්භ කළත් සමහර වෙලාවට පැයකින්,

දෙකකින් අවසන් කිරීම, තවත් සමහර අවස්ථාවල සභාපතිවරයාට කාරක සභාවට පැමිණීමට අමතක වීම වාගේ අවස්ථා අපි අහලා තිබෙනවා. හැබැයි, වර්තමානයේ අපි ඒ තත්ත්වය නැති කරන්න මහන්සි ගන්නවා. ගරු සභාපතිතුමා ප්‍රධාන කාරක සභාවේ සියලු සාමාජිකයින්, ඒ වාගේම කාර්ය මණ්ඩලය කැපවෙලා - සභාපතිතුමාගේ කථාවේදීත් මේ ගැන කියවුණා - ඉතිහාසයේ පළමු වතාවට නියමිත වෙලාවට කාරක සභාවේ කටයුතු ආරම්භ කරලා, අවේලාවේ එම කටයුතු අවසන් කරපු එකම කාරක සභාව බවට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අද පත්වෙලා තිබෙනවා. ඒ වාගේම කාරක සභාවේ කාර්යක්ෂමතාව වැඩි කරලා, විනිවිදභාවයෙන් සහ මධ්‍යස්ථව නිර්දේශ ලබා දෙන තැනක් බවට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අද පත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම දසවන පාර්ලිමේන්තුව දැනට 157 වාරයක් කැඳවා තිබෙනවා. ඒ අතරින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව දින 63ක් රැස්වෙලා තිබෙනවා. ඒ වාගේම පෙත්සම් 2,233ක් ලැබිලා තිබෙනවා. පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද පෙත්සම් සංඛ්‍යාව 999ක්. විමර්ශනය කරන ලද පෙත්සම් සංඛ්‍යාව 392ක්. ඒකෙන් සහන නිර්දේශ කරපු පෙත්සම් සංඛ්‍යාව 158ක් බවට පත් කරලා තිබෙනවා, අවුරුදු එකහමාරක් වැනි කෙටි කාලයක් තුළ. මීට කලින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට චෝදනාවක් තිබුණා, ජන වරමට අනුව වැඩ කරන්නේ නැහැ කියලා. ඒ වාගේම වෙනත් මාතෘකා පැත්තටත් ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් COPE එක පිළිබඳව සභාවේ සාකච්ඡා වුණා. ඒ අවස්ථාවේදීත් කිව්වා, ජන වරමට අනුව නොවෙයි වැඩ කරන්නේ, හොරුන්ට දඬුවම් කරන්නේ නැහැ, හොරු අල්ලන්නේ නැහැ කියලා. ගාල්ල පැත්තේ මන්ත්‍රීවරයෙකුගෙනුත් එහෙම හඬක් ආවා. ඉතිහාසයේ කොහොම වුණත් වර්තමානයේ අපි ඒ ජන වරමට අනුව තමයි වැඩ කරන්නේ. ගාල්ල පැත්තේ මන්ත්‍රීවරයෙකුගෙන් ඒ හඬ ආවත් මුළු රටම දන්නවා, ඒ ජන වරමට අනුව තමයි අපි වැඩ කරන්නේ කියලා. ඒ ජන වරමට අනුව වැඩ නොකළා නම් මොන හේතුවක් නිසාවත් දයා ගමගේ මහත්තයලාගේ දේපළ රාජසන්තක වෙයි කියලා අපි හිතන්නේ නැහැ. ජන වරම දීලා තිබෙන්නේ ඒකට. ඒ ජන වරම දුන්නේ නැත්නම්, ඒ ජන වරමට අනුව වැඩ කළේ නැත්නම් කෙහෙලිය රඹුක්වැල්ල මහත්තයා ගෙන්වපු වතුර දාපු injection රෝගීන්ට විදලා එතුමාට හිර ගෙදර ඉන්න වෙයි කියලා අපි හිතන්නේ නැහැ. එස්.එම්. චන්ද්‍රසේන මහත්තයා සම්බන්ධයෙන් ගත්තාමත් එහෙමයි. මනුෂ නානායක්කාර මහත්තයා රුපියල් එක්ලක්ෂ විසිපන්දාහ ගණනේ 10x10 canopies ගහන්න සල්ලි වියදම් කළ ඒවාට දැන් අධිකරණ ක්‍රියාමාර්ග ගනීවි කියලා මම නම් හිතන්නේ නැහැ, මේ ජන වරම ආවේ නැත්නම්, ඒ ජන වරමට අනුව වැඩ කළේ නැත්නම්.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විධියට සභාපතිතුමා ප්‍රමුඛව පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි සියලුදෙනා කාරක සභිකයෝ විධියට මහන්සි ගන්නේ වඩාත් විනිවිදභාවයෙන් යුතුව පෙත්සම් විභාග කරන්නයි. පෙත්සම් විශාල ප්‍රමාණයක් - 2,000ක් විතර - ගොඩගැහිලා තිබෙනවා. හැබැයි, ඊ වෙනකල් කාර්ය මණ්ඩලයත්, කාරක සභිකයෝත්,- *[බාධා කිරීමක්]* ගාල්ල පැත්තේ කියලා කියනකොට පත්වීම් දීපු අය සම්බන්ධවත් කිව්වා නේ, කලින් සභාවේ. වැඩියෙන්ම ඉඩම් ක්ෂේත්‍රයට අදාළ ආයතනවල පත්වීම් ලබා දීලා තිබෙන්නේ ගාල්ලේ අයට. ඊළඟට අනුරාධපුරය පැත්තේ අයට. එහෙම තමයි. ඒ හැමෝම ස්ථිර නොකරපු කට්ටිය. ගාල්ල පැත්ත ගැන කථා කරන්න ගියොත් ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. ඒක ඉඩම් දීපු විධිය වෙන්න පුළුවන්, වෙන දේවල් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගැන නේ අපි මේ වෙලාවේ කථා කරන්නේ. හොරු, තක්කඩි, බෙබද්දෝ, මිනීමරුවෝ, මංකොල්ලකාරයෝ එක්ක වුණත් එකතු වෙලා අපි මේ ආණ්ඩුව පෙරළනවා කියන්නේ ඒක තමයි. YouTube එකට එක එක "සිරි"ලා කියනවා, දැන් හොරු, තක්කඩි, මංකොල්ලකාරයෝ, බෙබද්දෝ, ඕනෑම පිසාචයෙක් එක්ක එක්කහු වෙලා අපි මේ ආණ්ඩුව පෙරළනවා කියලා. ඇයි, එහෙම කියන්නේ? එක එක "සිරි" ලා මේ කථාව කියනවා. අපි බලමු, ඔය "සිරි"ලාට ඒක කරන්න පුළුවන්ද කියලා. ජනතාව ඔවුන්ගේ ඒ සෙල්ලම ගැන දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විධියට අපි මහන්සි ගන්නවා, ජන වරමට අනුව වැඩ කරන්න. ජනතාවගේ බලාපොරොත්තුව මේකයි. ඇත්තටම පෙත්සම් දෙදහස් ගණනක් තිබෙනවා. ජනතාවට මේ දුක කියන්න පාර්ලිමේන්තුවේ තිබෙන එකම කාරක සභාව තමයි, මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව. ඒ නිසා මේ ජනතාවගේ තිබෙන දුක නිවන්න ඒ කටයුතු ටික වේගයෙන්, කාර්යක්ෂමව, ඉතාම විනිවිදභාවයෙන් යුතුව සිදු කරන්න ඕනෑ. දේශපාලන කෝණයෙන් බලන්නේ නැතුව ඉතාම මධ්‍යගතව බලා ජනතාවගේ ඒ වැඩකටයුතු ටික වේගවත් කරන එක තමයි අපේ අරමුණ වෙන්නේ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධව මෙවැනි විවාදයක් පැවැත්වීම ඉතිහාසගත වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු වඩාත් වේගවත් කරලා, ජනතාව වෙනුවෙන් ඒක ශක්තිමත් කරන එක තමයි අපේ අරමුණ. වේලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම පාර්ලිමේන්තු ක්‍රමවේදය තුළ විශේෂයෙන්ම මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළින් දැවැන්ත සේවාවක් සිදු වෙනවා. නමුත් ගොඩක් අයට ඒක දැනෙන්නේ නැහැ. ගොඩක් අය ඒක දකින්නේත් නැහැ. විශේෂයෙන්ම මේ කාරක සභාවල තිබෙන ස්වාධීනත්වය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ ගැන විශේෂයෙන්ම මම කථා කරන්න ඕනෑ. මොකද, අපි බල තුලනය කිරීම ගැන වාගේම accountability පිළිබඳව ගත්තොත්, සාමාන්‍ය සම්ප්‍රදාය අනුව COPE, COPAහි - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත් - සභාපතිත්වය විපක්ෂයට තමයි ලබා දිය යුත්තේ. ඒ නිසා අපි රජයෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය විපක්ෂයට ලබා දුන්නත්, COPE එකේ සභාපති ධුරය විපක්ෂයට ලබා දීලා නැහැ. විපක්ෂයට ඒවායේ සභාපති ධුර ලබා දීම සම්ප්‍රදායානුකූලයි. ඒවා දේශපාලනීකරණය කිරීම සුදුසු නැහැ. ඒ අවස්ථාව ලබා දුන්නොත් මම හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට වඩාත් හොඳයි. ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන්ම මම කියනවා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

රටක් හැටියට ගත්තාම මේ ආයතනවල ස්වාධීනත්වය අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒවා දේශපාලනීකරණය කිරීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මොකද, රටේ ජනතාව කර ගන්න දෙයක් නැතුව පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට එනවා වාගේම තමයි කර ගන්න දෙයක් නැති නිසාම අධිකරණයටත් යන්නේ. ඒ නිසා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත් වැදගත්. මේ වනවිට අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. අද වනකොට අධිකරණ ක්‍රියාවලියේ විශාල ප්‍රමාදයක් තිබෙනවා. ඒ ප්‍රමාදයට ප්‍රධානතම හේතුවක් තමයි, අධිකරණ විනිසුරුවරුන්ගේ පුරප්පාඩු පැවතීම. අපි කවුරුත් ඒ ගැන දන්නවා. විපක්ෂය ඒ පිළිබඳව දිගින් දිගටම හඬ නඟනවා.

අධිකරණ විනිසුරුවරුන්ගේ පුරප්පාඩු ගත්තොත්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ පුරප්පාඩු 4ක් සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ පුරප්පාඩු 4ක් තිබෙනවා. නමුත් මේ ගැන කොච්චර කිව්වත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැහැ, ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුව. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට, අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට ප්‍රධානතම හේතුවක් වෙනවා, මේ විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු පුරවන එක. ඇයි, ඒක කරන්නේ නැත්තේ? ඒ කටයුතු වහාම අවසන් කරන්න. එතකොට අධිකරණ ක්‍රියාවලිය වේගවත් වෙනවා. දැන් ඉතා පැහැදිලියි, මේකට වෙන අරමුණක් තිබෙනවාය කියන එක. අධිකරණය තුළ දේශපාලනීකරණය කිරීමක් සිදු වන බව ඉතාම පැහැදිලියි.

අධිකරණය ගැන කථා කරනකොට මම මේ කාරණයත් කියන්න කැමතියි. අද අධිකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් උඩු යටිකුරු වෙලා තිබෙනවා. විපක්ෂයේ ඉන්න අපි කිහිපදෙනෙක් විතරක් නොවෙයි, නීතිඥ සංගමය, ජාත්‍යන්තර සංවිධාන ඇතුළු හැම සංවිධානයක්ම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දිගින් දිගටම හඬ නඟනවා, විනිශ්චයකාරවරුන් විශ්‍රාම යෑමේ වයස් සීමාව පිළිබඳව තිබෙන ගැටලුව ගැන. හැබැයි, ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් පුදුම දැඩි මතයක ඉන්නවා. ඒ වෙනුවෙන් ඉතා ඕනෑකමින් හැම දෙයක්ම අමතක කරලා, විනිශ්චයකාරවරුන් විශ්‍රාම යෑමේ වයස් සීමා වැඩි කරන්න ඕනෑ කියන මතයේම ආණ්ඩුව ඉන්නවා. මේ ගැන අද මුළු ලෝකයේම අවධානය යොමු වෙලා තිබෙනවා. අපි දැක්කා, මීට කලිනුත් පැවති ආණ්ඩු එහෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී දේවල් සිදු කළ ආකාරය. අග්‍ර විනිශ්චයකාරවරිය හැටියට සිටි අපේ බණ්ඩාරනායක මැතිනිය එම ධුරයෙන් නෙරපලා කොච්චර උද්ධච්චකමින්ද එදා ඒ ආණ්ඩුව හිටියේ? මේ ආණ්ඩුව එදා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කථා කළත්, උද්ධච්චකමින් එදා විරුද්ධ වෙච්ච දේ අද ඒ ආකාරයෙන්ම සිදු කරනවා. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා දැන් අධිකරණයට අත තියන එක නම් එච්චර නුවණට හුරු නැහැ. එහෙම අධිකරණයට අත තියපු ආණ්ඩුවලට, ඒ නායකයින්ට වෙච්ච දේවල් ඉතිහාසයේ අපි දැක තිබෙනවා. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා තමුන්නාන්සේලා අධිකරණයට අත තියන එක නතර කරන්න කියලා. මුළු ලෝකයම අද ඒක කියනවා. ඒ ස්වාධීනත්වය අපි ආරක්ෂා කරන්න ඕනෑ, ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. මේ වෙලාවේදී අපි ඉතා ඕනෑකමින් ඒ කාරණය කියනවා. අධිකරණය කියන්නේ අපේ පාර්ලිමේන්තුවට හා සමාන වැදගත්කමක් තිබෙන ස්වාධීන ආයතනයක්. ඒ ආයතනයේ ස්වාධීනත්වය අපි ආරක්ෂා කරන්න අවශ්‍යයි. ඒ පිළිබඳව රජයට ලොකු වගකීමක් තිබෙනවා. ඒ වාගේම රටේ ජනාධිපතිවරයාට ලොකු වගකීමක් තිබෙනවා. අද මේ ආණ්ඩුව, ජනාධිපතිවරයා එදා සිටි ස්ථාවරයේ ඉන්නේ නැතිව, එදා අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් කථා කළාට අද ඒ හැම දෙයක්ම අමතක කරලා වෙනම න්‍යාය පත්‍රයකට යනවා.

මේවා විපක්ෂය කියන දේවල් නොවෙයි. අද නීතිඥ සංගමය දිහා බලන්න. නීතිඥ සංගමය දේශපාලනය කරන ආයතනයක් නොවෙයි. එය ස්වාධීන ආයතනයක්. ඒ ස්වාධීන ආයතනයේ මතය විමසන්න. ඒ පිළිබඳව දිගින් දිගටම කිව්වත් ඒවා ඇහෙන්නේ නැහැ වාගේ ඉන්නවා; දකින්නේ නැහැ වාගේ ඉන්නවා. ජාත්‍යන්තර සංවිධාන ඉතා ඕනෑකමින් මේ පිළිබඳව කියලා තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම ජාත්‍යන්තර වශයෙන් මෙයට මැදිහත් වෙන්න, තානාපති කාර්යාලවල ඉන්න සියලු දෙනාම මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ කියලා. මොකද, අධිකරණයට අත තියලා ඒකාධිපතිවාදයකට යාමට තමයි අද මේ ආණ්ඩුව සැරසෙන්නේ. අපි වග කියන විපක්ෂයක් විධියට ඊට විරුද්ධ වනවා වාගේම තමුන්නාන්සේලාට ඉතා ඕනෑකමින් කියනවා, කරුණාකරලා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.53]

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 125වැනි ස්ථාවර නියෝගය යටතේ ආරම්භ කරපු මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳව අද දවසේ මේ පාර්ලිමේන්තුව තුළ කථා කරනවා. පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමු වතාවටයි මෙම කාරක සභාව පිළිබඳව මෙවැනි කථා බහක් ඇති වෙන්නේ කියන එක විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

ලංකාවේ ජනතාව එක පැත්තකින් තමන්ගේ පෞද්ගලික ජීවිත තුළ විවිධ දුෂ්කරතාවලට පත්වීම්, අනෙක් පැත්තෙන් සමහර රාජ්‍ය නිලධාරීන් එක්ක ගනුදෙනු කරද්දී ඇති වන විවිධ දුෂ්කරතා, ඒ වාගේම රාජ්‍ය නිලධාරීන් තවත් රාජ්‍ය නිලධාරීන් එක්ක ගනු දෙනු කරද්දී ඇති වෙච්ච තත්ත්වයන්, සමහර ආයතන තවත් ආයතන එක්ක වැඩ කරද්දී ඇති වෙච්ච තත්ත්වයන් අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළ විශාල වශයෙන් කථා බහට ලක් කරන මාතෘකා වෙනවා. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අනෙක් කාරක සභාවලට වැඩිය වෙනස් කාරක සභාවක් බව. රටේ තිබෙන විවිධ ක්ෂේත්‍රවල විවිධ ප්‍රශ්න ගැන එහිදී සාකච්ඡා වෙනවා. දැන් එන ප්‍රශ්නයට වැඩිය හාත්පසින් වෙනස් තව ටිකකින් එන ප්‍රශ්නය. තීන්දු තීරණ ගනිද්දී විශාල වශයෙන් විමසීම් කරලා, ඒ සම්බන්ධයෙන් හොඳ අධ්‍යයනයක් කරලා, ඒ තුළ තීන්දුවක් ගන්න එක තමයි මෙහි තිබෙන වැදගත්ම කාරණය කියලා මා විශ්වාස කරනවා.

විශේෂයෙන් අධිකරණය ගන්න තීරණයකදී පෙත්සම්කරුට, එහෙම නැත්නම් අදාළ ප්‍රශ්නය ඉදිරිපත් කරන පුද්ගලයාට අදහස් දැක්වීමේ අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. හැබැයි, මේ කාරක සභාවේදී එහෙම නොවෙයි සිදු වෙන්නේ. ඉස්සෙල්ලාම පෙත්සම්කරුගෙන් විමසීමක් කරලා, ඒ විමසීමට අනුව නිලධාරීන්ගෙන් විමසීමක් කරලා, නිලධාරීන් ඒ සම්බන්ධයෙන් දෙන උත්තරය අනුව තමයි අපි නිර්දේශය දෙන්නේ. එහිදී නිර්දේශයක් තමයි දෙන්නේ. ඒ නිර්දේශය ඉතාම සාධාරණ වීමට අපි බොහෝ කාරණා සම්බන්ධයෙන් මැදිහත්වීම් කරනවා. විශේෂයෙන්ම ඒ කාරණය මතක් කරන්න ඕනෑ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වන ගරු ගාමිණී රත්නායක මැතිතුමා මේ කරුණු කාරණා සම්බන්ධයෙන් විශාල අවබෝධයක් ඇතිව වැඩ කටයුතු කරන සභාපතිවරයෙක්. ඒක විශේෂ කාරණයක්. එතුමා මේ කමිටුව සම්බන්ධයෙන් විශාල උනන්දුවක් දක්වනවා. මම පෞද්ගලිකව දන්නවා, එතුමා නිදි වරාගෙන මේ සියලු කාරණා සම්බන්ධයෙන් අධ්‍යයනය කරනවා කියලා. මම සමහර අවස්ථාවල මෙම කමිටුවේ සභාපතිත්වය දරලා තිබෙනවා. සමහර කාරණා සම්බන්ධයෙන් මේ කමිටුවට සම්බන්ධ නිලධාරි මණ්ඩලයටත් විශාල දැනුමක් තිබෙනවා. ඔවුන් ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරලා තිබෙනවා. මේ සමාජයේ තිබෙන ප්‍රශ්න විශාල ප්‍රමාණයකට විසඳුම් දෙන පාර්ලිමේන්තුවේ තිබෙන එකම කාරක සභාව තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව. ඒ නිසා මේක ඉතාම වැදගත්, කාලෝචිත කාරක සභාවක්. මේ කාරක සභාව ඉදිරියට යන්න ඕනෑ. මේ කාරක සභාව මේ රටේ මහජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්, ඒ වාගේම සමහර රාජ්‍ය නිලධාරින්ගේ සුබසිද්ධිය වෙනුවෙන් ඇති කරපු කාරක සභාවක් ලෙස අපට ප්‍රකාශ කරන්න පුළුවන්. මෙහි ක්‍රියාකාරිත්වය බැලුවාම, සමහර මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ ප්‍රදේශයේ ඇති වෙන යම් යම් ප්‍රශ්නවලට මැති ඇමතිවරුන්ට කථා කරලා, අමාත්‍යාංශවලට කථා කරලා, විවිධ ආයතනවලට කථා කරලා උත්තර හදා ගන්න බැරි වුණාම, ඒ වාගේම ලැබී තිබෙන උත්තර ටික පරණ වුණාම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන්න අපට සිද්ධ වෙනවා. අවසානයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපිත් කියන්නේ "උත්තරයක් නැත්නම් පෙත්සම් පිළිබඳ කාරක සභාවටවත් දමමු" කියලායි. ඔය විධියට තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සමක් එන්නේ.

මම විශේෂයෙන් මේ කාරණය මතක් කරනවා. අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතු කරද්දී දකින ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව තමයි එම කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කරද්දී ඒක ක්‍රමවේදයට අනුව සිද්ධ නොවීම තුළ සමහර පෙත්සම් පිළිගැනීමට ලක් නොවන තත්ත්වයට පත් වීම. ඒ නිසා මා විශේෂයෙන් මතක් කරනවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරන්න කියලා. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා ලේඛන දෙකක් සකස් කර තිබෙනවා, එම කාරක සභාව විසින්. ඒ ලේඛනවලට අනුව පෙත්සම ඉදිරිපත් කළොත්, පෙත්සම පිළිගෙන ඉදිරි කටයුතු කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

පෙත්සමකට අදාළව නිලධාරින් විශාල ප්‍රමාණයක් කැඳවන්න ඕනෑ. සමහර වෙලාවට යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, මාතර, ගාල්ල වැනි ඈත ප්‍රදේශවල ඉන්න නිලධාරින් මේ ස්ථානයට එන්න ඕනෑ. නිලධාරින් පැමිණීමේදී අත්‍යවශ්‍ය අය හැර අනෙක් අය පැමිණීයාම සම්පූර්ණ දවසක් ගත වෙනවා. රජයට ලොකු වියදමක් යනවා. ඒ නිසා අත්‍යවශ්‍ය පිරිස හරියට ගණනය කරගන්න නම්, පෙත්සම හරියට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ පෙත්සමට අදාළ කාරණා ටික පෙළගැස්වීම පෙත්සම් කාරක සභාවේ නිලධාරි මහත්වරු විසින් කරනවා. අපි විශ්වාස කරනවා, මේ ක්‍රමවේදය හරියට අනුගමනය නොකළොත් පෙත්සම් කාරක සභාවට මේ කටයුතු ටික හරියාකාරව කරගෙන යන්න අපහසු වෙනවා කියලා. මා ඒ කාරණයත් අවධානයට ලක් කරනවා. අපි මන්ත්‍රීවරු 225දෙනා තමයි පෙත්සම් කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරන්නේ. පෙත්සමක් පිළිගන්වද්දී ඒක ක්‍රමානුකූලව, නීත්‍යානුකූලව, හරියාකාරව පෙත්සමක් විධියට ඉදිරිපත් කරන්න ඕනෑ.

අපි එම කාරක සභාවේ කටයුතු කරද්දී දකින තවත් දුර්වලතාවක් තිබෙනවා. ඒ තමයි, ඉදිරිපත් වන සමහර කාරණා කිසිදු පදනමක් නැති, කථා කරලා, කාලය මිඩංගු කරලා අභකට දමන්න සිදුවෙන කාරණා වීම. ඒ නිසා පෙත්සමක් ඉදිරිපත් කරද්දී ඒක පෙත්සම් කාරක සභාවට ගෝචරද කියන එක සම්බන්ධයෙන් යම් විමසීමක් කරලා, මේ පෙත්සම පෙත්සම් කාරක සභාවට දැමීම තුළින් ඒ පෙත්සම්කරුට යම්කිසි දෙයක් සිද්ධ වෙයිද කියන කාරණය පිළිබඳ හරියට අධ්‍යයනය කරලා මේ කටයුත්ත කරන්න කියලා අපි පෙත්සම් කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපි මහන්සි වෙලා වැඩ කටයුතු කරලා නිර්දේශයක් අරගෙන, ඒ නිර්දේශය ක්‍රියාත්මක කිරීමට සමහර රාජ්‍ය ආයතනවලට ඉදිරිපත් කළාම, ඒ රාජ්‍ය ආයතන මේ සම්බන්ධයෙන් දක්වන ආකල්පය - මේ ගැන කථා බහට ලක් වුණා - ටිකක් පහළ මට්ටමේ තිබෙන්නේ කියලා අපි විශ්වාස කරනවා. ඒ නිර්දේශය සමහර වෙලාවට ප්‍රතික්ෂේප වෙනවා; සමහර වෙලාවට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම කල් යනවා. මට අදත් ලිපියක් ලැබිලා තිබෙනවා. අපි නිර්දේශයක් ලබා දෙනවා. අපි නිර්දේශයක් දුන්නාම ඒකට අදාළ ආයතන ටික හරියට පෙළ ගැහිලා ඒ නිර්දේශයට අනුව වැඩ කටයුතු කරන්න ඕනෑ. හැබැයි, මේ නිර්දේශයට අනුව වැඩ කටයුතු කිරීම ඉතාම ප්‍රමාදයට ලක් වෙන අවස්ථා බොහොමයක් තිබෙන බව අපි දන්නවා.

වසර ගණනාවක කාලයක් ගත වූ ප්‍රශ්නයක් හේතුවෙන් මේ රටේ මහ ජනතාව අතරින් අගතියට පත් වූ යම් පිරිසකට ඒ අගතියෙන් මිදීම වෙනුවෙන් කරන කටයුත්තකදී මහජන පෙත්සම් කාරක සභාව විසින් ගන්නා තීන්දු තීරණ හරියාකාරව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිලධාරින් එකට පෙළ ගැහෙන්න ඕනෑ කියා අපි විශ්වාස කරනවා. එවැනි පෙළ ගැස්මක් නැතිනම් අප ගන්නා මේ උත්සාහයේ තේරුමක් නැහැ. ඒ නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවල අප ගන්නා තීන්දු තීරණ හරියාකාරව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතන ටික හරියාකාරව පෙළ ගැහෙන්න කියන ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී කරනවා.

මේ කටයුත්ත තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා යෝජනාවලියක් ගෙන ආවා. ඒ යෝජනාවලිය සම්මත කරමින්, මහජන පෙත්සම් පිළිබඳ පිළිබඳ කාරක සභාව දසවෙනි පාර්ලිමේන්තුව තුළ ඉතාම සාර්ථක කාරක සභාවක් බවට පත් වීමට අවශ්‍ය සියලු කටයුතු සිදු වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 4.02]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று விசேடமாக, பொது மனுக்கள் பற்றிய குழுவுக்குச் சமர்ப்பிக்கப்படும் மனுக்கள் தொடர்பாகக் கொண்டுவரப் பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணையானது உண்மையாகச் சிறப்பான, பாராட்டுக்குரிய ஒரு விடயமாகும். அந்த வகையிலே, இதனை முன்வைத்திருக்கின்ற பொது மனுக்கள் பற்றிய குழுவின் தவிசாளரும் அரச தரப்புப் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ ஆர்.எம். காமினி ரத்நாயக்க அவர்களுக்கு முதலில் எனது நன்றியையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் ஆட்சியாளர்களினாலே ஊழியர்களும் பொதுமக்களும் பல பாதிப்புக்களுக்கு உள்ளாக்கப்பட்டு இருக்கின்றார்கள். அது தொடர்பில் நியாயம் கோரி இந்தப் பொது மனுக்கள் பற்றிய குழுவின் ஊடாகப் பிரேரணைகளைச் சமர்ப்பிக்கின்றபொழுது, அதற்கான நீதி என்பது, நியாயம் என்பது கால தாமதப்படுத்தப்பட்டு வழங்கப்படுகின்ற ஒன்றாகத்தான் இருந்தது. இதற்கு விண்ணப்பிக்கின்ற, மனுக்களைக் கொடுக்கின்ற அரச ஊழியர்களோ அல்லது பொதுமக்களோ தங்களுக்கான நீதி உடன் கிடைக்க வேண்டுமென்ற எதிர்பார்ப்புடன்தான் அந்த மனுக்களைக் கொடுக்கின்றார்கள். ஆனாலும், கடந்த காலங்களிலே பல மாதங்களாக அல்லது பல வருடங்களாக அவர்களுக்கான நீதி, நியாயம் கிடைக்கப்பெறாத நிலைதான் காணப்பட்டது. அந்த அரச ஊழியர்கள் தங்கள் வாழ்நாளில் 20 - 30 - 40 வருடங்கள் அரச திணைக்களங்களில் அல்லது ஏனைய துறைகளில் பணியாற்றியிருந்தும் தங்களுக்கான நியாயம் கிடைக்காமல் இருக்கின்ற காரணத்தினால், அவர்கள் ஓய்வுபெறுகின்ற நேரத்தில் தங்களுக்குரிய ஓய்வூதியம் கிடைக்கவில்லையென்று இந்த மனுக்களைக் கொடுக்கின்றார்கள். உண்மையாக அவர்கள் அரச அதிகாரிகளிடமோ அல்லது ஏனைய அமைச்சர்களிடமோ போய் முறையிட்டும் தங்களுக்கான நீதி கிடைக்கவில்லையென்ற காரணத்தினால்தான், Public Petitions Committeeக்கு மனுக்களைக் கொடுக்கின்றார்கள். ஆனால், கடந்த காலங்களில் இது தாமதப்படுத்தப்பட்டிருந்தாலும், தற்பொழுது புதிதாக நியமிக்கப்பட்ட தவிசாளர் அவர்கள் மிகச் சிறப்பாகச் செயற்பட்டதன்மூலம் கிட்டத்தட்ட 392 மனுக்களை அந்தக் குழுவின்மூலம் விசாரித்திருக்கின்றார்கள். பல மனுக்களுக்கான தீர்வுகளும் கொடுக்கப்பட்டிருக்கின்றது. அந்த வகையிலே அவர்களைப் பாராட்டுகின்றேன்.

விசேடமாக, 45 வயதுக்குப் பின்பு நியமனம் பெற்று ஓய்வுபெறும் pensioners தொடர்பாக நாங்கள் அண்மையிலும்கூட பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சிடமும் பிரஸ்தாபித்திருந்தோம். ஆனால், அவர்கள் அதற்குமுன் 15-20 வருடங்கள் வரை volunteers ஆகச் சேவை செய்திருக்கின்றார்கள். அவர்களுக்கு 45 வயதுக்குப் பின்புதான் நிரந்தர நியமனம் கிடைக்கப் பெற்றது. அதன் பின்பும் அவர்கள் 10-15 வருடங்கள் சேவை செய்திருக்கின்றார்கள்; அவர்களுடைய சம்பளத்தில் ஓய்வூதிய நிதி கழிக்கப்பட்டிருக்கின்றது; pension card கொடுக்கப்பட்டிருக்கின்றது; ஓய்வூதிய number கொடுக்கப் பட்டிருக்கின்றது. ஆனால், அவர்களுக்கு ஓய்வூதியம் கொடுக்கப்படவில்லை. அவர்கள் ஓய்வுபெற்று 5-6 வருடங்களாகியும் நிர்க்கதியான நிலையில் இருக்கின்ற சூழ்நிலை காணப்படுகின்றது. அவர்கள் உண்மையில் மிகவும் கஷ்டப்பட்டு இந்த நாட்டுக்காக உழைத்தவர்கள். விசேடமாக, கிழக்கு மாகாணத்திலே இருக்கின்ற சுகாதாரப் பணி உதவியாளர்கள் - Health Assistants- இதில் கூடுதலாகப் பாதிக்கப்பட்டவர்களாக இருக்கிறார்கள். ஆகவே, இவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கான நியாயத்தையும் இந்தக் குழு வழங்க வேண்டும் என்று இந்த உயரிய சபையினூடாகக் கேட்டுக் கொள்கின்றேன்.

இன்னுமொரு விடயத்தைக் குறிப்பிட விரும்புகிறேன். சிவராசா அனோஜன் என்பவர் சவூதி நாட்டிலே பொலிசாரால் கைது செய்யப்பட்டிருக்கின்றார். அதற்கு காரணம் என்னவென்றால், அவரால் இடப்பட்ட ஒரு முகநூல் பதிவாகும். அதாவது, யாழ்ப்பாணத்திலிருந்து கதிர்காமத்துக்குப் பாத யாத்திரை சென்ற பக்தர்களுடன் பயணித்த 'சுப்பிரமணி' என்ற நாய், நபரொருவரால் தாக்கப்பட்டது தொடர்பான முகநூல் பதிவுகள் இரு சமூகங்களுக்கிடையே பல பிரச்சினையை ஏற்படுத்தியிருந்தது. அதாவது, ஒரு மதத்தவர் மற்றொரு மதத்தையும், ஓர் இனம் இன்னோர் இனத்தையும் விமர்சித்து முகநூலில் பதிவுகளை இட்டிருந்தார்கள். உண்மையாக இந்தப் பதிவுகளின் நிமித்தம் முரண்பாடான ஒரு சூழ்நிலை காணப்பட்டது. இந்த நிலையிலே சவூதியில் பணிபுரியும் சிவராசா அனோஜன் என்ற தமிழ் இளைஞர், உணர்ச்சிவசப்பட்டுச் சில கருத்துகளை, அதாவது முஸ்லிம்களினால் மதிக்கப்படுகின்ற, முஸ்லிம்களினால் மட்டுமல்ல ஏனைய மதத்தவர்களினாலும் மதிக்கப்படுகின்ற தூதர் நபிகள் நாயகம் குறித்து விமர்சித்துச் சில கருத்துகளைப் பதிவிட்டிருந்தார். ஆனால், அவ்வாறு பதிவிட்ட ஐந்து அல்லது பத்து நிமிடங்களுக்குள்ளே அந்தப் பதிவை அவர் நீக்கிவிட்டு, அதற்காக மனம்வருந்தி, "நான் செய்தது தவறு, இப்படியான பிழையை நான் அறியாமல் செய்து விட்டேன், என்னை மன்னித்து விடுங்கள்!" என்று இஸ்லாமிய சமூகத்திடம் மன்னிப்புக் கோரியிருந்தார்.

அப்படி அவர் மன்னிப்புக் கோரியிருந்தும்கூட, இங்கே இருக்கின்ற சிலர் சவூதி அரசாங்கத்துக்கு இந்த விடயங்களை எடுத்துக்கூறியதன் நிமித்தம் அவர் கைது செய்யப் பட்டிருந்தார். அவர் தான் செய்த தவறை உணர்ந்து, இஸ்லாமிய சமூகத்திடம் மன்னிப்புக் கேட்டிருக்கின்றார். உணர்ச்சிவசப்பட்டே அந்தத் தவறைச் செய்திருக்கின்றார்; வேண்டுமென்று செய்யவில்லை. ஆகவே, அவருக்கு மன்னிப்பு வழங்கி, அவரை விடுதலை செய்ய வேண்டும். இந்த உயரிய

சபையினூடாகவும் இந்த அரசாங்கத்தின் ஊடாகவும் சவூதி அரசாங்கத்துக்கு இந்த விடயத்தைக் கொண்டு சென்று, அவரை விடுதலை செய்வதற்கான முழு ஒத்துழைப்பையும் அனைவரும் வழங்க வேண்டுமென இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இலங்கைக்கான சவூதி அரேபிய தூதுவராலயத்துக்கும் இது தொடர்பான கோரிக்கையை விடுக்க வேண்டும். இலங்கை அரசாங்கம் இதிலே கவனம் செலுத்தி, அவரை விடுவிப்பதற்கான நடவடிக்கையை மேற்கொள்ள வேண்டுமென இந்தச் சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.10]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව තුළින් සාකච්ඡා කරන්නේ දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සහ කාර්ය සාධනය පිළිබඳවයි. අපේ කමිටුවේ සභාපතිතුමා වන ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙනෙක් පෙත්සමක් ඉදිරිපත් කරන්නේ කුමන තත්ත්වයට පත් වුණු මොහොතකද කියලා අපි දන්නවා. රාජ්‍ය සේවයේ නිරත වන කෙනෙකුට එම කාලසීමාවේදී හෝ විශ්‍රාම යන අවස්ථාවේදී සාධාරණයක් ඉටු නොවුණු අවස්ථා තිබෙනවා නම්, ඔහුට හෝ ඇයට තම අදෝනාව නැත්නම් දුක ඉදිරිපත් කරන්න තිබෙන එකම තැන තමයි මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව.

අපි දන්නවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කරන ක්‍රමවේදය. පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 225දෙනා හරහා පෙත්සම් ඉදිරිපත් කරන්න පුළුවන්. ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ ස්ථාපිත කමිටුවක් හරහා එම පෙත්සම් විභාගයට ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අවස්ථාවල, ඒ කියන්නේ අටවන පාර්ලිමේන්තුව, නවවන පාර්ලිමේන්තුව වාගේ පාර්ලිමේන්තු කාලවලදී ඉදිරිපත් කළ පෙත්සම්වලට ඒ අවස්ථාවලදී සාධාරණයක් ඉටු නොවුණු නිසා දසවන පාර්ලිමේන්තුවටත් ඔවුන් ඒ පෙත්සම් ඉදිරිපත් කර තිබෙනවා, සාධාරණයක් බලාපොරොත්තුවෙන්. ඒ වාගේම තමයි ඒ කාලවල ඉදිරිපත් කළ පෙත්සම් විශාල ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වෙලාත් තිබෙනවා. ඒ නිසා අපි කමිටුව විධියට ඒ ක්‍රමයත් නිවැරදි කිරීම සඳහා ඊට අවශ්‍ය ආකෘති පත්‍ර හදා ඒවා නිවැරදිව ඉදිරිපත් කිරීමට අවස්ථාව සකසා දී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු මන්ත්‍රීවරු දැනුවත් කර ඊට අවස්ථාව ලබා දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙත්සමක් ඉදිරිපත් කරන අවස්ථාවේදී සහ එය විභාගයට ගන්නා අවස්ථාවේදී අපි දැක තිබෙනවා, ඒ කෙනාගේ අසරණභාවය. ඔවුන් එක වෙලාවකට දෙගිඩියාවකින් එනවා, මේ අවස්ථාවේදීවත් මගේ ප්‍රශ්නයට සාධාරණයක් වෙයිද කියන හැඟීමෙන්. ඒ කෙනාගේ movementsවලින් අපට ඒක තේරුම් යනවා. සමහර දවසට පැය දෙකකටත් එහා අපි සමහර පෙත්සම් විභාග කරනවා. අපි එය කරදරයක් ලෙස දකින්නේ නැහැ. සමහර වෙලාවට ඒ අය කලබලයෙන් ඉදිරිපත් කළ පෙත්සම් තිබෙනවා. නමුත් අපේ කමිටුව විසින් ඒවා හොඳින් අවබෝධ කරගෙන ඉවසීමෙන් ඒ අයට සවන් දෙනවා. ඒ විධියට සමහර පෙත්සම් පැය දෙක තුනක් විභාග කළ අවස්ථාත් තිබෙනවා. අවසානයේ රාජ්‍ය නිලධාරින් සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් ඊට සාධාරණය ඉටු කර දුන්නාම, ඒ පෙත්සම්කරු ඇස්වලින් කඳුළු පෙරාගෙන යන අවස්ථා අපි දැක තිබෙනවා.

අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විධියට කටයුතු කරන්නේ කිසිම දේශපාලන අරමුණකින් නොවෙයි. යම් පෙත්සම්කරුවෙකු එතැනට පැමිණ තිබෙන්නේ ඇයිද කියන කාරණාව අපි හොඳින් දකිනවා. නමුත් අපි දැක තිබෙනවා, පසුගිය කාලය පුරාවට යම් යම් අවස්ථාවලදී බොහෝ අය දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු ආකාරය. 1980 ගණන්වල ඉඳලා ඉදිරිපත් කරපු පෙත්සම් අපට ලැබී තිබෙනවා. ඔවුන් දේශපාලන පළිගැනීම්වලට හසු වෙලා තිබෙනවා. දේශපාලන පළිගැනීම් සම්බන්ධව සොයා බලන කමිටුවල නිර්දේශත් ඒ සමහර ඒවාට ලැබී තිබෙනවා. ඒ පෙත්සම්කරුවන් ඒවාට සාධාරණයක් බලාපොරොත්තු වෙනවා. හැබැයි, දැන් ඔවුන්ට දැනී තිබෙනවා, පක්ෂ, පාට මොකක් වුණත්, මොන ජාතියක කෙනෙක් වුණත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් ඔවුන්ට සාධාරණයක් කෙරෙනවා කියලා. ඒ වාගේම රාජ්‍ය නිලධාරින්ගේ පැත්තෙනුත් සාධනීයව එම කටයුතු සිදු වෙනවා. ඒ ඒ රාජ්‍ය ආයතනවල වගකීම් දරන අය ඔවුන්ට ඇහුම්කන් දීලා, සාකච්ඡා කරලා එම කටයුතු සිදු කරනවා. එසේ කරන්න පුළුවන් තත්ත්වයක් අද වනවිට නිර්මාණය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරක සභාවට පෙත්සම් බොහොමයක් ඉදිරිපත් වෙනවා. ඒවාට සාධාරණය ඉෂ්ට කරන්නේ කොහොමද, ඉක්මනින් ඒ පෙත්සම් විභාග කරන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කරනවා. මේ දසවන පාර්ලිමේන්තුවේ රැස්වීම් දිනවලදීත් පෙත්සම් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරනවා. පසුගිය පාර්ලිමේන්තුවලදීත් පෙත්සම් විශාල ලෙස එකතු වෙලා තිබුණා. අපි සාකච්ඡා කළා, කොහොමද ඒ අයට සාධාරණයක් ලබා දෙන්නේ කියලා. ඒ අනුව අපි අනුකමිටු තුනක් පත් කර, ඒවායේදී සාකච්ඡා කරලා එම පෙත්සම්කරුවන්ට සාධාරණය ඉටු කරන්න කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අරමුණ තමයි, වගකීම තමයි මේ පෙත්සම්කරුවාට සාධාරණයක් කරන්න ඕනෑය කියන එක. වසර ගණනාවක් රාජ්‍ය සේවයේ ඉඳලාත් ඔහුට සිද්ධ වෙලා තිබෙන අකටයුතුකම් වෙනුවෙන් අපි සහනයක් සැලසීම කළ යුතු වෙනවා. විභාග කිරීමට ගන්න පුළුවන් පෙත්සම් තිබෙනවා. ඒ කියන්නේ රාජ්‍ය නිලධාරින්ගේ අසාධාරණ ක්‍රියා, නීති රෙගුලාසි නිසා සිදුවෙන අසාධාරණ, ආයතනවලින් එන ගැටලු වාගේම, මාරුවීම්, උසස්වීම්, විනය ක්‍රියාමාර්ග සම්බන්ධ සිදුවීම් විභාග කිරීමට ගන්නවා. ඒ වාගේම, මේ පෙත්සම් පිළිබඳ කාරක සභාව පෙත්සමක් විභාගයට නොගන්නා කාරණා තිබෙනවා. අධිකරණයේ නඩුවක් පවතින කරුණක් සම්බන්ධ පෙත්සම් කාරක සභාවේ විභාගයට ගන්නේ නැහැ. ඒ වාගේම ජනාධිපතිතුමාගේ, කථානායකතුමාගේ වරප්‍රසාද සම්බන්ධ ප්‍රශ්න මේ පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කථා කරන්නේ නැහැ. පෞද්ගලික ආරාවුල්, වාණිජ වශයෙන් තිබෙන ගැටලු මේ පෙත්සම් පිළිබඳ කාරක සභාවේ විභාග කරන්න, සලකා බලන්න ගන්නේ නැහැ. ඊට අමතරව තිබෙන සියලු පෙත්සම් අපි විභාග කරලා ඊට අදාළ සාධාරණය ඉටු කරලා තිබෙනවා. පෙත්සම් විභාග කරලා අවසානයේ ගරු සභාපතිතුමාත්, අපිත් කථා කරද්දී අපේ හිතට දැනෙනවා අපි සාධාරණයක් කළා කියලා. මොකද, මේවා අවුරුදු ගණන් ඇදුණු ඒවා; සාධාරණයක් නොවුණු ඒවා.

[ගරු අජිත් ගිහාන් මහතා]

හැබැයි, ඒ වැඩි ප්‍රමාණයකට සාධාරණය කරලා, ඒ තිබෙන නීති රෙගුලාසි යටතේ සාධාරණය කරලා යවන්න අපට පුළුවන් වුණාය කියන සතුට තිබෙනවා. දසවෙනි පාර්ලිමේන්තුවේ පෙත්සම් පිළිබඳ කාරක සභාව ඒ කාරණය මැනවින් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අරමුණ අනුව ක්‍රමවත්ව, නිවැරදිව කටයුතු කරද්දී සමහර අයට ප්‍රශ්න ටිකක් තිබුණා. පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය සාධනය ගැන අද සාකච්ඡා කරනකොට සමහර අය දේශපාලන අරමුණුත් එක්ක තමයි කථා කළේ. සමහර අයට පැලවත්ත මතක් වෙනවා. පැලවත්ත ගැන කථා කරනවා. සමහර අය - හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා - අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරනවා. අධිකරණයට අත තියනවා කියලා කථා කරනවා. එතුමන්ලා ඒවා කියද්දී අපට මතක් වෙනවා, සිරිකොතේ කොහොමද මේවා විභාග වුණේ කියලා. මේවා මැදමුලනේ කොහොමද විභාග වුණේ, නෙළුම් මාවතේ ක්‍රියාත්මක වුණේ කොහොමද කියලා එතුමන්ලාට දැනෙනවා ඇති. අපේ ගරු සභානායකතුමා පැහැදිලි කළා, පැලවත්තේ කාර්යාලයෙන් කරන කාර්යභාරය. මෙච්චර සාධාරණව රටේ නීතිය ක්‍රියාත්මක වෙද්දී, රටට ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබියදී, සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා මේ රටේ සමගියෙන් ජීවත් වෙද්දී, මේ සියලුදෙනාම සාධාරණව ක්‍රියාත්මක වෙද්දී සමහර අයට බිල්ලෝ මැවෙනවා. ඒ නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් රටේ ස්ථාවර කරපු ආර්ථිකයක්, සාධාරණත්වයක්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා. මේ රට ජාතිවාදය වපුරමින් විනාශ වෙච්ච රටක්. දැන් මේ රට යම් නිවැරදි තැනකට ගෙනැල්ලා තිබෙනවා. අද වන විට මේ රටේ හැම දෙනාටම සාධාරණය ඉටු වෙලා, අධිකරණ ක්‍රියාමාර්ග නිවැරදිව සිද්ධ වෙද්දී දැන් බය වෙලා. ඔවුන්ට නඩු වැටෙද්දී, ඒවාට අදාළ ක්‍රියාමාර්ග ගනිද්දී, දවස ගාණේ නඩු පවරලා ඒ කටයුතු කරද්දී දැන් බිය වෙලා තිබෙනවා.

ඔබතුමන්ලාම කිව්වා, දැන් යම් කාර්යභාරයක් කරලා තිබෙනවා කියලා. එහෙම නම් ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය නිවැරදියි වාගේම, මේ පාලනයත්, ප්‍රජාතන්ත්‍රවාදයත්, නීතියත්, අධිකරණ ක්‍රියාවලියත් නිවැරදිව ක්‍රියාත්මක වෙනවා කියලා. අපි ජනතාවට පොරොන්දු වෙච්ච පරිදි අපේ රටේ ජනතාවට සාධාරණය ඉටු කරනවා. ඒ සඳහා අපි සියලුදෙනාම එකතුව වැඩ කරනවා කියන කාරණය මම මතක් කරන්න කැමතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.18]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொது மனுக் குழுவுக்குப் பொதுமக்களால் சமர்ப்பிக்கப்படும் மனுக்கள் சம்பந்தமாக இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணையானது உண்மையிலேயே வரவேற்கத்தக்க ஒன்றாகும். இதைக் கொண்டுவந்திருக்கின்ற கௌரவ பாராளுமன்ற உறுப்பினரும் பொதுமனுக்கள் பற்றிய குழுவின் தவிசாளருமான கௌரவ காமினி ரத்நாயக்க அவர்களுக்கு இச்சந்தர்ப்பத்திலே நான் எனது நன்றியையும் பாராட்டையும் தெரிவித்துக்கொள்ளுகின்றேன். அந்தக் குழுவிலே நானும் ஓர் உறுப்பினராக இருந்து அந்த விடயங்களை முன்னெடுப்பதையிட்டுப் பெருமை கொள்கிறேன்.

எங்களுடைய பொது மனுக் குழுவின் தவிசாளர் அவர்களை மாத்திரமல்லாமல், அக்குழுவைச் சார்ந்திருக்கும் அனைத்து உறுப்பினர்களையும் குழுவில் பணியாற்றும் உத்தியோகத்தர்களையும் இந்த இடத்திலே நாங்கள் பாராட்டியாக வேண்டும். ஏனென்றால், இந்தப் பாராளுமன்ற அவையின் நிலையியற் கட்டளைகளுக்கு அமைவாக இயங்கும் குழுக்களில், மிகக் கூடுதலான நேரம் உழைக்கின்ற அல்லது பங்களிப்புச் செய்கின்ற குழு என்று சொன்னால், அது பொது மனுக்கள் பற்றிய குழுவாகத்தான் இருக்கும். அந்த அடிப்படையில், கிடைக்கப்பெற்ற கிட்டத்தட்ட 2,000 மனுக்களில், 900க்கும் அதிகமானவற்றை விசாரணை செய்து, அவற்றில் 300க்கும் மேற்பட்ட மனுக்கள் தொடர்பான அறிக்கைகளை எங்களுடைய தவிசாளர் அவர்கள் பாராளுமன்றத்துக்குச் சமர்ப்பித்திருக்கின்றார் என்று நான் நினைக்கின்றேன்.

பொதுவாக அந்த விடயங்கள் தொடர்பாக ஆராய்கின்றபொழுது, உண்மையிலே அலுவலகங்களில் பணியாற்றியவர்கள் தங்களுக்கு ஏற்பட்ட பாதிப்புக்கள் சம்பந்தமாக அந்தந்த அலுவலகங்களால் தீர்வு காண முடியாத நிலையில், சம்பந்தப்பட்ட திணைக்களங்களுக்கும் அமைச்சுகளுக்குக்கும் தமது கோரிக்கைகளை அனுப்பி, அங்கும் அவர்களுக்கான தீர்வுகள் கிடைக்கப்பெறாத பட்சத்திலேயே பாராளுமன்ற உறுப்பினர் ஒருவர் மூலமாக இந்த கௌரவமிக்க சபைக்கு அதனைக் கொண்டுவருவதன் மூலம் அதற்கான தீர்வைப் பெற்றுக்கொள்ள எதிர்பார்க்கின்றனர் என்பதைக் காண முடிகின்றது. இவ்வாறு அவர்கள் எல்லோரும் எதிர்பார்க்கின்ற இந்த விடயம், இந்தப் பாராளுமன்றத்தின்மீது அவர்களுக்கு இருக்கின்ற நம்பிக்கையைப் பறைசாற்றுகின்றது. அவ்வாறான ஒரு விடயத்தைப் பொறுப்பெடுத்துச் செய்கின்ற எங்களுடைய கௌரவ பாராளுமன்ற உறுப்பினர் காமினி ரத்நாயக்க அவர்களது தலைமையில், எங்களுக்குக் கிடைக்கும் பல வினோதமான முறைப்பாடுகள் உட்பட அனைத்தையும் மிகப் பொறுமையாக கரிசனையோடும் கருணையோடும் விசாரணை செய்து, அதற்கான தீர்வுகளை முன்வைக்கின்ற ஒரு குழுவாக அத்தனைபேரும் செயற்படுகின்றார்கள். அதற்காக இந்தச் சந்தர்ப்பத்திலே அவர்கள் எல்லோருக்கும் மீண்டும் நன்றி கூறுகின்றேன்.

பொதுமக்களால் குழுவுக்கு மனுக்கள் சமர்ப்பிக்கப் படுவதாக இருந்தாலும், அவை பாராளுமன்ற உறுப்பினர்கள் ஊடாகவே இந்த அவைக்கு முன்வைக்கப்படுகின்றது. மக்களினால் தெரிவுசெய்யப்பட்டு இங்கே இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள், தாம் சார்ந்த கட்சி பேதங்களுக்கு அப்பாற் செயற்படுகின்ற ஒரு விடயமாக நாங்கள் இதனைப் பார்க்கின்றோம். இதேபோன்று, மாவட்ட ரீதியாக அல்லது பிரதேச ரீதியாக ஏற்படுகின்ற பிரச்சினைகளை கட்சி பேதங்களுக்கு அப்பால் அந்தந்தப் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் மாவட்ட மட்டக் கூட்டத்திலும் நாங்கள் முன்வைக்கின்றோம். இங்கே அம்பாறை மாவட்ட கரையோரப் பிரதேச அபிவிருத்திக்

குழுவின் தலைவரான கௌரவ ஆதம்பாவா அவர்கள் இருக்கின்றார். அதேபோன்று, ஏனைய மாவட்டத்தைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றார்கள். நாங்கள் எல்லோரும் சேர்ந்து அந்த விடயங்களை முன்வைக்கின்ற போதும் அவற்றை நடைமுறைப் படுத்துவதற்குச் சந்தர்ப்பங்கள் இல்லாதிருக்கின்றது. எனவே, அந்த விடயங்களை நாங்கள் எங்கே கொண்டுபோய்ச் சேர்ப்பது? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த விடயங்களை நீங்கள் கவனத்திற்கொள்ள வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கிறேன்.

கடந்த காலங்களிலே நாங்கள் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலே பல விடயங்களை முன்வைத்தோம். குறிப்பாக, இறக்காமம் பிரதேசத்துக்கு ஒரு சுற்றுலா நீதிமன்றம் தேவை என்று அந்த மக்களுடைய பிரச்சினையை முன்வைத்தபோது, அதற்கான அங்கீகாரம் இறக்காமம் பிரதேச செயலகத்தின் மூலமாகவும், அம்பாறை மாவட்டத் தினூடாகவும் கிடைக்கப் பெற்றது. அதற்குப் பிறகு என்ன நடந்தது என்பது இதுவரை தெரியாமல் இருக்கின்றது.

அடுத்து, ஒலுவில் துறைமுகப் பிரச்சினை! அந்தத் துறைமுகப் பிரச்சினைகள் ஒரு பக்கம் இருந்தாலும், அங்கே பாதிக்கப்பட்ட காணிச் சொந்தக்காரர்களுக்கு, தோட்ட சொந்தக்கார்களுக்கு நஷ்ட ஈடு வழங்கும் விடயங்களை நாங்கள் அங்கே முன்வைத்தோம். ஆனால், இதுவரைக்கும் அதற்கு என்ன நடந்ததென்று தெரியாமல் இருக்கின்றது.

அதுபோன்று, நெல் கொள்வனவு பற்றிய விடயத்தை எடுத்துக்கொண்டால், நிர்ணய விலையில் நெல்லைக் கொள்வனவு செய்ய முடியாதிருந்த சந்தர்ப்பம் பற்றி இங்கு கூறியபோது, நிந்தவூரிலே இருக்கின்ற நெற்களஞ்சிய சாலையின் புனரமைப்புக்கு 7 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டதென நான் நினைக்கின்றேன். இருந்தும், அதற்கான விலைமனு கோரப்பட்டபோது, ஒப்பந்தாரர்கள் தொடர்ச்சியாக நிராகரிக்கும் சந்தர்ப்பத்தையே நாங்கள் பார்க்கின்றோம். இந்த நிராகரிப்பால் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற விவசாயிகள் நெல்லை அரசின் நிர்ணய விலைக்கு விற்பனை செய்வதில் பல கஷ்டங்களை அனுபவிக் கின்றார்கள். இவ்வாறான சந்தர்ப்பத்தில் குறைந்த விலைக்கு நெல்லை விற்பனை செய்ய வேண்டி இருக்கின்றது. குறித்த அதிகாரிகள் இதிலே கவனம் செலுத்தாமையே இதற்கான காரணமாகுமென நாங்கள் நினைக்கின்றோம். இந்த விடயம் தொடர்பில் அவர்களால் கூறப்படுகின்ற காரணம், அதற்காக குறித்தொதுக்கப்பட்ட விலை நிர்ணயம் போதாது என்பதாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

எனவே, இன்றைய காலத்தின் விலை அதிகரிப்பைக் கவனத்திற்கொண்டு, இதற்காகக் கூடுதலான விலையை வழங்கி, இந்த வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன். இந்த விடயங்கள் தொடர்பில் எங்களுக்குப் பல முறைப்பாடுகள் கிடைத்தாலும் அவை அனைத்தையும் நாங்கள் இங்கே கொண்டுவந்து சேர்ப்பதில்லை. காரணம் என்னவென்றால், சில விடயங்களை மாவட்ட ரீதியாக அல்லது பிரதேச ரீதியாகத் தீர்த்துக்கொள்ளலாம் அல்லது உயர் அதிகாரிகள்மூலம் நடவடிக்கை எடுக்கலாம் என்பதனாலாகும்.

அடுத்து, அண்மைக் காலமாகச் சில திணைக்கள அதிகாரிகள், பெண் உத்தியோகத்தர்களுக்கு எதிராகச் செய்கின்ற செயற்பாடுகள் videos மூலமாகச் சமூக வலைத்தளங்களில் உலா வருவதை நாங்கள் பார்க்கின்றோம். அதை மிகவும் கேவலமான விடயமாக நாங்கள் பார்க்கின்றோம். அதாவது, பெண் உத்தியோகத்தர்களைத் தங்களுடைய அபிலாஷைகளுக்கு இணங்கி நடக்குமாறு பணிக்கின்ற சந்தர்ப்பங்களை அல்லது குறிப்பிட்ட இடத்தில்தான் பணிபுரிய வேண்டுமென்று கட்டாயப் படுத்துகின்ற சந்தர்ப்பங்களை மீறுகின்றபோது, அவர்கள் இடமாற்றம் செய்யப்படுகின்றார்கள்; தூர இடங்களுக்கு அனுப்பப்படுகின்றார்கள். இவ்வாறு செய்யும்போது, ஏனைய உத்தியோகத்தர்களும் அந்தத் திணைக்கள தலைவர்களுக்கு அச்சப்படுகின்ற ஒரு சூழல் இருக்கின்றது. அவ்வாறான ஒரு சம்பவம் நிந்தவூர் பிரதேச செயலகத்திலே அரங்கேறியிருப்பதாகவும், அந்தப் பிரதேச செயலகத்தின் தலைவராக இயங்குகின்ற லத்தீப் என்ற பிரதேச செயலாளர் மிக மோசமான நடத்தையைக் கொண்டிருக்கின்றார் என்றும் எங்களுக்குப் பல முறைப்பாடுகள் கிடைத்திருக்கின்றது. அவர் அங்கே இருந்துகொண்டு பழைய அரசியல்வாதிகளுக்காக அரசியல் செய்கின்ற ஒரு கூலியாளாகச் செயற்படுகின்றார் என்றும் அங்கே இருக்கின்ற நிர்வாக உத்தியோகத்தர்களுக்கு எதிராக, அவர்கள் உள ரீதியாகப் பாதிக்கப்படுமளவுக்குச் செயற்படுகின்றார் என்றும் பொதுமக்களும் உத்தியோகத் தர்களும் எங்களுக்குத் தெரிவிக்கின்றார்கள். எனவே, அரசு இந்த விடயத்தைக் கவனத்திற்கொண்டு, அவரைச் சரியாகத் திறம்படச் செயற்படச் செய்ய வேண்டும் அல்லது அவருக்கான உரிய இடத்தைத் தேர்ந்து கொடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்வதுடன், பொதுமக்களின் மனுக்களை ஆராய்கின்ற விடயத்தில் மேலும் கவனம் செலுத்துமாறும் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද ලලිත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තු ඉතිහාසයේ අලුත් පිටුවක් ලියන තත්ත්වයට අද පත්වෙලා තිබෙනවා. මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මමත් එම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. එම නිසා එහි තිබිච්ච ගුණාංග කොහොමද කියලා අපි දන්නවා. අපේ ගරු සභාපතිතුමාගේ ඉඳලා එය නියෝජනය කරන මහජන නියෝජිතයින්ගේ ගුණාංග අපි දැක තිබෙනවා. ඒ වාගේම, එම ස්ථානයට පැමිණි අයගේ ප්‍රතිචාරත් ගොඩක් වෙලාවට අපි දැකලා තිබෙනවා. ඒ සියල්ලත් එක්ක මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය තවදුරටත් ශක්තිමත්ව ඉදිරියට යන්න මේ විවාදය, මේ අවස්ථාව ශක්තියක් වේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා.

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී දැකපු ගොඩක් දේවල් තිබුණා. එම කාරක සභාවට සහභාගී වන ජනතාවගේ, බොහෝ විට රජයේ නිලධාරින් හැටියට වැඩ කරපු රාජ්‍ය සේවයේ හිටපු අයගේ අමාරුකම්, ඔවුන්ගේ ප්‍රශ්න, දුක්ගැනවිලි කන්දරාවක් මේ වෙනකොට අපි අහලා තිබෙනවා. ඒ වාගේම පසුගිය ආණ්ඩු පාලන කාලයන් හා සැසඳීමේදී ඊට අදාළ අවුරුදු 5ක කාල සීමාවේදී ලැබුණු පෙත්සම්වලට වඩා වැඩි ප්‍රමාණයක්, දසවන පාර්ලිමේන්තුවේ මේ ගෙවී ගිය කාලය තුළ අපට ලැබිලා තිබෙනවා. මගේ මතකය නිවැරදි නම්, මේ වන විට අපට පෙත්සම් 2,300 ගණනක් ලැබී තිබෙනවා. එයින් පෙත්සම් 999ක් ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු සඳහා යොමු කර තිබෙනවා. මේ සියලු කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් නිලධාරින් ඇතුළු අපේ ගරු සභාපතිතුමා කරගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනුවෙන් ගතවන කාලය, ඒ වැය වන ශ්‍රමය, ඉවසීම කොච්චර වටිනා මානව ගුණාංගයක් හැටියට ඒ වපසරිය තුළ විදහා දැක්වෙනවා ද කියලා අපි දන්නවා. එතැනදී මම දැකපු එක උදාහරණයක් මේ සභාවට මතක් කරන්න ඕනෑ.

එක්තරා දියණියක් තාත්තා කෙනෙක් එක්ක ආවා. ඒ අය ආවේ කොහේ ඉඳලා ද කියන එක මට නිශ්චිත නැහැ. හැබැයි, අසාධාරණයට ලක්වුණා කියන ඇයගේ ප්‍රශ්නය කියන්න සභායට තමන්ගේ තාත්තාවත් එක්කගෙන ඇවිල්ලා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඇය ඉදිරිපත් වුණා. ඒ නව යෞවනිය, තමන්ට මුහුණ දෙන්න වුණු ප්‍රශ්නය - අකටයුත්ත - ඇයගේ අදහසින් ම කාරක සභාවට ඉදිරිපත් කළා. සභාපතිතුමා ඇතුළු එහි සිටි සියලුම නිලධාරින් ඇයට ඒ පිළිබඳව විශ්වසනීය අදහසක් ඉදිරිපත් කළා. "ඔබට අසාධාරණයක් සිදුවෙලා නැහැ, මේ නිලධාරින් කියන විධියට බැංකුවේ සේවයට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට ඔබට සහභාගි වෙන්න නොලැබුණේ මෙන්න මේ කාරණා හින්දා" කියලා කොච්චර තහවුරු කරන්න හැදුවත් ඇය එයින් තෘප්තිමත් නොවුණු බව මට මතකයි. ඒ වාගේම දිදුලන ඇස්වලින් ඇය කියා සිටියා, තමන් ලෙහෙසියෙන් පරාජය භාර ගන්නේ නැහැ, අසාධාරණයක් වුණා නම් හඹාගෙන ගිහිල්ලා හරි ඒ අසාධාරණයට එරෙහිව කටයුතු කරනවා, ඒ සාධාරණත්වය වෙනුවෙන් තමයි මෙතැනට ආවේ කියන එක. අපිත් හැමදාම - ඉතිහාසය පුරාවටත්, වර්තමානයේත් - නියෝජනය කළේ අසාධාරණයට ලක්වන ජනතාව. අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට ඒ අය වෙනුවෙන් වැඩි නැඹුරුවක් දක්වනවා; ඒ අය දෙස දැඩි උනන්දුවකින් බලනවා.

එතැන සිදුවුණු කථා බහේ අවසානය මම මේ විධියට කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇයගේ ප්‍රශ්නයට උත්තරය වශයෙන් ඒ වෙලාවේ ලැබුණේ මොකක්ද? ඒක එහෙම තමයි, ඔබ අත්විඳින තත්ත්වයට, නැත්නම් ඔබට ඒ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වෙලා රැකියාවට යෑම දක්වා වූ කටයුතු සිදු නොවුණේ මෙන්න මේ හේතු නිසා කියලා සාධාරණ කාරණා ටිකක් එතැනදි හෙළිදරව් කළා. නමුත්, කොච්චර කිව්වත් ඇය එය පිළිගත්තේම නැහැ. බැංකුව නියෝජනය කරමින් ආ නිලධාරි මහත්වරුන් එක පැත්තක හිටියා. අනෙක් පැත්තේ සභාපතිතුමා හිටියා. මේ සිද්ධිය සභාපතිතුමාට මතක ඇති. ඇය, හොඳ අනාගතයක් තිබෙන කෙනෙක්. ඒ නිසා ඇයගේ හිත හදන්න ඕනෑ නිසා උපදේශනයක් දෙනවා වාගේ, එහෙම නැත්නම් බණ දහම් කියා දෙනවා වාගේ අපේ සභාපතිතුමා මැදිහත්වෙලා කාරණා ගණනාවක් කියලා අවසානයේදී මෙහෙම දෙයකුත් කිව්වා, "ඔය බැංකුවේ ගරු සභාපතිතුමා, විශ්වවිද්‍යාලයේ මාත් එක්ක එකට හිටපු යහළුවා, හැබැයි මම දන්නේත් නැහැ, මේ interview එක තිබුණා කියලා. ඒ තරමට ඒවා ප්‍රසිද්ධ කරලා, විනිවිදභාවයකින් කරන්නේ" කියලා. ඒ වාගේම සභාපතිතුමා කිව්වා, "බැංකුවේ සභාපතිට කථා කරලා මට මොනවාද කරන්න බැරි, එතුමා මාත් එක්ක එක room එකේ හිටපු කෙනා" කියලා. මම එහෙම කිව්වාට කමක්නැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි. එතුමා ඒ සම්මුඛ පරීක්ෂණ ගැන දැනගෙන හිටියේ නැහැ.

ඇමතිලාගේ ලේකම්ලා සහ ගෝලයෝ ටික ගිහිල්ලා රජයේ රැකියා විකුණන, රැකියාවකට පිටරට යනවා නම් එම රැකියාව සල්ලිවලට විකුණන පාලනයක් තමයි මීට කලින් තිබුණේ. ඒ කාලයේ නීත්‍යානුකූලව රැකියා දුන්නේ නැහැ, දෙන එකත් විකුණපු යුගයක් තිබුණේ. එහෙම පැවති කාලයකින් පසුව මෙහෙම යුගයක් බිහි වුණාට පස්සේ ජනතාවට ප්‍රසිද්ධියේ ම ගිහිල්ලා, විනිවිදභාවයකින් යුතුව සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වෙලා රැකියා ලබා ගැනීමට එක් අවස්ථාවක් විතරක් නොවෙයි, අවස්ථා එක්ලක්ෂ විසිදහසක් දැන් රජයෙන් ලබා දීලා තිබෙනවා. ඇයට, ඒ පිළිබඳව බලාපොරොත්තු තියාගන්න කියන ගමන් ම කිව්වා, මේක බොහොම විනිවිදභාවයකින් සිදුවුණු දෙයක් කියලා. මට මොනවාද කරන්න බැරි, නමුත් එතුමා එක්ක මම මේ ගැන කථා කළේ නැහැ කියලාත් සභාපතිතුමා කිව්වා. ගොඩක් කරුණු කථා වෙච්ච නිසා මම මේ උදාහරණයක් විතරයි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙලාවේ තවත් ආශ්චර්යවත් දෙයක් සිද්ධ වුණා. බැංකුව වෙනුවෙන් ඇවිල්ලා හිටපු නිලධාරිතුමෙකු නැඟිටලා බොහොම හැඟීම්බරව කිව්වා, "මමත් ඉතිහාසයේදී බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ ගණනාවකට සහභාගි වෙලා තිබෙනවා, නමුත් කිසිම කෙනෙකුගේ අතපෙවීමක් නැතිව, බලපෑමක් නැතිව, දේශපාලන බල අධිකාරියේ පීඩාවක් නැතිව විනිවිදභාවයෙන් සහ බොහොම නිදහසේ ඒ කටයුත්ත කරපු එකම අවස්ථාව මේක" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න හදන්නේ රජයේ රැකියා ලබා දීමේ ප්‍රතිපත්තිය වාගේ දේවල්වලදී විශේෂයෙන් විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්න ඕනැය කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය මදි වුණත් මේ ගැනත් මම කියන්න ඕනෑ. ජනතාව හැම ආකාරයකින්ම හිතලා බලලා හදාගත් ආණ්ඩුව ඉස්සරහට ගෙනයන්න අපි කටයුතු කරනවා වාගේම ජනතාවටත් විනයක් සහ ගුණයක් ඇතිව හැසිරෙන්න දැන් බල කෙරෙනවා. ඒ වාගේම නිලධාරීන්ටත් හැම ආකාරයකින්ම තමන්ගේ රාජකාරිය නිවැරදිව කරන්න බල කෙරෙනවා. බොහෝ වෙලාවට අපේ මහජන නියෝජිතයින් - ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් - පොලීසිය, හමුදාව පිරිවරා ගෙන ගියේ නැති වුණාට, ඒක නොහැකියාව, නොතේරුම්කම, බයාදුකම කියලා බොහෝ නිලධාරීන් හිතාගෙන ඉන්නවා නම් දැන් ඒ සිතුවිල්ලත් වෙනස් කරගන්න වෙනවා. මේ රටට හොඳ ගමනක් තිබෙනවා. වැටිච්ච රටක් තමයි නැඟිටලා මේ ඉස්සරහට යන්නේ. ඒ නිසා බොහොම සංවේදීව ජනතා ප්‍රශ්න අපි අහන්න ඕනෑ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ අපේ සභාපතිතුමා, කෑගල්ල දිස්ත්‍රික්කයේ නායකයෙකු හැටියටත්, ඉතිහාසයේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු කෙනෙකු හැටියටත්, පූර්ණකාලීන වෘත්තීය සමිති නායකයෙකු හැටියටත් ලබා ඇති අත්දැකීම් එක්ක තමයි මේ කාරක සභාව මෙහෙයවන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, මෙම කාරක සභාවේ හිටපු සභාපතිවරුන්ගේ නම් කිහිපයක්. එතුමන්ලාට අගෞරවයක් වන නිසා මම ඒ නම් කියන්නේ නැහැ. හැබැයි, දවල් දොළහමාරටත් තමන්ගේ ගෙදර ඉඳන් මේ කමිටුවට එන්නේ නැතුව, - නිලධාරින් ඇවිල්ලා දහයහමාර වෙනකල් වාඩි වෙලා බලාගෙන ඉන්නවා - ඒ ප්‍රශ්න පැය දෙකෙන් සාකච්ඡා කරන්නේ නැතුව මාරු වෙලා ගිය ඉතිහාසයකුත් මෙහි තිබුණා. ඒ සම්බන්ධයෙන් නිලධාරීන් සාක්ෂි

දරනවා. ඒ නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මේ නියෝජනය අඩිබවා යන නියෝජනයක් ඉතිහාසයේ තිබුණේ නැහැ. ඒ නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හරහා සිද්ධ වන මේ මහා සේවය ජනතාවට තවදුරටත් ලබා දීම සඳහා එහි සභාපතිතුමා ඇතුළු සියලුදෙනාට ශක්තිය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ පිළිබඳ විශ්වාසයෙන් තමන්ගේ ප්‍රශ්න සියල්ල මේ ආණ්ඩුවට ඉදිරිපත් කරන්න, ඒ සියලුම ප්‍රශ්නවලට උත්තර මතුවටත් තිබෙනවා කියන විශ්වාසය තබාගෙන ඉදිරියට යමු කියලා සියලු දෙනාට මා ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.35]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේක හරි වැදගත් යෝජනාවක්. සමහර විට මේ විවාදය ආරම්භ කරපු මන්ත්‍රීතුමා මේ පිළිබඳව මීට වඩා හරවත් කථාවක් කළාද දන්නේ නැහැ. මට ටිකක් පුදුම හිතුණා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කරන දේවල් පිළිබඳව. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපිත් කරන්නේ කොහොම හරි මෙතැනට ඇවිල්ලා ජනතාවගේ ප්‍රශ්නයක් කථා කළා කියලා ටීවී එකේ දමාගෙන ෂෝ වෙන එක. ඒක තමයි ඔක්කෝම අය කරගෙන ගියේ. ඔබතුමන්ලාගෙන් කීදෙනෙක් දන්නවාද දන්නේ නැහැ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, කැබිනට් මණ්ඩලයටත් වඩා බලයක් තිබෙන එකක් බව. එක්සත් රාජධානියේ රාජ්‍ය නිලධාරින් මහජනතාවට සිදු කරන අකරතැබ්බ, අසාධාරණ ගැන කථා කරන්න ඉස්සෙල්ලාම හදාගත්ත තැන - ඒ කමිටුව - තිබුණේ House of Lordsහි. ඒ කාලයේ රජතුමාට තිබුණා, ප්‍රභුවරුන්ගේ සභාවක්. ඒ ප්‍රභුවරුන්ගේ සභාවට පෙත්සමක් ඉදිරිපත් කළාම, ඒ ප්‍රභුවරුන් රජතුමා වෙනුවෙන් රජතුමාගේ නිලධාරින් කරන අකටයුතුකම් පිළිබඳව සඳහන් මහජනතාවගේ පෙත්සම් හොයා බලා ඒවාට සහන ලබා දුන්නා. ඒක තමයි පටන් ගැන්ම. එච්චර පැරණි ආයතනයක් තමයි ඔය Committee on Public Petitions කියන එක. ඊට පස්සේ reform Act එකක් - ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොවෙයි. මොකද, එක්සත් රාජධානියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නැහැ - ගෙනැල්ලා ආයතනික වශයෙන් නීතියට ඇතුළත් කළා. ඒ කාලයේ ලංකාවේ Soulbury Constitution එකටත් ඒක ඇතුළත් කළා.

ලංකාවේ හැටියට රජතුමා කියන්නේ, විධායකයේ ප්‍රධානියාට නේ. විධායකය සහ ඔහු යටතේ ක්‍රියා කරන, පරිපාලන කටයුතු සිදු කරන නිලධාරින් - administrative officersලා - විසින් මහජනතාවට සිදු කරන අකටයුතුකම් පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කරන්න ලැබෙන ස්ථානයක් තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ. ඊට පස්සේ ඇති කරගන්නා ලද රජයට විරුද්ධව රිට් ආඥා ලබා ගැනීම, මූලික අයිතිවාසිකම් නඩු ඉදිරිපත් කිරීම කියන කාරණා සියල්ලක්ම පොතේ හැටියට නැත්තටම නැති වෙන්න ඕනෑ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ඉතිහාසය පුරා තමන්ගේ කටයුතු හරියට කළා නම්. ඒ කියන්නේ, මේ කාරක සභාව එච්චර ලොකු බලයක් තිබෙන ස්ථානයක්. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, රටේ විධායක සහ පරිපාලන නිලධාරින් විසින් සාමාන්‍ය මහජනතාවට සිදු කරන අකටයුත්තක්, අසාධාරණයක් පිළිබඳව පෙත්සමක් මාර්ගයෙන් තමන්ගේ පැමිණිල්ල ඉදිරිපත් කිරීමට තිබෙන ස්ථානයක්. එම නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ලැබී තිබෙන ඒ බලතල ගැන අඩුවෙන් සලකන්න එපා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලතලවලට සමාන, රිට් ආඥා නිකුත් කරන අභියාචනාධිකරණයේ බලතලවලට සමාන සහ ඊටත් වඩා ප්‍රබල ස්ථානයක්. ඒගොල්ලන්ට පුළුවන්, ඕනෑම අකටයුත්තක් සඳහා අදාළ නිලධාරින් කැඳවා ඔවුන්ගෙන් ඒ අසාධාරණය පිළිබඳව අහන්න.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම තවත් කමිටු කිහිපයක්ම තිබෙනවා. මම හිතන විධියට, අද උදේ ඔබතුමන්ලා ස්ථාවර නියෝග 120 (4) යටතේ තවත් සංශෝධනයක් කළා. මට ඒ ගැන කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. 120වන ස්ථාවර නියෝගය යටතේ තවත් කමිටුවක් තිබෙනවා. ඒ කමිටුව තමයි, Committee on Public Enterprises. ඒකත් අකටයුතුකම් පිළිබඳව සොයා බලන කමිටුවක්. හැබැයි, අපරාධමය කටයුතු පිළිබඳව අධිකරණමය කටයුතු කිරීමට දැන් ඔයගොල්ලන් ස්ථාවර නියෝගයට යම්කිසි සංශෝධනයක් ගෙනාවා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාදයක් කරන්න පටන් ගත්තා. එතැන නම් ලොකු අවුලක් තිබෙනවාය කියන එක මට කියන්න වෙනවා. ඔබතුමන්ලා ඒකට අකැමැති වෙයි. සමහර විට පසුගිය ආණ්ඩුවල දූෂිතයන් අපරාධමය වශයෙන් කරපු වැරැදිවලට වග කියනවා වෙනුවට, පාර්ලිමේන්තුවේ විවාදයක් හරහා ඔවුන්ව වැරැදිකරුවන් කිරීමට තැත් කිරීම නම් එච්චර හොඳ වැඩක් නොවෙයි.

පාර්ලිමේන්තු ස්ථාවර කමිටු පිටුපස ඓතිහාසික කරුණු තිබෙනවා. ඒවා පිළිපදින්න ඕනෑ. ඇත්තවශයෙන්ම මම පළමු වරට පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේදීත්, නීති විද්‍යාලයේදීත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගැන ඉගෙන ගත්තා. ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කළා. නමුත් ඒකත් එච්චර සාර්ථක වුණේ නැහැ. මොකද, අද වනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ තිබෙන මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු සහ රිට් ආඥා නඩු වාගේම පළාත්බද මහාධිකරණවල තිබෙන රිට් ආඥා නඩු ප්‍රමාණය එකතු කරලා බැලුවාම පෙනෙනවා, මේ රටේ ජනතාව පුදුම කරදරයක ඉන්නේ කියන එක. අපි වාගේ නීතිඥ මහත්මයෙක් ඒ නඩු කථා කරන්න යොදා ගත්තොත් ඒ මිනිස්සුන්ට ලොකු වියදමක් යනවා. ඒක ලෙහෙසි නැහැ.

අනෙක් කාරණය මේකයි. නීතිඥ වෘත්තිය ගත්තාම, වෘත්තීයමය වශයෙන් ඉහළම සේවය ලබා දෙන වෘත්තිකයන් මේ වාගේ නඩු කථා කරන්න විශාල ගාස්තුවක් අය කරනවා. නමුත්, සාමාන්‍ය ජනතාවට රජයේ නිලධාරින්, විධායකය සහ පරිපාලනමය වශයෙන් සිදු කරන අකටයුත්ත සහ අසාධාරණය සම්පූර්ණයෙන් විසඳා ගන්න පුළුවන්. අධිකරණයේ නඩු ප්‍රමාද වීම ගැන ඔබතුමන්ලා කවුරු හරි හිතනවා නම්, අධිකරණයේ අනවශ්‍ය නඩු ගොඩක් තිබෙනවා කියාත් කවුරු හරි හිතනවා නම්, හොඳම වැඩේ තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මීට වැඩිය පුළුල් කරලා, මීට වැඩිය එය ඩිජිටල්කරණය කිරීම. මට දැන් ආරංචියි, ඔබතුමන්ලා සංගණනයක් කරලා, statistics එකක් අරගෙන ඇවිල්ලා පසුගිය වතාවට වඩා ලොකු ගණනක් dispose කරලා තිබෙනවාය කියලා. මම හිතන විධියට ඔබතුමන්ලා ඒවා වෙබ් අඩවිය හරහා ප්‍රචලිත කරනවා. එතකොට ඒකේ විනිවිදභාවයක් පෙනෙනවා. මම නම් ප්‍රාර්ථනා කරන්නේ ඊළඟ අවුරුදු කිහිපය තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ විෂය ධාරාව තවත් ටිකක් සාර්ථකව සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසයි. මේ යෝජනාව ඉදිරිපත් කිරීම හා ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය සාධනය සම්බන්ධව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා, විවාදයක් පවත්වන්නේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ පළමුවැනි වතාවටයි. මම හිතන විධියට, මේක ඓතිහාසික අවස්ථාවක්. ඒ සම්බන්ධව විවාද කරන මේ අවස්ථාවේදී මට කථා කරන්න කාලය ලබා දීම ගැන මම බෙහෙවින්ම සතුටට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025.01.01වැනි දා ඉඳලා 2026.07.15වැනි දා දක්වා කාලය ගත්තාම, පාර්ලිමේන්තුව දින 157ක් රැස් වෙලා තිබෙනවා. ඒ දින 157 තුළ මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව 63 වතාවක් මේ විධියට රැස් වෙලා තිබෙනවා. එතකොට අපි අටවන පාර්ලිමේන්තුව ගත්තොත්, පාර්ලිමේන්තුව රැස් වුණු අවුරුදු පහක කාලය තුළම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව රැස් වෙලා තිබෙන්නේ 120 වතාවයි. ඊට පස්සේ නවවන පාර්ලිමේන්තුව ගත්තොත්, 59 වතාවයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව රැස් වෙලා තිබෙන්නේ. දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මේ වනවිට පෙත්සම් 392ක විමර්ශනය අවසන් කරලා තිබෙනවා. අටවන පාර්ලිමේන්තුවත් මුළු කාලයටම - වසර පහටම - විමර්ශනය අවසන් කරලා තිබෙන්නේ පෙත්සම් 1,000ක පමණයි.

නවවන පාර්ලිමේන්තුව ගත්තොත්, වසර පහටම විමර්ශනය කර අවසන් කරලා තිබෙන්නේ පෙත්සම් 494යි. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, මහජනතාව වෙනුවෙන්ම වෙන් වෙච්ච, මහජනතාවට එන්න තිබෙන අවසන්ම තැන. ඒ කියන්නේ, නීත්‍යනුකූලව කටයුතු කරන ස්ථානවලට ගිහිල්ලා, අභියාචනාධිකරණ මණ්ඩලවලට ගිහිල්ලා, ඊට පසුව එන්න තිබෙන අවසන්ම තැන තමයි මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව. මහජනතාව තුළ විශ්වාසය වඩාත් වැඩිදියුණු කරන්න මේ දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වැඩ කටයුතු කරලා තිබෙනවා. මේ කාරක සභාව තුළ පෙත්සම්කරු, කාරක සභාව, අදාළ ආයතනය, අදාළ අමාත්‍යාංශය කියන පාර්ශ්ව තුනම ඉන්නවා. එතැනදී කථා බහ කරලා, අදාළ වැඩ කටයුතු කරලා තමයි අදාළ අමාත්‍යාංශවලට යෝජනා යවන්නේ. එහෙම යෝජනා යැව්වාට ඒ යවන නිර්දේශ ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා පෙර කථාවලින් අපට අහන්න ලැබුණා. පසුගිය කාලය බැලුවාම අපට පෙනෙනවා, තාක්ෂණික කරුණු මතත් කථා කරලා, දේශපාලන අවශ්‍යතා මතම ගොඩක් වෙලාවට රාජ්‍ය නිලධාරින්ට නිර්දේශ ලබා දීලා තිබෙන බව. "සානුකම්පිතව සලකා බලා පුළුවන් දෙයක් කරලා දෙන්න" වාගේ තීන්දු තීරණ දීලා තිබෙනවා. ඒ නිසා තමයි ගොඩක් වෙලාවට පසුගිය පාර්ලිමේන්තු තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක නොවෙන්න හේතු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අටවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සම් 4,160ක් යොමු වෙලා තිබෙනවා. නවවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සම් 722 යොමු වෙලා තිබෙන්නේ. දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට මේ වෙද්දී පෙත්සම් 2,233ක් යොමු වෙලා තිබෙනවා. ඒකෙන්ම පෙනෙනවා, දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් රටේ පොදු මහජනතාව තුළ කොපමණ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවාද කියලා. මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී එම කාරක සභාවට එන ආයතනයන්ගෙනුත් මම විශේෂ ඉල්ලීමක් කරනවා, ඒ කාරක සභාවට එද්දී යම් තීරණයක් ගත හැකි, යම් කරුණු - කාරණා ඉදිරිපත් කළ හැකි වගකිව යුතු නිලධාරිනුත් පැමිණෙන්න කියලා. මොකද, මම පෙර සඳහන් කළ පරිදි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කරන්නේ පෙත්සම්කරු, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සහ අමාත්‍යාංශයේ ඒ අදාළ ආයතනවල නියෝජිතයන් කියන පාර්ශ්ව තුන. නමුත් මෙතැනට ඇවිල්ලා කථා කළත්, අදාළ බලතල නැති කෙනෙක් වුණොත් අමාත්‍යාංශයට ගිහිල්ලා අදාළ කරුණු කාරණා දැක්වීමේදී පෙත්සම්කරුට අගතියක් වෙන්න පුළුවන්, ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක කරන්නත් බැරි වෙන්න පුළුවන්.

ඊළඟ කාරණය මේකයි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මාස තුනකට සැරයක් විමර්ශනය කළ පෙත්සම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරනවා. දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව මේ වෙද්දී වාර්තා තුනක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ ගරු කථානායකතුමා විසින් ඒක අදාළ අමාත්‍යාංශයට යොමු කළාම, ඒ අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් සති අටක කාලයක් තුළ ගන්නා ලද ක්‍රියාමාර්ගය පිළිබඳව හෝ ඒ දෙන ලද නිර්දේශය ක්‍රියාත්මක කරන්න බැරි නම් ක්‍රියාත්මක කරන විකල්ප ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක පිළිබඳව නැවත පාර්ලිමේන්තුවට දන්වනවා. මොකද, දසවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළ කරන විමර්ශනවලින් පසුව දෙන ලද නිර්දේශ ඒ අමාත්‍යාංශවලට යොමු කළාට පස්සේ අපි නිරන්තරයෙන් සොයා බැලීමක් කරනවා, මේ කාරක සභාව විසින් දෙන ලද නිර්දේශයන්ට මොකද වෙන්නේ කියලා.

ඒ එක්කම මම මේ ගරු සභාවෙන් ඉල්ලන්න කැමැතියි, ඔබතුමන්ලා සියලුදෙනාම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතුවලට ඉදිරියේදීත් සක්‍රියව සහභාගි වෙන්න, දායකත්වය ලබා දෙන්න කියලා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ලැබෙන පෙත්සම් ප්‍රමාණය එන්න එන්නම වැඩි වීම තුළ අපට ඒ කටයුතු digitalize කර ගැනීමට හැකියාවක් තිබෙනවා නම්, ඒ සඳහා අවශ්‍ය කරන සහයෝගය අදාළ අමාත්‍යාංශවලින්, අදාළ ආයතනවලින් වාගේම පාර්ලිමේන්තුවේ ඒ දත්ත සැකසුම් කරන අංශයෙන් ලබා දෙනවා නම්, අපට ඒ සඳහා online tracking system එකක් හදා ගන්න පුළුවන් නම්, ඒ වාගේම අදාළ පෙත්සම්කරුට හා පෙත්සම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට එම පෙත්සම කුමන අවස්ථාවේද තිබෙන්නේ යන්න පිළිබඳව SMS පණිවුඩයක් යවා ගන්න පුළුවන් නම්, මේ කාර්යභාරය තවත් වැඩිදියුණු කරලා, ජනතාවාදී රජයක් විධියට, ජනතාවට අන්තිමට එන්න තිබෙන තැන විධියට, පාර්ලිමේන්තුව තුළ මහජනතාවගේ කරුණු කථා බහ කරන්න තිබෙන එකම කාරක සභාව විධියට වඩා ඵලදායී සේවයක් මේ තුළින් වැඩිදුරටත් ඉටු කරන්න අපට පුළුවන් කියන යෝජනාවත් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.49]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩි 9ක් තිබුණා. තව එකක් වැඩි කළා කියලා කථා කරලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, බලන්නකෝ.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் நடைபெறுகின்ற பொது மனுக்கள் பற்றிய குழுவின் பணி மற்றும் செயலாற்றுகை தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு, மிக முக்கியமான விடயமொன்றைச் சொல்ல வேண்டும். நான் மிகவும் கவலையுடனேயே இதனைச் சொல்கின்றேன். நான் இதுவரை பாராளுமன்ற உறுப்பினராக கிட்டத்தட்ட இரண்டு வருடங்கள் இருந்திருக்கிறேன். அண்மையில் கிளிநொச்சி மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் நடந்த சம்பவம் பற்றி நான் இந்த இடத்தில் சொல்ல விரும்புகின்றேன்.

கிளிநொச்சி மாவட்டம் என்பது, இலங்கையிலே மிக மோசமாகப் பாதிக்கப்பட்ட மாவட்டம் என்பதையும், 22 barsஐக் கொண்டுவந்த பெருமையுடைய கௌரவ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

அவர்களுடைய மாவட்டம் என்பதையும், அதிகுறைந்த வருமானத்தைக் கொண்ட மாவட்டம் என்பதையும், தமிழீழ விடுதலைப் புலிகளின் இதயமாக இருந்த ஒரு தேசம் என்பதையும் நான் இங்கு நினைவுபடுத்த விரும்புகின்றேன். இன்றைக்கு கிளிநொச்சி மண் எந்தவோர் அபிவிருத்தியும் இல்லாமல் படுமோசமாக மாறியிருக்கிறது. அந்த வகையில், கிளிநொச்சியிலிருந்து இதுவரைக்கும் தெரிவு செய்யப் பட்டிருக்கும் பாராளுமன்ற உறுப்பினர்களுடைய அடிப்படை அறிவு தொடர்பாக நாங்கள் மிகவும் கவலைப்படுகின்றோம்.

குறித்த ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்துக்கு முதல்நாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சிறீதரன் அவர்களுடன் 31 ஊழல்வாதிகள் திட்டமிட்ட ரீதியில் சந்திப்பை ஏற்படுத்தியிருந்தனர். அதன் விளைவாக, GA முரளிதரன் அவர்கள் ஒவ்வொரு கமக்கார அமைப்புக்கும் தலா இரண்டு பேருக்கு அக்கூட்டத்தில் கலந்துகொள்வதற்கு அனுமதி கொடுத்திருந்தார். அதன் அடிப்படையில் அவர்கள் அங்கு அமர்ந்திருந்தார்கள். அன்றைய தினம் நான் 7 files கொண்டுவந்தேன். அது அவர்களுக்குத் தெரியும். அவர்களில் ஒருவர்தான் முத்து சிவமோகன் என்பவர். அவர் பதிவு செய்யப்படாத கிளிநொச்சி கமக்கார அமைப்பின் தலைவராவார். அவருடைய ஊழல்கள், அவருடைய வீட்டுக்குப் போடப்பட்ட பாலம், வேழமாலிகிதன் என்று சொல்லப்படுகின்ற கரைச்சி பிரதேச சபை தவிசாளரின் அண்ணனுக்குக் கொடுக்கப்பட்ட 170 தென்னங்கன்றுகள், அதற்குச் செலவழிக்கப்பட்ட 600 மில்லியன் ரூபாய், எங்களுடைய தம்பி இளங்குமரன் அங்கு கடலை நாட்டிய videos என்பவற்றுடன் தொடர்புடைய தாராளமான ஆதாரங்களுடன்தான் நான் அன்றைய தினம் கூட்டத்துக்குச் சென்றிருந்தேன்.

கவலை என்னவென்றால், எங்களுடைய மதிப்புக்கும் அன்புக்கும் பாசத்துக்கும் உரிய அமைச்சர் சந்திரசேகர் அவர்கள் அன்றைய தினம் என்னைப் பார்த்து,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்று கேவலமாகச் சொன்னதுதான். வடக்கு மாகாணத்தில் சுயேச்சைக் குழுவில் போட்டியிட்டு, மக்களுடைய வாக்குகளால் தெரிவு செய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர் நான்! இலங்கை வரலாற்றில் கடந்த 76 வருடங்களில் முதன்முதலாக கட்சி அடிப்படையில் அன்றி சுயேச்சைக் குழுமூலம் மக்களால் தெரிவு செய்யப்பட்ட ஒரு பாராளுமன்ற உறுப்பினர் நான்! தேசியப்பட்டியல் ஊடாகப் பாராளுமன்றத்துக்கு வந்து அமைச்சரான கௌரவ சந்திரசேகர் அவர்கள் மிகக் கேவலமாக என்னை நடத்தினார். என்னை நோக்கிய அடக்குமுறையாகவோ அல்லது விமர்சனமாகவோ அதனை நான் பார்க்கவில்லை. ஏனென்றால், அன்று நான் மிகவும் அமைதியாகவே உட்கார்ந்திருந்தேன். நான் யாரையும் அடிக்கவுமில்லை; ஏசவுமில்லை. பாராளுமன்ற உறுப்பினரான என்னை அங்கிருந்து வெளியேற்றுமாறு பொலிஸாருக்குச் சொன்னபோது, "அப்படி வெளியேற்ற முடியாது" என பொலிஸார் சொன்னார்கள். இந்த நிலைமைக்குத்தான் அரசாங்கம் போயிருக்கின்றது.

நான் உங்களுக்கு ஒன்றைச் சொல்ல விரும்புகின்றேன். இன்று கிளிநொச்சி மாவட்டம் இந்த நிலைமைக்கு வந்திருப்பதற்கு முக்கிய காரணம், கிளிநொச்சி மாவட்டத்தில் முழுக்க முழுக்க நிறைந்திருக்கின்ற ஊழல்கள்தான். வடக்கு மாகாணத்தில் சுகாதாரத்துறையில் நிறைய ஊழல் இடம்பெற்றிருக்கிறது. இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவில் முறைப்பாடு செய்யவில்லையா? என்று இவர்கள் கேட்பார்கள். அவ்வாறு கேட்கின்ற அதிபுத்திசாலிகளுக்குச் சொல்கின்றேன். தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற ஊழல் தொடர்பாக நான் இரண்டு வருடங்களுக்கு முன்னரே அந்த ஆணைக்குழுவில் முறைப்பாடு செய்திருக்கிறேன். அதேபோல், சாவகச்சேரி ஆதார வைத்தியசாலையில் 17 மில்லியன் ரூபாய் மோசடி இடம்பெற்ற சம காலத்திலேயே நான் அது தொடர்பாக அந்த ஆணைக்குழுவில் முறைப்பாடு செய்திருக்கிறேன். எனினும், கடந்த இரண்டு வருடங்களாக எந்தவித விசாரணையும் நடக்கவில்லை. என்னைப் பொறுத்தவரை, அவை பொதுமக்களுக்குத் தெரியப்படுத்தப்பட வேண்டும் என்ற முக்கியமான நோக்கத்துக்காகவே நான் DCC meetingக்குப் போகிறேன்.

இதைவிட முக்கியமாக, நீங்கள் ஒரு விடயத்தைப் பார்க்க வேண்டும். வடக்கு மாகாணத்தைப் பொறுத்தவரைக்கும், வைத்தியர் கேதீஸ்வரன் அவர்களால் கிருஷ்ணபுரத்தில் COVID-19 centreஐக் கட்டும்போது இடம்பெற்ற ஊழலும், மருதங்கேணியில் COVID-19 centreஐக் கட்டும்போது இடம்பெற்ற ஊழலும் மிகப் பெரிய ஊழல்களாக இருக்கின்றன. இந்த இரண்டு ஊழல் நடவடிக்கைகள் தொடர்பிலும் விசாரிக்கப்பட்டு, வடக்கு மாகாண சுகாதாரத்துறையின் internal auditஆல் தயாரிக்கப்பட்ட audit report என்னிடம் இருக்கிறது. அந்த audit reportஇல் இவர் குற்றவாளியாக இனங்காணப்பட்டு இருக்கிறார். எனினும், முன்னர் இருந்த வடக்கு மாகாண ஆளுநர் ஒருபோதுமே இவருக்கு எதிராக நடவடிக்கை எடுக்கவில்லை. இந்த ஊழல் சம்பந்தமான inquiry reportஐ மூடுமாறு ஒரு கடிதம்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

போடப்பட்டு அந்த விடயம் மறைக்கப்பட்டிருக்கிறது. இதே வைத்தியர் எனக்கு எதிராக பருத்தித்துறை நீதிமன்றத்தில் தாக்கல் செய்த வழக்கில், இதை நான் ஆதாரமாகக் கொடுப்பதற்குத் தயாராக இருக்கிறேன். தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் மில்லியன் கணக்கான காசு 2013ஆம் ஆண்டு தொடக்கம் 2023ஆம் ஆண்டு வரை சேர்க்கப்பட்டதற்குரிய ஆதாரங்களை எங்களுடைய மதிப்புக்குரிய நீதிபதி லட்சுமி அவர்களுக்கு நான் சமர்ப்பித்திருந்தேன்.

சமூக ஊடகத்தைப் பாவித்து சமூகத்தில் விழிப்புணர்வை ஏற்படுத்துகின்ற ஒருவனுக்கு எதிராக Online Safety Actஇன்கீழ் வழக்குத் தாக்கல் செய்யப்படுகின்றபோது, வழங்கப்படுகின்ற தீர்ப்பை சமூகம் உதாரணமாக எடுத்துக்கொள்ளக் கூடாதென நான் சொல்ல விரும்புகின்றேன். எனக்கு எதிராகத் தாக்கல்செய்யப்பட்ட அந்த வழக்கின் தீர்ப்பில், குறித்த வீடியோவை remove பண்ண வேண்டும் என்ற கட்டளை மட்டுந்தான் எனக்கு இடப்பட்டது. இதன்மூலம் சமூகத்துக்காகக் குரல்கொடுக்கின்ற ஒருவனுடைய குரல்வளையை நசுக்கினால், அதன் விளைவுகள் படுமோசமானதாக இருக்கும். வேறு யாரும் இந்தச் சமூகத்திலிருந்து அந்த மக்களுக்காகப் போராட மாட்டார்கள் என்பதை நான் உங்களுக்கு இந்த இடத்தில் சொல்கின்றேன்.

அடுத்து, வேழமாலிகிதன் என்று சொல்லப்படுகின்றவரின் அண்ணன் உச்சமாலிகிதன் மீது பசளை விடயத்தில் மிகப் பெரிய ஊழல் நடைபெற்றிருப்பதாக புகார் இருக்கிறது. அதைவிட, எங்களுடைய முரளிதரன் அவர்கள் ஆறு ஒன்றை map பண்ணியிருக்கிறார். 'தித்வா' புயல் ஏற்பட்டபோது, இது நடந்ததாகச் சொல்லப்பட்டிருக்கிறது. இந்த ஊழல் தொடர்பான தகவல்கள் என்னிடம் இருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 9ක් තිබුණා. ඒක පොඩ්ඩක් බලන්න.

මම මේ කාරණය සිංහලෙන් කියන්න ඕනෑ. එදා ඇවිල්ලා මට අපේ ඇමති කෙනෙක්, මේ රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා මම DCC meeting එකේදී මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැන අහපු වෙලාවේදී, මට ප්‍රශ්න අහන්න දෙන්නේ නැතුව,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මට එළියට යන්න කියලා බණිනවා කියන්නේ- අනුර කුමාර දිසානායක මැතිතුමා, ඔබතුමන්ලා තමයි අපට කිව්වේ, මේ රටේ වංචා, දූෂණ සම්බන්ධයෙන් ඔබතුමන්ලා කටයුතු කරනවා, කොයි ආකාරයකින් හෝ කොහේ හෝ ෆයිල් එකක් තිබෙනවා නම්, අරගෙන එන්න කියලා. අපිත් ඒක විශ්වාස කරලා, මම ඇවිල්ලා වංචා, දූෂණ සම්බන්ධයෙන් තිබෙන Commission එකට complaint එකක් දැම්මා. ඊට අමතරව, මම ළඟ පහක්, හයක් තිබෙනවා. ඒවා ගැනත් මම ජනාධිපතිතුමාට ලියුමක් දැම්මා. ජනාධිපතිතුමා නලින්ද ජයතිස්ස ඇමතිතුමාට ලියුමක් දැම්මා, ඒක ගැන විමර්ශන කරන්න කියලා. දැන් අවුරුදු දෙකක් ගිහිල්ලාත් ඒ එක විමර්ශනයක් කරලා නැහැ.

උතුරේ Jaffna Teaching Hospital එකේ බෙහෙත් ගබඩාව පිච්චුවා. ඒක ගැන කිසි විමර්ශනයක් අද වෙනකම් ගිහිල්ලා නැහැ. ඒක ගැන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අපි කථා කරන්න යනකොට ජනාධිපතිතුමනි, පොඩ්ඩක් හිතලා බලන්න, අපි වාගේ Parliament Membersලාට කිසි ආරක්ෂාවක් දෙන්නේ නැතුව ඔබතුමන්ලාගේ මැර කල්ලි ඇවිල්ලා - ඒ වීඩියෝ බලන්න. ඒ වීඩියෝවල තිබෙනවා - අපට ගහනවා. ඒ වීඩියෝවල ඒක තිබෙනවා. අපට ආරක්ෂාව දෙන්නත් බැහැ කිව්වා. අන්තිමට අපට ගිනි අවි දීලා ඒක එළියට ගත්ත එකට නඩුවක් දාලා හිර කළා. ඒ නිසා මම විශ්වාස කරනවා, අපේ ජනාධිපතිතුමා නිකම් අර යෝෂිත රාජපක්ෂගේ පරණ 2009, 2013 කාලයේ ගහපු බඩුවක් හොයාගෙන ඇවිල්ලා statements අරගෙන, ඒවා කරන්නේ නැතුව, උතුරේ ඇති වෙන්න තිබෙනවා, වංචා දූෂණ. අපි ඒක පෙන්වලා දෙනවා. අන්තිමට වෙන්නේ අපිව,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා.

හැබැයි, ඕෂල හේරත් කියන පුද්ගලයා ගිහිල්ලා මාව පාර්ලිමේන්තුවෙන් එළියට දාන්න නඩුවකුත් දාලා තිබෙනවා. ඒකෙන් අපේ දෙමළ ජනතාව විශ්වාස කරන්නේ, සිංහල ජනතාව උතුරේ ඉඳන් කවුරු හරි ස්වාධීනව ආවාම කැමැති නැහැ, ඒ නිසා මේ වාගේ ඉවත් කරනවා කියලා වැරදි මතයක් යනවා. හැබැයි, මම වැඩි කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ නැහැ. ඔබතුමාට වැඩි කාලයක් කරදර කරන්නෙත් නැහැ. තව සති දෙකයි, සති තුනයි ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරමු, අවසන් කරමු.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා.

ඒ නිසා කරුණාකරලා හිතලා බලන්න, කවදාවත් මේ වාගේ වෙනම ස්වාධීනව, political background එකක් නැතුව ආව එකම පුද්ගලයාව ඔයගොල්ලෝ නඩුවක් දාලා පාර්ලිමේන්තුවෙන් ඉවත් කරනවා කියන්නේ සිංහල ජනතාව පොඩ්ඩක් හිතන්න ඕනෑ, කවදාවත් ඔයගොල්ලන්ට ඇත්ත කියන්න-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවසන් කළා. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නන්දන පත්කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.58]

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සර්ව ආගමික වදනක් තිබෙනවා, පිපාසිතයාට වතුර දෙන්න, නිරුවතින් සිටින කෙනාට වස්ත්‍ර දෙන්න, අනාථයාට පිහිට වෙන්න, අසාධාරණයට ලක් වූ කෙනාට සාධාරණය ඉෂ්ට කර දෙන්න කියලා. අපි විශ්වාස කරනවා, පාර්ලිමේන්තු ඉතිහාසයේ රටේ ජනතාවගේ විශ්වාසය දිනා ගත්ත, ඒ අසාධාරණයට ලක් වූ ජනතාවට පිහිට වෙන එකම පාර්ලිමේන්තුව, මේ දසවෙනි පාර්ලිමේන්තුව කියලා.

අපි දන්නවා, පාර්ලිමේන්තුව කියන්නේ නීති හදන තැනක් විතරක් නොවන බව. ජනතාවගේ දුක්ඛ පීඩාවට පිහිට වෙන තැනක් බවට මේ පාර්ලිමේන්තුව පත්විය යුතුයි කියා අපි විශ්වාස කරනවා. අන්න ඒ නිසාම මේ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අද මේ වෙනකොට ඒ වැඩ කොටස ඉෂ්ට කරමින් පවතිනවා. රටේ ඈත දුෂ්කර පළාත්වල ජීවත් වෙන දේශපාලන පළි ගැනීම්වලට ලක් වෙච්ච, ඒ වාගේම නිලධාරිවාදයේ සපත්තුවට යට වුණු බොහෝ ජනතාවක් අපි නිරන්තරයෙන් දකිනවා. ඒ වාගේම පොලීසියට ගිහිල්ලා අසාධාරණයට ලක් වුණු, පොලීසියට ගිහිල්ලා වැඩක් නැති වුණාම, අමාත්‍යාංශයට ගිහිල්ලා ඒ නිලධාරීන්ගේ අසාධාරණයට ලක් වුණාම, ඒ ලිපිගොනුවල අතරමං වුණාම, ඒ වාගේම තමන්ට දේශපාලන හයියක් නැති වුණාම, මන්ත්‍රී කෙනෙක්, ඇමති කෙනෙක් හඳුනන්නේ නැති වුණාම, අතේ සල්ලි නැති වුණාම, නීතිඥයෙකුට ගෙවන්න අතේ මුදල් නැති වුණාම, ජනතාවට එහෙම නැත්නම් ඒ දුක්ඛ වේදනාවට, පීඩාවට පත් වෙච්ච කෙනාට එන්න තිබෙන එකම තැන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ගත්තොත්, ඒ අසාධාරණයට ලක් වෙච්ච පීඩිතයාට, පුරවැසියාට සහනය පතා එන්න තිබෙන එකම දොර මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවයි කියා අපි විශ්වාස කරනවා. එහි විශේෂත්වයන් කිහිපයක් තිබෙනවා. ඕනෑම ලේකම්වරයෙකු, ප්‍රධාන ලේකම්වරයෙකු, එහෙම නැත්නම් පොලිස්පතිවරයා වුණත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවන්න අවශ්‍ය බලය ස්ථාවර නියෝග 125 (9) මඟින් එම කාරක සභාවට ලැබී තිබෙනවා. ඒ වාගේම, එහි පක්ෂ පාට භේද, ජාති ආගම් භේද කිසිවක් නැහැ. එතැන ඉඩ තිබෙන්නේ ඒ ඉදිරිපත් වන ජනතාවගේ ප්‍රශ්නයට විතරයි. ඒ වාගේම තමයි, රුපියලක්වත් වියදම් නොකර තමන්ට සාධාරණය ඉල්ලා සිටින්න පුළුවන් එකම තැන බවට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පත් වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තු ඉතිහාසය තුළ, අපේ රටේ වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගැන කියපු අවස්ථා කිහිපයක් තිබෙනවා. එක් අවස්ථාවක එතුමා කියා තිබෙනවා, "පෙත්සමක් කියන්නේ, කඩදාසියක් විතරක් නොවෙයි, එක පවුලක බලාපොරොත්තුවක්" කියලා. ඒ කියන්නේ, එම කාරක සභාවට ඉදිරිපත් කරන පෙත්සම නිකම් කඩදාසියක් විතරක් නොවන බවයි. සමහර විට ඒ පෙත්සම තුළ තිබෙන්නේ අසාධාරණයට ලක් වෙච්ච එක පවුලක දුක, දොම්නස සහ කඳුළ. ඒ විතරක් ද නොවෙයි. එතුමා කියනවා, "නිලධාරිවාදයට පාඩමක් උගන්වන්න පුළුවන් එකම තැන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවයි" කියලා. ඒ වාගේම එතුමා කියනවා, "රාජ්‍ය යන්ත්‍රණයේ දූෂණයට සහ ප්‍රමාදයට තිබෙන එකම බය මේ කමිටුවයි" කියලා. මේවා කියා තිබෙන්නේ අපේ රටේ වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමායි.

විශේෂයෙන්ම අද පවතින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවත්, ඉතිහාසයේ නවවන, අටවන, හත්වන පාර්ලිමේන්තුවල පැවැති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා දෙසත් ආපසු හැරී බැලීමක් කළොත්, ඉතාම කනගාටුවෙන් තමයි ඒවා ගැන කථා කරන්න වෙන්නේ. නමුත් අද තිබෙන - දසවන පාර්ලිමේන්තුවේ - මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගත්තොත්, එහි සභාපති ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා යටතේ එහි සාමාජිකයන් වන අපි සියලුදෙනා එම කාරක සභාවේ කටයුතු නිසි වෙලාවට ආරම්භ කරනවා. එහි රැස්වීමේ ආරම්භය යොදාගෙන තිබෙන්නේ උදේ 10.30 නම්, අපි ඒ නියමිත වෙලාවටම - උදේ 10.30ටම - එම කාරක සභාව ආරම්භ කරනවා. හැබැයි, ඉතිහාසයේ එම කාරක සභාව තුළ කටයුතු කළ ආකාරය ගත්තාම, එම කාරක සභාවේ සභාපතිවරයා සමහර විට ගෙදරින් පිටත් වන්නේත් උදේ 10.30ට. එතෙක් තම පෙත්සම විභාග කරවා ගන්න එන පෙත්සම්කරු පැය ගණනක් එතැනට වෙලා කඳුළු සලමින් ඉන්නවා. නුවරඑළිය, බදුල්ල, මඩකලපුව වැනි ඈත දුෂ්කර ප්‍රදේශවල සිට මේ කාරක සභාවට සහභාගි වෙන්න පාර්ලිමේන්තුවට පැමිණියත්, පෙත්සම විභාග කරන්න එම කාරක සභාවේ සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරු පැය ගණනක් යනකල් පැමිණෙන්නේ නැහැ. අද එහෙම නොවෙයි. වත්මන් ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වෙන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට වෙලාව පිළිබඳ සීමාවක් නැහැ. දවල් ද, හවස ද කියා බලන්නේ නැතිව දිනට නියමිත සියලු පෙත්සම් විභාග කරලා, අගතියට, අසාධාරණයට ලක් වෙච්ච ජනතාවට සාධාරණය ඉෂ්ට කරනවා. එදා එහෙම නොවෙයි සිදු වුණේ. එදා කොහොමද සිදු වුණේ? සමහර විට උදේ 10.30ට නොවෙයි, 11.30ට කාරක සභාවේ කටයුතු පටන් අරගෙන එය පැය දෙකතුනක් ඇතුළත අවසන් කරනවා. එහෙම නැත්නම් එදාට කාරක සභාව පවත්වන්නේ නැතිව අවලංගු කරනවා. ඒ විධියට පාර්ලිමේන්තු ඉතිහාසය තුළ පැවැති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවලදී පෙත්සම්කරුවන් විශාල ලෙස අසාධාරණයට ලක් වෙච්ච අවස්ථා ගැන අපි අහලා තිබෙනවා.

ඒ විතරක් ද නොවෙයි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී තමන්ගේ පාක්ෂිකයන්, එහෙම නැත්නම් තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර තිබෙන පෙත්සම්වලට වැඩිපුර අවස්ථා හදා දෙමින් පක්ෂග්‍රාහීව කටයුතු කළ අවස්ථා පිළිබඳවත් අපි අහලා තිබෙනවා. හැබැයි, අද එහෙම වෙන්නේ නැහැ. අද සියල්ලන්ටම සාධාරණය ඉෂ්ට වෙමින් තිබෙනවා. පෙත්සම්කරු මොන දේශපාලන පක්ෂයේ කෙනෙක්ද කියන එක අද පාර්ලිමේන්තුවේ පවතින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අදාළ නැහැ. ඒ නිසා අද කෙනෙකුට ලොකු හැන්දෙනුත්, තව කෙනෙකුට පොඩි හැන්දෙනුත් බෙදන්නේ නැහැ. එකම හැන්දෙන් බෙදන තත්ත්වයක් තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තුළ අද තිබෙන්නේ. ඒ නිසා මහජන පෙත්සම්

[ගරු නන්දන පත්මකුමාර මහතා]

පිළිබඳ කාරක සභාව අද කාගේත් අවධානයට ලක් වෙච්ච, කාගේත් විශේෂ ප්‍රශංසාවට ලක් වෙච්ච තැනක් බවට පත් වෙලා තිබෙනවා.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරයෙක් වන ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා කියා තිබෙනවා, "ජනතාවගේ කඳුළු පිසදාන්න තිබෙන තැන තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව" කියලා. බුදු වදන අනුව නම් එය "පරදුක්ඛ දුක්ඛිත" යනුයි. අනුන්ගේ දුකේදී කම්පාවට පත් වීම ගැනයි එයින් කියා තිබෙන්නේ.

මා ඉහතින් ද කී පරිදි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අද විශේෂ අවධානයට ලක් වෙලා තිබෙනවා. එය අසාධාරණයට ලක් වුණු ජනතාවට ඉතාම හොඳින් සාධාරණය ඉෂ්ට කරමින් තිබෙනවා. පෙර පැවැති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීම් පවත්වා තිබෙන වාර ගණන, විභාග කරලා තිබෙන පෙත්සම් ප්‍රමාණය ගත්තාම මේ වසර එකහමාර තුළ අපේ ක්‍රියාකාරිත්වයේ වෙනසක් තිබෙනවා. ඒ කියන්නේ, අද ඉතා සාධනීය තැනක මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තිබෙනවා. අසාධාරණයට ලක් වුණු ජනතාවට, රාජ්‍ය යන්ත්‍රණය තුළ අසාධාරණයට ලක් වුණු පුරවැසියන්ට අදටත් වඩා හොඳින් සාධාරණය ඉෂ්ට කරන තත්ත්වයට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හෙට දින පත් කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.05]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉතිහාසය තුළ බලය මෙහෙයවපු ආණ්ඩු පාර්ලිමේන්තුවේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරන ලද දූෂණ, වංචා සහ අක්‍රමිකතා සිදුවීම් පිළිබඳව සාම්ප්‍රදායිකව, සම්මත ආකාරයට පාර්ලිමේන්තුවට වාර්තාව ඉදිරිපත් කළාට, ඒ කිසිම ආණ්ඩුවක් ඒ සිදුවීම්වලට සම්බන්ධ වෙච්ච වග උත්තරකරුවන්ට ඉතිහාසයේ කවදාවත් නීතිමය ක්‍රියාමාර්ග අරගෙන නැහැ. මෙන්න මේ නිසාම, ඉතිහාසය පුරා ඒවාට සම්බන්ධ වෙලා, මහජන මුදල් ගසා කාලා, විනාශ කරලා, රට ප්‍රපාතයට හෙළපු මිනිස්සු දේශපාලනඥයින්ගේ පිහිටෙන් අද ඉතාම සුහදව ජීවත් වන තත්ත්වයක් තිබෙනවා. ඒ යථාර්ථය දැකලා කටයුතු කළා නම්, ඒ ගසා කාපු මහජන මුදල් ඒ හොරුන්ගෙන්, ඒ මංකොල්ලකාරයන්ගෙන් අය කර ගත්තා නම් අපේ රට මේ වාගේ මහා අගාධයකට වැටෙන්නේ නැහැ. එහෙම වුණා නම්, අපට හොඳ රටක් සහ හොඳ හෙටක් බිහි කර ගන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කියන්න ඕනෑ ඒ කාලයේ නිකුත් කරපු COPE වාර්තා දෙකක් ගැන. එකක් 2007දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත්, අනෙක 2017දී නීතිපතිතුමාටත් යවලා තිබෙනවා. හැබැයි COPE එකෙන් ඉදිරිපත් කළ ඒ වාර්තාවලට කිසිදු ඵලදායක ක්‍රියාමාර්ගයක් අරගෙන නැති බවයි පැහැදිලි වන්නේ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතු සහ කාර්ය සාධනය පිළිබඳව පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේ මෙවැනි විවාදයක් ඉතිහාසයේ කවදාවත් අරගෙන නැහැ. එහෙම නම්, මෙන්න මේක තමයි ඒ ස්වර්ණමය අවස්ථාව, පළමුවෙනි අවස්ථාව. මේ අවස්ථාව උදා කිරීමේ අවස්ථාව මේ රටේ ජනතාව ජන වරම මඟින් ජාතික ජන බලවේග ආණ්ඩුවට හෙවත් අපේ රජයට ලබා දුන්නා. ජාතික ජන බලවේගය ආණ්ඩුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පත් කරපු සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් සෑම කෙනෙක්ම, ඒ වාගේම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරමින් ක්‍රියා කරන නිලධාරින් සෑම දෙනාම ඒ කර්තව්‍යය පළමුව කිරීම තුළ ඉතිහාසගත වෙනවා. අන්න එහෙම තමයි මහජනතාවගේ ආණ්ඩුවක් වන අපේ ආණ්ඩුව කටයුතු කරන්නේ. විපක්ෂයේ අයත් එය ආදර්ශයට අරගෙන, වහසි බස් දොඩන්නේ නැතිව, වැල යන පැත්තට මැස්ස ගහන්නේත් නැතිව අප යන මේ ගමනට ආශීර්වාද කරන්න කියන විශේෂ ඉල්ලීම අපි මේ අවස්ථාවේදී කරනවා.

බුදු බණෙහි කියැවෙනවා, "පරදුක්ඛේ සති සාධූනං හදය කම්පනං කරෝතී ති කරුණා" කියලා. මා දකින විධියට, මා විශ්වාස කරන විධියට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ එවැනි කරුණාබර හදවත් ඇත්තන්ගේ හෙවත් දුග්ගන්නා රාළලාගේ තෝතැන්නක්; දුග්ගන්නා රාළලාගෙන් සැදුම්ලත් මහා මෙහෙයුම් කාමරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය අවධානයට යොමු කරන්න ඕනෑ. ඒ තමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් දෙන්නේ නියෝගයක් නොවෙයි, නිර්දේශයක් කියන එක. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලබා දෙන ඒ නිර්දේශය ක්‍රියාත්මක කරන්න දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් අනිවාර්යයෙන්ම බැඳිලා ඉන්නවා. ඒ අය ඒ නිර්දේශ ක්‍රියාත්මක නොකරනවා නම් ඒකට ඉතාම සාධාරණ සහ යුක්තිසහගත හේතු ඉදිරිපත් කරන්න ඕනෑ. අපි ඔවුන්ට අවස්ථා තුනක් දෙනවා. ඔවුන් ඒ අවස්ථා තුන මඟ හරිනවා නම් අපි විශ්වාස කරනවා, එය ගරු කථානායකතුමාගේ බලතල අනුව පත් කළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශවලට සහ ව්‍යවස්ථාදායකයට කළ අගරු කිරීමක් විධියට. ඒ අයගේ ඒ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් අපට ක්‍රියාමාර්ග තුනක් ගන්න පුළුවන්. එක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට කැඳවලා ඔවුන් දෝෂ දර්ශනයට ලක් කරන්න පුළුවන්. දෙක, පාර්ලිමේන්තුවට කැඳවලා දෝෂ දර්ශනයට ලක් කරන්න පුළුවන්. තුන, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අයිතිය තිබෙනවා අධිකරණ ක්‍රියාමාර්ගවලට ගිහිල්ලා ඒ අයට නිසි දඬුවම් ලබා දීලා පෙත්සම්කරුවන්ට යුක්තිය ඉෂ්ට කරන්න. ඒ කාරණයට මා විශේෂයෙන්ම අවධානය යොමු කරනවා.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමා විසින් ආයතන ප්‍රධානීන්ට අනිවාර්යයෙන්ම කල් තියා පෙත්සම්කරුවන්ගේ පෙත්සම් ලිපි ගොනුව යවනවා. ඒක යැව්වාට පස්සේ ඒ අය එම ලිපි ගොනුව සම්බන්ධයෙන් අතීත, වර්තමාන සහ අනාගත තත්ත්ව පිළිබඳව අනිවාර්යයෙන්ම සූදානම් වෙලා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට එන්න ඕනෑ. සමහර නිලධාරින් ගැන කියන්න හරිම කනගාටුදායකයි. ඒ ගැන අපට අත්දැකීම් තිබෙනවා. ඒ පෙත්සම්කරුවන් නිලධාරින්ට වඩා සූදානමින් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අර නිලධාරින් පෙත්සම්කරුවන්ගේ කරුණු ඉදිරියේ අභියෝගයට ලක් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විධියට එතැනදී අපිත් අසරණභාවයට පත් වනවා. අපි ඒ වාගේ අවස්ථාවල පෙත්සම්කරු බැහැර කරලා ඒ නිලධාරින්ට කියනවා, මේ විධියේ අකටයුතුකම්වල යෙදෙන්න එපා, එහෙම

වුණාම ඔයාලාත් හැල්ලු වනවා, අපිත් හැල්ලු වනවා, මේ කටයුත්ත ගෙන යන්න බැහැ කියලා. එම නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට එනකොට නිලධාරින් ඒ කාරණය සම්බන්ධයෙන් සූදානම් වෙලා ආ යුතුයි කියලා මා විශේෂයෙන්ම අවධාරණය කරනවා.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කළාට පසුව යම් පිළිවෙතක් තිබෙනවා. ඒ කියන්නේ, අදාළ මන්ත්‍රීවරයා විසින් පෙත්සම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක් සිදු වන ක්‍රියාවලියක් තිබෙනවා. එම ක්‍රියාවලියේදී සමහර පෙත්සම්වලට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමා හා කාර්ය මණ්ඩලය විසින් විශාල කාලයක් ගන්නවා. මම ඒ වාගේ අවස්ථාවල දුරකථනයෙන් කථා කරලා කියනවා, මෙච්චර කාලයක් ගන්න එපා කියලා. සාමාන්‍යයෙන් මාස 08ක්, 09ක්, 10ක්, 12ක් විතර ගන්නවා. එහෙම වුණායින් පස්සේ පෙත්සම්කරු අපෙන් අහනවා, ප්‍රශ්න කරනවා, "ඇයි මේ පෙත්සම තවම විභාග කළේ නැත්තේ?" කියලා. අපි කාරක සභාවට කථා කරලා ඇහුවාට පස්සේ කියනවා, තවම සූදානම් නැහැ කියලා. අපි ඒක පෙත්සම්කරුට කියන්නේ නැහැ. අපි කියනවා, හෙට අනිද්දාම ඒ පෙත්සම ඉදිරිපත් කරනවා කියලා. එම නිසා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නිලධාරින්ගේ අවධානය අපි විශේෂයෙන්ම යොමු කරවනවා, මේ පිළිබඳවත් සැලකිලිමත් වෙන්න කියලා.

පෙත්සම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමා විසින් ඒ සමහර පෙත්සම්වල කරුණු ආයතන ප්‍රධානීන්ට යවනවා තොරතුරු ගන්න. යවලා, එයාලාට දෙනවා ඒ පිළිතුරු එවන්න කාල රාමුවක්. ඒ කාල රාමුව සමහර වෙලාවට ආයතන ප්‍රධානීන් සැලකිල්ලට ගන්නේ නැහැ. පළමුව, දෙවෙනුව හා තුන්වෙනුව ඒ අයට සිහි කැඳවීම් කළාට පසුව තමයි උත්තර එවන්නේ. ඒකෙන් පෙත්සම්කරුවන්ට ලොකු අගතියක් වනවා. එම නිසා විශේෂයෙන්ම ආයතන ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරවනවා, මේ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙලා අනිවාර්යයෙන්ම නිසි වෙලාවට උත්තර එවන්න කියලා.

ඒ වාගේම නිලධාරින්ගේ යම් යම් ආකාරයේ පැහැදිලි කිරීම් නිසා පෙත්සම්කරුවන් අගතියට පත් වන අවස්ථා තිබෙනවා. එවිට ඔවුන්ගේ බලාපොරොත්තු බිඳ වැටෙනවා. ඒ වාගේ අවස්ථාවල අපට සිද්ධ වෙනවා, අනිවාර්යයෙන්ම ඒ ගැන සැලකිලිමත් වෙලා අර නිලධාරිනුත් ආරක්ෂා කරලා, සානුකම්පිතව සලකා බලා, සමහර ඒවාට අමාත්‍ය මණ්ඩල තීරණ අරගෙන ඔවුන්ට යුක්තිය ඉෂ්ට කරන්න. ඒ නිසා විශේෂයෙන්ම අපි ඒ කාරණය අවධාරණය කරන්න ඕනෑ.

ගාමිණී රත්නායක සහෝදරයා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට කටයුතු කරනවා. මගේ අවුරුදු 24ක පාර්ලිමේන්තු ඉතිහාසයේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ විවිධාකාර සභාපතිවරු එක්ක වැඩ කටයුතු කර තිබෙනවා. එක්තරා අවස්ථාවක මමත් සභාපති ලෙස මුලසුන අරගෙන තිබෙනවා. මම දැකපු ඉතිහාසය තුළ මානව හිතවාදී විධියට සූදානම් වෙලා ඇවිල්ලා ඉතා නිවැරදි තීන්දු ක්‍රියාත්මක කරන පළමුවන සභාපති විධියට මෙතුමා ඉතිහාසගත වනවා. මෙතුමා ඉතා මැනවින් ඒ කාර්යය ඉෂ්ට කරනවාය කියන එක මම මේ මොහොතේදී අවධාරණය කරන්න ඕනෑ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා, රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා ගැන කථා කරන්න මම කාලය කා දමන්නේ නැහැ. මට කියන්න තිබෙන්නේ මේකයි. "නැහැදෙන එකා ගුණ දහමින් වෙලුවත්-උගේ ගතිය නාරියි මැරුවත්" කියලා තමයි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්. පෙත්සම් විභාගයට ගැනීමේදී සභාපතිතුමා, සාමාජික මහජන නියෝජිතයන්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය මොනම ආකාරයකින්වත් නීතිය මුල්කරගෙන කටයුතු කරන්නේ නැහැ. අපි ඒවාත් බලනවා. නමුත්, අපි මානව හිතවාදී විධියට මානුෂිකව කල්පනා කර බලලා සාධාරණව යුක්තිය ඉෂ්ට කිරීමට මැදිහත් වනවා. අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය ඉතාම මැනවින් දිගින් දිගටම සිදු කිරීම තුළින් මහජනතාවගේ සුබසිද්ධිය සහතික කරනවාය කියන එක මේ මොහොතේ පැහැදිලි කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩබ්ලිව්.එම්.එම්. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.17]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සුබ උපන් දිනයක් ප්‍රාර්ථනා කරනවා.

මහජනතාවගේ වේදනා වෙනුවෙන්, මහජනතාවට වන අසාධාරණ වෙනුවෙන් කටයුතු කරන්න තිබෙන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳව අද සිදු කරන විවාදයට මගේත් අදහස් දැක්වීමට අදහස් කරනවා. ඇත්තටම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, මට පෙර කථා කළ මන්ත්‍රීතුමන්ලා කියපු විධියටම ජනතාවට සිද්ධ වන අසාධාරණකම් පැමිණිලි ලෙස ඉදිරිපත් කළාම, ඒවා පරීක්ෂා කරලා බලලා ඒ වැරදි නිවැරදි කරන්න අදාළ ආයතනවලට නිර්දේශ යොමු කරන කොමිසම කිව්වොත් නිවැරදියි.

පළමුව මම කැමැතියි, ආණ්ඩුවට යෝජනාවක් කරන්න, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් ඉදිරිපත් කරන නිර්දේශ අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරනවා ද කියලා බලන්න, පසු විපරමක් කරන්න ක්‍රමයක් සකස් කරන්න කියලා. අසරණ ජනතාවගේ පැමිණිලි විභාග කළාට පස්සේ සැබෑවටම ඔවුන්ගේ අපේක්ෂාවලට, ඔවුන්ට සිදු වූ අසාධාරණකම්වලට පිළිතුරක් ලැබුණා ද කියලා පසු විපරමක් සිදු කිරීම අත්‍යවශ්‍ය යැයි කියා මම හිතනවා.

වර්තමාන ජනාධිපතිතුමා කලින් කිව්වා කියලා මන්ත්‍රීතුමෙක් කිව්වා, නිලධාරිවාදය මඟින් සිදු වන අසාධාරණයට පිළිතුර තිබෙන්නෙත් මේ කාරක සභාවේ කියලා. ඉතින්, මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, වර්තමාන ජනාධිපතිවරයා මන්ත්‍රී ලෙස ඉන්නකොට දැකපු නිලධාරිවාදය අවසන් කරන්නට මේ වසර දෙකක කාලසීමාව තුළ ජනාධිපතිවරයා සහ ආණ්ඩුව ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා. ඒක ඉදිරි කථාවකදී මේ රටට, මේ සභාවට හෙළි කරනවා නම් ඒකත් වඩා සුදුසුයි කියලා මම හිතනවා.

ඒ වාගේම මේ විවාදයේදී ඇහුණු දෙයක් තමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වඩා වඩාත් ශක්තිමත් කරන්න අනෙකුත් ආණ්ඩු කාලසීමාවට වඩා මේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක වෙච්ච බව. ඒක ඇත්තටම සතුටට කාරණාවක්.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

හේතුව, ලංකාවේ බිහි වෙච්ච සෑම ආණ්ඩුවක්ම යම් යම් දේවල් කරපු නිසා තමයි අද මේ රට මේ විදියට අපට ලැබුණේ. මේ ආණ්ඩුව බලයට එන්න කලින් මොකුත්ම කළේ නැහැ, මේ ආණ්ඩුව විතරයි ඔක්කොම කළේ වාගේ කියන ආණ්ඩුවකයි, මීට කලින් හිටපු ආණ්ඩුත් බොහෝ දේවල් කළා කියන පක්ෂයක ඉන්න සාමාජිකයකුයි අතර සිදු වන සංවාදයක් තමයි මේක. ඒ නිසා මේ ආණ්ඩුවේ ඒ වාගේ අලුත් ඵලදායි වැඩ සිද්ධ වීම අපි අගය කරනවා. කලින් ඒවා අගය නොකරන ජේවීපී කුහකත්වය අපි තුළ නැති නිසා ඔබේ මහන්සිය, උත්සාහය අප අගය කරනවා. මේ වාගේ අසාධාරණකම් පිළිබඳව කථා කරමින්, මෙම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තව තවත් ශක්තිමත් කරන්න ගතහැකි ක්‍රියාමාර්ග ගන්න කියා ඉල්ලමින් මම ඊළඟ කාරණාවට යොමු වෙන්නම්.

අද දවසේ විවාදයට ගත් තවත් කරුණක් තමයි, COPA එකේ සහ COPE එකේ නීතිමය ක්‍රියාකාරිත්වය පිළිබඳව. ඒකට අදාළව මට කියන්න තිබෙන දේත් මම කියන්නම්. මට කලින් කථා කළ මන්ත්‍රීතුමාගේම අදහස ගත්තොත්, නීතිපති දෙපාර්තමේන්තුවට මේක යොමු කළාම ඒවා විභාග වෙලා නැහැ කියලා කියනවා. එහෙම නම් උත්තරය විය යුත්තේ මොකක්ද? එම ආයතන වඩාත් කාර්යක්ෂමව, ශක්තිමත්ව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ටික දෙන්නට ඕනෑ. එහෙම නැතුව, නීතිපති දෙපාර්තමේන්තුව සතුව පවතින, අධිකරණය සතුව පවතින, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතුව පවතින, ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින ක්‍රියාන්විතයන් සහ ක්‍රියාකාරිත්වයන් පාර්ලිමේන්තුවට ගැනීම නොවෙයි. ඒවාට අවශ්‍ය නීති, අණපනත් ක්‍රියාත්මක කරන්න තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. හැබැයි, මේ මොහොතේ කරන්න උත්සාහ කරන්නේ, මෙතැනදී ඇති වන ගැටලු COPA එක හෝ COPE එක හරහා විසඳන තැනක් බවට පත් කරන එකයි. එතැනදී ඇති වන ප්‍රධාන ප්‍රශ්නය තමයි මේ සාකච්ඡාවට, එහෙම නැත්නම් මේ පරීක්ෂණයට දායක වන රාජ්‍ය නිලධාරින්ට තමන්ගේ පැත්තෙන් අදහස් ඉදිරිපත් කරන්න ඒ මොහොතේ අවස්ථාවක් නොලැබීම. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රී කණ්ඩායමේ අභිමතය පරිදි සහ ඒ මොහොතේදී එන අදහස්වලට අනුව තමන්ගේ කරුණු ඉදිරිපත් කිරීම තමයි දිගින් දිගටම දකින්නට ලැබෙන්නේ.

මේ දක්වා තිබුණු ආණ්ඩුත්, මේ ආණ්ඩුවත් පාර්ලිමේන්තුවේ විවිධ කමිටු හරහා තමන්ගේ බලය පවත්වාගෙන යන්න විවිධ උපායමාර්ග ක්‍රියාත්මක කළා, ඒ වාගේම ක්‍රියාත්මක කරමින් ඉන්නවා. උදාහරණයක් විදියට කිව්වොත්, මේ ආණ්ඩුව බලයට එන්න කලින් හැමදාම කෑ ගහපු කාරණයක් තමයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න කියන එක. පෙර පැවැති ආණ්ඩු රාජ්‍ය බලය පවත්වාගෙන යන්න මේ පනත භාවිත කළා කිව්වා. ඉතින්, ඒක දැනුත් භාවිත කරනවා. ඊට අමතරව Online Safety Bill එක, ඒ වාගේම ICCPR පනත, තමන්ගේ දේශපාලන ප්‍රතිවාදීන්ට එරෙහිව භාවිත කළා. වර්තමානයේදී මේ ආණ්ඩුවත් COPE එක, COPA එක වගේ කමිටු හරහා කරන්නේ ඒ වැඩේම තමයි. ආණ්ඩුව ජනප්‍රිය දේශපාලන මතවාද දිගේ ඉදිරියට යන්න දරන උත්සාහයක් මිසක්, එහෙම නැතුව ඇත්තටම මේ හරහා රටට වැඩක් කරන්න දරන උත්සාහයක් හැටියට නොවෙයි මම මෙය දකින්නේ. එම නිසා මගේ කථාව තුළින් මේකට කෙළින්ම විරෝධතාව පළ කරනවා.

විශේෂයෙන්ම අවශ්‍ය කරන ජනප්‍රිය දේශපාලන සටන් පාඨවලට අදාළ කමිටු භාවිත කරන්න උත්සාහ කරමින්, "මිතුරන්ට සෑම දේ, නීතිය සතුරන්ටයි" යන කියමන වර්තමාන ආණ්ඩුව බොහොම අපූරුවට ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මම එහෙම කිව්වත්, විපක්ෂය පැත්තෙන් ඒ සඳහා යෝජනාවක් තිබෙන්නට ඕනෑ නේ. යෝජනාව තමයි විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තොරතුරුවලට අනුව COPE එක හෝ වෙනත් ඕනෑම කමිටුවක් හරහා විමර්ශන සිදු කළාට පස්සේ, ඒ විමර්ශනයෙන් අනතුරුව පෙර ආකාරයටම ඒක නීතිපති දෙපාර්තමේන්තුවට යවලා, එම දෙපාර්තමේන්තුව හරහා අධිකරණය මඟින් ඒ වැරැදිවලට දඬුවම් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියන එක. ඒක කරන්න මොනවා හෝ ප්‍රායෝගික ගැටලු තිබෙනවා නම්, කාර්යක්ෂමතාව අඩුයි නම්, නිලධාරින්ගේ ප්‍රශ්න තිබෙනවා නම්, මූල්‍යමය ප්‍රශ්න තිබෙනවා නම්, ඒ වාගේම පහසුකම් අඩුයි නම්, කරුණාකරලා ඒවාට මුදල් වෙන් කරන්න. එහෙම නැතුව, ක්‍රියාත්මක වීමට තිබෙන වෙනත් ආයතන අඩපණ කරලා, ඒ සියල්ල පාර්ලිමේන්තුව පැත්තට අරගෙන සෘජුව කටයුතු කරන්න අවශ්‍යතාවක් නැහැ. එහෙම නම් පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතුව එක්වරම නීතිපති දෙපාර්තමේන්තුව හරහාම නඩුවකට ගියා නම් ඊට වඩා හොඳයි. උසාවියට යවන්න ඕනෑ වැඩ නීතිපති දෙපාර්තමේන්තුව හරහා පාර්ලිමේන්තුවට අරගෙන ජනප්‍රිය දේශපාලනය ක්‍රියාත්මක කරන්න උත්සාහ දැරීමක් තමයි ඊට හේතුව විදියට මම දකින්නේ. අපි ක්‍රියාත්මක කරන්නට යන්නේ මෙහෙම නම් මොකකක්ද තත්ත්වය? 1988-1989 කාලයේ ඔබ වෙනුවෙන් නිර්මාණය වුණු සින්දු තිබෙනවා. එක තැනක මෙවැනි පද පේළියක් තිබෙනවා, "කුමට එරට අධිකරණය නීතිය හා විනිසුරන්" කියලා. මම ජේවීපී එකෙන් අහන්න කැමැතියි, තවමත් ඔබ "පවන" ගී ප්‍රසංගවල යන සින්දුවලට එකඟද? එකඟ නම්, ඔබ මේ ක්‍රියාත්මක වෙන්නේ ඒ ගීතවලට එරෙහිවයි, එදා කියපු දේවල්වලට අංශක 180ක් විරුද්ධවයි. එදා පාලකයන්ට ඔබ ගීතවලින් කියපු කාරණා ටික සහ ඔබ එකඟ වෙච්ච දේවල්වලට විරුද්ධ වැඩක් තමයි ඔබ මේ කරමින් ඉන්නේ. එම නිසා ඔබ තවමත් "පවන"ට එකඟද කියලා මේ මොහොතේ මම අහන්නට කැමැතියි.

ඊළඟට මම කියන්න කැමැතියි, මෙන්න මේ කාරණයත්. මෙය ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කරන අවස්ථාවක්. එම නිසා ජනප්‍රිය දේශපාලනය ආණ්ඩුවේ සිටියදී ඔබව සතුටු කරන අතර, පාලන බලය ගිලිහී ගිය පසු එහි වේදනාව බොහෝ සෙයින් ඔබට දැනෙන්න ඉඩ තිබෙනවා. මේක තවදුරටත් විග්‍රහ කළොත්, පසුගිය දවස්වල COPE එක හරහා ගල් අඟුරු වංචාව විමර්ශනය වුණු විදිය අපි දැක්කා. ආණ්ඩුවේ නියෝජිතයන් එතැනදී වංචාවක් සිදු වුණේ නැති බව ඒත්තු ගන්වන්නට දරන උත්සාහය රූපවාහිනී තිරය හරහා රටම දැක්කා. ඕනෑම ආණ්ඩුවක් එහෙමයි. තමන්ගේ ආණ්ඩුව ඇතුළේ මොනම හරි වරදක් සිදු වුණාම පුළුවන් තරම් උත්සාහ කරනවා, ඒක එහෙම වුණේ නැහැ කියලා කියන්න. හැබැයි, ඔබේම "සිරස" නාළිකාව ඊයේ කියනවා මම දැක්කා, මේකෙන් බිලියන 4.5ක් - කෝටි 450ක්, ලක්ෂ 45,000ක් - පාඩු වුණා කියලා. ගල්අඟුරු වංචාවෙන් වෙච්ච පාඩුව ලක්ෂ 45,000ක්. මම ඔබතුමන්ලාගෙන් මේ ප්‍රශ්නය අහනවා. ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන, දූෂණය, නාස්තියට විරුද්ධව කථා කරන ආණ්ඩුවක්. කෝ, මේ වෙනුවෙන් බොහොම ඉක්මනින් නීතිය ක්‍රියාත්මක වෙනවාද? ඔබතුමන්ලා කියනවා, පරණ ආණ්ඩු කාලයේ ඒ දේවල් කාර්යක්ෂම නැහැ කියලා. කෝ, මේ ආණ්ඩුවේ කාර්යක්ෂමතාව? එහෙම නම්, මේකෙන් පෙන්නුම් කරන්නේ ඔබතුමන්ලා නැවත වතාවක් ඔබතුමන්ලාගේ පාලන බලය පවත්වාගෙන යන්නට දූෂණය, වංචාව, නාස්තිය කියන දේවල් මෙවලමක් ලෙස පාවිච්චි කරනවා මිස ඇත්තට මේ දේවල් නවත්වන්න උත්සාහ කරන්නේ නැහැ කියන එකයි. එහෙම උත්සාහ කරනවා නම් මේ වෙද්දී ඔබතුමන්ලා කන්ටේනර් 323 පිළිබඳව අදාළ නිලධාරින්ට, ඇමතිවරුන්ට, ඒවාට නිර්දේශ කරපු අයට නීතිය ක්‍රියාත්මක කරලා ඉවර වෙන්න ඕනෑ.

ඊට අමතරව, මම පෙර සඳහන් කරපු ගල්අඟුරු වංචාවෙන් ලක්ෂ 45,000ක් විනාශ කරපු අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන්න ඕනෑ. ඉන්ධන වැඩි මිලට ගත්තා කියලා වෙන රටක ඉන්න පුද්ගලයෙකු, වෙන බැංකුවක ඉන්න ප්‍රධානියෙකු කියන කල් මේ පාර්ලිමේන්තුව හෝ වෙන කිසිම තැනක් ඔබතුමන්ලා දැනුවත් කළේ නැහැ. එහෙම නම්, ඒ දේවල්වල සිදු වෙච්ච මූල්‍යයන්වල විගණනයන් ඔබතුමන්ලා සිදු කරලා තිබෙනවාද? කෝ, ඔබේ අවංකභාවය? කථා කළාට එහෙම දේවල් වෙනවාද?

පසුගිය කාලයේ plug bases වගයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හයි කරන්න ගිහිල්ලා ළඟටම ඇවිල්ලා නතර කර ගත්තා, ඒ වංචාව මාධ්‍ය හරහා හෙළි වෙච්ච නිසා.

අවසාන වශයෙන් මේක ගැනත් මම පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ. "Rebuilding Sri Lanka" කියලා අරමුදලක් ඔබතුමන්ලා නිර්මාණය කළාය කිව්වා. ඒකට තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච කරදරවලට අවශ්‍ය අයට උදව් කරන්න මුදල් දාන්න කියලා කිව්වේ. අග්‍රාමාත්‍යතුමිය එක අවස්ථාවක පාර්ලිමේන්තුවේ කියනවා, "එහෙම ගිණුමක් භාණ්ඩාගාරයේ තිබෙනවා. ඒක සුරක්ෂිතව තිබෙනවා. හැබැයි, ඒක "Rebuilding Sri Lanka"නොවෙයි කියලා. ඒකෙන් මොකක්ද කියැවෙන්නේ? මේක හරියට නිකම් අර වෙසක් කාලයට පිං පත්‍රයක් අරගෙන ගිහිල්ලා නැති දන්සලක් වෙනුවෙන් ගමෙන් සල්ලි එකතු කරනවා වාගේ වැඩක්. සල්ලි තිබෙනවා. "Rebuilding Sri Lanka" කියලා එකක් නැහැ. මම නැවත ඔබතුමන්ලාට කියනවා, මේ සියල්ල අනාගත ආණ්ඩුවක ඔබතුමන්ලාට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවන වැඩ බව. හැබැයි, මම නැවත කියන දේ තමයි ඔබතුමන්ලා අද ජනප්‍රිය දේශපාලනය වෙනුවෙන් මේ දේවල් භාවිත කළාට, ඔබතුමන්ලා මේකේ ඵලවිපාක විඳිද්දී ඔය දේවල් මතක තියා ගන්න කියන එක.

ඊළඟ කාරණය මෙයයි. දූෂණය, නාස්තිය, හොරකම නැවැත්වූවාම සියල්ල සාර්ථක වෙනවා කියන දේශපාලන සටන් පාඨයෙන් තමයි ඔබතුමන්ලා බලය ගත්තේ. මම ඔබතුමන්ලාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මට දැන ගන්න ලැබිච්ච වාර්තාවක් තිබෙනවා. ගිය අවුරුද්දේ රූපවාහිනී සංස්ථාව පාඩුයි. ස්වාධීන රූපවාහිනිය පාඩුයි. ගුවන් විදුලි සංස්ථාව පාඩුයි. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව පාඩුයි. සතොස කෝටි 53ක් - ලක්ෂ 5,300ක් - පාඩුයි. ශ්‍රීලන්කන් එක පාඩුයි. දුඹුරු සීනි කඩ දාන්න ආපු ලංකා සීනි සමාගම ලක්ෂ 32,000ක් පාඩුයි. මේ සල්ලි ටික හොරකම් කරන්නේ කවුද කියන එකයි මම අහන්නේ. මීට කලින් හිටපු ආණ්ඩුවල මෙහෙම පාඩු සිද්ධ වුණා කියලා කියපු ගමන් අනුර කුමාර මහත්තයා මේ සභාවේ ඉඳලා කිව්වේ මොකක්ද? "මේවා හොරකම් කරනවා, මේ ඇමතිවරු හොරකම් කරනවා" කියලා කිව්වා. මම අහන්නේ මේකයි. දිගින් දිගටම මේ පාඩු සිද්ධ වෙනවා නම් මේ සල්ලි හොරකම් කරන්නේ කවුද? හොරකම් කරන්නේ නැත්නම් පාඩු සිද්ධ වෙන්නේ කොහොමද? අතීතයේ වෙච්ච පාඩු, හොරකම් නිසා සිද්ධ වෙච්ච ඒවා වෙන්නයි; ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ වෙච්ච පාඩු, හොරකම් නිසා සිද්ධ වෙච්ච ඒවා නොවෙන්නයි තිබෙන තර්කය මොකක්ද? ඔබතුමන්ලා ඉදිරිපත් කරපු සියලු තර්ක සම්බන්ධ මේ කරුණු කාරණාවලින් පැහැදිලි වෙනවා, ඒවා සියල්ල බලය දිනා ගැනීම උදෙසා මිසක්, වෙනත් කිසිදු කාරණාවක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොවෙයි කියන්නේ කියලා.

මම අවසාන වශයෙන් මේ ඉල්ලීම කරනවා. ගැටලුවක් ආපු මොහොතේදී QR system එකක් ගෙනාවා. QR system එකක් ගෙනැල්ලා මිනිසුන්ගේ ගමන් මාර්ගය සීමා කළා. මේ වෙද්දී ලෝක වෙළඳ පොළේ ඉන්ධන මිල අඩු වෙලා තිබෙනවා. ඉන්ධන මිල අඩු වෙලා තිබෙද්දීත් ඔබතුමන්ලා QR system එක අයින් කරලා නැවත මිනිසුන්ගේ සාමාන්‍ය ජීවිතය ගෙන යන්න උදවු කරන්නේ නැත්තේ ඇයි? ඔබතුමන්ලාට අවශ්‍ය මිනිසුන්ගේ ජීවිත සීමා කරන්නද? ඔබතුමන්ලා කියන දේවල් ප්‍රායෝගිකවත් කළොත් මේ රට ලස්සන වෙයි. හැබැයි, ඔබතුමන්ලා හදන්නේ අණපනත් පාලන තන්ත්‍රයේ දිගටම පවත්වාගෙන යන්න නම්, ඒකේ ඵලවිපාක ඔබතුමන්ලා කියන 76 වසර ඇතුළේම අතීතයෙන් ගන්න තිබෙන පාඩම්වලින් ඉගෙන ගන්න කියලා කියනවා. මේ මොහොතේදී සිනාවෙන ඔබ, මේ අණපනත් නිසා අනාගතයේ කඳුළු සලන බව මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අග්‍රාමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.29]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර එවන මහජනතාවට - අපේ පුරවැසියන්ට - පාර්ලිමේන්තුවේ කාර්යභාරය ගැන හොඳ අදහසක්, පුළුල් අදහසක් ගන්න අද දවසේ මේ පවත්වන විවාදය හොඳ අවස්ථාවක් කියලා මම හිතනවා. මොකද, බොහෝ වෙලාවට පාර්ලිමේන්තුව ගැන, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව අපේ පුරවැසියන්ට අදහසක් ගන්න අවස්ථාව ලැබෙන්නේ මේ සභා ගර්භයේ සිද්ධ වන දෙවල්වලින් පමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, අවාසනාවකට මේ සභා ගර්භය තුළ සිදු වන වාද-විවාද අපි බලාපොරොත්තු වන මට්ටමේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ, දියුණු පාර්ලිමේන්තුවක් තුළ තිබිය යුතු මට්ටමටම හැම වෙලාවේම ඔසවා තබන්න අපට බැරි වෙලා තිබෙනවා, අපහසු වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම මාතෘකාවට අදාළව කථා නොකරන එක, ඒ වාගේම පදනමක් නැතුව තොරතුරු ඉදිරිපත් කිරීම, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝදෙනෙක් චෝදනා මත පමණක් තමන්ගේ කථා මේ සභා ගර්භය තුළ සිදු කිරීම නිසා ඇත්තවශයෙන්ම පාර්ලිමේන්තුව ගැන පසුගිය කාලය තුළ - මේක අද ඊයේ වෙච්ච එකක් නොවෙයි - ජනතාව තුළ එච්චර ප්‍රසන්න හැඟීමක් නොවෙයි තිබුණේ.

නමුත් අප සියලුදෙනාම දැනගත යුතු දෙයක් සහ විශේෂයෙන්ම අපේ රටේ පුරවැසියන් දැනගත යුතු දෙයක් තමයි, සමහර වෙලාවට මේ සභා ගර්භයට වඩා විශාල වැදගත්කමක් ඇති කාර්යභාරයක් පාර්ලිමේන්තුවේ විවිධ කමිටු හරහා සිද්ධ වන බව. මුදල් පාලනය පිළිබඳව, මුදල් අවභාවිතාව පිළිබඳව සිද්ධ වන සංවාද වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ඇත්තවශයෙන්ම ආරක්ෂා වන සහ ජනතාවට සෘජුවම මේ ක්‍රියාවලියට සම්බන්ධ වන්න හැකියාව

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

තිබෙන ඉතාම වැදගත් වන කමිටු ගණනාවක් මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වනවා. මා හිතනවා, අපට අද දවස තුළ එවැනි කමිටු තුනක් පිළිබඳව විවාද කිරීමට හැකියාව ලැබීම පුරවැසියන් හැටියට මේ ක්‍රියාවලිය පිළිබඳවත්, මේ රටේ පුරවැසියන්ගේ බදු මුදලින් යැපෙන සහ මේ රටේ පුරවැසියන්ගේ ඡන්දයෙන් පත් වන මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය පිළිබඳව හොඳ දැනුවත්වීමක් ලබාගන්නත් අවස්ථාවක් වනවා කියලා. ඒ වාගේම ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ප්‍රායෝගික තැන් ගැන සංවාදයක් ඇති කිරීමටත් මේක ඉතා ම වටිනා අවස්ථාවක් හැටියට මා දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ, මේ පාර්ලිමේන්තුව තුළ තිබෙන වැදගත්ම කාරක සභාවක්. මේ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාටත්, සියලු සාමාජික මන්ත්‍රීවරුන්ටත් මම ස්තුතිවන්ත වනවා, මේ කාරක සභාවේ වැඩ කටයුතු කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් සහ ජනතා අවශ්‍යතාවලට සෘජුව මැදිහත් වන කාරක සභාවක් ලෙස පවත්වාගෙන යෑම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව කියන්නේ ඇත්තවශයෙන්ම පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන ප්‍රධානම තැනක්. ඒ වාගේම සෘජුවම මේ රටේ පුරවැසියන්ට වන අසාධාරණයක් මහජන නියෝජිතයින් හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා වෙන තැන්වලින් නොලැබුණු විසඳුමක් ලබාගන්න, ඊටත් වඩා තමන්ට ඇහුම්කන් දෙන, තමන්ගේ කථාව, තමන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන් සුවිශේෂී තැනක්. ඇත්තවශයෙන්ම මේක අතිශයින්ම වැදගත් කාරක සභාවක්. එම නිසා මේ කාරක සභාව පිළිබඳව අපේ විශේෂ අවධානයක් යොමු විය යුතුයි.

මම හිතනවා, මේ කාරක සභාවේ වැඩ කටයුතු පිළිබඳව පුරවැසියනුත් දැනුවත් විය යුතුයි කියලා. ඇත්තටම අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කියන්නේ මේ කාරක සභාවේ වැඩිම කාලයක් සේවය කරපු මන්ත්‍රීවරයෙක්. ඒ නිසා එතුමාට මේ කාරක සභාව ගැන කියන්න, විශාල අත්දැකීම් සහ කතන්දර ඇති. ඒවා වටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒවා තුළින් ඇත්තටම පුරවැසියාත්, මහජන නියෝජිතයාත් අතර තිබෙන සම්බන්ධතාව හොඳින් පෙන්වන්න පුළුවන්. අපි දන්නවා, තමන්ගේ පෙත්සම ඉදිරිපත් කරන්න මන්ත්‍රීවරයා නැඟිටිට වෙලාවේ ඉඳන් ඒ පුරවැසියාට දැනෙන හැඟීම. ඒ අවස්ථාවේදී ඔහුගේ වටිනාකම, ඔහුගේ නම, ඔහුගේ ප්‍රශ්නය සභා ගර්භය තුළ කියැවෙනවා. මම හිතනවා, ඒකම මේ රටේ පුරවැසියන්ට අපි කරන විශාල සේවයක් කියලා. මොකද, අපි ඒකෙන් උත්සාහ කරන්නේ මේ සභාව තුළ පුරවැසියාට වටිනාකමක් දෙන්න, පුරවැසියාගේ ප්‍රශ්නයට වටිනාකමක් දෙන්න, ඒ ප්‍රශ්නයට ඇහුම්කන් දෙන්න අපි සූදානම් කියන ඒ පණිවුඩය ලබා දෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ප්‍රජාතන්ත්‍රවාදය කියන එක අපට රකින්න පුළුවන් උතුම්ම ක්‍රමය වන්නේ ඔවුන්ට එවැනි වටිනාකමක් දීම නොවෙයිද? අපි දන්නවා, මෙතැන ඒ නම කියවුණු වෙලාවේ ඉඳලා ඒ පුරවැසියාට යම් කිසි හැඟීමක් එන බව, තමන් වෙනුවෙන් කවුරු හරි පෙනී ඉන්නවා, තමන්ගේ නියෝජිතයා පෙනී ඉන්නවා කියලා. බොහෝ වෙලාවට විවිධ තැන්වලට ඉදිරිපත් කරලා, විසඳා ගන්න බැරි වෙලා, ඔවුන් අනාථ වෙලා, දුක් විඳලා, තැනින් තැනට-තැනින් තැනට තල්ලු වෙලා තමයි අන්තිමට මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඒ ප්‍රශ්න එන්නේ. සමහර වෙලාවට අවුරුදු ගණනාවක් තිස්සේ රාජ්‍ය සේවය තුළ ඒ ප්‍රශ්න එතැනින් මෙහාට, එතැනින් එහාට තල්ලු වෙලා තමයි මෙතැනට එන්නේ. එතකොට මෙතැනදී ඇහුම්කන් දීලා ඒ ප්‍රශ්නයට යම් කිසි සාධාරණයක් ඉෂ්ට කර දීමට පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන්ගේ බලය පාවිච්චි කිරීම අතිශයින්ම වැදගත් දෙයක් කියලා මා හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසාම අපි ඉදිරියටත් බලන්න ඕනෑ, මේ කාරක සභාව තවත් ශක්තිමත් කරන්න. ඒ වාගේම ඒ ක්‍රියාවලිය තුළ ජනතා සහභාගිත්වය තව තවත් ලබා ගන්න පුළුවන් වන විධියට මේ කාරක සභාව දියුණු කරන්නත්, විවෘත කරන්නත්, එහි විනිවිදභාවය තවත් තහවුරු කරන්නත් වැඩ කළ යුතුයි කියා අප විශ්වාස කරනවා.

මේ වෙලාවේ අපේ මහ ලේකම්තුමියත් මෙතැන ඉන්නවා. ඇත්තවශයෙන්ම මෙවැනි කාරක සභා අපේ පාසල් දරුවන්ට විවෘත කරන්න, ඒවා ක්‍රියාත්මක වන විධිය ගැන ඔවුන්ට ඉගෙන ගන්න අවස්ථාවක් ලබා දෙන්න අවශ්‍යයි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳව, පාර්ලිමේන්තුවේ වැදගත්කම පිළිබඳව, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන විධිය ගැන අවබෝධයක් ලබා දෙන්න පුළුවන් නම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වුණත් ඒක ඉතාම හොඳ අවස්ථාවක් වෙන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපට මේ කාරක සභා විවෘත කරන්න පුළුවන්. අපි සාමාන්‍යයෙන් COPE එක, COPA එක වාගේ කාරක සභා අපේ මාධ්‍ය හරහා විවෘත කරනවා. මේ කාරක සභාවත් ඒ හා සමානම වැදගත් කාරක සභාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේක පුරවැසියා සෘජුවම පාර්ලිමේන්තුවත් එක්ක සම්බන්ධ වන තැනක්; පුරවැසියාට ඇහුම්කන් දෙන තැන බවට ප්‍රායෝගිකව අපට පෙන්වන්න පුළුවන් තැනක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාම මෙහි වේගවත් බව, විනිවිදභාවය අපට තව වැඩි කරන්න පුළුවන් නම් හොඳයි කියා මා හිතනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, මේ කාරක සභාවට එන පෙත්සම පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු මොහොතේ සිට ඒක විභාග කිරීමට, ඒ සඳහා නියෝගය ඒමට, ඒ නියෝගය ක්‍රියාත්මක වීමට විශාල කාලයක් ගත වන බව. එම නිසා මේ ක්‍රියාවලිය track කරන්න පුළුවන් system එකක් අපට හඳුන්වා දෙන්න පුළුවන් නම් හොඳයි කියා මා හිතනවා. ඒ කියන්නේ, තමන්ගේ පෙත්සම ඉදිරිපත් වුණු වෙලාවේ සිට ඒක කොහෙද තිබෙන්නේ, මොකක්ද සිද්ධ වන්නේ කියන එක පුරවැසියාට track කරන්න පුළුවන් නම් මම හිතනවා, අපි තවත් විවෘත වනවා, අපේ විනිවිදභාවය තවත් වැඩි වනවා කියලා. ඒ තුළින් පුරවැසියාත් පාර්ලිමේන්තුවත් අතර තිබෙන සම්බන්ධතාව වැඩි කර ගන්නත් අපට පුළුවන් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කාරක සභාවෙන් ලැබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී අපට විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන බව මම දන්නවා. ඒ නිර්දේශ ක්‍රියාත්මක වුණේ නැත්නම් ගන්න පුළුවන් පියවර මොකක්ද කියන එක අවිනිශ්චිතයි. සමහර වෙලාවට මේ ප්‍රශ්න එච්චරටම පරණයි, එච්චරටම සංකීර්ණයි. එවැනි ප්‍රශ්නවලට අපට දෙන්න පුළුවන් සුදුසු නිර්දේශත් සීමාසහිතයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු අගමැතිතුමියනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා.

ඒවා ක්‍රියාත්මක කරන්න ඒවාට වගකිව යුත්තන් හොයා ගන්න එකත් සමහර වෙලාවට අතිශයින්ම සංකීර්ණයි. නමුත් සමහර දේවල් අපට කරන්න පුළුවන්. කාරක සභාව හැටියට අපේ නිර්දේශ පුළුවන් තරම් නිශ්චිතව, කාල සීමාවක් එක්ක දෙන්න පුළුවන් නම්, ඒ කාල සීමාව තුළ ක්‍රියාත්මක වෙන්න බැරි වනකොට ඒකට ගන්න පුළුවන් මොකක් හරි ක්‍රියාමාර්ගයක් - ඒ නිලධාරීන්ව අපට නැවත කැඳවන්න පුළුවන්ද, පසු විපරමක් කරන්න පුළුවන්ද - ගැන සොයා බලනවා නම්, මේ කාරක සභාව තවත් වැදගත් වෙනවා කියලා මම හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මේ කාරක සභාවට එන නිලධාරීනුත් මතක තියා ගන්න ඕනෑ, මේ කාරක සභාවේ වැදගත්කම පිළිබඳව. ඇත්තවශයෙන් මෙතැන තමයි අපි පුරවැසියාට වටිනාකමක් ලබා දෙන්නේ. මෙතැන තමයි අපි පුරවැසියාට ඇහුම්කන් දෙන්නේ. පුරවැසියාට ඇත්තවශයෙන්ම පාර්ලිමේන්තුවේ අගය - වටිනාකම -, තමන්ගේ ඡන්දයේ වටිනාකම දැනෙන තැනක් හැටියට අපි මේ කාරක සභාව පවත්වාගෙන යන්න ඕනෑ. ඒ කාරණය මේ කාරක සභාවට එන නිලධාරීන් හොඳින් මතක තබා ගත යුතුයි. මෙතැන තමයි අපි සියලු දෙනාම පරීක්ෂාවට ලක් වෙන්නේ. එලෙස පරීක්ෂාවට ලක් වීම වදයක් වෙන්න බැහැ; කරදරයක් වෙන්න බැහැ. ඒක තමයි මේ කාරක සභාවේ අරමුණ. ඒක තමයි විය යුත්තේ. ඒ නිසා මම නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ කාරක සභාවේ වගකීම බැරෑරුම් ලෙස භාර ගන්න, ඒ කාර්යභාරය හොඳින් තේරුම් ගන්න කියලා. මේක ප්‍රජාතන්ත්‍රවාදය තුළ, පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ කොච්චර වැදගත්ද කියන එක ගැන අපි අවධානය යොමු කළ යුතුයි කියා යෝජනා කරමින්, මේ වැදගත් විවාදයට සම්බන්ධ වීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, කාරක සභාවේ වැඩ කටයුතුවලට ඉතාම හොඳින් මැදිහත් වන අපේ සභාපතිතුමා ඇතුළු කාරක සභාවේ සාමාජිකයන් සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.41ට, 2026 ජූලි 22වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.41க்கு, பாராளுமன்றம் 2026 யூலை 22, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.41 p.m. until 9.30 a.m. on Wednesday, 22nd July, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 887/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 887/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 01 - 887/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 888/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 888/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 02 - 888/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 889/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 889/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 03 - 889/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.